273 වන කාණ්ඩය - 8 වන කලාපය
தொகுதி 273 - இல. 8
Volume 273 - No. 8

2019 අගෝස්තු 07 වන බදාදා
2019 ஓகஸ்ட் 07, புதன்கிழமை
Wednesday, 07th August, 2019

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කුඩා විදානලාගේ ශාන්ත බණ්ඩාර මහතාගේ ඉල්ලා අස්වීම

කථානායකතුමාගේ සහතිකය

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කළ ප්‍රශ්න**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

උතුරු හා නැඟෙනහිර වෛද්‍යවරුන් ස්ථාන මාරු කිරීමේ පටිපාටිය

**කල්තැබීමේ යෝජනාව:**

මඩකළපුව විශ්වවිද්‍යාල පෞද්ගලික සමාගම පවරා ගැනීම

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**

பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு குடா விதானலாகே சாந்த பண்டாரவினது இராஜினாமா

சபாநாயகரது சான்றுரை

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**

வடக்கு, கிழக்கில் வைத்தியர்களின் இடமாற்ற நடைமுறை

**ஒத்திவைப்புப் பிரேரணை:**

மட்டக்களப்புப் பல்கலைக்கழகத் தனியார் நிறுவனத்தைப் பொறுப்பேற்றல்

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Resignation of Hon. Kuda Vidanalage Shantha Bandara, Member of Parliament

Speaker's Certificate

AUDITOR-GENERAL'S REPORT

QUESTIONS POSED TO HON. PRIME MINISTER

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Transfer Procedure of Doctors in North and East

ADJOURNMENT MOTION:

Takeover of Batticaloa Campus Private Limited

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2019 අගෝස්තු 07 වන බදාදා***
*2019 ஓகஸ்ட் 07, புதன்கிழமை*
*Wednesday, 07th August, 2019*

**අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කථානායකතුමා**
**[ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் பி.ப.1.00 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள்
[மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.
The Parliamentmet at 1.00 p.m.,
MR. DEPUTY SPEAKER
[THE HON. J.M. ANANDA KUMARASIRI] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කුඩා විදානලාගේ ශාන්ත බණ්ඩාර මහතාගේ ඉල්ලා අස්වීම
### பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு குடா விதானலாகே சாந்த பண்டாரவினது இராஜினாமா
### RESIGNATION OF HON. KUDA VIDANALAGE SHANTHA BANDARA, MEMBER OF PARLIAMENT

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ශාන්ත බණ්ඩාර මහතා සිය පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත භාර දී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි. එම ලිපිය දැන් මහ ලේකම්වරයා විසින් කියවනු ලැබේ.

***අනතුරුව පහත සඳහන් ලිපිය මහ ලේකම් විසින් කියවන ලදී:***
*அதன்பிறகு, செயலாளர் நாயகத்தினால் பின்வரும் கடிதம் வாசிக்கப்பட்டது.*
*Whereupon the Secretary-General read the following letter:*

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2019.08.~~05~~ 07

පාර්ලිමේන්තු මහ ලේකම්තුමා
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

ලේකම්තුමනි,

**එක්සත් ජනතා නිදහස් සන්ධාන ජාතික ලැයිස්තු මන්ත්‍රීධුරයෙන් ඉල්ලා අස්වීම.**

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ජාතික ලැයිස්තුවේ මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කරන ජා.හැ.ප. අංක **720884216v** කුඩා විදානලාගේ ශාන්ත බණ්ඩාර වන මම අද දින සිට එනම් 2019.08.05 වන දින සිට එම ධූරයෙන් ඉල්ලා අස්වන බව කාරුණිකව දන්වන අතර, එම ඉල්ලා අස්වීම භාරගන්නා මෙන් කාරුණිකව ඉල්ලමි. තවද එම පුරප්පාඩුව සලකා ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ස්තූතියි.

මෙයට,

**ශාන්ත බණ්ඩාර**
ජාතික ලැයිස්තු පාර්ලිමේන්තු මන්ත්‍රී (එ.ජ.නි.ස.)

*පිටපත : 01. ගරු කථානායකතුමා - (කා.දැ.පි.)*

## II

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2019 අගෝස්තු 06 දින "සමාගම් (සංශෝධන)" නමැති පනත් කෙටුම්පතෙහි ගරු කථානායකතුමා විසින් සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

(i) 2013 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ X කොටස;

(ii) 2014 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ XIV කොටස;

(iii) 2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXX කොටස, තෙවැනි කාණ්ඩයේ XI සහ නවවැනි කාණ්ඩයේ XII කොටස;

(iv) 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXV කොටස, තෙවැනි කාණ්ඩයේ XIII කොටස සහ නවවැනි කාණ්ඩයේ IX, X හා XI කොටස්; සහ

(v) 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XIX හා XX කොටස්, තෙවැනි කාණ්ඩයේ VII හා VIII කොටස් සහ නවවැනි කාණ්ඩයේ IV, V හා VI කොටස්

මම ඉදිරිපත් කරමි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள், மலைநாட்டு மரபுரிமைகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise, Kandyan Heritage and Kandy Development and Leader of the House)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014, 2015 සහ 2016 වර්ෂ සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

එම වාර්තා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016/2017 වර්ෂය සඳහා කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ව්‍යාපාර සහ වාණිජ කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු ලකී ජයවර්ධන මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்கி ஜயவர்தன - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் இராஜாங்க அமைச்சரும் நகரத் திட்டமிடல், நீர் வழங்கல் மற்றும் உயர் கல்வி பதில் அமைச்சரும்)
(The Hon. Lucky Jayawardana - State Minister of City Planning and Water Supply)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හන්දෙස්ස, පමුණුව, අංක 93-සී දරන ස්ථානයෙහි පදිංචි පී.ඩබ්ලිව්.ජී. පියසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා (සමාජ සවිබලගැන්වීම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாலித தெவரப்பெரும - சமூக வலுவூட்டல் பிரதி அமைச்சர்)
(The Hon. Palitha Tewarapperuma - Deputy Minister of Social Empowerment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගවරගිරිය, කොළබැව යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එච්. විමලසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු රංජිත් සියඹලාපිටිය මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.*
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් ප්‍රශ්න අසන අවස්ථාව.
ගරු හර්ෂණ රාජකරුණා මැතිතුමා.

## ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කළ ප්‍රශ්න
## மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்
## QUESTIONS POSED TO HON. PRIME MINISTER

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු අගමැතිතුමාගෙන් මෙම ප්‍රශ්නය අහනවා.

දිවයිනේ රැකියා විරහිත උපාධිධාරීන් 16,000කට රජයේ රැකියා ලබා දීමේ ජාතික උත්සවය ජූලි 30 වැනි දින අරලියගහ මන්දිරයේදී ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට කටයුතු යොදා තිබූ අවස්ථාවක රැකියා විරහිත උපාධිධාරීන් සියලු දෙනාට රැකියා ලබා දෙන ලෙස ඉල්ලමින් ඒකාබද්ධ රැකියා විරහිත උපාධිධාරී සංගමය කොළඹ කොටුව දුම්රිය පොළ ඉදිරියේ උද්ඝෝෂණ පවත්වන ලදී.

1. රැකියා විරහිත උපාධිධාරීන්ට පත්වීම් ලබා දීම සඳහා රජය විසින් අනුගමනය කළ ක්‍රමවේදය කවරේද?
2. තෝරා ගැනීමේදී යොදා ගත් නිර්ණායක මොනවාද?
3. දැනට සිටින මුළු රැකියා විරහිත උපාධිධාරීන්ගෙන් කොපමණ සංඛ්‍යාවකට රැකියා ලබා දුන්නේද?
4. රැකියා ලබා නොදුන් ඉතිරි අය සම්බන්ධයෙන් ඉදිරියේදී ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද?
5. විශේෂයෙන් බාහිර උපාධිධාරීන්ට රැකියා අවස්ථාවක් ලබා දුන්නේද?

නොඑසේ නම් ඒ මන්දැයි ගරු සභාවට දැනුම් දෙන ලෙස මේ අවස්ථාවේදී ඉල්ලමි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசியக் கொள்கைகள், பொருளாதார அலுவல்கள், மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு மாகாண அபிவிருத்தி மற்றும் இளைஞர் அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development and Youth Affairs)

රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා අවස්ථා සැලසීම අපේ රජයේ ප්‍රමුඛත්ව කාර්යයක් ලෙස සලකා අපි කටයුතු කරනවා. 2018 මැයි 25වන දා රැස් වූ අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයට අනුව අදියර කීපයකින් රැකියා විරහිත උපාධිධාරීන් පුහුණු කිරීම යටතේ පළමුවන අදියරේදී 2018 අගෝස්තු මාසයේ 20වන දින අභ්‍යාසලාභී උපාධිධාරීන් 5,000ක් බඳවා ගැනීමට අපි කටයුතු කළා. ඒ අතරින් 3,200 දෙනෙක් රැකියා භාර ගන්න පැමිණියා. ඊට පසුව ඔක්තෝබර් මාසයේ අපේ රැකියා ලබා දීමේ අවස්ථාව නැති වුණා. රැකියා දීමේ අවස්ථාව ආපසු ලබා ගත්තාට පසුව අපට අවස්ථාව ලැබුණා, අභ්‍යාසලාභී උපාධිධාරීන් 16,800දෙනකු සඳහා පත්වීම් ලිපි ප්‍රදානය කිරීමට. ඒක පසුගිය ජූලි මාසයේ 30, 31 සහ අගෝස්තු 01වන දා සිදු කිරීමට අපට හැකි වුණා. මේ රැකියා විරහිත උපාධිධාරීන් වෙත පත්වීම් ලබා දීමේදී ඉතා සාධාරණ ක්‍රමවේදයක් අපි අනුගමනය කළා. පෙර වාගේම, විශ්වවිද්‍යාලයෙන් පිට වූ වර්ෂය අනුව තමයි අපි ඒ පත්වීම් දුන්නේ. එනම්, උපාධිය සම්පූර්ණ වූ වර්ෂය සැලකිල්ලට ගෙන එම පත්වීම් ලබා දුන්නා. ඒ අනුව, 2016 දෙසැම්බර් 31වන දිනට පෙර උපාධිය සම්පූර්ණ කරන ලද රාජ්‍ය විශ්වවිද්‍යාල අභ්‍යන්තර සිසුන් සඳහා අපි පත්වීම් දුන්නා. දැනට, 2011 දෙසැම්බර් 31වන දිනට පෙර රජයේ විශ්වවිද්‍යාලයකින් බාහිර උපාධියක් ලබාගත් උපාධිධාරීන් සඳහාත් පත්වීම් ලබා දීමට අපි කටයුතු කර තිබෙනවා. ඉහත කී උපාධිධාරීන් 3,200ත් එක්ක ගත් විට මේ වන විට රැකියා විරහිත උපාධිධාරීන් 20,000කට පමණ පත්වීම් දීලා තිබෙනවා. අපි පත්වීම් දුන්නු 16,800න් කී දෙනෙක් පත්වීම් බාර ගන්නවා ද කියලා අපට තවම වාර්තා වෙලා නැහැ. ඒකට තව සති දෙක තුනක් යයි. ඒ ඇබෑර්තු සියල්ලම අරගෙන, ඉතිරිව තිබුණු ඇබෑර්තුත් අරගෙන පළමුවැනි වටය හැටියට බාහිර උපාධිධාරීන් 6,000කට, 7,000කට පත්වීම් දීලා, ඊට පස්සේ ඊළඟ වැඩ පිළිවෙළ අනුව බාහිර උපාධිධාරීන්ට රැකියා ලබා දෙන්න අපි ක්‍රියා කරනවා. අපි පළමුවෙන්ම කටයුතු කළේ, රාජ්‍ය විශ්වවිද්‍යාලවල අභ්‍යන්තර උපාධිධාරීන්ට රැකියා ලබා දීමටයි. ඊට පස්සේ බාහිර උපාධිධාරීන්ට රැකියා ලබා දීමට අපි කටයුතු කරනවා. ඒ අනුව තමයි අපි වැඩ කටයුතු කරලා තිබෙන්නේ.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු අග්‍රාමාත්‍යතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මේකයි.

මා දන්නා තරමින් 2012 වර්ෂයේ බාහිර උපාධිධාරීන් 800කට පමණ පත්වීම් ලබා දීලා තිබෙනවා. 2016 දෙසැම්බර් 31 දක්වා සිටින internal graduatesලා සියලුදෙනාට රැකියා ලැබිලා තිබෙනවා. විශේෂයෙන්ම මහජන නියෝජිතයන් හැටියට අපට ලොකු ඉල්ලීමක් තිබෙනවා, බාහිර උපාධිධාරීන්ටත් රැකියා ලබා දීමේදී ඒ හා සමානව සලකා බලන්න කියලා. ඒ ගැන රජයේ අවධානය යොමු වෙලා තිබෙනවා ද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඒ ගැන අපේ අවධානය යොමු වෙලා තිබෙන්නේ. බාහිර උපාධිධාරීන් සම්බන්ධව තිබෙන ප්‍රශ්නය මේකයි. සමහර අය රැකියා කරන ගමන්, වෙනත් වැඩ කටයුත්තක් කරන ගමන්, බාහිර උපාධිය කරලා, ඊට පස්සේ මෙතැනින් රැකියාවක් ගන්න බලනවා. නමුත් සමහර විට මේ ලැබෙන රැකියාවෙන් ඒ අය සෑහීමකට පත් වෙන්නේ නැහැ. ඒ නිසායි ඔවුන් පරණ රැකියාවේම සිටින්නේ. ඒකයි අපි තීරණය කළේ, ඉස්සෙල්ලාම අභ්‍යන්තර උපාධිධාරීන්ට රැකියා දීලා, ඊට පස්සේ බාහිර උපාධිධාරීන්ට රැකියා ලබා දෙන්න.

දෙවනුව අපි තීරණයක් ගත්තා, ඒ අයට රැකියා ලබා දීමට නම් ඇත්ත වශයෙන්ම නියම රැකියාවක් තිබෙන්න ඕනෑ කියලා.

පාසල්වලටත් ගුරුවරු වුවමනා නිසා රැකියා අවස්ථා ලැබුණා. අපි අමාත්‍යාංශ එක්කත්, සංස්ථා එක්කත් කථා කරලා මේ අයට යම් කිසි ප්‍රයෝජනවත් වැඩ කොටසක් දෙන්නේ කොහොමද කියලා සාකච්ඡා කරලා තමයි පත්වීම් දෙන්නේ. අපි දන්නවා, සමහර තැන්වලට බාහිර උපාධිධාරීන් විශාල ප්‍රමාණයක් අරගෙන ඉන්නවා කියලා. දැන් අපට කථා කරන්න තිබෙන්නේ ඒ උපාධිධාරීන් නොගත්ත අමාත්‍යාංශවලටයි.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

අගමැතිතුමනි, උපාධිධාරීන් විශාල සංඛ්‍යාවක් සංවර්ධන නිලධාරීන් හැටියට ග්‍රාම නිලධාරී කොට්ඨාසවල සංවර්ධන කටයුතු සඳහා නියැලී සිටිනවා. ඒ "සංවර්ධන නිලධාරීන්ගේ එකමුතුව" මා හමුවුණා. ඒ සංවර්ධන නිලධාරීන් විශාල ප්‍රමාණයක් තවත් ග්‍රාම නිලධාරී කොට්ඨාසයක වැඩ බලමින් සේවය කරනවා.

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

ග්‍රාම නිලධාරින්ට ලබා දෙන අතිරේක දීමනාව ඒ අයටත් නොලැබීම හේතුවෙන් ඒ අය ලොකු කනස්සල්ලකට පත් වෙලා තිබෙනවා. මම හිතන්නේ එය ඉතා සාධාරණ ඉල්ලීමක්. ග්‍රාම නිලධාරින්ට තවත් කොට්ඨාසයක වැඩ බලනකොට යම් අතිරේක දීමනාවක් ලැබෙනවා. එලෙසින්ම ඒ කටයුතු සංවර්ධන නිලධාරින්ගෙනුත් ඉටු වෙනවා. මේ දවස්වල" ගම් පෙරළිය" වැඩසටහන යටතේ විශාල වැඩකටයුත්තක් සංවර්ධන නිලධාරින්ගෙන් ඉටු කෙරෙනවා. ඒ දවස්වල සංවර්ධන නිලධාරින්ගෙන් ලොකුවට වැඩක් කෙරුණේ නැහැ, ඇට ටිකක් බෙදන්න තමයි තිබුණේ. නමුත්, දැන් ඒ සංවර්ධන නිලධාරින්ගෙන් විශාල වැඩ කොටසක් සිදු වෙන නිසා ඒ අයට යම් දීමනාවක් -ලැබිය යුතු දීමනාවක් - ලබා දෙන්න කටයුතු කරනවාද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඇත්ත වශයෙන්ම ගරු මන්ත්‍රීතුමනි, මම මේ ප්‍රශ්නය අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට යොමු කරන්නම්. ඔබතුමා කියපු හැටියට බිම් මට්ටමින් අද විශාල වැඩ කොටසක් සිදු වෙනවා. කිසිම ආණ්ඩුවක් නොකරපු විධියට හැම තැනකම වැඩ කටයුතු සිදු වෙනවා. යටිතල පහසුකම් ලබා දෙන්න, පාරවල් හදන්න, පාසල් හදන්න වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක වෙනවා. එවැනි විශාල වැඩ කොටස් ගණනාවක් තිබෙනවා. ඒ වැඩ කොටස් කරන්නත් ඒ නිලධාරින් යොමුවෙලා තිබෙනවා. ඔබතුමා කියපු කාරණය මම අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු ඇමතිතුමාට යොමු කරන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟ ප්‍රශ්නය, ගරු සී.බී. රත්නායක මන්ත්‍රීතුමා.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ගරු අගමැතිතුමාගෙන් අසනු ලබන ප්‍රශ්නය මෙයයි.

වර්තමාන ආණ්ඩුව බලයට පත් වීමට පෙර මේ රටේ තරුණ තරුණියන්ට ලබා දුන් ප්‍රධානතම පොරොන්දුව වූයේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් වන ආකාරයට රැකියා දසලක්ෂයක් ලබා දෙන බවයි. මේ වන විට මේ ආණ්ඩුවට වසර හතරහමාරක් ගත වී තිබෙන අතර, රැකියා දසලක්ෂයෙන් කොපමණ රැකියා ලබා දී තිබෙනවාද කියලා සවිස්තර වාර්තාවක් ඔබතුමා මෙම ගරු සභාවට ඉදිරිපත් කරනවාද?

එම රැකියා දසලක්ෂයෙන් රාජ්‍ය අංශයට අලුතින් ලබා දුන් රැකියා සංඛ්‍යාව කොපමණද? ඒවා ලබා දුන්නේ කුමන පදනමකින්ද? ලබා දුන් එම රැකියාවල සවිස්තර ලේඛනයක් ලබා දෙන ලෙසද ඉල්ලමි.

පෞද්ගලික අංශයේද දායකත්වය ලබාගෙන රැකියා ලබා දෙන බවටද ආණ්ඩුව මැතිවරණයට පෙර පොරොන්දු වූ අතර, ඒ ආකාරයෙන් ආණ්ඩුව මැදිහත් වී ලබා දුන් පෞද්ගලික අංශයේ රැකියා සංඛ්‍යාව කොපමණද?

රට පුරා කර්මාන්තපුර ඇති කරමින් විදේශ ආයෝජන ගෙන්වා ග්‍රාමීය තරුණයින්ගේ රැකියා ප්‍රශ්නයටද විසඳුම් ලබා දෙන බව ඔබතුමා මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් පොරොන්දු වූ බව සිහිපත් කරනු කැමැත්තෙමි. රැකියා ප්‍රශ්නය විසඳීම සඳහා එවැනි කර්මාන්තශාලා කොපමණ සංඛ්‍යාවක් රට පුරා ස්ථාපිත කර තිබේද? එම කර්මාන්තශාලා මඟින් ලබා දී ඇති සමස්ත රැකියා ප්‍රමාණය දිස්ත්‍රික් මට්ටමින් කොපමණද යන්න පිළිබඳ සවිස්තර වාර්තාවක් ලබා දෙන ලෙසද ඉල්ලමි.

අනෙක් ප්‍රශ්නය, -උපාධිධාරින්ගේ ප්‍රශ්නය- ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා අහපු නිසා මම ඒ ප්‍රශ්නය අහන්නේ නැහැ. ඔබතුමා ඒ ප්‍රශ්නයට පිළිතුර ලබා දුන්නා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඔබතුමා අහලා තිබෙන්නේ ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයේ කොටසක්. මම ඒකට පිළිතුර ලබා දීලා තිබෙනවා. ආණ්ඩුවෙන් රැකියා දුන්න ප්‍රමාණය සහ පෞද්ගලික අංශයෙන් රැකියා දුන්න ප්‍රමාණය ගැන අපි තොරතුරු ඉල්ලා තිබෙනවා. පෞද්ගලික අංශයේ සේවක අර්ථසාධක අරමුදලේ ලියා පදිංචි වී ස්ථිර වශයෙන් සේවය කරන අය ඉන්නවා. සමහර තැන්වල ස්ථිර නොකළාට එතැනම වැඩ කටයුතු කරන අය ඉන්නවා. ඒ වාගේම සංවිධාන නොවූ අංශයේ, informal sector එකේ, ස්වයං රැකියා කරන සංඛ්‍යාවකුත් ඉන්නවා. මේ සියලු විස්තර ලබා දෙන්න කියලා මම ඉල්ලා තිබෙනවා. දැනට විශාල සංඛ්‍යාවකට රැකියා ලබා දීලා තිබෙනවා. මට පෞද්ගලික අංශයේ සමහර අය කියන්නේ, "ඒ අය ළඟ ඇබෑර්තු තිබෙනවා. නමුත් ඇබෑර්තු පිරවීමට පිරිස මදි" කියලායි. ඒ කියන්නේ සමහර අය දැනට ගමේ තිබෙන ආදායමින් සෑහීමට පත් වෙලා ඉන්නවා. ඊට වඩා හොඳ ආදායමක් ලැබුණේ නැත්නම් ඒ අය වෙන රැකියාවකට යන්න අකමැතියි. ඒකට ඒ අයට දොස් කියන්න බැහැ. ඒ නිසා සමහර අංශවල, විශේෂයෙන් ඉදිකිරීමේ අංශය වැනි අංශ ගණනාවක රැකියා ඇබෑර්තු තිබෙනවා.

ඊට අමතරව දැන් තව ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. සංචාරක ව්‍යාපාරයෙන් විශාල සංඛ්‍යාවක් ජීවත් වුණා. පාස්කු ඉරු දින සිදු වූ බෝම්බ පිපිරීම නිසා ඒ අයට තාවකාලිකව ඒ ආදායම් අහිමි වෙලා තිබෙනවා. දෙසැම්බර් මාසය වන විට ඒ අයට යළිත් ඒ කටයුතු කරන්න පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. අද එක් එක් ණය ක්‍රම, විශේෂයෙන් "Enterprise Sri Lanka" වැනි වැඩසටහන් නිසා ව්‍යාපාර කටයුතු කරන සංඛ්‍යාවත් වැඩි වෙලා තිබෙනවා. ඒ පිළිබඳ වාර්තා අපට ලැබිලා නැහැ. ඒ සඳහා දුන්න මුදල අපි දන්නවා. දැනට එමඟින් බිහි වුණු රැකියා ප්‍රමාණය අපට සොය ගන්න තිබෙනවා.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
ගරු අග්‍රාමාත්‍යතුමනි, රැකියා සම්බන්ධයෙන් වන සවිස්තර වාර්තාවක් කඩිනමින් ලබා දෙන්න පුළුවන් වේවිද කියන එකයි මම ඇහුවේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඒක පුළුවන් තරම් ඉක්මනින් ලබා දෙන්න කියලා මම කියලා තිබෙනවා.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
ඉදිරි මාස 6 ඇතුළත තව රැකියා කීයක් ඔබතුමා නිර්මාණය කරන්න සූදානම් වෙනවාද, ලබා දෙන්න කටයුතු කරනවාද?

ඊළඟට, සේවක අර්ථ සාධක අරමුදල් පිළිබඳව කථා කරපු නිසාම මේ කාරණයත් කියන්න ඕනෑ. විශ්‍රාම වැටුපක් ලබා නොදෙන නිසා බොහෝ පිරිස් පෞද්ගලික අංශයේ රැකියාවලට නොයන බවක් ඒත්තු ගැන්වෙනවා, ඔබතුමා කියපු පරිදි. ඒ නිසා ඒ අයටත් විශ්‍රාම වැටුප් ලබා දෙමින් රැකියා ලබා දීම සඳහා කටයුතු කරනවාද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඒ ගැනත් යෝජනා කිහිපයක් ලැබී තිබෙනවා; සාකච්ඡා කරගෙන යනවා. එක ප්‍රශ්නයක් වෙලා තිබෙනවා, විශ්‍රාම වැටුප් නොමැති වීම. අනෙක, ඒ අය හැම වෙලාවේම බලන්නේ දැනට ලැබෙන ආදායමට වඩා වැඩි ආදායමක් ලැබෙනවාද කියලායි. එහෙම ලැබෙන්නේ නැත්නම් එතැනට යන්නේ නැහැ. ඒකයි තිබෙන අනෙක් ප්‍රශ්නය.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

ඒ සඳහා දිරි ගැන්වීමක් කරලා කටයුතු කළ යුතු වෙනවා ගරු අග්‍රාමාත්‍යතුමනි. විරැකියාව පිළිබඳ විශාල-

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඉදිරියේදී මේ ගැන කථා කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ අතුරු ප්‍රශ්න අහලා ඉවරයි.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තව එක ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

අතුරු ප්‍රශ්න දෙකක් අහන්න පමණයි අවස්ථාව දෙන්නේ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේත් අවසරය පරිදි, අග්‍රාමාත්‍යතුමාගෙන් මම මේ ප්‍රශ්නය අහන්න කැමැතියි. රජයේ රැකියා ලබා දීමේදී, පුරප්පාඩු නැති තැන්වලටත් පුරප්පාඩු හොය හොයා දමනවා වාගේම, තිබෙන පුරප්පාඩු ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයක් ඇතුළත් කරනවා. ඒවා දේශපාලන හේතු මත සිදු වෙනවා. අපට ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. රක්ෂා දෙන එකට අපි විරුද්ධ වෙනවා නොවෙයි. නමුත්, ඒ නිසා පෞද්ගලික අංශයේ රැකියාවලට යන්න බොහෝ පිරිස් උනන්දු වෙනවා අඩුයි.

ඒ වාගේම, පෞද්ගලික අංශයේ අයට බදු වැඩි කර තිබෙනවා. ඒ ආයතනවල විදුලි බිල වැඩියි; ජල බිල වැඩියි. ඒ නිසා ඒ අයගේ කර්මාන්ත නඩත්තු කරගන්න බැරි තත්ත්වයක් තිබෙනවා.

එම නිසා අනවශ්‍ය විදියට රාජ්‍ය අංශයේ රැකියා පුරවන්න -පුටු පුරවන්න- යනවාට වැඩිය පෞද්ගලික කර්මාන්ත ක්ෂේත්‍රය දියුණු කරන්න, නිෂ්පාදන ආර්ථිකය වැඩි කරන්න ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා මම අහන්න කැමැතියි. අග්‍රාමාත්‍යතුමනි, මේ වතාවේ අය වැය ලේඛනයෙනුත් කෘෂිකර්ම ක්ෂේත්‍රයට වෙන් කරපු මුදල අඩුයි. ඒ වාගේම ධීවර ක්ෂේත්‍රයට වෙන් කරපු මුදලේත් අඩුවක් තිබෙනවා. ඒ වාගේම පශු සම්පත් ක්ෂේත්‍රයට වෙන් කරපු මුදලේත් අඩුවක් තිබෙනවා. ඒ නිසා එම ක්ෂේත්‍ර තුළින් රැකියා නිර්මාණය කර ගන්න අමාරුයි. නමුත්, රැකියා අවස්ථා නිර්මාණය කර ගැනීමේ අවස්ථා වැඩි වශයෙන් තිබෙන්නේ එම ක්ෂේත්‍ර තුළයි. තමුන්නාන්සේලා ඒ ක්ෂේත්‍රවල රැකියා අවස්ථා නිර්මාණය කරන්නේ නැතිව සමෘද්ධියට සහ ප්‍රචාරක කටයුතුවලට විශාල මුදලක් දුන් බව පෙනෙන්න තිබෙනවා. ඒ අනුව, ප්‍රචාරක කටයුතුවලට රුපියල් මිලියන 3,000ක් විතර දීලා තිබෙන බව අපට පෙනෙන්න තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු පී. හැරිසන් ඇමතිතුමනි, ඔබතුමා පිළිතුරක් දෙනවාද?

**ගරු පී. හැරිසන් මහතා (කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ஹரிசன் - கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Agriculture, Rural Economic Affairs, Irrigation and Fisheries and Aquatic Resources Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්මයට දුන් මුදල ප්‍රමාණවත් නැහැයි කියලා එතුමා කිව්වා. හැබැයි, ලෝක බැංකු ව්‍යාපෘති යටතේ තිබෙන විශාලම ව්‍යාපෘති දෙක තිබෙන්නේ කෘෂි කර්මාන්තය ආශ්‍රිතව කියලා අමරවීර මැතිතුමාම දන්නවා. ඒ, කෘෂි නවීකරණ වැඩසටහන, සුසිරි කෘෂි කාර්මික සහ වාරිමාර්ග ව්‍යාපෘතිය. වැව් 700ක් හදන්න එම ව්‍යාපෘති යටතේ අපට මුදල් හම්බවෙලා තිබෙනවා. රජයට බරක් නොවී ලෝක බැංකු ආධාර යටතේ එම ව්‍යාපෘති ක්‍රියාත්මක වනවා. වැව් විතරක් නොවෙයි, -

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

එම ව්‍යාපෘති මේ අවුරුද්දේ පටන් ගෙන තිබෙනවාද?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

මේ අවුරුද්දේ පටන් ගෙන තිබෙනවා. ඒ අනුව, ලංකාවේ දිස්ත්‍රික්ක හයක රුපියල් බිලියන 2,000ක ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක වනවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති ටික මොනවාද කියලා මම දන්නවා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

මේ අවුරුද්දේ තමයි කෘෂි කර්මාන්තය වෙනුවෙන් වැඩිම මුදලක් වෙන්වෙලා තිබෙන්නේ. ඉතිහාසයේ කවදාවත් කෘෂිකර්ම ක්ෂේත්‍රයට එවැනි මුදල් ප්‍රමාණයක් වෙන්වෙලා නැහැ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු ඇමතිතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අතුරු ප්‍රශ්න දෙකක් සඳහා පමණයි අවස්ථාව ලබා දිය හැකි වන්නේ. ඔබතුමා දැන් අතුරු ප්‍රශ්න හතරක් පමණ ඇහුවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු අගමැතිතුමාගෙන් ඇහුවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අගමැතිතුමාගෙන් අසන ලද ප්‍රශ්නයට තමයි, ගරු පී. හැරිසන් ඇමතිතුමා පිළිතුරු දුන්නේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
සාමාන්‍යයෙන් අපේ රටේ ජනතාව තුළ රජයේ රැකියාවලට විශාල කැමැත්තක් තිබෙනවා. එහෙත් අපට දැන් පෞද්ගලික අංශයත් දියුණු කරන්න අවශ්‍ය වෙලා තිබෙනවා. අපි ඒ සඳහා තවත් දිරිගැන්වීම් ඇතුළු කරන්න බලාපොරොත්තු වනවා. [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
நன்றி, பிரதிச் சபாநாயகர் அவர்களே!

முல்லைத்தீவு மாவட்ட புதுக்குடியிருப்புப் பிரதேச செயலகத்திற்கு உட்பட்ட கமநல சேவைத் திணைக்களத்திற்குச் சொந்தமான நஞ்சுண்டான் குளம் நீண்ட காலமாகப் புனரமைக்கப்படாமையினால், என்னால் விடுக்கப்பட்ட கோரிக்கைக்கு அமைவாக, 2019.02.14ஆம் திகதி பிரதமரது அமைச்சினால் 40 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டு 06 மாதங்களாகியும், இக்குளத்தைப் புனரமைப்பதற்கு வனப் பாதுகாப்புத் திணைக்களம் இன்றுவரை அனுமதி வழங்க வில்லை என்பதைக் கௌரவ பிரதமர் அவர்கள் அறிவாரா?

வனப் பாதுகாப்புத் திணைக்களத்தின் அனுமதி வழங்கல் குறித்து மேதகு சனாதிபதி அவர்களை நேரடியாகச் சந்தித்து நான் கேட்டபோது, அதற்குரிய அனுமதியைக் கொடுக்கும்படி வனப் பாதுகாப்புத் திணைக்களத்தினருக்குச் சனாதிபதி அவர்கள் பணிப்புரை வழங்கியும், முல்லைத்தீவு மாவட்ட அரசாங்க அதிபர் பல தடவை வனப் பாதுகாப்புத் திணைக்களப் பணிப்பாளரிடம் அதுபற்றிக் கோரிக்கை விடுத்தும், இன்றுவரை அதற்குரிய அனுமதி கிடைக்கவில்லை என்பதை கௌரவ பிரதமர் அவர்கள் அறிவாரா?

நஞ்சுண்டான் குளத்தைப் புனரமைப்பதன்மூலம் இளங்கோபுரம், வள்ளுவர்புரம், மாணிக்கபுரம், தேராவில் ஆகிய அயல் கிராமங்களைச் சேர்ந்த 1,300 விவசாயக் குடும்பங்கள் மேட்டுநிலப் பயிர்ச்செய்கையின்மூலம் வாழ்வா தாரங்களைப் பெற்றுக்கொள்ள முடியும் என்பதனால், வனப் பாதுகாப்புத் திணைக்களத்தினுடைய அனுமதியைப் பெற்றுக்கொள்ளவும், இக்குளத்தின் புனரமைப்புக்குரிய மேலதிக நிதியை வழங்கவும் நடவடிக்கை எடுக்க முடியுமா என்பதை கௌரவ பிரதமர் அவர்கள் இச்சபையில் தெளிவுபடுத்துவாரா?

நஞ்சுண்டான் குளத்தைப் புனரமைப்பதற்கு அனுமதி மறுக்கின்ற வனப் பாதுகாப்புத் திணைக்களம், வவுனியா மாவட்டத்தில் நெடுங்கேணிப் பிரதேச செயலகத்திற்குக் கீழுள்ள, கச்சல்சமளங்குளம் என்ற வவுனியா கமநல சேவைத் திணைக்களத்திற்கு உட்பட்ட குளத்தினை அனுராதபுரம் கமநல சேவைத் திணைக்களத்தின்மூலம் புனரமைப்புச்செய்து, அப்பகுதியில் 250 ஏக்கர் காடுகளை அழித்து அங்கு சிங்கள மக்களைக் குடியேற்றுவதற்கு நடவடிக்கை எடுத்து வருகின்றது என்பதை கௌரவ பிரதமர் அவர்கள் அறிவாரா?

வடக்கு, கிழக்குப் பிரதேசத்தில் வனப் பாதுகாப்புத் திணைக்களம், வன ஜீவராசிகள் திணைக்களம், மகாவலி அதிகாரசபை, தொல்லியல் திணைக்களம் ஆகிய அரச திணைக் களங்களில் ஆவணப்படுத்தப்பட்டிருக்கின்ற காணிகளில் எதிர்காலத்தில் சிங்கள மக்களைக் குடியேற் றுவதற்காக, இக்காணிகளைக் குறித்த திணைக் களங்கள் கையகப்படுத்தி யிருப்பது இச்சம்பவத்தின்மூலம் வெளிப் படையாகத் தெரிகின்றது என்பதை கௌரவ பிரதமர் அவர்கள் அறிவாரா?

ஆமெனில் வடக்கு, கிழக்கில் குறித்த திணைக்களங்கள் தமிழ் மக்கள் சார்ந்த கோரிக்கைகளை நிராகரித்துச் சிங்கள மக்களுடைய குடியேற்றங்களுக்கு ஏதுவாகச் செயற்படுவதைத் தடுத்து நிறுத்த முடியுமா என்பதை கௌரவ பிரதமர் அவர்கள் இச்சபையில் அறிவிப்பாரா?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුලතිව් දිස්ත්‍රික්කයේ, පුදුකුඩිඉරුප්පු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නන්වුන්ඩාන් වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අදාළ අනුමැතිය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2019 අප්‍රේල් 10 වැනි දින ලබා දී තිබෙනවා. So, they have given it on 10th of April. ඒ සම්බන්ධයෙන්, වන සංරක්ෂක ජනරාල් විසින් නිකුත් කරන ලද ලිපිය මා ඉදිරිපත් කරන්නම්.

ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් උතුරු නැඟෙනහිර සංවර්ධනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය රැස්වූ අවස්ථාවේදීද මෙම වැව ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධව සාකච්ඡා වී තිබෙනවා. එහිදීද මේ ගැන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත අදාළ උපදෙස් ලබා දී තිබෙනවා. එසේම, මෙම වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මගේ අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 40ක මුදලක් වෙන්කර තිබෙනවා. ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ වූ පසුව ඉතිරි මුදල් අවශ්‍ය පරිදි ලබා දීමට හැකියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කළ පරිදි, වවුනියාව දිස්ත්‍රික්කයේ, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කළමනාකාරිත්වය යටතේ පවත්නා භූමියක් තුළ කච්චල්සමලක්කුලම නමින් වැවක් ප්‍රතිසංස්කරණය කර සිංහල ජනයා නැවත පදිංචි කිරීම සඳහා කටයුතු කර නැහැ. අතීතයේ පැවති ගැටුම් නිසා වල් බිහි වී ඇති වැව් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් අවසර ඉල්ලා ඇතත්, එම ලැයිස්තුවටද කච්චල්සමලක්කුලම නමින් වැවක් ඇතුළත්ව නැහැ. එසේම වනජීවී රක්ෂිත ලෙස ස්ථාපිත කර ඇති ප්‍රදේශවල පවතින වනජීවී සම්පත්වලට නිසි නෛතික ආරක්ෂාවක් ලබාදීමේ අරමුණින් වෙන්කර ඇති ප්‍රදේශ, ජනතාව පදිංචි කිරීම වැනි වෙනත් පරිබාහිර කාර්යයක් සඳහා යොදා

ගැනීමට වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ ප්‍රතිපාදන නොමැති බැවින්, ජනතාව පදිංචි කිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින්ද කිසිදු ඉඩම් වෙන් කිරීමක් සිදු කර නැහැ.

ගරු මන්ත්‍රීතුමාට මා කියන්න කැමැතියි, කිසිම දිස්ත්‍රික්කයක ජන වාර්ගික අනුපාතය වෙනස් කරන්න අපි ක්‍රියා කරන්නේ නැති බව. මේ ප්‍රදේශයේ බහුතරයක් ඉන්නේ දෙමළ ජනතාවයි. ඒ දෙමළ ජනතාව මේ ප්‍රදේශයේ ජීවත් කරවන්න තමයි අපි බලාපොරොත්තු වන්නේ. යම්කිසි නිලධාරියකු විසින් එය උල්ලංඝනය කරනවා නම්, ඒ බව මට දැනුම් දෙන්න. මා ඒ ගැන විභාග කරන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Do you have any Supplementary Questions, Hon. Member?

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

Yes.

நன்றி, பிரதிச் சபாநாயகர் அவர்களே!

கௌரவ பிரதமர் அவர்களே, நீங்கள் குறிப்பிட்டதுபோல, 2019ஆம் ஆண்டு 04 ஆம் மாதம் வன இலாகா திணைக்களம் அனுமதி வழங்கியிருந்தது. நான் மற்றும் அரசாங்க அதிபர் எல்லோரும் மாவட்ட District Forest Officer உடன் அந்தப் பிரதேசத்துக்குச் சென்றிருந்தோம். ஆனால், அவர்கள் அங்கு வந்து ஆய்வு செய்து, அதன் பின்பு ஓர் அனுமதியை வன இலாகா பணிப்பாளரிடம் கோரியிருந்தார்கள். அந்த அனுமதி இன்னும் வராமல் இருக்கின்றது. இந்த வருடம் முடிகின்ற காரணத்தினால் அந்தப் பணத்தைச் செலவழிப்பதில் மிகப் பெரிய ஒரு தர்மசங்கடமான நிலை இருக்கின்றது.

கௌரவ பிரதமர் அவர்களே, நான் உங்களிடம் நேரடியாக வந்து, இந்தக் குளம் தொடர்பாக 40 மில்லியன் ரூபாயைக் கேட்டபோது, நீங்கள் அந்தத் தொகையை வழங்கியிருந்தீர்கள். அதற்கு எனது மனமார்ந்த நன்றிகள்! யுத்தத்தால் பாதிக்கப்பட்ட அந்த மாவட்டத்தில் மக்களுடைய விவசாயத்தை மேம்படுத்துவதில் கௌரவ பிரதமராகிய நீங்களும் அக்கறையாக இருக்கின்றீர்கள் என்பதற்கு நான் கேட்ட உடனே அந்தப் பணத்தை வழங்கியது ஒரு சாட்சியாக இருக்கின்றது. ஆகவே, இந்தக் குளத்தைத் தங்களுடைய கண்காணிப்பின்கீழ் முற்று முழுதாகப் புனரமைப்புச் செய்து, நீங்கள் அதனை அந்த மக்களிடம் நேரடியாக ஒப்படைக்க வேண்டுமென்று நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்கின்றேன்.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු මන්ත්‍රීතුමනි, අපි නන්වුන්ඩාන් වැව ප්‍රතිසංස්කරණය කරලා, ප්‍රදේශයේ ජනතාවට භාර දෙනවා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නයට මිත් පිළිතුරක් දෙන්න ඕනෑ. වැව් 40ක් සංවර්ධනය කරන්න ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් මුදල් ලැබී තිබෙනවා. අපි මේ මාසයේ 25වන දා මල්වතු ඔය ජලාශයට මුල්ගල තබනවා. ඒ තුළින්, ගරු මන්ත්‍රීතුමාගේ දිස්ත්‍රික්කයේ ඉඩම් හෙක්ටෙයාර 2,000ක් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ජලය ලබා දෙනවා. ඒ වාගේම, කාලයක් තිස්සේ එතුමාගේ ඉල්ලීමක් වෙලා තිබුණු යෝධ වැව සංවර්ධනය කිරීම අපි ලබන අවුරුද්දේ සංවර්ධන වැඩකටයුතුවලට ඇතුළත් කර තිබෙනවා. යෝධ වැව සංවර්ධනය සහ ප්‍රධාන ඇළ වේල්ල සකස් කිරීමටත්, එතුමා ඉල්ලන ලද ඉතිරි වැව් ටික ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබා දෙන්නත් අප බලාපොරොත්තු වෙනවා.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

ගරු ඇමතිතුමනි, irrigation වැඩවලට අගමැතිතුමා සල්ලි දුන්නා කියලා තමයි මම දැන් කිව්වේ. Forest Department එකේ තිබෙන ප්‍රශ්නය තමයි මම මේ ඉදිරිපත් කළේ.

යෝධ වැව project එකට අගමතිතුමා රුපියල් මිලියන 300ක් දුන්නා. ඒක තමයි මම කිව්වේ. යුද්ධය තිබුණු ප්‍රදේශවල ඒ වැඩවලට ගරු අගමැතිතුමා සල්ලි දුන්නා. අපට තිබෙන ප්‍රශ්නය මේකයි. Forest Department එකේ තිබෙන problem එක නිසා අපට වැව් ටික සංවර්ධනය කර ගන්නට බැරි වෙලා තිබෙනවා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට Forest Department එකෙන් ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඔබතුමාත්, අපේ වාරිමාර්ග නිලධාරිනුත්, වන සංරක්ෂණ නිලධාරිනුත් ගෙන්වා සාකච්ඡා කරලා අපි විසඳුමක් ලබා දෙන්නම්. [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නයද? The final Supplementary Question.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ பிரதமர் அவர்களே, இன்று நான் பட்டதாரிகள் நியமனங்கள் தொடர்பாக உங்களுடைய அலுவலகத்தில் உங்களைச் சந்தித்திருந்தேன். கௌரவ பாராளுமன்ற உறுப்பினர் ராஜகருணா அவர்களும் இது சம்பந்தமாக கேள்வியைக் கேட்டிருந்தார்.

கௌரவ பிரதமர் அவர்களே, 2016ஆம் ஆண்டுக்கு முன்னர் பட்டம் பெற்றவர்களுக்குத் தாங்கள் தற்போது நியமனங்கள் வழங்கியிருந்தீர்கள். மன்னார் மாவட்டத்தில் 144 பேருக்கும் வவுனியா மாவட்டத்தில் 198 பேருக்கும் முல்லைத்தீவு மாவட்டத்தில் 126 பேருக்குமான நியமனங்களுக்குரிய படிவங்கள் மாவட்டச் செயலகங்களுக்கு வந்திருந்தன. இருந்தபோதிலும், அந்த மாவட்டத்தில்

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

ஏற்கெனவே நியமனங்களில் இருக்கின்றவர்கள் கிட்டத்தட்ட 30 - 40 பேர் அந்த நியமனங்களைப் பெற்றுக்கொள்ளவில்லை. அந்தந்த மாவட்டத்தில் இருக்கின்ற வெளிவாரிப் பட்டதாரிகள் மட்டுமன்றி, குறிப்பாக யுத்தம் காரணமாக வெளியேறி இந்தியப் பல்கலைக்கழகங்களில் பட்டம் பெற்ற உள்வாரிப் பட்டதாரிகள் பலரும் இந்த மாவட்டங்களில் இருக்கிறார்கள். ஆகவே, விடுபடுகின்ற வெற்றிடங்களுக்கு அந்தந்த மாவட்டத்தைச் சேர்ந்த வெளிவாரிப் பட்டதாரிகளையும் இந்த வெளிநாட்டு இந்திய பட்டதாரிகளையும் உள்வாங்க வேண்டு மென்று நான் உங்களிடம் நேரடியாகக் கேட்டிருந்தேன். அதற்கு நீங்கள் சம்மதித்திருந்தீர்கள். நான் இதை இந்தச் சபையினுடைய கவனத்துக்கும் கொண்டு வருகின்றேன். இதற்குரிய நடவடிக்கையைத் தாங்கள் எடுக்கவேண்டுமென்று விநயமாகக் கேட்டுக்கொள்கின்றேன்.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

මම දැන් මේ සභාවට එන විට මන්ත්‍රීතුමා ඒ කරුණු මට දැනුම් දුන්නා. ඒ ගැන මම පරීක්ෂා කරලා පියවර ගන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු අග්‍රාමාත්‍යතුමා ගෙන් අසනු ලබන ප්‍රශ්නය මෙයයි.

වැඩිවන ජීවන වියදමට සරිලන වැටුප් වැඩිවීමක් ලබා දෙන ලෙසට වැඩ කරන ජනතාව විසින් 2019 අය වැය ඉදිරිපත් කිරීමට ආසන්නයේ ආණ්ඩුවට ඉදිරිපත් කරන ලද ඉල්ලීම්වලට ප්‍රතිචාර වශයෙන් 2019 ජූලි මාසයේ 01වෙනි දා සිට රාජ්‍ය සේවකයන්ට අන්තර්කාලීනව රුපියල් 2,500ක දීමනාවක් ලබා දෙන බවට වූ යෝජනාවක් අය වැයට ඇතුළත් විය. එසේම 2019.04.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2019 අනුව සියලු රාජ්‍ය සේවකයන් සඳහා මෙම රුපියල් 2,500ක අන්තර්කාලීන දීමනාව ගෙවීමට කටයුතු කළ යුතු බව සඳහන් විය.

කෙසේ වුවද, 09/2019 චක්‍රලේඛය අනුව ජූලි මාසයේ වැටුපට මෙම මුදල එකතු කරනු ලැබ ඇත්තේ දෙපාර්තමේන්තු රාජ්‍ය සේවකයන්ට පමණි. රාජ්‍ය සේවයටම අදාළ සංස්ථා, මණ්ඩල, ව්‍යවස්ථාපිත ආයතන ඇතුළු අර්ධ රාජ්‍ය ආයතන 346ක සේවකයන්ට මෙම රුපියල් 2,500ක දීමනාව ලබා දිය යුතුව තිබුණද, ඔවුන්ට මෙතෙක් මෙම දීමනාව ලබා දීමට ආණ්ඩුව පියවර ගෙන නැත. මේ හේතුවෙන් අර්ධ රාජ්‍ය ආයතනවල සේවක සේවිකාවන්ට බරපතළ අසාධාරණයක් සිදු වී ඇති බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

ඒ අනුව පහත ගැටලුවලට අගමැතිවරයා පිළිතුරු ලබා දෙනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

1. 2019 අය වැය මඟින් යෝජනා කළ රුපියල් 2,500ක දීමනාව අර්ධ රාජ්‍ය සේවකයන්ට ලබා නොදීමට කටයුතු කර ඇත්තේ ඇයි?
2. එම දීමනාව ලබා දීමට පියවර ගනු ලබන්නේ කවදාද? එම අවස්ථාවේදී හිඟ දීමනා සමඟ එය ලබා දීමට පියවර ගනු ලබන්නේද?
3. 2019.04.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2019 අනුව සියලු රාජ්‍ය සේවකයන් සඳහා මෙම දීමනාව ලැබිය යුතුව තිබියදී අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයන් ඉන් බැහැර කරන ලද්දේ කුමන පදනමකින්ද යන්න දැන ගන්නට කැමැතියි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය සේවකයන්ගේ වැටුප් විෂමතා සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීමට ගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද විශේෂ වැටුප් කොමිසමේ නිර්දේශවලට අනුව එම වාර්තාවේ නිර්දේශ සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරන තෙක්, 2019 ජූලි මාසයේ 01වෙනි දා සිට එක් සේවකයකුට රුපියල් 2,500ක අන්තර් දීමනාවක් ගෙවීමට රජය කටයුතු කර තිබෙනවා. අංක 09/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය නිකුත් කරනු ලැබුයේ ඒ අනුවයි. රාජ්‍ය සේවයේ නිලධාරින්ට තිබෙන්නේ පොදු වැටුප් ව්‍යුහයක්. වැටුප්, දීමනා, වැටුප් වර්ධක යනාදිය සකස්වෙලා තිබෙන්නේ එම පොදු ක්‍රමවේදයට අනුවයි. වැටුප් වැඩිවීම ලබා දීමේදීත්, එම වැඩිවීම් ලබා දෙන්නේ එම පොදු ප්‍රතිපත්තියට අනුගතවයි. මීට අමතරව අර්ධ රාජ්‍ය අංශ ලෙස සැලකෙන රාජ්‍ය ව්‍යාපාර, රජයේ සංස්ථා, මණ්ඩල හා අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන සඳහා වැටුප් ව්‍යුහය සකස් වී තිබෙන්නේ ඒ ඒ ආයතනවල පවතින තනතුරුවල ස්වභාවය හා ඒ ඒ ආයතන විසින් සිදු කරන කාර්යභාරය අනුවයි. එම ආයතන පිහිටුවා ඇත්තේ යම් යම් නිශ්චිත කාර්යයන් සඳහායි. එම ආයතන අතුරින් සමහර ආයතන ඉටු කළ යුතු සුවිශේෂ කාර්යභාරය සලකා බලා, බොහෝ විට සාමාන්‍ය රජයේ සේවකයන්ට වඩා වැඩි වැටුප් ගෙවනවා. එසේම, මෙම අංශ දෙකෙහි සේවකයන් වෙත ගෙවනු ලබන විවිධ දීමනා, පාරිතෝෂික හා වෛද්‍ය පහසුකම් වැනි විවිධ පහසුකම්වල වෙනස්කම් රැසක් තිබෙනවා. මෙම කරුණු අනුව සාමාන්‍ය රජයේ සේවකයන් වෙත ලබා දෙන යම් වැටුප් වැඩිවීමක්, අර්ධ රාජ්‍ය අංශයේ සේවකයන් වෙත එලෙසින්ම ලබා දීමට හැකියාවක් නැහැ. එලෙසම, ලබා දිය හැක්කේ දැනට පවතින ක්‍රමවේදයවලට අනුව පමණයි. රජයේ සේවය විවිධ අංශ අතර පවතින වැටුප් ව්‍යුහයේ බරපතළ විෂමතාවකට ලක් නොවන අයුරින් පවත්වා ගෙන යා යුතුයි.

එමනිසා ඔබතුමාගේ යෝජනාව අධ්‍යයනය කර, ඒ සම්බන්ධයෙන් ගත හැකි පියවර පිළිබඳව ඔබතුමා දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස මුදල් ඇමතිතුමාට දැනුම් දෙන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේලා 2019 අය වැය ලේඛනයේ 150 වන කාරණයේ කියන්නේ මේ විධියටයි. "....ජනාධිපතිතුමා විසින් පත් කරන ලද විශේෂ වැටුප් කොමිසමේ වාර්තාව, ඒ පිළිබඳව පත් කළ තාක්ෂණික කමිටුවේ නිර්දේශ නිකුත් කළ පසුව ක්‍රියාත්මක කරනු ඇත." එම වාර්තාව හදා තිබෙනවා. ඒ වාර්තාවේ අදාළ කරුණු තාක්ෂණික කමිටුවක ඇගයීමෙන් පසුව තමයි ක්‍රියාත්මක කරන්නේ කියලා ඔබතුමන්ලා අය වැය ලේඛනයේ සඳහන් කර තිබෙනවා. එය ක්‍රියාත්මක වන

තෙක්, 2019 ජුලි මාසයේ 01 වැනි දා සිට රජයේ සේවකයන්ට රුපියල් 2,500ක මාසික දීමනාවක් ගෙවන බව තමයි අය වැය ලේඛනයේ සඳහන් කොට තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට පෙර මෙවැනි දීමනා ලබා දෙන සෑම අවස්ථාවකදීම වාගේ -සමහර අවස්ථාවල ඒ දීමනාව ලබා දෙන කොටම, සමහර අවස්ථාවල එම දීමනාව ලබා දී මාස කිහිපයකට පසුවත්- මේ විධියටම ප්‍රශ්න කළාට පසුව මෙම ආයතනවල සේවකයන්ටද ඒ දීමනා ලබා දී තිබෙනවා. පළමුව, වැඩි කරන අවස්ථාවේදීම ලබා දීපු අවස්ථා තිබෙනවා. ඒ වාගේම වැඩි කළාට පසුව අර්ධ රාජ්‍ය අංශවල සේවයේ නිරත සේවක-සේවිකාවන්ගේ ඉල්ලීම අනුව එම දීමනා ලබා දී තිබෙනවා.

ගරු අගමැතිතුමනි, මම ඔබතුමාට කියන්නේ මේකයි. ඔබතුමන්ලා මේ වැඩිවීම දෙන්න සැලසුම් කරන්නේ ජීවන වියදම ඉහළ යෑම හේතු කොටගෙනයි. ඒ කාරණය රාජ්‍ය සේවකයන්ට වාගේම, අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයන්ටත් බලපෑමක් ඇති කරනවා. ඒ නිසා මෙම රුපියල් 2,500 දීමනාව, අර්ධ රාජ්‍ය ආයතනවල වැඩ කරන සේවක-සේවිකාවන්ටත් ලබා දිය යුතු බව හරිම පැහැදිලියි. ඒ නිසා ඔබතුමා ඒ සඳහා කටයුතු කරන්නේද කියලා මා දැන ගන්න කැමැතියි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඇත්ත වශයෙන්ම, රාජ්‍ය සේවකයන්ට වැටුප් හා දීමනා වැඩි කරපු හැම අවස්ථාවේම, අර්ධ රාජ්‍ය සේවකයන්ටත් වැඩි කරලා නැහැ. ඒ වාගේම, රාජ්‍ය සේවයට බලපාන්නේ නැතිව අර්ධ රාජ්‍ය සේවකයන්ට හා සංස්ථාවල සේවකයන්ට විටින් විට වැටුප් හා දීමනා වැඩි කර තිබෙනවා. මම කිව්වේ, මේ ක්‍රම දෙක අනුවම අපට ක්‍රියා කරන්න බැහැ කියලායි. ඔබතුමාගේ යෝජනාව ගැන අධ්‍යයනය කර, ඒ සම්බන්ධයෙන් ගත හැකි පියවර පිළිබඳව - මොකක්ද කරන්න පුළුවන්ද කියලා - මම මුදල් අමාත්‍යතුමාගේ අවධානය යොමු කරවනවා. අර්ධ රාජ්‍ය සේවයයි, රාජ්‍ය සේවයයි අතර වෙනසක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට දෙවැනි අතුරු ප්‍රශ්නයක් තිබෙනවා ද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නයත් එයම තමයි.

ගරු අගමැතිතුමනි, ඔබතුමා දැන් ප්‍රකාශ කරනවා, මුදල් ඇමතිතුමාත් සමඟ සාකච්ඡා කොට මෙයට විසඳුමක් ලබා දෙන බව. හැබැයි, ඔබතුමන්ලා ආණ්ඩුවක් විධියට කළ යුතු වන්නේ රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කරනකොටම අර්ධ රාජ්‍ය සේවකයන් පිළිබඳව ගත යුතු ක්‍රියාමාර්ග ගැනත් ඒ මොහොතේම සැලකිල්ලට භාජන කිරීමයි. එසේ නැතිව, රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමෙන් පසුව අර්ධ රාජ්‍ය සේවකයන් පිළිබඳව නැවත සලකා බැලීමක් කිරීම නොවෙයි වඩාත් යෝග්‍ය වන්නේ. රාජ්‍ය සේවකයන්ට දීමනාවක් ලබාදීමේදීම අර්ධ රාජ්‍ය සේවකයන්ටත් එම දීමනාව ලබා දෙනවාද , ඊට සමාන දීමනාවක් ලබා දෙනවාද, ඊට වඩා වැඩි දීමනාවක් ලබා දෙනවාද කියන එක තීරණය කළ යුතුව තිබෙනවා. එම නිසා, ඔබතුමා මුදල් අමාත්‍යවරයාට මේ කරුණ යොමු කොට ඒ අධ්‍යයනයෙන් පසුව එළඹෙන වාර්තාව කවදා වෙනකොට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට තීරණයක් ගැනීමට නියමිත ද කියලා දැන ගන්නට කැමැතියි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார - பொது நிருவாக, அனர்த்த முகாமைத்துவம் மற்றும் கால்நடை வளங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration, Disaster Management and Livestock Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර අමාත්‍යතුමා ඔබතුමා ඒ ප්‍රශ්නයට පිළිතුරක් දෙනවාද?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය සේවකයන් හා අර්ධ රාජ්‍ය සේවකයන් කියන ඒ සියලුදෙනාටම අපි රුපියල් දහදාහක වැටුපක් වැඩි කළා වාගේම ඔවුන්ගේ මූලික වැටුපටත් ඒක එකතු කළා. අපේ ආණ්ඩුව යටතේ මේ රටේ හැම රජයේ සේවකයෙකුටම සියයට එකසිය හතකට වැඩි ගණනකින් වැටුප් වැඩි වී තිබෙනවා, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ. මේ රුපියල් 2,500 දීමනාවක් වශයෙන් විතරයි අපි දෙන්නේ. වැටුප් වැඩිවීම ඒ සියල්ලන්ටම සමානව ලබා දී තිබෙනවා. සමහර සංස්ථා හා අර්ධ රාජ්‍ය ආයතනවල ඒ අයට අදාළව යම් දීමනා, දිරි දීමනා හා වැටුප් වැඩි කරන අවස්ථා තිබෙනවා. නමුත් රජයේ සේවකයන්ට එම අවස්ථාව එන්නේ නැහැ. ඒකයි මේ දෙකේ තිබෙන වෙනස.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඊළඟට, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න. [බාධා කිරීමක්]

අතුරු ප්‍රශ්න දෙකක් ඔබතුමා ඇහුවා ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමනි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා පිළිතුරු දුන්නේ මම අගමැතිතුමාගෙන් අහපු ප්‍රශ්නයට. මගේ පළමුවන අතුරු ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් අගමැතිතුමා ප්‍රකාශ කළා, මුදල් අමාත්‍යවරයාට මේ කරුණ ඉදිරිපත් කොට, එතුමාගේ අවධානයට මෙම කරුණ යොමු කොට මේ පිළිබඳව පියවරක් ගන්නවා කියලා. එම පියවර කුමක්ද කියලා මම දැන ගන්නට කැමැතියි. වැටුප් වැඩිවීම හෝ වැඩි නොවීම හෝ අර්ධයක් ගෙවීම හෝ ගන්නා කවර හෝ පියවරක් කවදා වෙනකොට නිශ්චිත වශයෙන් ප්‍රකාශයට පත් කරනවාද කියා මම දැන ගන්නට කැමැතියි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මුදල් ඇමති සමඟ සාකච්ඡා කරලා මම ඒ ගැන දැනුම් දෙන්නම්. අපේ ඇමතිතුමා දැන් එහි පසුබිම ගැන මේ ගරු සභාව දැනුවත් කළා.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 1 - 19/'18 - (2), ගරු හේෂා විතානගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## ඌව පළාත් සභාවේ අක්‍රමිකතා: විගණකාධිපතිවරයාගේ වාර්තාව
### ஊவா மாகாணசபையின் முறைகேடுகள்: கணக்காய்வாளர் தலைமை அதிபதியின் அறிக்கை
### IRREGULARITIES IN UVA PROVINCIAL COUNCIL: AUDITOR-GENERAL'S REPORT

113/'18

**2. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) ඌව පළාත් සභාව තුළ සිදු වී ඇති සහ සිදු වෙමින් පවතින අක්‍රමිකතා සම්බන්ධව විගණකාධිපතිවරයාගේ අංක SIN/B/AG/KI/2017/02 හා 2017 අප්‍රේල් 20 දින ඌව පළාත් ප්‍රධාන ලේකම් වෙත යවා ඇති විමර්ශන වාර්තාව පිළිබඳව එතුමා දන්නේද?

(ආ) (i) එම වාර්තාවේ ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදේශකවරුන් පත් කිරීම සම්බන්ධව අනාවරණ කර ඇති අංක 2 (අ) (i) සිට (x) දක්වා කරුණු;

(ii) එම අනාවරණයට අදාළව අංක 2 (අ) (i) සිට (xiii) දක්වා නිරීක්ෂණය කර ඇති කරුණු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) ஊவா மாகாணசபையில் இடம்பெற்றுள்ள மற்றும் இடம்பெற்று வருகின்ற முறைகேடுகள் சம்பந்தமாக கணக்காய்வாளர் தலைமை அதிபதியால் SIN/B/AG/KI/2017/02 இலக்கமும் 2017.04.20 திகதியும் கொண்ட புலனாய்வு அறிக்கை ஒன்று ஊவா மாகாண பிரதம செயலாளருக்கு அனுப்பிவைக்கப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) அவ்வறிக்கையில் ஊவா மாகாணசபையின் பிரதான அமைச்சரின் ஆலோசகர்களை நியமித்தல் சம்பந்தமாக வெளிக்கொணரப் பட்டுள்ள, பந்தி இலக்கம் 2 (அ)(i) தொடக்கம் (x) வரையான விடயங்களை இச்சபைக்கு சமர்ப்பிப்பாரா;

(ii) மேற்படி வெளிக்கொணரல்கள் தொடர்பாக 2 (ஆ) (i) தொடக்கம் (xiii) வரை மேற்கொண்டுள்ள அவதானிப்புகளைச் சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government:

(a) Is he aware that the Auditor-General has sent to the Chief Secretary of the Uva Province the Inquiry Report No. SIN/B/AG/KI/2017/02 dated 20.04.2017 in respect of the irregularities that have taken place and are taking place in the Uva Provincial Council?

(b) Will he inform this House-

(i) whether he would present to this House the facts contained in paragraphs from 2(a)(i) to (x) of the aforesaid Report which disclose information regarding the appointment of advisers to the Chief Minister of the Uva Province; and

(ii) whether observations that have been presented in paragraphs from 2(a) (i) to (xiii) in regard to the aforesaid disclosures will be presented to this House?

(c) If not, why?

**ගරු ජේ.සී. අලවතුවල මහතා (අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல - உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. J.C. Alawathuwala - State Minister of Internal and Home Affairs, Provincial Councils and Local Government)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඔව්.

(ආ) (i) ඔව්. විගණකාධිපතිගේ අංක SIN/B/AG/KI/2017/02 හා 2017 අප්‍රේල් 20 දින ඌව පළාත් ප්‍රධාන ලේකම් වෙත යවා ඇති විමර්ශන වාර්තාවේ ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදේශකවරුන් පත් කිරීම සම්බන්ධව අනාවරණ කර ඇත.

ඊට අදාළව පාර්ලිමේන්තු ප්‍රශ්නය මඟින් විමසා ඇති අංක 2(අ) (i) සිට (x) දක්වා කරුණු ඇමුණුම් අංක 01 මඟින් දක්වා ඇත. ඇමුණුම 01 **සභාගත*** කරමි.

(ii) ඔව්. එම උපදේශකවරුන් පත් කිරීම සම්බන්ධ අනාවරණයට අදාළ විගණකාධිපතිගේ නිරීක්ෂණ වාර්තාවේ අංක 2 (අ) (i) සිට (xii) දක්වා පමණක් නිරීක්ෂණ ඉදිරිපත් කර ඇති අතර, එම නිරීක්ෂණ ඇමුණුම් අංක 02 මඟින් දක්වා ඇත. ඇමුණුම 02 **සභාගත*** කරමි.

(ඇ) අදාළ නොවේ.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් ලිපි කීපයක් හුවමාරු වෙලා තිබෙනවා. අපේ අමාත්‍යාංශය ඌව පළාත් ප්‍රධාන ලේකම්තුමාට මේ ගැන දැනුම් දීලා තිබෙනවා. ඒ වාගේම, මේ මන්ත්‍රීතුමා කියපු කාරණාව සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය වශයෙන් අපි දැනුම් දීම් කළත්, ඒ ගැන ගත හැකි වෙනත් ක්‍රියා මාර්ගයක් අපට නැහැ. නමුත්, මෙතුමා කිව්වා වාගේ නව විගණන පනත අනුව අමාත්‍ය මණ්ඩල තීරණ නොසලකා හැරීම පිළිබඳ නීත්‍යනුකූලව ක්‍රියා කිරීමට විගණකාධිපතිවරයාට බලය තිබෙනවා. ඒ නිසා එතැනින් තමයි ඒ කටයුතු ක්‍රියාත්මක වෙන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මම අහපු පළමු ප්‍රශ්නයට පිළිතුර ලැබුණේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි. මම මේ අහන්නේ මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් පළමුවන අතුරු ප්‍රශ්නයෙන් ඇහුවේ, විගණකාධිපතිවරයා ඒ තීන්දුව නොගැනීම ගැන, ආණ්ඩුවක් හැටියට ඔහුට විරුද්ධව ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව තිබෙන නීතිමය ප්‍රතිපාදන මොනවාද කියලයි.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අමාත්‍ය මණ්ඩල තීරණය උල්ලංඝනය වීම සම්බන්ධයෙන් අපි ලේකම්වරයාට දැනුම් දීලා තිබෙනවා. නමුත් රේඛීය අමාත්‍යාංශය හැටියට අපට නීතිමය ක්‍රියාමාර්ගයකට යන්න හැකියාවක් නැහැ. නමුත්, අලුත් විගණන පනත අනුව නීතිමය ක්‍රියාමාර්ග ගන්න විගණකාධිපතිතුමාට පුළුවන්. එතුමා නීතිමය ක්‍රියාමාර්ග අරගෙන නැති එක ගැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වෙනකොට හත්දෙනෙකුට වර්ෂ හතරහමාරක කාලයක සිට මුදල් ගෙවනවා; තවමත් මුදල් ගෙවනවා. මේ වෙනුවෙන් රුපියල් මිලියන 200කට එහා මුදලක් වැය කරලා තිබෙනවා. මේ අපේ රටේ ජනාධිපතිතුමා ගත්ත තීන්දුවක්. ඒ වාගේම අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරපු කාරණයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ ජනාධිපතිතුමා කිව්වා, අපට රුපියල් ලක්ෂ හතරක වැටුපක් ලැබෙනවා කියලා. මම මගේ වැටුප් විස්තරය ගත්තා. පක්ෂ විපක්ෂ හැම මන්ත්‍රීවරයෙකුටම ලක්ෂ හතරක් ලැබෙනවා කියන කාරණය එතුමා කිව්වා. ඉදිරිපත් කර තිබෙන යෝජනාවක් පිළිබඳව එතුමා සෘජු තීන්දුවක් ගත්තාය කිව්වා. ඒකට එතුමා එකඟ නැහැ කියලා කිව්වා. ඒක හොඳයි. නමුත්, ලක්ෂ හතරක වැටුපක් ලැබෙනවාය කියන එක මහ මුසාවක් කියන කාරණය කියන්න ඕනෑ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මගේ මූලික වැටුප තිබෙන්නේ, රුපියල් 54,000යි. දීමනා ටික එකතු කළත් රුපියල් ලක්ෂ හතරක් ලැබෙන්නේ නැහැ. මම කියන්න හදන්නේ,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, මේ ප්‍රශ්නයට ඒ කාරණය අදාළ නැහැ. කරුණාකරලා ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණයත් කිව්වොත් තමයි කථාව ටිකක් සුන්දර වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප ගැන බොරු කියලා අපේ ගෞරවය කෙළෙසන්න වැඩ පිළිවෙළක් කරද්දීත්, ජනාධිපතිතුමා කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා හැටියට ගත්ත තීන්දුව අභිභවා ගිහිල්ලා විශාල මුදල් කන්දරාවක් වියදම් කරන බව ඔබතුමන්ලා ජනාධිපතිවරයාට - කෙළින් තීරණ ගන්නා නායකයාට- දන්වලා, අදාළ අයට දඬුවමක් දීමට අවශ්‍ය කටයුතු කරනවාද? ආණ්ඩුකාරවරයා පත් කරන්නේ ජනාධිපතිතුමා. ප්‍රධාන ඇමතිවරයා පත් කරන්නේත් ජනාධිපතිතුමා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මේ ගැන තීන්දුවක් ගන්න ජනාධිපතිවරයාට වගකීමක් තිබෙනවාය කියලා මම හිතනවා. ඊයේ එතුමා අපට ලැබෙන වැටුප ගැන කථා කළා. නමුත්, එතුමාගේ තීන්දුව තුළ මහා විශාල මුදල් සම්භාරයක් අපේ පළාත් සභාවට අහිමි වෙලා තිබෙනවා. මේවා නැවත අය කර ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් සකස් කිරීමට සහ ජනාධිපතිවරයාගේ නියෝජිතයන් වන ඔවුන්ට දඬුවම් දීමට යම් කිසි යෝජනාවක් කිරීමේ අයිතියක්, බලයක් ඔබතුමාගේ අමාත්‍යාංශයට තිබෙනවාද?

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රේඛීය අමාත්‍යාංශය හැටියට පළාත් සභාවල කාරණා සම්බන්ධයෙන් දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව අපට සීමා සහිතව තමයි මැදිහත් වෙන්න පුළුවන් වෙන්නේ. නමුත් මේ පසුබිම් වාර්තාව කියවා බැලුවාම මෙතැන යම් කිසි අක්‍රමිකතාවක් සිදු වෙලා තිබෙනවා කියලා පැහැදිලියි. ඒ කියන්නේ, උපදේශකයන් දෙන්නෙක් පත් කර ගන්න හැකියාව තිබෙද්දී හත් දෙනෙක් පත් කරලා -පස් දෙනෙක් වැඩිපුර පත් කරලා- තිබෙනවා. ඒ ගැන අපි ලිපි මඟින් පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා දැනුවත් කරලා තිබෙනවා. නමුත් අපට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් එක්ක එතැනින් එහාට යන්න හැකියාවක් නැහැ.

නමුත්, මෙතුමා කිව්වා වාගේම නව විගණන පනත අනුව විගණකාධිපතිතුමාට පුළුවන්, මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගන්න. එතුමා එම ක්‍රියාමාර්ග අරගෙන නැති එක තමයි ප්‍රශ්නය විධියට තිබෙන්නේ. (7th Start)

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පැහැදිලි කිරීමක් කරගන්න පුළුවන්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බැහැ. මම ඔබතුමාට අවස්ථාව දුන්නා.

## යුද්ධයට පෙර උතුරු පළාතේ තිබුණු ඉන්ධන පිරවුම්හල්: අයිතිකරුවන්

## யுத்தத்துக்கு முன்னர் வட மாகாணத்திலிருந்த எரிபொருள் நிரப்பு நிலையங்கள்: உரிமையாளர்கள்

FILLING STATIONS IN NORTHERN PROVINCE PRIOR TO WAR: OWNERS

208/'18

**3. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 1983 යුදමය තත්ත්වය ආරම්භ වීමට පෙර උතුරු පළාතේ පැවති ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට (CPC) අයත් ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව හා ඒවා පිහිටා තිබූ ස්ථානවල ලිපිනයන් කවරේද;

(ii) එම පිරවුම්හල්වල අයිතිකරුවන් හා ඔවුන්ගේ ලිපිනයන් කවරේද;

(iii) ඉහත (ii) හි සඳහන් අයිතිකරුවන් අතරින් යුද්ධ කාලසීමාව තුළ ඝාතනය වීමෙන්, අතුරුදහන් වීමෙන් හෝ මියයෑමෙන් එම පිරවුම්හල්වල අයිතිය වෙනස් වූ අයිතිකරුවන් කවුරුන්ද;

(iv) ඉන් අනතුරුව, එම පිරවුම්හල්වල අයිතිය ලබාගත් පුද්ගලයන් හා ඔවුන්ගේ ලිපිනයන් කවරේද;

(v) පසු අයිතිකරුට මුල් අයිතිකරුගේ ඥාතිත්වයක් තිබේ නම්, ඒ සම්බන්ධයෙන් කරුණු සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நெடுஞ்சாலைகள், வீதி அபிவிருத்தி மற்றும் பெற்றோலிய வளங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1983 ஆம் ஆண்டு யுத்த நிலைமை ஆரம்பிப் பதற்கு முன்னர் வட மாகாணத்தில் காணப்பட்ட இலங்கை பெற்றோலிய கூட்டுத்தாபனத்துக்குச் (CPC) சொந்தமான எரிபொருள் நிரப்பு நிலையங்களின் எண்ணிக்கை மற்றும் அவை அமைக்கப்பட்டிருந்த இடங்களின் முகவரிகள் யாவை;

(ii) மேற்படி எரிபொருள் நிரப்பு நிலையங்களின் உரிமையாளர்கள் மற்றும் அவர்களின் முகவரிகள் யாவை;

(iii) மேலே (ii) இல் குறிப்பிடப்படும் உரிமையாளர் களில் யுத்த காலத்தில் கொலைசெய்யப்படுதல், காணாமற்போதல் அல்லது மரணமடைதல் காரணமாக மேற்படி நிரப்பு நிலையங்களின் உரிமை கைமாற்றப்பட்டுள்ள உரிமையாளர்கள் யாவர்;

(iv) இதற்குப் பின்னர் மேற்படி நிரப்பு நிலையங் களின் உரிமையைப் பெற்றுக்கொண்ட நபர்கள் மற்றும் அவர்களது முகவரிகள் யாவை;

(v) பின்னுரிமையாளருக்கு அதன் ஆரம்ப உரிமையாளருடன் ஏதேனும் உறவுமுறை காணப்படுமாயின், அதனைக் குறிப்பிடுவாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Highways and Road Development and Petroleum Resources Development:

(a) Will he inform this House -

(i) the number and addresses of the filling stations belonging to the Ceylon Petroleum Corporation (CPC) which were available in the Northern Province prior to the start of war in 1983;

(ii) the owners of the aforesaid filling stations and their addresses;

(iii) the new owners of the filling stations of which the ownership changed during the period of war due to the murder, abduction or death of the initial owners mentioned in (ii) above;

(iv) the persons who subsequently obtained ownership of the aforesaid filling stations and their addresses; and

(v) whether the kinship between the first owner and the second owner of the aforesaid filling stations will be specified, if such a relationship exists among the two parties?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 1983 වසරට පෙර උතුරු පළාතේ තිබුණු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව 34කි. එම පිරවුම්හල් පිහිටි ස්ථානවල ලිපිනයන් ඇමුණුම අංක 01 මඟින් දක්වා ඇත.

(ii) එම සියලු පිරවුම්හල් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු වේ. නමුත්, එම පිරවුම්හල් බෙදුම්කාරිත්වය හිමි බෙදුම්කරුවන්ගේ නම් හා පිහිටි ස්ථානවල ලිපිනය ඇමුණුම අංක 01හි දක්වා ඇත.

(iii) පිරවුම්හල්වල අයිතිය වෙනස් වී නොමැති අතර, ඉහත ඇමුණුම අංක 01හි දක්වා ඇති පිරවුම්හල් 34න් පිරවුම්හල් 13ක බෙදුම්කාරත්ව ධුර පමණක් වෙනස් වී ඇත. එසේ වෙනස් වූ පිරවුම්හල්හි බෙදුම්කාරත්ව නාම ලේඛනය ඇමුණුම අංක 02හි දක්වා ඇත.

(iv) පිරවුම්හල්වල අයිතිය වෙනස් වී නොමැත. 1983 වසරින් පසුව බෙදුම්කාරත්ව ධුර වෙනස් වූ බෙදුම්පොළවල නව බෙදුම්කරුවන්ගේ නම් හා ලිපිනය ඇමුණුම අංක 03හි දක්වා ඇත.

(v) පිරවුම්හල්වල අයිතිය වෙනස් වී නොමැත. එම බෙදුම්කාරිත්වය වෙනස් වූ පිරවුම්හල්වල

බෙදුම්කරුවන්ගේ පැරණි බෙදුම්කරු හා නව බෙදුම්කරු අතර සම්බන්ධතා පිළිබඳ තොරතුරු සංස්ථාව සතුව නොමැත. ඇමුණුම් සියල්ල **සභාගත*** කරමි.

(ආ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමා මාර්ගයෙන් මම මේ ප්‍රශ්නය මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙත යොමු කරනවා.

1983ට කලින් ඉන්ධන පිරවුම්හල් අයිතිව තිබුණු කීප දෙනෙක් යුද්ධය නිසා ඝාතනය වුණා. සමහර විට ඔවුන්ගේ දරු පවුල් විදේශගත වෙලා තිබෙනවා. මම මේ කියන සිද්ධියට අදාළවත් එවැනි සිදු වීමක් තමයි තිබෙන්නේ. එසේ ඝාතනයට ලක් වූ පුද්ගලයාගේ දියණිය ලංකාවට ඇවිල්ලා එහි අයිතිය ඉල්ලනකොට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් දිගින් දිගටම එය ප්‍රමාද කරමින් ඉන්නවා. ඒ ලේඛන නැහැ කියනවා. ඔවුන් ඒ කාරණා පිළිගන්නේ නැහැ. නමුත්, ඔවුන් වෙනත් කෙනෙකුට එහි අයිතිය ලබා දීලායි තිබෙන්නේ. මම ගරු අමාත්‍යවරයා වෙත එම පුද්ගලයා යොමු කරන්නම්. ඔවුන්ගේ වරදක් නිසා නොවෙයි එසේ සිදු වී තිබෙන්නේ. යුද්ධයට අහුවෙලා මේ රටේ ඉන්න බැරි නිසා තමයි ඔවුන් මේ රටින් ගිහිල්ලා තිබෙන්නේ. මේ රටේ යම් කිසි මුදලක් ආයෝජනය කරලා එවැනි දෙයක් පටන් ගන්න හදන කොට ඒ සඳහා අවස්ථාව දෙන්නේ නැහැ. කරුණාකර මේ ප්‍රශ්නයට සාධාරණ විසඳුමක් ලබා දෙන්න කියා මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු මන්ත්‍රීතුමනි, මෙය විශේෂිත අවස්ථාවක් නේ. මෙම ප්‍රශ්නය ඇමතිතුමාට යොමු කරලා මොකක් හෝ පරණ තොරතුරක් සොයා ගෙන සාධාරණයක් කරන්න අපට පුළුවන් වෙයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 4-416/'19-(3), ගරු ගාමිණී ලොකුගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## කන්තලේ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය: අඩුපාඩු
## கந்தளாய் உதவி காணி ஆணையாளர் அலுவலகம்: குறைபாடுகள்
## ASSISTANT LAND COMMISSIONER'S OFFICE IN KANTALAI: DEFICIENCIES

443/'19

**5. ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කන්තලේ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය හෝ එහි කොටසක් ත්‍රිකුණාමලය, නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලයට හෝ වෙන යම් ස්ථානයකට ගෙන යෑමේ සැලැස්මක් තිබේද;

(ii) නොඑසේ නම්, එහි දැනට පවතින අඩුපාඩු සපුරා දීමට පියවර ගන්නේද;

(iii) කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සියලු ඉඩම් මධ්‍යම රජයට අයත් ඒවා වන බැවින් මෙම කාර්යාලය තවදුරටත් වැඩිදියුණු නොකරන්නේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கந்தளாய் உதவி காணி ஆணையாளர் அலுவலகத்தை அல்லது அதன் ஒரு பகுதியை திருகோணமலை பிரதி காணி ஆணையாளர் அலுவலகத்திற்கு அல்லது வேறு ஓர் இடத்திற்கு கொண்டு செல்லும் திட்டமொன்று உள்ளதா என்பதையும்;

(ii) இன்றேல், அங்குள்ள குறைபாடுகளை நிவர்த்தி செய்ய நடவடிக்கை எடுக்கப்படுமா என்ப தையும்;

(iii) கந்தளாய் பிரதேச செயலாளர் பிரிவிலுள்ள சகல காணிகளும் மத்திய அரசாங்கத்திற்குச் சொந்த மானவை என்பதால், இந்த அலுவலகம் தொடர்ந்தும் மேம்படுத்தப்படாமைக்கான காரணம் யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Lands and Parliamentary Reforms:

(a) Will he inform this House-

(i) whether there is a plan to shift Kantalai Assistant Land Commissioner's Office or a part of it to Trincomalee Deputy Land Commissioner's Office or some other place;

(ii) if not so, whether measures will be taken to remedy the existing deficiencies in aforesaid office; and

(iii) as to why aforesaid office is not improved further, since all the lands under the purview of the Kantalai Divisional Secretary's Division are State lands?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) එවැනි සැලැස්මක් නැත.

(ii) මානව හා භෞතික සම්පත්වල අඩු පාඩු සපුරා දීමට පියවර ගනිමින් පවතී.

(iii) වැඩි දියුණු කිරීමට පියවර ගෙන ඇත.

(ආ) අදාළ නොවේ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි.

ගරු ඇමතිතුමනි, මෙය ඔබතුමාටත් කරන්න පුළුවන් වැඩක්. 1953 කන්තලේ මැතිවරණ කොට්ඨාසයේත්, 1954 සේරුවිල මැතිවරණ කොට්ඨාසයේත් මහාමාන්‍ය ඩී.එස් සේනානායක මහතා විසින් ඇති කළ ගොවි ජනපදවල පදිංචි කරවූ ගොවි ජනතාවගේ ඉඩම්වලට බඳු බලපත්‍ර ලබා දීමට මෑතකදී කටයුතු කරලා තිබුණා. මා විසින් කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට කරුණු ඉදිරිපත් කිරීමෙන් පසුව ඉඩම් ඇමතිතුමා වශයෙන් ඔබතුමා ඒ වාර්තාව පදනම් කරගෙන ඒ අයට ඔප්පු ලබා දීමට පොරොන්දු වුණා. ඒ වාගේම, 1954 ජනතාව පදිංචි කරවපු සේරුවිල කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් ගණනාවක්ම 1982 වන විට වනජීවී දෙපාර්තමේන්තුවේ රක්ෂිතවලට ඇතුළත් කරලා ගැසට් නිකුත් කරලා තිබෙනවා. ඒවා නිදහස් කර සේරුවිල ජනතාවට ඒ ඉඩම්වලට ඔප්පු ලබා දීමට ඉඩම් ඇමතිතුමා පොරොන්දු වුණා. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා සේරුවිල සහ කන්තලේ ගොවි ජනපදවල ජනතාවට ඔප්පු ලබා දීමට කටයුතු කරන්නේ කවදාද කියලා මා දැන ගන්න කැමතියි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා මේ කාරණය ගැන බොහොම උනන්දුවක් දක්වන මන්ත්‍රීවරයෙක්. ඔබතුමා අපේ උපදේශක කාරක සභාවටත් මේ කරුණ යොමු කළා. ඊට පසුව ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති කමිටුවකදී කන්තලේ ඉඩම් ගැන සමීක්ෂණයක් කරන්න කියලා උපදෙස් දුන්නා. ඒ අනුව ජූලි මාසයේ 2, 3, 4 කියන දවස් තුනේදී අපේ ඉඩම් කොමසාරිස් ජනරාල් කාර්යාලයෙන් විශේෂ කණ්ඩායමක් යොදවලා ඒ සමීක්ෂණ කටයුතු කරලා තිබෙනවා. එම වාර්තා දැන් ලැබී තිබෙනවා. ඒ අනුව, පනත ප්‍රකාරව කඩිනමින් කටයුතු කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. ගරු ඇමතිතුමනි, මෙය ඔබතුමාට අදාළ වෙන්නත් පුළුවන්, නොවෙන්නත් පුළුවන්. ඔබතුමා මේ ප්‍රශ්නයට ඇහුම්කන් දුන්නොත් හොඳයි. ගරු අගමැතිතුමා අපේ වන්නි දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමාට ලබා දුන් පිළිතුරටත් මේ කාරණය අදාළයි. ඔබතුමාට මේ කාරණය අදාළ නැත්නම් ඔබතුමාට පුළුවන් පොලිස්පති ලවා FCID එකට නැත්නම් CID එකට යොමු කරලා මේ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න. මහා පරිසර විනාශයක් පිළිබඳවයි මා ඔබතුමාට මේ කියන්න යන්නේ.

කන්තලේ, මඩකලපුව මාර්ගයේ සිත්තාරු මහවැලි පාලමේ සිට මීටර් 500ක් විතර ගඟේ ඉහළ, තුම්මෝදර කියන ස්ථානයේ ප්‍රධාන අලි මංකඩක් අහුරා භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ, GSMB Technical Services (Pvt.) Limited විසින් EIA අනුමැතියවත් නැතිව නීති විරෝධී වැලි ගොඩ දැමීමේ කටයුත්තක් ඊයේ දින සිට ආරම්භ කර තිබෙනවා.

මෙම අනවසර වැලි ගොඩ දැමීම කරන්නේ සූරියපුර, සමඟිපුර, සමනල පාලම, විල්ලුවේ සිට කින්නියා දක්වා ගම්මානවලට ගංවතුරින් වන හානිය වළක්වා ගැනීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් සාදා තිබෙන ගංවතුර ආරක්ෂණ වේල්ල අබලන්ව ඇති බව එම ගම්මානවල ගොවි ජනතාව වාරිමාර්ග දෙපාර්තමේන්තුවට හා මහවැලි අධිකාරියට දැනුම් දීම නිසායි.

නමුත් කළ යුත්තේ, වැලි ගොඩ දැමීම වෙනුවට ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් මුදල් යොදවා මෙම ගම්මානවල ජීවත් වන පවුල් ගැන සිතා වාරිමාර්ග අමාත්‍යාංශය හෝ, මහවැලි අමාත්‍යාංශය, සිරිසර පිවිසුම වැඩසටහනින් මඟින් මුදල් වෙන් කරගෙන, යුද හමුදාවේ තිබෙන යන්ත්‍ර සූත්‍ර භාවිත කර හෝ මෙම වේල්ල සාදා ජන ජීවිතය හා වගා බිම් බේරා ගැනීමයි.

නමුත් එසේ නොකර, මෙතැන තිබෙනවාය කියන 165,000ක වැලි කියුබ් තොගයට තිබෙන කෑදරකම නිසා, භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ මැනුම්වලට හා සමීක්ෂණයට අනුව, 18,000කට වඩා අඩු වැලි කියුබ් ප්‍රමාණයක් මෙතැනින් ගන්නට හැකි බව සඳහන් වාර්තාව උපයෝගී කරගෙන, මුළු ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයට පානීය ජලය සපයන සිත්තාරු පාලම අසල ස්ථානයේ තිබෙන වැලිත් නීති විරෝධී ලෙස ගැනීමට කටයුතු කරනවා. භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ අසේල ඉද්දවෙල කියන සභාපතිවරයාගේ වුවමනාව අනුව, මුදල් ලබා ගැනීමේ චේතනාවෙන්ම නීති විරෝධී ලෙස මේ කටයුත්ත කෙරෙනවා. ඔහු අමාත්‍යාංශයේ සියලුදෙනාගේ සහයෝගය ඇතිව රටේ පවතින නීතියට පිටින් කරගෙන යන මේ කටයුත්ත නවතා දමන්න ඔබතුමාට හැකියාවක් තිබෙනවාද කියලා මා අහනවා.

මා පෙර කියූ පරිදි, අලි මංකඩක් සම්පූර්ණයෙන් අහුරා, EIA වාර්තාවක් අරගන්නේ නැතිවයි මේ දේ කරගෙන යන්නේ. ඉඩම් ඇමතිතුමා හැටියට ඔබතුමාටත් අයිතියක් තිබෙනවා, රටේ මේ සෑම ඉඩමක් පිළිබඳවම. කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා හැටියට ගරු අගමැතිතුමා ප්‍රකාශ කළා වනජීවී කලාපවල කිසිම ක්‍රියාකාරකමක් කරන්න දෙන්නේ නැහැ කියලා. මේ වැලි නිධිය ගත්තොත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ලක්ෂ තුනකට වැඩි ජනතාවකට -අපේ සම්පන්දන් මන්ත්‍රීතුමා ඇතුළු සියලුදෙනාටම- පානීය ජලය පිළිබඳ ,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙමඟින් බරපතළ පරිසර හානියක්. පරිසර අමාත්‍යාංශයේම, භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ සභාපතිවරයාගේ සෘජු මැදිහත් වීම නිසා සිදු වන මෙම කටයුත්ත වහාම නතර කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක පරිසර අමාත්‍යාංශයට බලපාන කාරණයක්. අපි එම ප්‍රශ්නය පරිසර රාජ්‍ය අමාත්‍ය අජිත් මාන්නප්පෙරුම මැතිතුමාට යොමු කරනවා.

ගරු මන්ත්‍රීතුමා කලින් අහපු ප්‍රශ්නයට මම කෙටියෙන් පිළිතුරක් දෙන්නම්. මෙම සමීක්ෂණයට අනුව අපි ඉඩම් ඔප්පු ලබා දීම කඩිනමින් කරනවා. විශේෂයෙන්ම ජනපද නිලධාරින්ගේ හිඟයකුත් තිබුණා. ඊයේ-පෙරේදා එම තනතුර සඳහා 35දෙනෙක් බඳවා ගත්තා. පුරප්පාඩු 95ක් තිබෙනවා. ඉතිරි පුරප්පාඩුවලටත් අපි ඉදිරියේ දී බඳවා ගන්නවා. කොහොමත් මේ කාර්යාලයට වැඩිපුර පිරිසක් අනුයුක්ත කරලා හෝ අපි ඔබතුමාගේ ඉල්ලීම ඉෂ්ට කරනවා.

## කාන්තා උපාධිධාරි අභ්‍යාසලාභින්: ප්‍රසූත නිවාඩු
## பெண் பட்டதாரி பயிலுநர்: பிரசவ லீவு
## LADY GRADUATE TRAINEES: MATERNITY LEAVE

474/'19

**6. ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ආයතන සංග්‍රහයේ 18:2:1 උප වගන්තියට අනුව රාජ්‍ය සේවයේ නියුතු නිලධාරිනියකට සෑම සජීවී දරු උපතක් සඳහාම රජයේ වැඩ කරන දින 84ක සම්පූර්ණ වැටුප් සහිත නිවාඩුවක් හිමි විය යුතු බවත්;

(ii) ආයතන සංග්‍රහයේ 18:3:1 උප වගන්තියට අනුව දරුවා රැකබලා ගැනීම පිණිස දින 84ක අඩ වැටුප් සහිත නිවාඩුවක් හිමිවිය යුතු බවත්;

(iii) ආයතන සංග්‍රහයේ 18:4:1 උප වගන්තියට අනුව අවශ්‍ය වන්නේ නම්, තවත් දින 84ක වැටුප් රහිත නිවාඩුවක් ලබාදිය හැකි බවත්;

(iv) ඉහත (i) යටතේ නිවාඩු ගණන් බැලීමේදී නිවාඩු කාලය තුළ ඇති සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු ඇතුළත් නොකළ යුතු බවත්; එතුමා දන්නේද?

(ආ) (i) එසේ වුවද, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලද උපාධිධාරි පුහුණු වැඩසටහන යටතේ බඳවාගත් නිලධාරිනියන්ට ලබාදී ඇති පත්වීම් ලිපිය අනුව ඔවුන්ට ලබාදෙනු ලබන්නේ සති 06ක ප්‍රසූත නිවාඩුවක් පමණක් බව පිළිගන්නේද;

(ii) මෙම නිලධාරිනියන්ට ආයතන සංග්‍රහය අනුව හිමි විය යුතු ප්‍රසූත නිවාඩු ලබාදීමට අවශ්‍ය පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, அனர்த்த முகாமைத்துவ மற்றும் கால்நடை வளங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தாபனக்கோவையின் 18:2:1 உப பிரிவிற்கமைவாக அரச சேவையில் ஈடுபட்டுள்ள பெண் உத்தியோகத்தர் ஒருவருக்கு குழந்தை உயிருடன் பிறக்கும் ஒவ்வொரு பிரசவத்திற்கும் முழுச் சம்பளத்துடன் கூடியதாக அரசாங்கத்தின் 84 வேலை நாட்களை லீவு நாட்களாக பெற்றுக் கொள்வதற்கு உரித்துள்ளது என்பதையும்;

(ii) தாபனக் கோவையின் 18:3:1 உப பிரிவிற்கு அமைவாக பிள்ளையை பராமரிப்பதற்காக 84 நாட்கள் அரைச் சம்பளத்துடன் கூடிய லீவு நாட்கள் உரித்தாக வேண்டும் என்பதையும்;

(iii) தாபனக் கோவையின் 18:4:1 உப பிரிவிற்கு அமைவாக தேவையாயின் மேலும் 84 நாட்கள் சம்பளமற்ற லீவினை பெற்றுக்கொள்ள முடியும் என்பதையும்;

(iv) மேற்படி (i) இன் கீழ் லீவு கணிப்பிடப்படும் போது லீவு நாட்களுக்குரிய சனிக்கிழமை, ஞாயிற்றுக்கிழமை, மற்றும் அரச லீவு நாட்கள் உள்ளடக்கப்பட கூடாது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) ஆயினும், தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சினால் நடைமுறைப்படுத்தப்பட்டுள்ள பட்டதாரி பயிற்சி நிகழ்ச்சித் திட்டத்தின் கீழ் ஆட்சேர்ப்பு செய்யப் பட்ட பெண் உத்தியோகத்தர்களுக்கு வழங்கப்பட்டுள்ள நியமனக் கடிதத்தின் படி இவர்களுக்கு ஆறு கிழமை பிரசவ லீவு மாத்திரம் கிடைக்கின்றது என்பதை அவர் ஏற்றுக் கொள்வாரா என்பதையும்;

(ii) இந்த உத்தியோகத்தர்களுக்கு தாபனக்கோவைக்கு ஏற்ப கிடைக்கவேண்டிய பிரசவ லீவினை வழங்குவதற்கு தேவையான நடவடிக்கையை எடுப்பாரா என்பதையும்;

(iii) ஆமெனில், அத் தேதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Disaster Management and Livestock Development:

(a) Whether he is aware that-

(i) a lady officer of Public Service is entitled to 84 working days of leave with salary for each live childbirth in terms of the subsection 18:2:1 of the Establishments Code;

(ii) the half pay leave of 84 days are entitled in terms of the subsection 18:3:1 of the Establishments Code to look after the baby;

(iii) no-pay leave of another 84 days can be granted in terms of the subsection 18:4:1 of the Establishments Code, if necessary; and

(iv) Saturdays, Sundays and public holidays that are falling within such period should not be counted at the time that the leave are counted as per aforesaid (i) ?

(b) Will he inform this House-

(i) whether he accepts, however only six weeks of maternity leave has been allowed as per the appointment letter of the graduates who were recruited under the Graduate Training Programme of the Ministry of the National Policies and Economic Affairs; and

(ii) whether measures will be taken to grant the rightful maternity leave that aforesaid officers are entitled to as per the Establishments Code; and if so,

(iii) from what date?

(c) If not why?

**ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්.

(iv) ඔව්.

(ආ) (i) ඔව්. ඔවුන්ගේ පත්වීම් ලිපිය අනුව ලබාදෙන සති 6ක නිවාඩු කාල සීමාවෙන් ඔබ්බට ලබා ගන්නා නිවාඩු සඳහා එක් දිනක නිවාඩුවට මාසික දීමනාවෙන් 1/30 බැගින් අඩු කරනු ලැබේ.

(ii) උපාධිධාරී අභ්‍යාසලාභී නිලධාරිනියන්ගේ ප්‍රසූත නිවාඩු සම්බන්ධයෙන් ඔවුන්ගේ පත්වීම් ලිපියෙහි සඳහන් විධිවිධානවලට පරිබාහිරව ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව නිවාඩු ලබා දීමේ හැකියාවක් නොමැත. කෙසේ වෙතත් ඇතැම් අමාත්‍ය මණ්ඩල තීරණ මත බඳවා ගත් උපාධිධාරී අභ්‍යාසලාභී නිලධාරිනියන්ට ඔවුන්ගේ පත්වීම් ලිපියෙහි සඳහන් ප්‍රසූත නිවාඩුවලින් පරිබාහිරව යම් යම් සහන ලබා දෙමින් අමාත්‍ය මණ්ඩල තීරණ අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ නිකුත් කර ඇත.

උදාහරණ : 2013.02.14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2013.

මම එම චක්‍රලේඛයේ කොටසක් කියවන්නම්.

I. මාස 09ක පුහුණු කාලයක් සපුරා ඇති උපාධිධාරී අභ්‍යාසලාභීන්ට මසකට අනියම් නිවාඩු 02ක් හිමිවනවා. ඒක සාමාන්‍ය එකක්.

II. මාස 09ක පුහුණු කාලයක් සපුරා ඇති කාන්තා උපාධිධාරී අභ්‍යාසලාභීන්ට දින 84ක සම්පූර්ණ වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබාදීම.

(iii) අදාළ නොවේ.

(ඇ) (ආ) (ii) හි පිළිතුර අදාළ වේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දැනීමේ හැටියට 2012 ඉඳලාම බඳවා ගත් අභ්‍යාසලාභී උපාධිධාරිනියන්ට මේ ප්‍රශ්නය තිබෙනවා. ප්‍රශ්නය පැහැදිලියි. අභ්‍යාසලාභීන් යම්කිසි කාලයක් විශේෂ කොන්දේසිවලට යටත්ව වැඩ කරන්න ඕනෑය කියන එක අපි පිළිගන්නවා. නමුත් වයස අවුරුදු 24න් උපාධිය අවසන් කළත්, අපේ රටේ උපාධිධාරීන්ට රැකියා ලැබෙනකොට වයස අවුරුදු 30, 35 හෝ 40ක් පමණ වෙනවා. ඒ නිසා තමයි ප්‍රසූත නිවාඩු ප්‍රශ්නය බලපාන්නේ. ඔබතුමා කියපු විධියට මීට අදාළව 04/2013 චක්‍රලේඛය තිබෙනවා නම්, ඔබතුමා සියලු අභ්‍යාසලාභී උපාධිධාරිනියන්ට අනෙකුත් රජයේ නිලධාරිනියන්ට ලැබෙන විධියටම ප්‍රසූත නිවාඩු ලබා දීමට කටයුතු කරනවාද? මොකද, මාතෘභාවයට උපාධියක් තිබෙනවාද, නැද්ද කියන දේ අදාළ වෙන්නේ නැහැ නේ. පොදුවේ තිබෙනවා ප්‍රසූත නිවාඩු දින 84ක්. නමුත් මේ අයට හම්බ වෙන්නේ දින 42යි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

දින 84යි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඒ පොදුවේ ගත්තාම දැනට තිබෙන තත්ත්වයනේ. ඔබතුමා කිව්වේ විශේෂ චක්‍රලේඛයක් ගැන නේ. මගේ ප්‍රශ්නය මේකයි. ඔබතුමා දැන් කියපු 04/2013 චක්‍රලේඛය අනුව සමස්ත අභ්‍යාසලාභී උපාධිධාරිනියන්ට රජයේ අනෙකුත් නිලධාරිනියන්ට ලැබෙන විධියටම ප්‍රසූත නිවාඩු ලබා දෙන්න ඔබතුමා කටයුතු කරනවාද?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

කිසි ප්‍රශ්නයක් නැහැ. එම චක්‍රලේඛය හැමෝටම අදාළයි. එම චක්‍රලේඛය අනුව අපි ක්‍රියා කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු ඇමතිතුමනි, මම අද උදේත් මේ පිළිබඳව අදාළ වෘත්තීය සමිතිවලින් විමසුවා. නමුත්, අභ්‍යාසලාභී උපාධිධාරීන්ට රාජ්‍ය සේවයේ නියුතු අනෙකුත් නිලධාරීන්ට ලැබෙන ප්‍රසූති නිවාඩු ලැබෙන්නේ නැහැ. ඒක බලාත්මක කරන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු අග්‍රාමාත්‍යතුමාට ප්‍රශ්නයක් යොමු කළා උපාධිධාරී පත්වීම් පිළිබඳව. නමුත්, වෙනත් මන්ත්‍රීවරයෙකු එම ප්‍රශ්නයම අසා තිබුණු නිසා මට එම අවස්ථාව නැති වුණා. ගරු ඇමතිතුමනි, ඒකාබද්ධ රැකියා විරහිත උපාධිධාරී සංගමයේ නිලධාරීන් ඔබතුමා මුණ ගැසී තිබුණා. ගරු අගමැතිතුමා දැන් කිව්වා, 5,000කට රැකියා ලබා දුන්නාම භාර ගත්තේ 3,200යි, 1,800ක් ආවේ නැහැ කියලා. ගරු ඇමතිතුමනි, ඒ අනුව සියයට 40ක් විතර රැකියා භාර ගන්න ඇවිත් නැහැ. ඔබතුමන්ලා 16,800කට රැකියා දුන්නා. ඒකෙන් සියයට 30ක් කිව්වොත්, 5,000ක් වනවා. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, අභ්‍යන්තර සහ බාහිර කියලා අභ්‍යාසලාභී උපාධිධාරීන් වර්ග කරන ප්‍රතිපත්තියක් අනුගමනය කරන්න එපා කියලා.

ගරු ඇමතිතුමනි, මේ අගෝස්තු 31 වනකොට ඔබතුමාට දැන ගන්න පුළුවන් පත්වීම් භාර නොගත්තේ කවුද කියලා. අන්න ඒ ඉතිරි පුරප්පාඩු ප්‍රමාණය බාහිර උපාධිධාරීන්ට ලබා දෙන්න කටයුතු කරනවාද කියලා දැන ගන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, රැකියා විරහිත උපාධිධාරීන් සියලුදෙනාටම රැකියා දෙන්න ඕනෑ බව ඇත්ත. නමුත්, රැකියා දෙන්න වෙන්නේ කොටස් වශයෙන් නේ. අන්න ඒ රැකියා ලබා දීමේ දී මේ උපාධිධාරීන්ට වද දෙන්නේ නැතුව අභ්‍යන්තර සහ බාහිර වශයෙන් 50ට 50 වශයෙන්

-අභ්‍යන්තරව 50ක් සහ බාහිරව 50ක් -හෝ වෙනත් යම් කිසි ප්‍රතිශතයකින් ලබා දෙන නිශ්චිත ක්‍රමවේදයක් හදනවාද?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

බාහිර උපාධිධාරින්ටත් ඒ අවස්ථාව දෙන්න කියලා අපිත් ඇමතිවරු විධියට කැබිනට් මණ්ඩලයේ දී යෝජනා කර තිබෙනවා. මම හිතන විධියට ඉදිරියේ දී බාහිර අයටත් ඒ අවස්ථාව ලබා දෙන්න අපට පුළුවන් වෙයි . ඉදිරියේ දී අපට යම් ක්‍රමවේදයක් හදන්න වෙයි, උපාධිධාරින්ට රැකියා ලබා දෙන්නේ කොහොමද කියලා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

රාජ්‍ය පරිපාලන විෂයය භාර ඇමතිවරයා විධියට ඔබතුමාට වග කීමක් තිබෙනවා නේ, ක්‍රමවේදයක් යෝජනා කරන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

මම ඒ යෝජනා කළා.

## කාලගුණ විද්‍යා දෙපාර්තුමේන්තුව නවීකරණය: නව තාක්ෂණික උපකරණ

## வளிமண்டலவியல் திணைக்களத்தை நவீனமயமாக்கல்: நவீன தொழிநுட்பக் கருவிகள்

## MODERNIZATION OF DEPARTMENT OF METEOROLOGY: NEW TECHNICAL EQUIPMENT

519/'19

**7. ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සතු නොදියුණු තාක්ෂණික උපකරණ මඟින් නිවැරදි කාලගුණික අනාවැකි ලබා ගැනීමේ ගැටලුවක් පවතින බව දන්නේද;

(ii) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට මානව සම්පත් ඌනතාවක් පවතින්නේද;

(iii) එසේ නම්, ඒ පිළිබඳ විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) කාලගුණ විද්‍යා දෙපාර්තුමේන්තුවට නවීන තාක්ෂණික උපකරණ ලබා දීමට සැලසුම් කර තිබේ නම්, එම උපකරණ කවරේද;

(ii) එම නවීන උපකරණ භාවිත කර සිදු කරනු ලබන කාර්යයන් කවරේද;

(iii) එම උපකරණ සඳහා වැය වන මුදල කවරේද;

(iv) එම නවීන උපකරණ මිලදී ගැනීමේ ක්‍රමවේදය කවරේද;

(v) නවීන තාක්ෂණික උපකරණ ලබා දෙන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, அனர்த்த முகாமைத்துவ மற்றும் கால்நடை வளங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வளிமண்டலவியல் திணைக்களத்துக்கு உரித்தான மேம்படுத்தப்படாத தொழிநுட்ப கருவி மூலம் துல்லியமான வானிலைத் தரவுகளைப் பெற்றுக்கொள்வது சிக்கலாக அமைந்துள்ளது என்பதை அறிவாரா;

(ii) வளிமண்டலவியல் திணைக்களத்தில் மனித வளப் பற்றாக்குறை காணப்படுகின்றதா;

(iii) ஆமெனில், அது பற்றிய விபரங்களை முன்வைப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) வளிமண்டலவியல் திணைக்களத்துக்கு நவீன தொழிநுட்பக் கருவிகளை வழங்குவதற்கு திட்டமிடப்பட்டிருப்பின், அக்கருவிகள் யாவை;

(ii) மேற்படி நவீன கருவிகளைப் பயன்படுத்தி மேற்கொள்ளப்படும் பணிகள் யாவை;

(iii) மேற்படி கருவிகளுக்காக செலவாகும் பணத் தொகை யாது;

(iv) மேற்படி நவீன கருவிகள் கொள்வனவு செய்யப்படும் முறையியல் யாது;

(v) நவீன தொழில்நுட்பக் கருவிகளை வழங்கும் திகதி யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Disaster Management and Livestock Development:

(a) Will he inform this House-

(i) whether he is aware of the fact that making accurate predictions about the weather has become an issue to the Department of Meteorology due to technical equipment which are not sufficiently advanced;

(ii) whether the Department of Meteorology suffers a dearth of human resources; and

(iii) if so, the details pertaining to this issue?

(b) Will he also inform this House-

(i) if plans have been formulated to provide new equipment for the Department of Meteorology, the names of such modern technical equipment;

(ii) the purposes for which the aforementioned equipment shall be used;

(iii) the amount of money that will be spent to purchase the aforesaid equipment;

(iv) the methodology adopted to purchase the aforementioned modern technical equipment; and

(v) the date on which modern technical equipment will be provided to the Department?

(c) If not, why?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

(අ) (i) තාක්ෂණිකව දියුණු උපකරණ මඟින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සවිබල ගැන්විය යුතුය. ඒ සඳහා අංක අමප17/2946/715/037 හා 2018.01.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කරමින් සිටී. අමාත්‍ය මණ්ඩල තීරණය ඇමුණුම 03හි දක්වා ඇත.

(ii) මානව සම්පත් ඌනතාවක් ඇත.

(iii) එය කාලාන්තරයක් තිස්සේ ක්‍රමයෙන් උද්ගත වී ඇති තත්ත්වයකි. වර්තමානයට සහ නවීන තත්ත්වයට ගැළපෙන ලෙස කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි සේවක මණ්ඩලය නැවත සමාලෝචනය කර සකස් කිරීමට උපදෙස් ලබා දී ඇත. මේ වන විට එම කටයුතු සිදු කරමින් පවතින අතර අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු ඇමුණුම 04 මඟින් දැක්වේ. ඇමුණුම් **සභාගත*** කරමි.

(ආ) (i) දැනට JICA ආධාර යටතේ ඩොප්ලර් රේඩාර් යන්ත්‍ර 02ක් ලබා ගැනීමේ කටයුතු ක්‍රමානුකූලව සිදු කරමින් පවතී. අංක අමප17/2946/715/037 හා 2018.01.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දෙපාර්තමේන්තුව නවීකරණයේදී මිලදී ගනු ලබන සෙසු උපකරණ තීරණය කරනු ලැබේ.

(ii) ඩොප්ලර් රේඩාර් භාවිත කර, කෙටි කාලීනව වර්ෂාපතනය ලැබීම්, බලාපොරොත්තු වන වර්ෂාපතනය ආසන්න ලෙස මිලි මීටර්වලින් ලබා දීම, අකුණු අනතුරු පිළිබඳ පූර්ව දැනුවත් කිරීම, ටොනාඩෝ තත්ත්ව පිළිබඳව පූර්ව දැනුවත් කිරීම් සිදු කිරීමට බලාපොරොත්තු වේ.

(iii) ශ්‍රී ලංකා රජයේ මුදල් ප්‍රතිපාදන යටතේ - රුපියල් 486,650,000.00

ජපන් රජයේ ආධාර ලෙස දැනටමත් ලබා දී ඇති මුදල් ප්‍රතිපාදන- ජපන් යෙන් 2,503,000,000.00

මෙම යන්ත්‍ර 02 ජපන් රජය මඟින් මිලදී ගෙන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වෙත භාරදෙනු ලබන බැවින්, ඒ සඳහා වැය වන මුදල නිශ්චිතව කිව නොහැකියි.

ඒ නිසා ඒ මුදල් ප්‍රමාණය කොපමණද කියන එක ඉදිරියේදී දන්වන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

(iv) ජපානයේදී සිදු කරනු ලබන විවෘත ටෙන්ඩර් කැඳවීමක් මඟින් ඩොප්ලර් රේඩාර් යන්ත්‍ර 02 මිලට ගන්නා සමාගම තීරණය කරනු ලැබේ.

මෙය ණයක් නොවෙයි, ජපන් ආධාරයක්. ඒ නිසායි එහෙම කරන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

(v) 2024 වසර තුළදී මෙය භාවිතයට ගැනීමට මුලින් තීරණය කර තිබුණා. එහෙත් කල්ගත වී ඇති නිසා, ජපානයේ එම කණ්ඩායම සමඟ සාකච්ඡා කර ඉතා ඉක්මනින් මේවා භාවිතයට ගන්න කටයුතු කරනවා.

(ඇ) පැන නොනඟී.

---

*** පුස්තකාලයේ තබා ඇත.**

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මෙය දීර්ඝ කාලයක් තිස්සේ පවතින ගැටලුවක්. මේ උපකරණ ගන්න දැනට ජපානයෙන් ආධාරයකුත් ලැබිලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ මේ පාලන කාලය තුළ විටින් විට තුන් හතර දෙනෙකු මෙම ඇමති ධුරයේ කටයුතු කර තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ විෂය පථයටත්, "රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන" කියන විෂයයන් ගැට ගහලා තිබෙනවා.

ඊයේ-පෙරේදා මීගමුව හා ඒ අවට ප්‍රදේශවලට සුනාමි අවදානමක් තිබුණා. තොරතුරු තාක්ෂණය ඔස්සේ, එහෙම නැත්නම් විදේශීය මාධ්‍යවලින් එවැනි තොරතුරු එනතෙක් අපේ රටේ මෙහෙම පද්ධතියක් ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ ප්‍රවෘත්ති අරගෙන ඇවිල්ලා තමයි පොලීසිය ගමේ අයට කිව්වේ, බඩුමුට්ටු ලෑස්ති කරගෙන පොඩ්ඩක් මුහුදු සීමාවෙන් ඉවතට යන්න කියලා.

මෙවැනි අවදානම් තත්ත්ව නිතර නිතර ඇති වුවත්, එම තොරතුරු දැනුම් දීම සඳහා ප්‍රමුඛතාව ලබා දී වැඩ කටයුතු කරන බවක් ඔබතුමාගේ පිළිතුර අනුව අපට පෙනෙන්න නැහැ. ඒ ගැන ඔබතුමාගේ අදහස මොකක්ද ගරු ඇමතිතුමනි?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කටයුත්ත කාලාන්තරයක් තිස්සේ දිගින් දිගටම ප්‍රමාද වුණු බව මාත් පිළිගන්නවා. ඒ කටයුතු කඩිනම් කරන්න අවශ්‍ය පියවර අපි දැන් අරගෙන තිබෙනවා.

ජපන් ආධාරවලට අමතරව, ලෝක බැංකු ණය හරහා CRIP එක යටතේත් අප මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙනවා. ඒ කටයුත්තත් අපි දැන් කඩිනම් කරගෙන යනවා. කාලගුණ අනාවැකි -සුනාමි තත්ත්ව, සුළි සුළං- සම්බන්ධව අපටත් තොරතුරු ලැබෙනවා. ජාත්‍යන්තර වශයෙන් තිබෙන ආයතනවල තොරතුරුත් එකතු කරගෙන, අපේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් තමයි ඒවා පොලීසියට දන්වන්නේ.

ඒ කටයුතු අපි හරියාකාරව කරගෙන යනවා. ඇමතිවරුන් වෙනස් වුණාට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් කරන වැඩ ඇනහිටින්නේ නැහැ.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

ගරු ඇමතිතුමනි, යම් යම් ව්‍යාපෘතිවලට රජයෙන් මුදල් වෙන් වෙනවා. මේ ආපදා වෙනුවෙන් ගෙවීම් කිරීමේදී, ඒ කටයුතු හරියට සිද්ධ වෙලා නැහැ. උදාහරණයක් වශයෙන්, සාලාව අවි ගබඩාව පිපිරීම, මීතොටමුල්ල කුණු කන්ද නාය යෑම, ගංවතුර, නාය යෑම් වෙනුවෙන් ගෙවීම් කිරීමේදී සමහර තැන්වල අතපසුවීම් සිද්ධවෙලා තිබෙනවා.

තවත් උදාහරණයක් මා කියන්නම්. මා නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයට සුළි සුළඟකින් දැඩි ලෙස හානි වුණා. ඒ ප්‍රදේශයට ගංවතුරක් ඇති වුණා. ඒ ආපදා දෙකේදීම, ඇස්තමේන්තු කළ මුදලින් කොටසක් විතරයි ඒ ජනතාවට ලැබුණේ. ඒ වාගේම, ප්‍රාදේශීය යටිතල පහසුකම් විනාශ වීම සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය කිසිදු වග

කිමක් ගත්තේ නැහැ. මේ ආපදා නිසා විනාශ වූ, පළාත් පාලන ආයතන සතු මාර්ග, බෝක්කු, පාලම් තවමත් එහෙමම තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අදාළ ඉල්ලීම් කළත් මේ වනතුරු ඒ වෙනුවෙන් ක්‍රියාමාර්ග අරගෙන නැහැ. ඔබතුමාට මේ කටයුතු සඳහා මැදිහත් වීමක් කරන්න පුළුවන්ද කියන එක තමයි මා දෙවැනි අතුරු ප්‍රශ්නය ලෙස අහන්නේ, ගරු ඇමතිතුමනි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ස්වාභාවික ආපදාවලට ලක්වූ උදවියට ඉතිහාසයේ නම් කිසිම මුදලක් ගෙව්වේ නැහැ. 2016දී තමයි මුලින්ම සියලු ස්වාභාවික ආපදා විපත් රක්ෂණය කළේ. අපි ඒ වෙනුවෙන් රුපියල් මිලියන 300ක් ගෙව්වා. මේ අවුරුද්ද වනවිට රුපියල් මිලියන 15,000ක වාරිකයක් ගෙවලා මේ රටේ සියලු ආපදාවලට ලක්වන අය රක්ෂණය කර තිබෙනවා. සුළි සුළං, ගංවතුර, අකුණු ගැසීම් වැනි සියලු ස්වාභාවික ආපදාවලින් හානියට ලක්වන අයට අප මුදල් ගෙවනවා.

ඊළඟට, යටිතල පහසුකම්වලට හානි සිදුවෙලා තිබෙනවා කියලා අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා. ඒ විස්තරත් අපට දන්වන්න. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්න අපට පුළුවන් වෙයි.

## මහඉලුප්පල්ලම කෘෂි පර්යේෂණ ආයතනයේ පර්යේෂණ: ප්‍රගතිය
## மஹாஇலுப்பள்ளம விவசாய ஆராய்ச்சி நிறுவனத்தினது ஆராய்ச்சிகள்: முன்னேற்றம்
## RESEARCHES OF MAHAILLUPPALLAMA FIELD CROPS RESEARCH AND DEVELOPMENT INSTITUTE: PROGRESS

677/'19

**8. ගරු එස්.සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහඉලුප්පල්ලම කෘෂි පර්යේෂණ ආයතනය වියළි කලාපයේ ඇති වැදගත් කෘෂි වගා පර්යේෂණ මධ්‍යස්ථානයක් බව පිළිගන්නේද;

(ii) වර්ෂ 2010 සිට 2018 දක්වා එහි පර්යේෂණ කටයුතු සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම කාලය තුළදී සොයාගත් භෝග වර්ග කවරේද;

(ii) එම පර්යේෂණ කෘෂි ආර්ථිකයට බලපානු ලබන ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சரை கேட்ட வினா:

(அ) (i) மஹாஇலுப்பள்ளம விவசாய ஆராய்ச்சி நிறுவனமானது உலர்வலயத்தில் அமைந்துள்ள மிகவும் முக்கியத்துவம் வாய்ந்ததொரு விவசாய செய்கை ஆராய்ச்சி நிலையம் என்பதனை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) 2010 தொடக்கம் 2018 ஆம் ஆண்டு வரை அதன் ஆராய்ச்சி நடவடிக்கைகளுக்காக ஒதுக்கப்பட்ட பணத் தொகையானது ஒவ்வொரு வருடத்தின் பிரகாரம் தனித்தனியாக எவ்வளவு என்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி காலப்பகுதியில் கண்டுபிடிக்கப்பட்ட பயிர் வகைகள் யாவை என்பதையும்;

(ii) மேற்படி ஆராய்ச்சிகள் விவசாய பொருளாதாரத்தின் மீது எவ்வகையில் தாக்கம் ஏற்படுத்துகின்றன என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Rural Economic Affairs, Irrigation and Fisheries and Aquatic Resources Development :

(a) Will he inform this House-

(i) whether it is admitted that the Field Crops Research and Development Institute at Mahailluppallama is one of the important field crops research centres in the dry zone; and

(ii) separately, the amount of money allocated for its research activities from year 2010 to 2018 according to each year?

(b) Will he also inform this House-

(i) the new crops that were introduced during that period; and

(ii) the impact of those researches on agro-economy?

(c) If not, why?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

වර්ෂ අනුව වෙන් කළ මුදල් ප්‍රමාණය පහත දැක්වෙන ඇමුණුම අංක 01 යටතේ දක්වා ඇත.

[ගරු පී. හැරිසන් මහතා]

**ඇමුණුම 01**

| වර්ෂය | වෙන් කළ මුදල (රුපියල් මිලියන) |
|---|---|
| 2010 | 24.17 |
| 2011 | 47.08 |
| 2012 | 52.03 |
| 2013 | 97.10 |
| 2014 | 99.26 |
| 2015 | 79.98 |
| 2016 | 75.51 |
| 2017 | 59.14 |
| 2018 | 69.37 |

(ආ) (i) මිරිස් භෝගයේ ප්‍රභේද තුනක්

බඩ ඉරිඟු භෝගයේ ප්‍රභේද තුනක්

මුං ඇට භෝගයේ ප්‍රභේද එකක්

කව්පි භෝගයේ ප්‍රභේද තුනක්

කොල්ලු භෝගයේ ප්‍රභේද දෙකක්

සෝයා බෝංචි භෝගයේ ප්‍රභේද එකක්

රට කජු භෝගයේ ප්‍රභේද තුනක්

බී ලූනු භෝගයේ ප්‍රභේද එකක්

පොකුරු ලූනු (රතු ලූනු) භෝගයේ ප්‍රභේද තුනක්

තුඹ කරවිල භෝගයේ ප්‍රභේද දෙකක්

දිවුල් භෝගයේ ප්‍රභේද දෙකක්

වැඩි විස්තර පහත දැක්වෙන ඇමුණුම අංක 02 යටතේ දක්වා ඇත.

**ඇමුණුම 02**

| බෝගය | ප්‍රභේද | නිර්දේශිත වර්ෂය |
|---|---|---|
| මිරිස් | MICH-03<br>MICHHY-01<br>MICHHY-02 | 2011<br>2015<br>2017 |
| බඩ ඉරිඟු | MI MAIZE H-01<br>MI MAIZE H-02<br>MI MAIZE POPCORN | 2013<br>2016<br>2016 |
| මුං ඇට | MI MB - 07 | 2018 |
| කව්පි | MICP - 01<br>ANKCP - 01<br>ANKCP - 02 | <br>2011<br>2015 |
| කොල්ලු | ANK BLACK<br>ANK BROWN | 2014<br>2014 |
| සෝයා බෝංචි | MISB-01 | 2013 |
| රට කජු | ANKG-01<br>ANKG-02<br>KCGN -01 | 2012<br>2015<br>2018 |
| බී ලූනු | MIBO -01 | 2014 |
| පොකුරු ලූනු (රතු ලූනු) | MILCO -01<br>ARLCLO-01<br>ARLCLO-02 | 2017<br>2018<br>2018 |
| තුඹ කරවිල | CHANDU(FEMALE)<br>VISHWA (MALE) | 2015<br>2018 |
| දිවුල් | ANKWA-01<br>ANKWA-02 | 2018<br>2018 |

(ii) මෙම පර්යේෂණවල ප්‍රතිඵල මඟින් කෘෂි ආර්ථිකයට කරනු ලබන බලපෑම සම්බන්ධයෙන් පර්යේෂණයක් සිදුකොට නොමැත. කෙසේ වුවද, හඳුනා ගනු ලැබූ ඒ ඒ භෝගවල ප්‍රභේද ගොවි ජනතාවට හඳුන්වා දී වගා කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත. ඒ අනුව ආසන්න වර්ෂය වශයෙන් 2017 වර්ෂයේදී අතිරේක භෝග වර්ග 11කින් ටොන් 395,514 ප්‍රමාණයක් නිෂ්පදනය කිරීමටත් ඒ තුළින් රුපියල් මිලියන 28,735ක් ඉපැයීමටත් හැකි වූ බවට වාර්තා වී ඇත.

2017 වර්ෂය තුළදී අතිරේක භෝග නිෂ්පාදනය හා වටිනාකම පහත දැක්වෙන ඇමුණුම අංක 03 මඟින් ඉදිරිපත් කරමි.

**ඇමුණුම 03**

| බෝගය | නිෂ්පාදනය (ටොන්) | වටිනාකම (රුපියල් මිලියන) |
|---|---|---|
| වියළි මිරිස් | 12,957 | 1,976 |
| ලොකු ලූනු | 53,603 | 2,796 |
| රතු ලූනු | 57,747 | 6,800 |
| බඩඉරිඟු | 195,744 | 7,107 |
| කුරක්කන් | 5,574 | 464 |
| තල | 7,754 | 948 |
| සෝයා | 14,363 | 968 |
| මුංඇට | 9,392 | 1,372 |
| කව්පි | 8,576 | 1,162 |
| රටකජු | 22,475 | 3,998 |
| උඳු | 7,329 | 1,144 |
| එකතුව | 395,514 | 28,735 |

(ඇ) අදාළ නොවේ.

**ගරු එස්.සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මේ පර්යේෂණ සඳහා අපි රුපියල් මිලියන 600ක පමණ මුදලක් වෙන් කරනවා. ඒ යොදවන මුදල්වල ප්‍රතිඵල අපට ලැබෙනවාද? උදාහරණයක් ලෙස, 2010 වසරේදී මිරිස් වගාව සඳහා බීජ ආනයනය කිරීම අරගෙන බලන්න. මේ පර්යේෂණ තුළින් ලබා ගත්තා වූ ප්‍රගතිය නිසා අපට විදේශ විනිමය කොපමණ ප්‍රමාණයක් ඉතිරි කර ගන්න පුළුවන් වුණාද කියන කාරණය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු වෙලා තිබෙනවාද?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය ටිකක් අපැහැදිලියි. එය නැවතත් කියන්න.

**ගරු එස්.සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

ගරු ඇමතිතුමනි, මේ පර්යේෂණ සඳහා අපි විශාල මුදලක් වියදම් කරනවා නේ. එහි ප්‍රතිඵල අපි නැවත මේ රටට ලබා ගන්න ඕනෑ. විදේශවලින් ආනයනය කරන කෘෂි භෝග වෙනුවෙන් පිට රටට යම් මුදල් ප්‍රමාණයක් ඇදී යනවා. මේ පර්යේෂණ තුළින් ඒ මුදල යම් ප්‍රමාණයකින් අඩුකරගන්න පුළුවන් වුණාද කියන එක ගැන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතුව යම්කිසි දත්ත ප්‍රමාණයක් සටහන් වෙලා තිබෙනවාද? ගරු ඇමතිතුමනි, හඳුනා ගත් බෝගවලින් නිෂ්පාදනය කළ ප්‍රමාණය නේ, ඔබතුමා දැන් මේ ගරු සභාවට කිව්වේ. අපට ඕනෑ කරන්නේ මේ ප්‍රමාණය වැඩි කරලා මේ රටේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ප්‍රගතියක් පෙන්වන්න නේ.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්මය කියන්නේ එක තැන තිබෙන විෂයයක් නොවෙයි. ඒ වාගේම, පර්යේෂණ කළාම ඒ පර්යේෂණවල ප්‍රතිඵල එන්නට ටික කාලයක් යනවා. ඒ ප්‍රතිඵල දවසකින් දෙකකින් ලැබෙන ඒවා නොවෙයි. හැබැයි, අපට දැනට ඒ පර්යේෂණවල ප්‍රතිඵල කොටසකුත් ලැබිලා තිබෙනවා. විශේෂයෙන්ම වී ඇතුළු එතුමා අහපු ධාන්‍ය වර්ගවල අලුත් භෝග වගා කරන්න අපි දැන් කටයුතු කර තිබෙනවා. සමහර භෝග වර්ග කාලයක් තිස්සේ එක දිගට වගා කරන විට ඒවා විවිධ රෝග උවදුරුවලට සහ කෘමි උවදුරුවලට ගොදුරු වෙනවා. එම නිසා අලුත් ප්‍රභේද ඇතිවෙලා තිබෙනවා. මේ ක්‍රමය ඇතුළත දැනට අපි මිරිස්, කව්පි, මුං ඇට, සෝයා බෝංචි, උඳු වාගේ දේවල්වලට, -මම ඉහතින් සඳහන් කළ ලැයිස්තුවට- අලුත් ප්‍රභේද ඇති කරගෙන තිබෙනවා. ඒ වාගේම, මේ අවුරුද්දේ උඳුවලින් ස්වයංපෝෂිත වෙන්නට අපට පුළුවන්වෙලා තිබෙනවා. පසුගිය අවුරුද්ද තුළදී අපි මුං ඇට මෙට්‍රික්ටොන් 10,000යි ගෙනැල්ලා තිබුණේ. ඒ වාගේම මේ අවුරුද්ද අවසන් වෙනකොට මුං ඇට ආනයනය සම්පූර්ණයෙන්ම නවත්වන්නට අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම කව්පි සහ තවත් ධාන්‍ය වර්ග කිහිපයක්. එතුමා කියපු කාරණය හරි. විශේෂයෙන්ම අපි ලජ්ජා වෙන්නට ඕනෑ. අපි තවමත් පිට රටින් කුරක්කන් ආනයනය කරනවා. හැබැයි, මේ අවුරුද්ද තුළ ඒකත් නවත්වන්නට අපි උත්සාහ කරනවා. අත්‍යවශ්‍ය ධාන්‍ය වර්ග 7ක ආනයනය සම්පූර්ණයෙන් නවත්වන්නට කටයුතු කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. අපේ විද්‍යාඥයන් ලංකාව තුළ කළ පර්යේෂණවල ප්‍රතිඵලයක් හැටියට තමයි මේ තත්ත්වය අපට ඇති කර ගන්නට පුළුවන්වෙලා තිබෙන්නේ. හොඳ බීජ ප්‍රභේදවලින් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හැකියාවක් ලැබිලා තිබෙනවා. ඒ අපේ පර්යේෂණවල ප්‍රතිඵලයයි.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ පර්යේෂණ ගැන තොරතුරු ගොවි ජනතාවට යනවා අඩුයි කියන එක ඔබතුමාත් දන්නවා, මාත් පිළිගන්නවා. උදාහරණයක් විධියට අලුත් මිරිස් වර්ගය ගනිමු. මම උපදේශක කාරක සභාව අවස්ථාවේදී කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලුවා, මට අලුත් මිරිස් ඇට ටිකක් දෙන්න කියලා. නමුත් මට ඒවා ලැබෙන්නට සැලැස්වුවේ නැහැ. ඔබතුමාත් දන්නවා ඇති, ගල්කිරියාගම කියන මිරිස් වර්ගය ඒ ප්‍රදේශයේ ගොවීන් සොයාගත්ත අලුත් ප්‍රභේදයක් බව. ගල්කිරියාගම කියන මිරිස් වර්ගය මාත් වගා කළා. මොකද, මට කෘෂිකර්ම අමාත්‍යාංශය සොයා ගත්ත වර්ගය ලබා ගන්න බැරිව ගිය නිසා. මේ කාරණා ගැන උනන්දු වන ගොවීන් ඉන්නවා. එම නිසා, ඒ ගොවීන්ට මේ පර්යේෂණ පිළිබඳව යම් දැනුමක් ලබා ගැනීමට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට උත්සාහ ගන්නවාද?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගල්කිරියාගම මිරිස් වර්ගය මහඉලුප්පල්ලම බීජ පර්යේෂණායතනයේ ප්‍රතිඵලයක්. දැන් ඔබතුමා ඇහුවා, ගොවීන්ට ඒ ගැන දැනුමක් සහ අවබෝධයක් ලබා ගැනීමට අවශ්‍යතාවක් තිබෙනවා නම් ඒක කරන්නේ කොහොමද කියලා. කිසි ගැටලුවක් නැහැ. ගොවි සංවිධාන මට්ටමිනුත්, ඔබතුමා විශේෂයෙන් නම් කරන තැනක් තිබෙනවා නම් ඒ ස්ථානයෙන් පුහුණුවක් ලබා දීමට හෝ අවශ්‍ය උපදෙස් ලබා දීමක් කරන්න අපට පුළුවන්. ඔබතුමා මිරිස් පැළ ටිකක් ගන්නට ඕනෑ නැහැ. මම ඔබතුමා ඉල්ලන දෙමුහුන් වර්ගයේ බීජ ඇට ටිකක්ම අරගෙන දෙන්නම්.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමා දැන් අතුරු ප්‍රශ්න දෙකක් ඇහුවා.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

මට අවස්ථාවක් දෙන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මට අවස්ථාව දෙන්න, මට අහන්නට වැදගත් ප්‍රශ්නයක් තිබෙනවා. මහවැලි "එච්" කලාපයේ ගොවීන් ජීවත් වෙන්න බැහැ කියලා, පසුගිය කන්නයට වන්දි ලබා දෙන්න කියලා තඹුත්තේගම මහවැලි කාර්යාලය ඉදිරිපිට කරන උපවාසයට දැන් සති හතරක් විතර වෙනවා. ඔබතුමා කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයා. කෘෂිකර්ම අමාත්‍ය ධුරය අපේ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකුට දීම අපට සම්පතක්. වියළි කලාපය සඳහා, වියළි කලාප සංවර්ධන විෂයට අදාළව, වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශයක් තිබීම අපට සම්පතක්. මේ ගොවීන්ගේ ඉල්ලීම් සඳහා ඔබතුමන්ලා යම් පියවරක් අරගෙන තිබෙනවාද ඇමතිතුමනි?

ගරු ඇමතිතුමනි, අද සමහර ගම්වලට බොන්න වතුර නැහැ. ඔබතුමා ඒ ගැන දන්නවා. එම ගොවීන් සඳහා ඉතා ඉක්මනින් සහනාධාර ක්‍රමයක් ඇති කිරීමට කෘෂිකර්ම බල ප්‍රදේශයක මහජන නියෝජිතයෙකු හැටියට ඔබතුමා ඉදිරි කෙටි කාලය තුළ උත්සාහ කරනවාද?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දන්නවා තඹුත්තේගම ප්‍රදේශය මහවැලි ප්‍රදේශයක් බව. අතිගරු ජනාධිපතිතුමා යටතේ තමයි මහවැලි අමාත්‍යාංශය ක්‍රියාත්මක වෙන්නේ. ඒ ගොවි මහත්වරුන් වන්දියක් තමයි ඉල්ලන්නේ. 2017 වර්ෂයේ සහ 2018 වර්ෂයේ ගොවීන්ට සිදු වුණු වගා හානි වෙනුවෙන් වන්දි ගෙවීම කෘෂි රක්ෂණ මණ්ඩලයෙන් කරන්නට අපට හැකියාවක් තිබෙනවා. ඒ ගැන ගැටලුවක් නැහැ. මේ මාසයේ 15වෙනි දා වෙනකොට අපි ලංකාව පුරාම සිටින ගොවි පවුල් 20,000 ගණනකට 2018 වර්ෂයේ යල කන්නයේ වගා හානි වෙනුවෙන් වන්දි මුදල් ගෙවලා ඉවර කරනවා. හැබැයි, මෙතුමා කියන්නේ, මහවැලි ප්‍රදේශයේ ගොවීන්ට ජලය නිකුත් නොකිරීම සම්බන්ධයෙන් වන්දි ගෙවන්න කියන ඉල්ලීමක් ඒ ගොවි මහත්වරුන්ගේ තිබෙනවා කියායි.

[ගරු පී. හැරිසන් මහතා]

එහෙම වන්දි ගෙවීමේ ක්‍රමවේදයක් නැහැ. ඒ ගොල්ලන්ට සහනාධාර වැඩ පිළිවෙළක් සකස් කරන්න මෙතුමා සහ මම අද දවාලේත් කථා කර ගත්තා. ඒ ගැන අතිගරු ජනාධිපතිතුමාත් දැනුවත් කරලා, එසේ වගා කරගන්න බැරි වුණු ප්‍රදේශවල සිටින ගොවි මහත්වරු වෙනුවෙන් සහනාධාර ලබා දීමේ ක්‍රමයක් ගැන අපට සාකච්ඡා කරලා තීන්දුවක් ගන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, බොහොම කනගාටුයි ඔබතුමාට දැන් අවස්ථාවක් දෙන්න අමාරුයි.

දෙවැනි වටය.

## ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව: විස්තර
### லங்காபுத்ர அபிவிருத்தி வங்கி: விபரம்
### LANKAPUTHRA DEVELOPMENT BANK: DETAILS

19/'18

**1. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය (ගරු හේෂා විතානගේ මහතා වෙනුවට)**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன - மாண்புமிகு ஹேசா விதானகே சார்பாக)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna on behalf of the Hon. Hesha Withanage)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව ආරම්භයේ සිට මේ දක්වා,

(i) යොදවන ලද සමස්ත ප්‍රාග්ධන හා සංචිත ප්‍රමාණය;

(ii) කොටස් මත ලද ආදායම සහ වත්කම් මත ලද ආදායම් ප්‍රමාණය;

(iii) සමස්ත සේවක සංඛ්‍යාව සහ එක් සේවකයකු වෙනුවෙන් වැය කළ මුළු මුදල් ප්‍රමාණය;

(iv) පුනරාවර්තන නොවන වියදම;

(v) බදු ලෙස රජයට ගෙවන ලද මුදල් ප්‍රමාණය;

(vi) ලාභය හෝ අලාභය;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) ඉහත තොරතුරු පෞද්ගලික අංශයේ බැංකු ආයතනයක් හා සංසන්දනාත්මකව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) லங்காபுத்ர அபிவிருத்தி வங்கியின் ஆரம்பம் தொடக்கம் இற்றைவரை,

(i) ஈடுபடுத்தப்பட்டுள்ள முழுமொத்த மூலதனம் மற்றும் ஒதுக்குத் தொகை;

(ii) பங்குகள் மீது பெறப்பட்ட வருமானம் மற்றும் சொத்துக்கள் மீது பெறப்பட்ட வருமானம்;

(iii) ஒட்டுமொத்த ஊழியர்களின் எண்ணிக்கை மற்றும் ஓர் ஊழியருக்காக செலவிட்ட மொத்தப் பணத்தொகை;

(iv) மீண்டுவரும் அல்லாத செலவுகள்;

(v) வரியாக அரசாங்கத்துக்கு செலுத்திய பணத் தொகை;

(vi) இலாபம் அல்லது நட்டம்;

ஒவ்வொரு வருடத்துக்கமைய வெவ்வேறாக எவ்வளவு என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா;

(ஆ) மேற்படி தகவல்கள் தனியார்துறை வங்கி நிறுவனத் துடன் ஒப்பிடப்படுகின்ற போது எவ்வளவு என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House separately with respect to each year of -

(i) the total capital and reserves;

(ii) the income on the shares and the income on the assets received;

(iii) the total number of employees and the total expenditure per employee;

(iv) the non-recurrent expenditure;

(v) the amount paid to the Government by way of taxes; and

(vi) the profit or loss;

from the inception of Lankaputhra Development Bank up to now?

(b) Will he also inform this House of the above information in comparison to a bank in the private sector?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2006 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා යොදවන ලද සමස්ත ප්‍රාග්ධන හා සංචිත ප්‍රමාණය ඇමුණුමෙහි* දක්වා ඇත.

(ii) ඉහත කාල සීමාවට අදාළව කොටස් මත ලද ආදායම සහ වත්කම් මත ලද ආදායම ඇමුණුමෙහි දක්වා ඇත.

(iii) සමස්ත සේවක සංඛ්‍යාව සහ එක් සේවකයෙකු වෙනුවෙන් වැය කළ මුළු මුදල් ප්‍රමාණය ඇමුණුමෙහි දක්වා ඇත.

(iv) පුනරාවර්තන නොවන වියදම ඇමුණුමෙහි දක්වා ඇත.

(v) බදු ලෙස රජයට ගෙවන ලද මුදල් ප්‍රමාණය ඇමුණුමෙහි දක්වා ඇත.

(vi) බැංකුව විසින් ලබන ලද ලාභය ඇමුණුමෙහි දක්වා ඇත.

**Annexure - 01**

| | | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 (Un audited) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| i | Share Capital | 1,500,000,000 | 1,500,000,000 | 3,616,377,973 | 3,671,972,223 | 3,671,972,223 | 3,671,972,223 | 3,671,972,223 | 3,671,972,223 | 3,671,972,223 | 3,671,972,223 | 3,671,972,223 | 3,671,972,223 | 3,671,972,223 |
| | Reserve Fund (Rs) | 1,165,753 | 2,308,954 | 6,122,113 | 9,257,884 | 10,291,616 | 14,157,535 | 25,068,040 | 42,362,443 | 51,295,229 | 60,932,527 | 73,865,780 | 88,775,607 | 100,165,424 |
| ii | Return on Equity (After Tax) | 1.53% | 1.90% | 2.90% | 1.60% | 0.50% | 2.00% | 3.30% | 7.90% | 4.00% | 4.20% | 5.40% | 5.50% | 4.30% |
| | Return of Assets (Before tax) | 2.42% | 3.30% | 4.20% | 3.20% | 2.40% | 1.90% | 4.30% | 5.80% | 2.40% | 2.90% | 3.00% | 4.30% | 3.20% |
| iii | Number of Employees | 63 | 115 | 172 | 165 | 169 | 169 | 152 | 153 | 147 | 201 | 183 | 170 | 165 |
| | Average Cost per employee per year (Rs.) | 296,517 | 523,965 | 515,865 | 548,273 | 539,795 | 581,074 | 661,300 | 672,018 | 879,385 | 846,599 | 866,256 | 937,282 | 1,041,054 |
| iv | No recurrent Cost (Rs.) | 51,023,052 | 68,945,365 | 35,427,309 | 17,343,986 | 2,471,800 | 41,287,228 | 16,403,227 | 6,717,770 | 13,779,629 | 19,889,272 | 4,384,733 | 9,449,934 | 7,381,584 |
| v | Contribution to Government as taxes (Rs.) | 1,556,950 | 66,695,500 | 75,199,169 | 214,101,276 | 195,149,836 | 118,987,254 | 47,218,908 | 51,545,902 | 50,101,802 | 50,884,727 | 59,844,420 | 95,586,574 | 102,124,480 |
| vi | Profit/(Loss) (Rs.) | 23,315,061 | 22,864,018 | 76,263,182 | 62,715,429 | 20,074,641 | 77,316,379 | 218,210,099 | 345,888,068 | 178,655,721 | 192,745,957 | 258,665,059 | 298,106,538 | 227,796,344 |

***[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]***
*[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*
*[This annex is also placed in the Library.]*

(ආ) ඉහත තොරතුරු පෞද්ගලික අංශයේ බැංකු ආයතනයක් සමඟ සංසන්දනය කිරීමට හැකියාවක් නොමැත.

(ඇ) පැන නොනඟී.

## මධ්‍යම සංස්කෘතික අරමුදල: බඳවා ගැනීම
## மத்திய கலாசார நிதியம்: ஆட்சேர்ப்பு
## CENTRAL CULTURAL FUND: RECRUITMENT

416/'19

**4. ගරු ටී. බී. ඒකනායක මහතා (ගරු ගාමිණී ලොකුගේ මහතා වෙනුවට)**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - மாண்புமிகு காமினி லொக்குகே சார்பாக)
(The Hon. T.B. Ekanayake on behalf of the Hon. Gamini Lokuge )

නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3):

(අ) (i) 2015.01.15 වැනි දිනට මධ්‍යම සංස්කෘතික අරමුදලේ සේවයේ යෙදී සිටි ස්ථිර, අනියම් හා කොන්ත්‍රාත් සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015.01.15 දින සිට 2018.05.15 දින දක්වා මධ්‍යම සංස්කෘතික අරමුදලට ස්ථිර, අනියම් හා කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගෙන ඇති සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම බඳවා ගැනීම් මධ්‍යම සංස්කෘතික අරමුදලේ පිරිස් පාලන සැලැස්මට අනුකූලව සිදු කර තිබේද;

(iv) ඉහත (ii)හි සඳහන් සේවකයන් වෙනුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලින් වැටුප් හා දීමනා ලෙස මාසිකව වැය කරනු ලබන මුදල කොපමණද;

(v) 2015.01.15 දින සිට 2018.05.15 දින දක්වා මධ්‍යම සංස්කෘතික අරමුදලින් පුරාවිද්‍යා දෙපාර්ත-මේන්තුවට ස්ථිර, අනියම් හා කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගෙන ඇති සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ඉහත (v)හි සඳහන් සේවකයන් වෙනුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලින් වැටුප් හා දීමනා ලෙස මාසිකව වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணத்துறை மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015.01.15 ஆம் திகதியில் மத்திய கலாசார நிதியத்தில் சேவையில் ஈடுபட்டிருந்த நிரந்தர, அமைய மற்றும் ஒப்பந்த ஊழியர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) 2015.01.15 தொடக்கம் 2018.05.15 ஆம் திகதி வரை மத்திய கலாசார நிதியத்துக்கு நிரந்தர, அமைய மற்றும் ஒப்பந்த அடிப்படையின் கீழ் ஆட்சேர்ப்பு செய்யப்பட்ட ஊழியர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) மேற்படி ஆட்சேர்ப்புகள் மத்திய கலாசார நிதியத்தின் ஆளணிக் கட்டுப்பாட்டு திட்டத்துக்கு அமைவாக மேற்கொள்ளப்பட்டுள்ளதா என்ப தையும்;

(iv) மேற்படி (ii) இல் குறிப்பிடப்பட்டுள்ள ஊழியர் களுக்காக மத்திய கலாசார நிதியத்தின் மூலம் சம்பளங்கள் மற்றும் கொடுப்பனவுகளாக மாதாந்தம் செலவிடப்படுகின்ற தொகை எவ்வள வென்பதையும்;

(v) 2015.01.15 தொடக்கம் 2018.05.15 ஆம் திகதி வரை மத்திய கலாசார நிதியத்தினால் தொல்லியல் திணைக்களத்துக்கு நிரந்தர, அமைய மற்றும் ஒப்பந்த அடிப்படையின் கீழ் ஆட்சேர்ப்பு செய்யப்பட்ட ஊழியர்களின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவென்பதை யும்;

(vi) மேற்படி (v) இல் குறிப்பிடப்பட்டுள்ள ஊழியர் களுக்காக மத்திய கலாசார நிதியத்தின் மூலம் சம்பளங்கள் மற்றும் கொடுப்பனவுகளாக மாதாந்தம் செலவிடப்படுகின்ற தொகை எவ்வள வென்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු ටී.බී. ඒකනායක මහතා]

asked the Minister of Housing, Construction and Cultural Affairs:

(a) Will he inform this House -

(i) the number of permanent, casual and contract basis employees who were serving at the Central Cultural Fund as at 15.01.2015, separately;

(ii) the number of permanent, casual and contract basis employees recruited to the Central Cultural Fund from 15.01.2015 up to 15.05.2018, separately;

(iii) whether such recruitment has been done in accordance with the personnel management plan of the Central Cultural Fund;

(iv) the amount spent out of the Central Cultural Fund per month for the salaries and allowances of the employees mentioned in (ii) above;

(v) the number of permanent, casual and contract basis employees recruited to the Department of Archaeology from the Central Cultural Fund from 15.01.2015 to 15.05.2018, separately; and

(vi) the amount spent out of the Central Cultural Fund per month for the salaries and allowances of the employees mentioned in (v) above?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

| | | | | |
|---|---|---|---|---|
| (අ) | (i) | ස්ථිර | = | 1871 |
| | | අනියම් | = | 118 |
| | | කොන්ත්‍රාත් | = | 03 |
| | | එකතුව | = | 1992 |
| | (ii) | ස්ථිර | = | 660 |
| | | අනියම් | = | 16 |
| | | කොන්ත්‍රාත් | = | 325 |
| | | එකතුව | = | 1001 |
| | (iii) | ඔව්. | | |
| | (iv) | රුපියල් 33,249,595.00 | | |
| | (v) | ස්ථිර | = | 00 |
| | | අනියම් | = | 00 |
| | | කොන්ත්‍රාත් (මුරකරු/කම්කරු) | = | 1398 |
| | (vi) | රුපියල් 41,159,917.37 (2018 මැයි මාසයට) | | |
| (ආ) | | අදාළ නොවේ. | | |

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Douglas Devananda to raise a Question under Standing Order No. 27(2).

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

අපේ ගරු ඇමතිතුමාත් සිටින නිසායි මම මේ ගැන අහන්නේ. බඩඉරිඟු ගෙන්වීම සම්බන්ධව -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඒක point of Order එකක් නොවෙයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කාරණය ගැන අහන්න අවස්ථාවක් දෙන්න, අපේ -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

නැහැ, ඒක point of Order එකක් නොවෙයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පොඩි අදහසක් -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මම පසුව ඔබතුමාට ඒ සඳහා අවස්ථාව දෙනවා. [බාධා කිරීමක්] නැහැ. බොහොම කනගාටුයි, ගරු මන්ත්‍රීතුමා.

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය අහන්න තමයි මම ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමාට අවස්ථාව දීලා තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම ඇමතිතුමාත් මෙතැන සිටින නිසායි අහන්නේ. මොකද, මේක රටේ වැදගත් ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Douglas Devananda, you can raise your Question now.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මෙයින් පසුව මට කතා කරන්න වෙලාව දෙනවාද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ වේලාවට ඒක බලමු.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### උතුරු හා නැඟෙනහිර වෛද්‍යවරුන් ස්ථාන මාරු කිරීමේ පටිපාටිය
### வடக்கு, கிழக்கில் வைத்தியர்களின் இடமாற்ற நடைமுறை
### TRANSFER PROCEDURE OF DOCTORS IN NORTH AND EAST

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர் கௌரவ ராஜித சேனாரத்ன அவர்களிடம் கேள்வி கேட்பதற்கு அனுமதித் தமைக்கு நன்றி!

நாட்டில் யுத்தம் நிலவிய காலகட்டங்களில் வடக்கு, கிழக்கு மாகாணங்களுக்கெனத் தனியான - விசேட, வைத்தியர் களுக்கான இடமாற்றப் பட்டியல் ஒன்று தயாரிக்கப்பட்டு, அதன் பிரகாரம் வடக்கு, கிழக்கு மாகாணங்களில் நியமனம் பெறுகின்ற வைத்தியர்களுக்கு ஒரு வருட காலத்தில் இடமாற்றங்களைப் பெறலாம் என்ற சலுகை வழங்கப் பட்டிருந்தது. ஒரு வருட காலத்தில் இடமாற்றம் பெறலாம் என்ற நம்பிக்கையில் பல வைத்தியர்கள் அங்கு வந்து கடமைகளில் ஈடுபட்டதன் காரணமாக இந்த ஏற்பாடு யுத்தம் நிலவிய காலகட்டத்தில் வடக்கு, கிழக்கு மாகாண மக்களுக்குப் பெரும் வாய்ப்பாக அமைந்திருந்தமை குறிப்பிடத்தக்கது.

யுத்தம் முடிவுக்குக் கொண்டுவரப்பட்டு, தற்போது 10 ஆண்டுகள் கடந்துவிட்டுள்ள நிலையிலும், மேற்படி வைத்தியர்களின் இடமாற்றத்திற்கான தனியான - விசேட பட்டியல் இன்னமும் வடக்கு, கிழக்கு மாகாணங்களில் நடைமுறைப்படுத்தப்பட்டு வருவதால், அப்பகுதிகளின் சுகாதார செயற்பாடுகளை முன்னெடுப்பதில் பாரிய பாதிப் புக்கள் ஏற்பட்டு வருவதாகக் கூறப்படுகின்றது. குறிப்பாக, சில விசேட திறன்களை இந்த வைத்தியர்களுக்குப் பயிற்றுவித்த பின்னர் சிறிது காலத்தில் இவர்கள் இடமாற்றம் பெறுவதால், சுகாதார சேவைகள் பெரிதும் பாதிக்கப்படுவதாகக் கூறப்படுகின்றது.

பொதுவாக ஒரு வைத்தியர் ஒரு வைத்தியசாலையில் நியமிக்கப்பட்டால், அவர் கட்டாயமாக 4 ஆண்டுகள் அங்கு சேவையாற்றிய பின்னரே இடமாற்றம் பெற முடியும் எனக் கூறப்படுகின்ற நிலையில் வடக்கு, கிழக்கு மாகாணங்களுக்கு மாத்திரம் இந்தத் தனியான பட்டியல் இன்னமும் தொடர்வ தானது எமது மக்களுக்கு அநீதி இழைக்கப்படுவதாகவும் கருதப்படுகின்றது.

அதேநேரம், தற்போது அரச மருத்துவமனைகளில் மருந்துகளுக்கான தட்டுப்பாடுகள் நிலவுவதாகவும் கூறப்படு கின்றது.

எனவே,

01. வைத்தியர்கள் இடமாற்றம் தொடர்பில் வடக்கு, கிழக்கு மாகாணங்களில் நடைமுறைப்படுத்தப்பட்டு வருகின்ற தனியான பட்டியலை உடன் நீக்கி, நாட்டில் ஏனைய 7 மாகாணங்களிலும் நடைமுறைப்படுத்தப் பட்டு வருகின்ற பொதுவான பட்டியலை வடக்கு, கிழக்கு மாகாணங்களிலும் நடைமுறைப்படுத்துவதற்கு நடவடிக்கை எடுக்க முடியுமா?

02. தற்போது நாட்டில் அரச மருத்துவமனைகளில் மருந்து வகைகளுக்குத் தட்டுப்பாடுகள் நிலவாத வகையில், அவற்றை வழங்குவது தொடர்பில் எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாது?

மேற்படி எனது கேள்விகளுக்கான பதில்களையும் எடுக்கப் படக்கூடிய நடவடிக்கைகள் தொடர்பான விளக்கங்களையும் கௌரவ அமைச்சர் அவர்கள் வழங்குவார் என எதிர்பார்க் கின்றேன். நன்றி.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. යුද්ධය අවසන් වී වසර දහයකට අධික කාලයක් ගත වී ඇති බැවින්, උතුරු-නැඟෙනහිර ස්ථාන මාරු ක්‍රමයෙන් බැහැර වන ලෙස 2017.01.11 සහ 2017.05.05 යන දිනවලදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පැවති සාකච්ඡාවලට අනුව උපදෙස් ලබා දී ඇත. ඒ අනුව උතුරු-නැඟෙනහිර ස්ථාන මාරු ක්‍රමයෙන් බැහැර වී, ඌන පහසුකම් සහිත සේවා ස්ථාන ලැයිස්තුවක් හඳුනා ගනු ලැබ ඇත. මේ පිළිබඳව වරින් වර පළාත් සෞඛ්‍ය අමාත්‍යවරුන්ගේ සමුළුවේදී හා මාසිකව පැවැත්වෙන අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීමේදී ද නිරන්තරවම සාකච්ඡා විය. ඒ පිළිබඳව අපේ සෞඛ්‍ය ලේකම්ට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ ලේකම්, කළුකපුආරච්චි මහත්මයා 15.01.2018 දින එවපු ලිපියේ මෙසේ සඳහන් වෙනවා:

"උතුරු-නැඟෙනහිර සේවය කරන වෛද්‍ය නිලධාරීන්ගේ ස්ථාන මාරු

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක 08.08.2017 හා 08.01.2018 දිනැති ලිපි සම්බන්ධයෙනි.

එම ලිපිවල සඳහන් කරුණු සම්බන්ධයෙන් සලකා බලන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය තවදුරටත් ප්‍රමාදවීම වැළැක්වීම සඳහා ඔබගේ සමාංක හා 08.08.2017 දිනැති ලිපිය සමඟ ඇමුණුම 01 ලෙස ඉදිරිපත් කර ඇති ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල 25කට අදාළව සකස් කරන ලද ඌන පහසුකම් සහිත සේවා ස්ථාන ලැයිස්තුව සඳහා එකඟතාව ලබා දීමට තීරණය කර ඇති බව එම කමිටුවේ නියමය පරිදි කාරුණිකව දක්වමි.

තවද, මෙම ඌන පහසුකම් සහිත සේවා ස්ථාන ලැයිස්තුව සකස් කිරීමේදී අදාළ නිර්ණායකයන්ට, සේවා ස්ථානයන්ට ආසන්නව පාසල් පිහිටා තිබීම වැනි නිර්ණායක ඇතුළත් කරනු

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

ඇති බව නිරීක්ෂණය කරන ලදී. ඉදිරි වර්ෂවලදී ඌන පහසුකම් සහිත සේවා ස්ථාන ලැයිස්තුව සකස් කිරීමේදී මෙම නිර්ණායක ද සලකා බැලිය..." යනුවෙන්.

ඒ අනුව 2017.11.25 වන දිනයෙන් පසුව පත්වීම් ලබා දී ඇති වෛද්‍ය නිලධාරි කණ්ඩායම්වලට උතුරු-නැඟෙනහිර ස්ථාන මාරු ලැයිස්තුව ක්‍රියාත්මක වන බවට දන්වා නැත. ඒ අනුව උතුරු-නැඟෙනහිර ස්ථාන මාරු ලැයිස්තුවක් ක්‍රියාත්මක කිරීමෙන් බැහැර වී ඇත. කෙසේ නමුත්, වාර්ෂික ස්ථාන මාරු යටතේ වසර දෙකක සේවා කාලයක් සම්පූර්ණ කරන නිලධාරින්ට සිය කැමැත්තෙන් ස්ථාන මාරුව අයදුම් කළ හැකි වේ.

ඒ නිසා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන මේ ප්‍රශ්නය පැන නඟින්නේ නැහැ, 2017 ඉඳලා එහෙම උතුරු-නැඟෙනහිර කියලා වෙනම ලැයිස්තුවක් නැහැ. තිබෙන්නේ දුෂ්කර සේවා ලැයිස්තුවක්. ඒක හැම දාම තිබුණා. ඒ අනුව විතරයි එහෙම කටයුතු කරන්නේ. හැබැයි, ඕනෑම රාජ්‍ය සේවකයෙකුට අවුරුදු දෙකෙන් පසුව ස්ථාන මාරුවීමක් ඉල්ලා ගත හැකියි. හැබැයි, ඒ ඉල්ලන තැන ඉඩ පහසුකම් තිබෙනවා නම් තමයි ලැබෙන්නේ.

දෙවැනි කාරණයේදී ඔබතුමා ඖෂධ හිඟය පිළිබඳව කියනවා. ඒ පිළිබඳව අපේ වෛද්‍ය සැපයීම් අංශයේ අධ්‍යක්ෂතුමා 2019.08.05 වැනි දින ලිපියක් නිකුත් කරලා තිබෙනවා. එහි මෙසේ සඳහන් වනවා:

"රජයේ රෝහල්වල මේ වනවිට ඇති වී තිබෙනවා යැයි පැවසෙන ඖෂධ හිඟය පිළිබඳ වර්තමාන තත්ත්වය පිළිබඳවයි

රජයේ රෝහල්වල මේ වන විට සැලකිය යුතු මට්ටමේ කිසිදු බෙහෙත් හිඟයක් නොමැත. මේ වන විට වෛද්‍ය සැපයීම් අංශයට වාර්තා වී තිබෙන්නේ සාමාන්‍යයෙන් එදිනෙදා රෝහල්වලට විශේෂිත වූ අයිතමයන්වල හිඟතාවක් පමණි. එම හිඟතාව ඇති වීමට පහත සඳහන් කරුණු බලපා ඇති බව හඳුනා ගැනීමට තිබේ.

1. අදාළ රෝහල විසින්ම කරන ලද අවඇස්තමේන්තු (Underestimation)
2. අදාළ අයිතමයේ ඉල්ලුම පුරෝකථන ඉල්ලුමට වඩා ඉහළ යාම
3. වාර්ෂික ඇණවුම් වෛද්‍ය සැපයීම් අංශයට ලැබීමේදී ඇති වූ ප්‍රමාදයන්

ඉහත ප්‍රමාදයන් හේතුවෙන් කිසිදු අත්‍යවශ්‍ය ජීවිතාරක්ෂක ඖෂධ හිඟයක් මේ වන විට රෝහල්වල නොමැත. මෙම ඖෂධ වර්ග Very Essential (V), Essential (E), Non-Essential (N) ලෙස හඳුනා ගෙන ඇති අතර, එම සියලු ඖෂධ තොග අදාළ රෝහල්වල හිඟයකින් තොරව පවත්වාගෙන යාමට පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන තිබේ.

1. ආයතන විසින් ප්‍රාදේශීයව මිලදී ගැනීම (Purchase by LP)
2. ආයතනය සතු විකල්ප සුදුසු ඖෂධ භාවිතා කිරීම (Substitute)
3. රෝහල් අතර වූ පරිගණක පද්ධතිය හරහා එක් රෝහලක නොමැති වූ ඖෂධයක් අදාළ ඖෂධ තිබෙන වෙනත් රෝහලකින් හුවමාරු කර ගැනීම (Redistribution through the MSMIS).

මෙම ක්‍රමවේදයන් භාවිත කර දැනට වෛද්‍ය සැපයීම් අංශයේ ප්‍රධාන ගබඩාවේ නොමැති ඖෂධ සියල්ල ඉතා සාර්ථකව කළමනාකරණය කර ගනිමින් 2019.08.05 දින කරාපිටිය ශික්ෂණ රෝහල විසින් ඖෂධ සපයා ගෙන ඇති සටහනක් මේ සමඟ අමුණා ඇත (ඇමුණුම 01). කෙසේ නමුත් එහි සඳහන් ඖෂධ බෙහොමයක්ද මේ වන විට වෛද්‍ය සැපයුම් ප්‍රධාන ගබඩාව වෙත ද ලැබී තිබේ."

"Out-of-stock drugs" කියන කාරණය වෛද්‍ය සංගමය විසින් පෙන්වලා තිබෙනවා. නමුත් ලැයිස්තුවේ ඇත්තම තත්ත්වය තිබෙනවා. ඒ නිසා එම සටහන තමුන්නාන්සේලාට බලා ගන්න මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ඒ සටහනේ සියලු විස්තර තිබෙනවා. ඖෂධ Local purchase කරලා තිබෙනවා. ඒ සඳහා වෙනත් ඖෂධ - substitutes - තිබෙනවා. ඒගොල්ලන් request කරලා නැති සමහර ඖෂධවලට වෙනත් ඖෂධ ඇවිල්ලා තිබෙන නිසා අලුතින් ඇණවුම් කරන්නේ නැහැ. මේ විධියට හැම ලැයිස්තුවේම කිසිම දෙයක් අඩුවෙලා නැහැ. "Approval pending" කියලා එක ඖෂධයක් විතරයි තිබෙන්නේ. ඖෂධ 34න් එක ඖෂධයක විතරයි approval එක ප්‍රමාද වෙලා තිබෙන්නේ. අනික් එක ඖෂධයක්වත් ප්‍රමාද වෙලා නැහැ. ඒ නිසා මේක අමූලික අසත්‍යයක්. කවුරුවත් එහෙම දෙයක් ප්‍රකාශ කරලා නැහැ. ඕනෑම hospital එකක් ඖෂධ ලැයිස්තුවක් හදනවා. හිඟ ඖෂධ නොවෙයි. ඖෂධ අඩු වනකොට ඒ හිඟය හදලා මෙහාට එවනවා. එලෙස අඩු ඖෂධ වෙනත් ළඟ රෝහලක තිබෙනවා නම් ඒවායින් ගන්න අපි අවසර දීලා තිබෙනවා. එහෙම නැත්නම් හැමෝටම ඒ ඖෂධ ගන්න මුදල් දීලා තිබෙනවා. යාපනය රෝහලේ අධ්‍යක්ෂවරයාගේ අතට රුපියල් මිලියන 10ක් -රුපියල් කෝටියක්- දීලා තිබෙනවා, නැත්නම් ඕනෑම බඩුවක් ඕනෑම වෙලාවක මිලදී ගන්න කියලා. ජාතික රෝහලේ අධ්‍යක්ෂවරයාගේ අතට රුපියල් කෝටි 5ක්, Rs. 50 million - cash in hand - දීලා තිබෙනවා, මේ වාගේ ඖෂධ ඕනෑම වේලාවක ගන්න. ඒ නිසා නිකම් ලැයිස්තු පෙන්වලා, මේ ඖෂධ නැහැයි කීම දේශපාලනය වෙනුවෙන් කියන අමූලික අසත්‍යයක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවාද?

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, மருந்து வகைகளின் பற்றாக்குறை தொடர்பாக கௌரவ அமைச்சர் அவர்கள் குறிப்பிட்டதை நான் ஏற்றுக்கொள்கின்றேன். அதேநேரத்தில் வடக்கு, கிழக்கு வைத்தியர்களுக்கெனத் தனியான இடமாற்றப் பட்டியல் வேண்டாமென்று பத்திரிகை களிலும்கூட செய்தி வெளிவந்திருந்தது. அதைவிட, அங்குள்ள சில பொது அமைப்புகள்கூட இந்தப் பிரச்சினையை முன்னெடுத்திருக்கின்றன. ஆனபடியால், அதனை மீண்டும் ஆராய்ந்து பார்க்குமாறு கேட்டுக்கொள்கின்றேன். நன்றி.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු මන්ත්‍රීතුමා, ඒ ක්‍රමයට ඔබතුමාත් එක්ක මාත් එදා ඉඳලාම එකඟයි. මම කිව්වේ මේකයි. යුද්ධය අවසන් වෙලා අවුරුදු 10ක් ගත වන කොට උතුරු නැඟෙනහිර කියලා වෙනම ගන්න අවශ්‍ය නැහැ. උතුර නැඟෙනහිර සමහර දුෂ්කර ප්‍රදේශවලට වඩා කැබිතිගොල්ලෑව, පදවිය වාගේ දුෂ්කර ප්‍රදේශ තිබෙනවා. කෙසේ වෙතත්, දුෂ්කර ලැයිස්තුවට තමයි උතුරු නැඟෙනහිර දාලා තිබෙන්නේ. 2017 ඉඳලා ලැයිස්තුවක් වශයෙන් අපි උතුරු නැඟෙනහිරට ස්ථාන මාරු දීලා නැහැ. මම පෙන්වූයේ ඒකයි. Public Service Commission එකෙනුත් මේ කරුණ approve කරලා තිබෙනවා.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විමලවීර දිසානායක මැතිතුමා, ඔබතුමාට අහන්න තිබෙනවාය කියපු ප්‍රශ්නය මොකක්ද?

**ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලක්ෂ 4ක දීමනාවක් ලැබෙනවා ය කියලා අපේ ජනාධිපතිතුමා කියා තිබෙන බව අද "ලංකාදීප" පත්තරේ සඳහන් වනවා.

මේ ගරු සභාවේ සිටින මන්ත්‍රීතුමන්ලා කාටවත් රුපියල් ලක්ෂ 4ක් හම්බ වෙන්නේ නැහැ. අපට රුපියල් ලක්ෂ 3කට අඩු දීමනාවක් තමයි හම්බ වෙන්නේ. පාර්ලිමේන්තුවට සහභාගි වන දීමනා, ඉන්ධන දීමනා, දුරකථන දීමනා කියන ඔක්කෝම එකතු වෙලා හම්බ වෙන්නේත් රුපියල් ලක්ෂ 3කට අඩු ගණනක්. රුපියල් ලක්ෂ 4ක් දෙනවා කියලා කියනවා නම්, ඉතිරි රුපියල් ලක්ෂය කවුද ගන්නේ? රුපියල් ලක්ෂ 4න් අපට හම්බ වෙන්නේ ලක්ෂ 3යි නම්, ඉතිරි රුපියල් ලක්ෂය කවුද ගන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ලක්ෂ 3ක් හම්බ වෙන්නේත් නැහැ.

**ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
අපට රුපියල් ලක්ෂ දෙකයි ගණනක් තමයි හම්බ වෙන්නේ. අම්පාරේ මන්ත්‍රීවරයකු වන නිසා මට ඉන්ධන දීමනාව රුපියල් 10,000ක් වැඩියි. අපේ දීමනා ඔක්කෝම එක්ක ලැබෙන මුදල රුපියල් ලක්ෂ 3කට ආසන්නයි. අපට ජීවත් වෙන්නත් බැරිවයි ඉන්නේ. ඉන්ධනවලටම මාසයකට රුපියල් 150,000ක් ඕනෑ. ඒ වාගේම දුරකථන බිල්, ජල බිල්, විදුලි බිල් ආදි ඔක්කෝම බිල් ගෙවන්න ඕනෑ. අපට ජීවත් වෙන්නත් බැරිව සිටිද්දී, ඇයි එතුමා එහෙම කියන්නේ? කවුරු හෝ එතුමාට වැරැදි තොරතුරු දෙනවා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට රුපියල් ලක්ෂ 2ක් වැඩිපුර දෙනවා ඇති. අපි බදු ගෙවන්නත් ඕනෑ. ඔක්කෝටම කපලා කපලා ඉතිරියක් නැහැ. අපට පාරේ යන්නත් බැහැ, ලෙඩ්ඩුන්ගේ ගෙවල්, බණ ගෙවල්, දාන ගෙවල්, මඟුල් ගෙවල්. මේ කියන ඔක්කෝටම යන්න එච්චරයි හම්බ වෙන්නේ. එම නිසා එතුමා කළ ප්‍රකාශය ඉතාම අසාධාරණයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ කාරණය මතු කළාට බොහොම ස්තුතියි.

මීළඟට, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. මේ අවස්ථා දෙක විතරයි විපක්ෂයට තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, කරුණාකර දැන් ඔබතුමාගේ කාරණය කියන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහොම ස්තුතියි.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
අපටත් ඕනෑ අවස්ථාවක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔය පැත්තටත් අවස්ථාවක් දෙනවා. පොඩ්ඩක් ඉන්න. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාටත් අවස්ථාවක් දෙන්නම්. පොඩ්ඩක් ඉන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නය අහන්න මට ඉඩ දුන්නේ නැති වෙලාවේ නම්, ඇමතිතුමා සිටියා. දැන් එතුමා නැහැ. නමුත්, අපේ ගරු සභානායකතුමා මේ ගරු සභාවේ සිටින නිසා මා මේ කාරණය කියන්න ඕනෑ. ගරු සභානායකතුමනි, බඩ ඉරිඟු ගෙන්වීම සඳහා මේ රටේ එක් එක් පුද්ගලයන්ට බලපත්‍ර ලබා දීලා තිබුණා. නමුත්, දැන් කුකුළු ගොවීන්ට විශාල ප්‍රශ්නයක් ඇති වෙලා. එක් එක් කෙනාට දීලා තිබුණු බලපත්‍රවලට අදාළව ඔක්කෝම ටික order කළාට පසුව-[බාධා කිරීමක්] එක් කෙනෙකුට මෙට්‍රික්ටොන් 300ක් ගෙන්වන්න ඉඩ දුන්නා කියලා හිතන්න. දැන් වන විට ඔහු බඩු ටික ගෙනැල්ලා දීලා ඉවරයි, ගරු සභානායකතුමා. හැබැයි, දැන් කරලා තිබෙන දේ තමයි ඒ සියලු බලපත්‍ර අහෝසි කරපු එක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට ආරංචි හැටියට දැන් ඒ අවස්ථාව දෙදෙනෙකුට විතරක් දීලා තිබෙනවා. මේ හේතුවෙන් දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? බඩ ඉරිඟු ගෙන්වූ අය විශාල හිරවීමක ඉන්නවා. ඒක ගැටලුවක්. ඒක තමයි පළමුවන කාරණය. ගරු සභානායකතුමනි, දෙවන කාරණය මේකයි. අපේ කුකුළු ගොවි පොළවලට -කුකුළන්ට- අවශ්‍ය බඩ ඉරිඟු ටික තමයි මේ විධියට ගෙනෙන්නේ. ඒ ගෙන්වීම නතර කිරීම නිසා කුකුළන්ට දීම සඳහා කෑම සොයා ගන්න බැරිව විශාල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා බිත්තර මිල විශාල වශයෙන් ඉහළ යාවි. දැන් විශාල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. ගරු සභානායකතුමනි, ඒ නිසා මා ඔබතුමාගෙන් ඉල්ලන්නේ, කරුණාකර මේ සම්බන්ධව සොයා බලා බඩ ඉරිඟු බලපත්‍ර දීලා තිබෙන අයට බඩ ඉරිඟු ගෙන්වන්න ඉඩ දෙන්න කියලායි. දෙදෙනෙකුට විතරක් ඔක්කෝම ටික ගෙන්වන්න දීලා අනෙක් ඒවා cancel කරපු එකෙන් තමයි මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. ගරු සභානායකතුමනි, එම නිසා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටින්න කැමැතියි, කරුණාකර මේ කාරණයට මැදිහත් වෙන්න කියලා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමනි, අනෙක් කාරණා දෙකත් අහලා එක වතාවේම උත්තරයක් දෙනවාද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
හොඳයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය ඔබතුමියගේ කාරණය කියන්න.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාත් කතා කරන්න යන්නේ ඊයේ අතිගරු ජනාධිපතිතුමා කරපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වැටුප සම්බන්ධ ප්‍රකාශය පිළිබඳවයි. මම හිතනවා, එය, ද්වේෂ සහගත ලෙස මන්ත්‍රීවරුන් අපහසුතාවට පත් කරන්න එතුමා කරපු ප්‍රකාශයක් කියලා. ගරු විමලවීර දිසානායක මැතිතුමා කිව්වා වාගේම, ඔය කියන විධියට රුපියල් ලක්ෂ 4ක් අපි කාටවත් හම්බ වෙන්නේ නැහැ. එතුමා නියෝජනය කරන පක්ෂයේ එතුමාගේ මන්ත්‍රීවරුන්ට රුපියල් ලක්ෂ 4ක් දෙනවාද කියලා අපි දන්නේ නැහැ. මේ මන්ත්‍රීවරුන් එක්ක තිබෙන වෛරය මොකක්ද කියලා අපි දන්නේ නැහැ. මට නම් හිතන්නේ, "යන්න බැරි ගොනා අන්ට පනිනවා වාගේ" අපිත් එක්ක වෛරයක් පිරිමහනවා කියන එකයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාරණයත් කියන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා බඩ ඉරිඟු සම්බන්ධයෙන් කියපු කාරණයට මාත් එකඟ වෙනවා. ඒ එක්කම, ගරු රෝහිණී විජේරත්න මන්ත්‍රීතුමිය කියපු කාරණය ගැන මටත් කියන්න ඕනෑ. ඊයේ ඉඳලා සමාජය අප දිහා බලන්නේ, ධන කුවේරයන් දිහා බලනවා වාගෙයි. ඊයේ අතිගරු ජනාධිපතිතුමා අපට කරන්න තිබෙන ලොකුම අපහාසයත් කළා. කුමන රටක කුමන පාර්ලිමේන්තුවක මන්ත්‍රීවරුන්ට රුපියල් ලක්ෂ 4ක වැටුපක් ගෙවනවාද කියලා අපි දන්නේ නැහැ. අප දන්නා පරිදි, අපේ මූලික වැටුප හැටියට ලැබෙන්නේ, රුපියල් 54,000යි. හැබැයි, සාමාන්‍යයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට දවසකට අඩුම තරමින් රුපියල් 4,000ක, 5,000ක, 6,000ක, 7,000ක පමණ විශාල මුදලක් ඉන්ධනවලට වැය වෙනවා. වාහනය ධාවනය කරන දුර ප්‍රමාණය අනුව එය වෙනස් වෙනවා. [බාධා කිරීමක්] එතුමාගේ පක්ෂයේ මහ ලේකම්තුමාට නම් ඊට වඩා යනවා ඇති.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමා කියන කාරණය තේරෙනවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණාකර මට ඉඩ දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

එහෙනම් ඉක්මනට කියන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

සාමාන්‍යයෙන් අපට දවසකට අවම වශයෙන් රුපියල් 5,000ක වත් ඩීසල් වැය වනවා. එතකොට, මාසයකට රුපියල් ලක්ෂ එකහමාරක විතර ඩීසල් වියදමක් යනවා. ඒ වාගේම, අපි කාර්යාල පවත්වාගෙන යන්න ඕනෑ. ඔය කියන දීමනාව ඇතුළේ අපේ කාර්යාල වියදම්, දුරකථන ගාස්තු සහ අනෙකුත් වියදම්වලට අදාළ මුදලත් ඇතුළත් වෙනවා. මේ සියලු දීමනා ඇතුළුව වුණත් -සියලු දීමනා සහිතව වුණත්- රුපියල් ලක්ෂ 2ක්, දෙකහමාරක් අතර මුදලක් තමයි ලැබෙන්නේ. අපි අපේ අතේ මුදලින් ඩීසල් ටික ගහගන්න ඕනෑ. කාර්යාලයීය දුරකථන බිල් ආදි සියලු දේවල් එකතු වුණාම රුපියල් ලක්ෂ 2ක්, දෙකහමාරක් පමණ හම්බ වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ මුදලින් අපට සති දෙකක් ඇදගෙන යන්න බැහැ. මම හිතන විධියට මාසිකව රුපියල් ලක්ෂ 4ක් වැටුප් ලබන මන්ත්‍රීවරු ශ්‍රී ලංකාවේ නම් නැහැ. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමාට කථා කරන්න කාලය දුන්නා. ඊට වඩා කාලයක් ඔබතුමාට දෙන්න බැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

අතිගරු ජනාධිපතිතුමාගේ පක්ෂය ගැන කියපු නිසායි මම කථා කරන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

එහෙම නම්, ඔබතුමාට අවස්ථාවක් දුන්නු වෙලාවේ ඒ ගැන කථා කරන්න ඕනෑ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ජනාධිපතිතුමාගේ පක්ෂයේ මහ ලේකම්වරයා විධියටයි මම කථා කරන්නේ.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය කිව්වා, "ජනාධිපතිතුමාගේ පක්ෂයේ මන්ත්‍රීවරුන්ට එවැනි වැටුපක් හම්බ වෙනවා ද කියලා දන්නේ නැහැ" කියලා. අපට නම් එවැනි වැටුපක් හම්බ වෙන්නේ නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ ඒක නොවෙයි. අධීක්ෂණ මන්ත්‍රීවරුන්ට අමතර රුපියල් ලක්ෂ දෙකක් ගෙවන්න කියලා කැබිනට් පත්‍රිකාවක් ඊයේ කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා තිබෙනවා. අන්න ඒකයි තිබෙන ප්‍රශ්නය. වෙන එකක් නොවෙයි. අපි කියන්නේ අන්න ඒක නවත්වන්න කියලායි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඇත්ත වශයෙන්ම මේ සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමාගේ අවධානයට යොමු කරවන්න අවශ්‍යයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

හොඳයි, බොහොම ස්තුතියි.

ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the provisions of Standing Order 8 of the Parliament, the hours of sittings of Parliament on this day shall be 1.00 p.m. to 6.30 p.m. At 2.00 p.m., Standing Order 8(5) of the Parliament shall operate. At 6.30 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## මඩකලපුව විශ්වවිද්‍යාල පෞද්ගලික සමාගම පවරා ගැනීම
## மட்டக்களப்புப் பல்கலைக்கழகத் தனியார் நிறுவனத்தைப் பொறுப்பேற்றல்
## TAKEOVER OF BATTICALOA CAMPUS PRIVATE LIMITED

[අ.භා.2.48]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"දේශපාලන බලය පාවිච්චි කරමින් රටේ පවතින නීති උල්ලංඝනය කරමින් සහ නීති විරෝධී ලෙස මුදල් ආයෝජනය කරමින් ආරම්භ කර ඇති Batticaloa Private Campus ආයතනය නිදහස් අධ්‍යාපනයටත්, ජාතික සංහිඳියාවටත් බාධාවක් බවට පත්ව තිබේ. පාර්ලිමේන්තුවේ අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව මඟින් මේ සම්බන්ධව දීර්ඝ විමර්ශනයක් සිදු කර එහි වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබ ඇත. මෙම නීති විරෝධී ආයතනය වහාම රජයට පවරාගෙන එය නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ පීඨ සංකීර්ණයක් බවට පත් කළ යුතු බවටත්, සැක කටයුතු අයුරින් මුදල් ගනුදෙනු සිදු කළ හා නීති විරෝධී ලෙස ක්‍රියා කළ පුද්ගලයන් නීතිය හමුවට ගෙන ආ යුතු බවටත් මෙම ගරු සභාවට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Batticaloa Campus (Pvt.) Limited පිළිබඳව මේ වන විට පාර්ලිමේන්තුවේත් විවිධ කාරක සභා හරහා විමර්ශන සිදු වෙමින් පවතිනවා. විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේ අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවත්, ඒ වාගේම COPE එකත්, අනෙක් පැත්තෙන් 2019 අප්‍රේල් 21 වැනි දින ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාර පිළිබඳව සොයා බලා පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන විශේෂ කාරක සභාවත් මේ පිළිබඳව විමර්ශනය කළා. මා දන්නා හැටියට මීට අමතරව CID එක සහ FCID එක මඟිනුත් මේ සම්බන්ධයෙන් යම් විමර්ශනයක් සිදු කරගෙන යනවා.

දැන් අපේ රටේ රාජ්‍ය නොවන, පෞද්ගලික උපාධි ප්‍රදානය කරන ආයතන ආරම්භ කිරීම සඳහා යම් යම් නීති, අණ පනත් පවතිනවා. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මඟින් රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය ශක්තිමත් කළත්, 1985දී ගෙන එන ලද සංශෝධනය නිසා රාජ්‍ය නොවන පෞද්ගලික උපාධි ප්‍රදානය කරන ආයතන පිහිටුවන්නට යම් අවසරයක් ලබා දීලා තිබෙනවා. එයත් ලබාදී තිබෙන්නේ ආයෝජන මණ්ඩල ව්‍යාපෘති හැටියට ශ්‍රමිකයන් පුහුණු කරන ආයතන සඳහා උපාධි ලබා දෙන්නටයි. ඒ අනුව ඒ සංශෝධන ඉදිරිපත් කිරීමේදී බොහොම පැහැදිලිවම අවසර ගත යුතු රජයේ ආයතන ප්‍රමාණයක් නම් කරලා තිබෙනවා. ඒ ආයතනය ආයෝජන මණ්ඩලයේ ලියා පදිංචි වෙන්නට ඕනෑ. ඒ වාගේම, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ගන්නට ඕනෑ. උපාධියට අදාළ වෘත්තීමය සභාවේ අනුමැතිය ගන්නට ඕනෑ. එය සෞඛ්‍යයට අදාළ එකක් නම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අවසරය ගන්නට ඕනෑ. මේ ආදී රාජ්‍ය ආයතන පද්ධතියක් මඟින් තමයි ඒ අවසර ලබා ගත යුතු වන්නේ. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ලාභ ඉපැයීමේ අරමුණින් ආරම්භ කරන ලද පෞද්ගලික උපාධි ප්‍රදානය කරන ආයතන නිතරම මේ ක්‍රමවේදය කඩමින් තමයි ඉස්සරහට ආවේ. හොඳම උදාහරණය තමයි මේ පාර්ලිමේන්තුවේදීත් අපි සාකච්ඡා කරපු SAITM එක සම්බන්ධ ප්‍රශ්නය. අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විධියට හිටපු කාලයේ ඒ නිසා විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබුණා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
එ් ගැන තවම මොකුත් කිව්වේ නැහැ. ඔබතුමාගේ නම කිව්වා විතරමයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, SAITM එක සම්බන්ධයෙන් මම මෙතුමාට මතක් කිරීමක් කරන්න කැමැතියි. SAITM එක පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවක් දුන්නා. නමුත්, ආණ්ඩුව හදිසි වෙලා ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව දෙන්න කලින් මාසයකට කලින් SAITM එක වහලා දැම්මා. මම අනන්තවත් කිව්වා, SAITM එක වහන්න එපා. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව අපට එනවා. එතකොට අපට SAITM එක නීත්‍යානුකූල කරන්න පුළුවන්, private education ස්ථාපිත වෙනවා කියලා. නමුත් රජය ඒක ඇහුවේ නැහැ. රජය හදිසි වෙලා SAITM එක වහලා දැම්මා. වහලා මාසයක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව ආවා, SAITM එක පිළිගන්න කියලා. සුමානයකට කලින් ඔබතුමන්ලා පත්තරේ දකින්න ඇති, ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කරලා තිබෙනවා SAITM එකේ ශිෂ්‍යයන්ට වන්දි ගෙවන්න කියලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බළලා මල්ලෙන් එළියට පැන්නා. ඒ කියන්නේ SAITM ආයතනය ගැන, ඒකට ලබා දෙන ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ගැන කිරිඇල්ල ඇමතිතුමා මාසයකට කලින් දැන ගෙන හිටියා. ඒක නේ එතුමා ආණ්ඩුවට බල කළා කියලා කියන්නේ, "පොඩ්ඩක් ඉන්න, ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවක් එනවා" කියලා. දැන් ආයෙත් කථා කරන්න දෙයක් නැහැ. ඒක හැන්සාඩ්ගත වෙලා තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව,-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නීතිඥවරයකු විධියට දැනගෙන සිටියා, SAITM එක සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුවක් ලැබෙන බව. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒක දන්නේ නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

තීන්දුව ලැබෙන බව කවුරුත් දන්නවා. නමුත් තීන්දුව මොකක්ද කියලා කවුරුවත් දන්නේ නැහැ. හැබැයි, ඔබතුමා දැනගෙන ඉඳලා තිබෙනවා, මේකට ලැබෙන්නේ ඔය කියන ආකාරයේ තීන්දුවක් කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ වෛද්‍ය ශිෂ්‍යයන් දින 500කට වඩා සත්‍යග්‍රහ කළා, දින 300කට වඩා පන්ති වර්ජනය කළා. ඒ දෙමව්පියන් එකතු වෙලා, විශ්වවිද්‍යාල ආචාර්යවරු එකතු වෙලා SAITM එකේ සිසුන්ටත් සාධාරණයක් වන විසඳුමකට එන්න මේ පාර්ලිමේන්තුව එකඟ වුණා. ඒක හරි වැදගත්. නැත්නම්, ඒ ආයතනයේ සිසුන් රැවටීමකට ලක් වෙනවා. දැන දැනම ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියා පදිංචි නොවූ ආයතනයකට ඇතුළත් වීම සම්බන්ධයෙන් ඔවුන් නොසලකා හරින්න තිබුණා. හැබැයි, SAITM ආයතනයට බැඳුණු සිසුන් ගැනත් සලකා බලා, පසුගිය 2018 ජුනි මාසයේ 20වැනි දා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත මේ පාර්ලිමේන්තුවේ සම්මත කළා. ඒ අනුව බොහොම පැහැදිලිව කිව්වා, එම ආයතනයේ ඉගෙන ගන්නා සිසුන්ටත් KDU උපාධි ලබා ගන්න පුළුවන් කියලා. ඇත්තටම MBBS (SAITM) ගන්න හිටපු අයට MBBS (KDU) ලැබෙනවා කියන්නේ විශේෂ වරප්‍රසාදයක්. හැබැයි, අද වෙනකොට පාර්ලිමේන්තුව විසින් සම්මත කරපු පනත වෙනුවට යම් තීන්දුවක් ලබා දීලා තිබෙනවා. ඒ ප්‍රශ්නය තවදුරටත් ව්‍යාකූල කරන්නේ නැතිව, හිතුවක්කාර ලෙස අත්තනෝමතිකව හැසිරෙන්නේ නැතිව පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද පනත අනුව හැසිරෙන්න කියලා මම මේ සියලු ආයතනවලට මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කාලයේ SAITM එක සඳහා අවසරය ලබා ගෙන, නීතිය කඩකරමින් එතැනට ආවේ එවකට ඇමතිවරයා වෙලා හිටපු එස්.බී.දිසානායක ඇමතිවරයාගේ දේශපාලන බලයත්, නෙවිල් ප්‍රනාන්දු මහතාගේ මුදල් බලයත් පාවිච්චි කරලායි. දැන් මේ අවස්ථාවේ දී Batticaloa Campus එක සඳහා දේශපාලන බලයත්, මුදල් බලයත් හිටපු මන්ත්‍රී හිස්බුල්ලා විසින් පාවිච්චි කරලා තිබෙනවා. මේ ආයතනය ඔවුන් මුලින්ම පටන් ගන්නේ 2013 ජුනි මාසයේ 11 වෙනි දා University College, Batticaloa කියලායි. ඒ කියන්නේ, රට පුරා ඉන්න තරුණ තරුණියන් සඳහා නොමිලේ වෘත්තීය පුහුණු පාඨමාලාවක් ආරම්භ කරන්නට තමයි හිස්බුල්ලා මැතිතුමා සභාපතිත්වය දරන Sri Lanka Hira Foundation එක එවකට තරුණ කටයුතු සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශයත් එක්ක ගිවිසුමකට අත්සන් කරන්නේ. මම එම ගිවිසුම **සභාගත*** කරනවා.

ඒ ගිවිසුම හැටියට, 2013 අගෝස්තු 15 සිට 2016 අගොස්තු 15 දක්වා අවුරුදු තුනක් සඳහා තමයි මේ University College, Batticaloa කියන ආයතනය ආරම්භ කරන්නට රජයත් එක්ක එකඟ වෙන්නේ.

> ඒකේ බොහොම පැහැදිලිව මෙසේ සඳහන් වෙනවා;
>
> "All diploma courses should be opened to the youth of general public Sri Lanka"
>
> ඒ වාගේම ඊළඟට සඳහන් වනවා;
>
> "The diploma courses should be offered on free of charge basis."

මේ විධියට අවසර ගත්ත Sri Lanka Hira Foundation එක, 2014 දෙසැම්බර් 10 වෙනි දා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සමාගමක් හැටියට ලියා පදිංචි වෙනවා. ඒ වාගේම, 2016 මැයි මාසයේ 19වෙනි දා ඔවුන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයත් එක්ක ගිවිසුම්ගත වෙනවා. ඔවුන් ක්‍රමානුකූලව university college එකක ඉඳලා උපාධි ප්‍රදානය කරන campus එකක් දක්වා මේ විධියට පරිවර්තනය වෙනවා.

මේ ඉඩම ලබා ගැනීමේ දී වෙන්නේ මොකක්ද? මේ ඉඩම ලබා ගන්නේ මහවැලි අධිකාරියෙන්. ඒ කාලයේත් මඩකළපුව කෝරළේ පත්තුව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පූනානි නැඟෙනහිර ග්‍රාම නිලධාරි වසමේ මහවැලි බී කලාපයට අයත් අසේලපුර, ජයන්තියාය ඒකකය සම්බන්ධ කරගෙන මහවැලියට වෙනත් සැලැස්මක් තිබුණා. හැබැයි, එහෙම තිබියදී නොමිලයේ වෘත්තීය පුහුණුව ලබා දීමේ මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා කරන ඉල්ලීමක් පිළිබඳව සලකා බලා 2013 ජූලි මාසයේ 24වැනි දා අක්කර 35ක්, අවුරුදු 35ක බද්දට යටත්ව ලබා දෙනවා. ඒ බදු මුදල කීයද? බදු මුදල අක්කරයකට රුපියල් 14,340යි. එම අක්කර 35 සඳහා වසරකට ගෙවන්න ඕනෑ වෙලා තිබුණේ රුපියල් 491,200යි. ඒ කියන්නේ, රුපියල් ලක්ෂ 5කට වඩා අඩු මුදලකට තමයි එම අක්කර 35 බදු ගන්නේ. එතකොට, ඉඩම හරි. ඒ වාගේම BOI එකත් එක්ක ව්‍යාපෘතිය අත්සන් කරලා තිබෙනවා. ඊළඟට ඒ අය මොකද කරන්නේ? ඒ සඳහා සෞදි අරාබියෙන් මුදල් ගෙන්වා ගන්නවා. සෞදි අරාබියේ තිබෙන අබ්දුල්ලා අල් ජෆාලි කියන පදනමෙන් 2016 මාර්තු සහ 2017 ජුනි අතර කාලය තුළ අවස්ථා 7කදී රුපියල් කෝටි 360කට ආසන්න මුදලක්, එහෙම නැත්නම් ඇමෙරිකානු ඩොලර් මිලියන 24.6ක් ගෙන්වා ගන්නවා.

අපි ඒ ක්‍රියාවලිය නීති විරෝධියි කියන්නේ ඇයි? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවෙන්ම එම ඉඩම ලබා ගැනීම නීති විරෝධියි. ඒ සම්බන්ධයෙන් COPE එක විසින් ඉදිරිපත් කළ විගණන වාර්තාව මගේ ළඟ තිබෙනවා. 2012 මාර්තු 15වැනි දින මහවැලි අධිකාරියෙන් එම ඉඩම සඳහා අවසර ලබා ගත්තා. එවකට මහවැලි සංවර්ධන ඇමතිවරයා වශයෙන් කටයුතු කළේ නිමල් සිරිපාල ද සිල්වා මහතා. නොමිලයේ වෘත්තීය පුහුණු අධ්‍යාපනය ලබා දීම සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ගොඩනඟා ගන්න තමයි ඒ වෙලාවේ අවසර ලබා දෙන්නේ. ඒ මොහොතේ ඒ සඳහා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අනුමැතිය ලැබී තිබෙනවා. හැබැයි, සාමාන්‍යයෙන් ඉඩම් බැහැර කරනකොට, එම ඉඩම් බැහැර කිරීමේ යෝජනාව ගැසට් පත්‍රයක් මඟින් පළ කරන්නට ඕනෑ. නමුත් එසේ පළ කරලා නැහැ. ඒ විධියට ඉඩම් බැහැර කරනකොට, මහවැලි අධිකාරියේ භෞතික සැලසුම් කමිටුවේ අධ්‍යක්ෂවරයා විසින් නිර්දේශ කරන්නට ඕනෑ. නමුත් එසේ නිර්දේශ කරලාත් නැහැ. මහවැලි මූලික ඉඩම් පරිහරණය පිළිබඳ සැලැස්ම අවධානයට යොමු කරන්නට ඕනෑ. මොකද, එම ඉඩම, මහවැලි කලාපවල Zone 4A, සිද්ධපුර නගරය ගොඩ නඟන්නට මහවැලි අධිකාරිය විසින් සැලසුම් කරන ලද කලාපයක පිහිටි ඉඩමක්. එසේ තිබියදී ඒ මූලික ඉඩම් පරිහරණ සැලැස්ම නොතකා තමයි එම ඉඩම බැහැර කරන්නේ.

ඊළඟට, පරිසර අධ්‍යයන වාර්තාවක් ගන්නට ඕනෑ. හැබැයි, පරිසර සහ වන සංරක්ෂණ අධ්‍යක්ෂවරයාගෙන් ඒ සඳහා අධ්‍යයන වාර්තාවක් ගන්නේ නැහැ. ඉඩම අරගෙන ඉදි කිරීම්වලින් සියයට 50ක් පමණ අවසන් කරලා තමයි, වාර්තාවක් ලබා දෙන්න කියලා මහවැලියට කියන්නේ. ඉතින් ඒ ඉඩම ලබා ගැනීම සම්බන්ධයෙන් මෙන්න මේ ආකාරයෙන් ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒ අයට දුන්නේ අක්කර 35යි. අක්කර 35ක් දුන්නාට, මේ වෙනකොට මහවැලි අධිකාරියේ වාර්තා මඟින් පෙන්නුම් කරනවා, අක්කර 35ට වඩා අක්කර 8ක් දැනටමත් වැඩිපුර භාවිත කරනවා කියලා. මේ තිබෙන්නේ, මහවැලි අධිකාරිය විසින් නිකුත් කරන ලද Land Occupation Map of Batticaloa Campus (Pvt.) Limited කියන Google Map එක. ඒ අය නීති විරෝධී විධියට දැනටමත් අක්කර 8ක් බලහත්කාරයෙන් පරිහරණය කරනවා. ඒ අතරේ තවත් අක්කර 45ක් ගැනීම සඳහා ඔවුන් අවසරය පතනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොදු කටයුත්තක් සඳහා, ඒ කියන්නේ අපේ රටේ තරුණ තරුණියන්ට නොමිලයේ අධ්‍යාපනය ලබා දෙන්නටයි රජය විසින් එම ඉඩම වෙන් කරන්නේ. එසේ වෙන් කර තිබියදී තමයි දේශපාලන බලය පාවිච්චි කරලා, කූට උපක්‍රම පාවිච්චි කරලා, ක්‍රමානුකූලව මෙය උපාධි විකුණන ආයතනයක් බවට පත් කරමින් යන්නේ. එම ඉඩමේ ගොඩනැඟිලි ඉදි කරලා තිබෙනවා. එම ගොඩනැඟිලි පිළිබඳව රටට වාර්තා කළ හැටි අපි මාධ්‍යවලින් දැක්කා. සාමාන්‍යයෙන් ගොඩනැඟිල්ලක් ඉදි කරනකොට ප්‍රාදේශීය සභාවෙන් ගන්න ඕනෑ අනුමැතියවත් එම ගොඩනැඟිලි ඉදි කිරීමේදී ලබාගෙන නැහැ.

ඊළඟට, එම ඉදි කිරීම නීති විරෝධී වෙන්නේ මෙන්න මේ නිසායි. හිටපු මන්ත්‍රීවරයා, හිටපු ආණ්ඩුකාරතුමා වන හිස්බුල්ලා මහතා 1993 වාගේ කාලයේ "හීරා පදනම" ආරම්භ කරලා තිබෙනවා. එය එක වෙලාවක "Sri Lanka Hira Foundation" එක වෙනවා. පසුව "Hira Foundation" වෙනවා. හැබැයි, එම ආයතනය රටේ සාමාන්‍ය නීතියේ හැටියට 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියා පදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියා පදිංචි කරලාත් නැහැ. එම නිසා, එතැනත් නීති විරෝධීභාවයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ කාලයෙන් විනාඩි පහක් ගන්නවා.

මෙතැන තිබෙන තවත් ප්‍රශ්නයක් තමයි, මේ ආයතනය සඳහා මුදල් ලැබුණු ආකාරය. මේ සම්බන්ධයෙන් තිබෙන බරපතළම ප්‍රශ්නය ඒකයි. මේ ආයතනය සඳහා මුදල් ලැබිලා තිබෙන්නේ සවුදි අරාබියෙන්. හැබැයි, මේ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින හිස්බුල්ලා මහත්මයාට හෝ ඔහුගේ පුත්‍රයාට මේක ණයක්ද, ප්‍රදානයක්ද කියලා හරියට කියා ගන්න බැරි වුණා. ඔවුන් ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු කාරක සභාවට කියලා තිබෙන්නේ මොනවාද? පාර්ලිමේන්තු කාරක සභාවේදී අප මේ ප්‍රශ්නය ඇහුවාම, හිස්බුල්ලා මහත්මයා මෙන්න මෙහෙම කියනවා: “We signed an agreement with the Sheikh Ali Abdulla Al Juffali Foundation Charity Fund based in Jeddah, Saudi Arabia. We had a meeting with them, signed an agreement and got the money. That was a soft loan with no interest, which we have to start to pay back after five years and it has to be paid in 15 years. We got money through the Bank of Ceylon”. මුලදී මෙය ණයක්ද, ප්‍රදානයක්ද කියා හරියට කියා ගන්න බැරිව ඉඳලා, එක වෙලාවක හිස්බුල්ලා මහත්මයා කියනවා, මේක ණයක් කියලා. හැබැයි ප්‍රශ්නය මේකයි. මේ ණය ලැබෙනකොට, ඒ ණය ගිවිසුම ඉදිරිපත් කළ යුතු ආයතනවලට ණය ගිවිසුම ඉදිරිපත් කරලා නැහැ. ඔවුන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට මේ ණය ගිවිසුම දීලා නැහැ; උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට දීලා නැහැ; ලංකා බැංකුවටත් දීලා නැහැ.

අනෙක් කාරණය මේකයි. මේ ආයතනයට ණයක් ගන්නවාය කිව්වාට, ඒ ණය ගෙවන්නේ කොහොමද? මේ ණය ලබාගෙන තිබෙන්නේ එහෙම ගෙවන්න පුළුවන් account එකකින් නොවෙයි. ඒ නිසා, මේ මුදල් ලැබීම පිළිබඳව මීට වඩා දැඩි පරීක්ෂණයක් කළ යුතු බවයි මම නම් හිතන්නේ.

ඊළඟට, මෙන්න මේ කාරණයත් වැදගත්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2019 ජූලි 19වන දින පළ වූ "ලංකාදීප" පුවත් පත මෙන්න මෙහෙම ප්‍රවෘත්තියක් වාර්තා කර තිබුණා:

"හිස්බුල්ලා සරසවියට සෞදි තහනම් සංවිධානයකින් කෝටි 1757ක්"

ඒ කියන්නේ, අපට වාර්තා වෙලා තිබෙන මුදලටත් වඩා වැඩි මුදලක් මෙම ආයතනයට ලැබිලා තිබෙනවා. ඒ සිද්ධිය සම්බන්ධයෙන් FCID එක පරීක්ෂණයක් ආරම්භ කර තිබෙන බව තමයි එම පුවත් පත් වාර්තාවේ සඳහන් වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය-පෞද්ගලික හවුල් සමාගමක් හැටියට 2013 වර්ෂයේ තමයි මේ ආයතනය ආරම්භ කරන්නේ. මේ ආයතනය ආරම්භ කරන එක පාර්ශ්වයක් වුණේ එම රජයේ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයයි. අනෙක් පාර්ශ්වය වූයේ හිරා පදනමයි. හිරා පදනමේ සභාපතිවරයා ලෙස කටයුතු කරන්නේ හිස්බුල්ලා මැතිතුමායි; නැඟෙනහිර පළාතේ හිටපු ආණ්ඩුකාරතුමායි. එතුමා රජයත් සමඟ එහෙම ගනුදෙනුවක් කිරීම අපේ රටේ නීතියට කොයි තරම් ගැළපෙනවාද කියන එක අප සිතා බලන්න ඕනෑ. පැහැදිලිවම, බැඳියාවන් අතර ගැටුමක් - conflict of interest - යටතට වැටෙන තත්ත්වයේ වරදක් ඔහු මෙතැනදී කර තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, රජයේ නියෝජ්‍ය ඇමතිවරයකු ලෙස හිඳිමින්, ඔහුගේ වරප්‍රසාද පාවිච්චි කරලා තමයි මේ ඒ ගනුදෙනු සිදු කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ සිටින රාජිත සේනාරත්න ඇමතිතුමාට එරෙහිව 2000 වර්ෂයේ අප්‍රේල් මාසයේදී ඩිලාන් පෙරේරා මන්ත්‍රීවරයා විසින් ගොනු කරන ලද නඩුවකට අනුව, රාජිත සේනාරත්න මන්ත්‍රීවරයාගේ මන්ත්‍රී ධුරය අහිමි වුණු බව ඔබතුමා දන්නවා. එවැනිම ආකාරයකට, රජයත් සමඟ ගනුදෙනු කිරීමේ පදනම යටතේ, අතීතයට බල පැවැත්වෙන පරිදි, හිස්බුල්ලා මහත්මයාගේ මන්ත්‍රී ධුරය අහෝසි කරන්න පුළුවන්. මා දන්නා හැටියට නීතිපති දෙපාර්තමේන්තුව දැනටමත් පාර්ලිමේන්තුවට මේ ගැන දන්වා තිබෙනවා. මෙවැනි ගනුදෙනුවක් කිරීම නිසා, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

91.(1) (ඊ) ව්‍යවස්ථාව අනුව, ඒ ගිවිසුමට ඇතුළත් වුණු 2013.06.11වන දා සිට ඔහුගේ මන්ත්‍රී ධුරය අවලංගු කිරීමේ හැකියාවක් පවතින බව ඔවුන් කියා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 100වන ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වෙනවා:

"යම් කිසි තැනැත්තකු තමා නුසුදුස්සකු වී ඇති බව හෝ තමාගේ ආසනය හිස් වී ඇති බව හෝ දැන දැනම නැතහොත් ඒ බව දැන ගැනීමට ප්‍රමාණවත් හේතු තිබිය දී -

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කරන ලද අවස්ථාවේ දී එසේ තෝරා පත් කරනු ලැබීමට සුදුසුකම් නොමැතිව සිටි නමුත් එසේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබ පාර්ලිමේන්තුවේ අසුන් ගතහොත් හෝ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දුනහොත්: හෝ

(ආ) පාර්ලිමේන්තුවේ ස්වකීය ආසනය හිස්වීමෙන් පසුව හෝ පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට හෝ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දීමට හෝ තමා නුසුදුස්සෙකු වූ පසු පාර්ලිමේන්තුවේ අසුන් ගතහොත් හෝ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දුන්හොත්,

ඒ තැනැත්තා එසේ අසුන් ගන්නා වූ හෝ ඡන්දය දෙන්නා වූ හෝ එක් එක් දවස වෙනුවෙන් රුපියල් පන්සියය බැගින් වූ දණ්ඩන මුදලකට යටත් වන්නේ ය. ඒ දණ්ඩන මුදල ජනරජයට අය විය යුතු වූ ණය මුදලක් සේ නීතිපතිවරයා විසින් කොළඹ දිසා අධිකරණයේ නඩුවක් පැවරීමෙන් අය කර ගත යුත්තේ ය."

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
හොඳයි.

බොහොම පැහැදිලියි, මෙය අර SAITM ආයතනය හා සමානවම නීති විරෝධී ආයතනයක් බව. දේශපාලන බලය, මුදල් බලය පාවිච්චි කරලා, සවුදි අරාබියෙන් හෝ වෙනත් රටවලින් මුදල් ගරා ගැනීම සඳහා සිදු කරන ලද ජාවාරමක් හැටියටයි මේක හඳුන්වන්න වෙන්නේ. ඇත්තටම මේ රටේ අධ්‍යාපනය ව්‍යාප්ත කරන්නට, විශේෂයෙන් නැඟෙනහිර පළාතේ දරුවන්ට තිබෙන උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කරන්නට එතුමාට ඕනෑකමක් තිබුණා නම්, රජයත් එක්ක එකතු වෙලා එතුමාට මීට වඩා දේවල් කරන්න ඉඩ කඩ තිබුණා. හැබැයි, එහෙම කරනවා වෙනුවට එතුමා මොනවාද මේ කරලා තිබෙන්නේ? මේ ඉඩම අරගෙන තිබෙන්නේත් නීත්‍යනුකූලව නොවෙයි. මේ මුදල් හොයා ගෙන තිබෙන්නේත් නීත්‍යනුකූලව නොවෙයි. ඒ මදිවාට එතුමාගේ මන්ත්‍රී ධුරය, නියෝජ්‍ය ඇමතිකම පාවිච්චි කර තිබෙනවා, මේවාට අවසර ලබා ගැනීම සහ මේ කටයුත්ත සඳහා. ඒ නිසා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව යෝජනා කරනවා, මේ Batticaloa Campus (Pvt.) Limited ආයතනය රජයට පවරා ගෙන, එය නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ පීඨ සංකීර්ණයක් බවට පත් කරන ලෙස හා මේ අයථා ගනු දෙනුවට සම්බන්ධ වූ, නීති විරෝධීව කටයුතු කළ අය නීතිය හමුවට පමුණුවන්න කියලා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ යෝජනාව ස්ථිර කිරීම, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 35ක කාලයක් තිබෙනවා.

ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹர்ஷன ராஜகருணா அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. HARSHANA RAJAKARUNA *took the Chair.*

[අ.භා.3.08]

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව, Batticaloa Campus (Pvt.) Limited සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ වාර්තාව පිළිබඳව සාකච්ඡා කරන මේ විවාදයේදී, එම ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිවරයා වශයෙන් මට කථා කරන්න ලැබීම සන්තෝෂයට කරුණක්.

අද සභාව කල් තබන අවස්ථාවේ මේ යෝජනාව ඉදිරිපත් කළ ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාත් අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයෙක්. Batticaloa Campus (Pvt.) Limited හරහා මුදල් අවභාවිත කරමින් නීති විරෝධී අන්දමින් කරන ලද කාර්යයන් රාශියක් අපි අධ්‍යයනය කළා. ඒ සියල්ල නිසා, නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ මණ්ඩපයක් ලෙස මුලින්ම එය රජයට පවරා ගන්නත්, ඊට පස්සේ ඉදිරි ක්‍රියාමාර්ග ගන්නත් අපි අවසාන වශයෙන් නිර්දේශ කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාර්තාව සකසා තිබෙන්නේ, අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවේ මන්ත්‍රීවරු සියලුදෙනාගේම සහභාගිත්වයෙන්. එම කාරක සභාව ඉදිරිපත් කරන ලද මෙම වාර්තාව එක පුද්ගලයකුගේ වාර්තාවක්, එහෙම නැත්නම් එක පුද්ගලයකුගේ මතයක් කියලා යම් කිසි කෙනකු කියන්න හදනවා නම්, ඒක සම්පූර්ණයෙන් වැරදියි. මම මුලින්ම ඒක නිෂ්ප්‍රභ කරන්න ඕනෑ.

ඊළඟට, මේ වාර්තාවට පිළිතුරු දෙන්න හිස්බුල්ලා මහතා පොතක් හදලා තිබෙනවා. ඒ පොත දැන් මගේ අතේ තිබෙනවා. මේ පොතේ සෑම තැනකම සඳහන් වෙනවා, මේක ආශු මාරසිංහගේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් සඳහා සකසපු වාර්තාවක් කියලා. මම ඒක ප්‍රතික්ෂේප කරනවා. පෞද්ගලික මන්ත්‍රී යෝජනා ඉදිරිපත් වන්නේත් රටේ ජනතාවගේ ප්‍රශ්න ගැන කථා කරන්නයි. එහෙම නැතිව, ගෙදර ප්‍රශ්න ගැන කථා කරන්න නොවෙයි ඒවා ඉදිරිපත් කරන්නේ. මගේ පෞද්ගලික ප්‍රශ්න ගැන කථා කරන්න නොවෙයි, මම පෞද්ගලික මන්ත්‍රී යෝජනා ඉදිරිපත් කරන්නේ. ඒවා හරහා කෙරෙන්නේ රටේ ජනතාවගේ ප්‍රශ්න ගැන සාකච්ඡා කරන එකයි. මට අයිතියක් තිබෙනවා, මේ ප්‍රශ්නය ගැන පාර්ලිමේන්තුවට මගේ අදහස ඉදිරිපත් කරන්න. මගේ අදහස මම මුලින්ම ඉදිරිපත් කළා. ඒක ඇත්ත. පෞද්ගලික මන්ත්‍රී යෝජනා ඉදිරිපත් වෙනවා. ඒවා න්‍යාය පුස්තකයේ තිබෙනවා. සමහර ඒවා විවාදයට ගන්නවා. සමහර ඒවා යටපත් වෙලා යනවා. එහෙම කියලා, රටේ ජනතාවගේ ප්‍රශ්නයක් සාකච්ඡා නොකර ඉන්න කිසිම වෙලාවක අපට බැහැ.

අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී අපි දීර්ඝ වශයෙන් මේ ප්‍රශ්නය ගැන සාකච්ඡා කළා. මේ ප්‍රශ්නය අපි සාකච්ඡා කළේ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුවයි කියලා කිසියම් කෙනකු අර්ථ දක්වන්න හදනවා නම්, ඒක සම්පූර්ණයෙන් වැරදියි. මුස්ලිම් අන්තවාදය ගැනවත්, වහබ්වාදය ගැනවත් තිබෙන ප්‍රශ්නයක් නොවෙයි මෙතැන තිබෙන්නේ.

නීති පද්ධතියට පරිබාහිරව, මේ රටට අහිතකර විධියට පටන් ගත් ආයතනයක් මේක. විශේෂයෙන් උසස් අධ්‍යාපන ආයතනයක් සම්බන්ධයෙන් තිබෙන මූලික සිද්ධාන්තවලට පරිබාහිරව පටන් ගත් ආයතනයක්. එම නිසා මේ ප්‍රශ්නය ඒ ආයතනය සම්බන්ධයෙන් වූ ප්‍රශ්නයක් වාගේම, ජාතියේත් ප්‍රශ්නයක්. එහෙම නැතිව මේ ප්‍රශ්නය පෞද්ගලිකව එක් එක් කෙනාගේ ප්‍රශ්නයක් නොවෙයි. කිසිම කෙනෙකු මේ සඳහා ජාතිවාදයවත්, වෙනත් කිසිම දෙයක්වත් ගාවගන්න අවශ්‍ය නැහැ. මේ දෙස නිවැරදි හා නිරවුල් දැසින් බලන්න. ඒක තමයි අපි ඉල්ලන්නේ. මේ වාර්තාවේ සඳහන් කරලා තිබෙන්නේත් ඒකයි. ඒ වාගේම මේක දීර්ඝ ඉතිහාසයක් තිබෙන කථාවක්.

මේ ප්‍රශ්නයට සම්බන්ධ හිරා පදනමේ ඉතිහාසය මුලින්ම අපි බලමු. මට කලින් කථා කළ නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාත් මේ ගැන කථා කළා. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයෙන් මේ සංවිධානය පිළිබඳව අපි විමසා සිටියා. හිරා පදනම නමින් සංවිධාන දෙකක් තිබුණා. එකක් තමයි, "ශ්‍රී ලංකා හිරා පදනම." අනික, "හිරා පදනම." රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ නිරීක්ෂණ වාර්තාව අපට ලැබුණා. අපි ජුනි මස 21 වෙනි දා ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පස්සේ 26 වෙනි දා තමයි අපට මේ වාර්තාව ලැබුණේ. එම නිසා අපට ලැබුණු මේ වාර්තාව අපේ ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තාවට ඇතුළත් කරන්න බැරි වුණා. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ නිරීක්ෂණ වාර්තාව හැන්සාඩගත කිරීම සඳහා මා **සභාගත*** කරනවා.

එම වාර්තාවේ පැහැදිලිව මෙසේ සඳහන්ව තිබෙනවා:

> "මෙම ආයතනය රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා 2011.07.06 දින මෙම කාර්යාලය වෙත අයදුම්පත්‍රයක් ඉදිරිපත් කොට ඇත. එවැනි ලියාපදිංචියක් සිදු කිරීමේදී අනුගමනය කරන සාමාන්‍ය ක්‍රියාපටිපාටියට අනුව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය බුද්ධි අංශයේ නිෂ්කාසනය ලබා ගැනීම සඳහා රාජ්‍ය බුද්ධි අංශය වෙත යොමු කර ඇත. එයට ප්‍රතිචාර වශයෙන් ජාතික බුද්ධි ප්‍රධානී විසින් අහිතකර බුද්ධි වාර්තාවක් (adverse notice) ලබා දී ඇත."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ඉතාම වැදගත් කාරණයක්. මේ ලේඛනයේ පැහැදිලිව කියනවා, adverse notice එකක් ලබා දී තිබෙන බව. එම ලේඛනයේ වැඩිදුරටත් මෙසේ සඳහන් වනවා:

> "ඒ අනුව බුද්ධි අංශ නිර්දේශය ලබා නොදීම නිසා මෙම ආයතනය ලියාපදිංචි කළ නොහැකි බව රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ එකල හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අංක MOD/NGO/1927 හා 2012.04.18 දිනැති ලිපිය මඟින් මෙම ආයතනය වෙත දන්වා යවා ඇත."

මෙහි ලිපියකුත් තිබෙනවා. එම ලිපිය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයෙන් එවා තිබෙන්නේ. එය address කර තිබෙන්නේ, "Hon. M.L.A.M. Hizbullah (MP), Deputy Minister of Child Development and Women's Affairs, Chairman, Hira Foundation" ලෙස. මේ ලිපියේ මාතෘකාව තිබෙන්නේ, "Registration of 'Hira Foundation' " කියලා. මෙය අත්සන් කර තිබෙන්නේ ලක්ෂ්මන් හුළුගල්ල මහතා, Director General විධියට. එහි මෙසේ සඳහන් වෙනවා:

> "I regret to inform you that the NGO Secretariat is not in the position to register 'Hira Foundation' as a NGO since the Intelligence Agencies have not recommended the registration of your organization."

එහි පැහැදිලිව කියලා තිබෙනවා, මේ සංවිධානය අහිතකර සංවිධානයක්, NGO Secretariat එකේ මේක register කරන්න බැහැ කියලා. මේක තමයි, හිරා පදනමේ ඉතිහාසය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ලිපියත් මම **සභාගත*** කරනවා.

මේ හිරා පදනම තමයි වෘත්තීය පුහුණු අමාත්‍යාංශය එක්ක ගිවිසුමක් අත්සන් කරන්නේ. මේ ගිවිසුම අත්සන් කරන්නේ මඩකළපුවේ පුනානි ප්‍රදේශයේ තාක්ෂණ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කරන්නයි. ඒ, 2013 මාර්තු 12වන දා. ඒ වාගේම මෙම ගිවිසුම අත්සන් කිරීම සම්බන්ධයෙන් නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා කියපු කාරණය හා සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලැබුණු ලියුමක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ඉතිහාසගත වන ලිපියක්. හිස්බුල්ලා මහතා කියන්න හදනවා, ආංශික අධීක්ෂණ කාරක සභාව හදපු මේ වාර්තාව බොරු කියලා. එතුමා මාධ්‍ය සංදර්ශනයක් පවත්වා කරන්න යන සියල්ල බොරුවක් කියලා මේ document එකෙන් කියා තිබෙනවා. මෙන්න ඒ වාර්තාව. මේක ලියන්නේ කවුද? අපට මේ ලිපිය ලැබෙන්නේ නීතිපති දෙපාර්තමේන්තුවෙන්. මේක ලැබෙන්නේ, "Secretary, Sectoral Oversight Committee on Education and Human Resources Development" යන ලිපිනයට. අපේ වාර්තාව සම්බන්ධයෙන් අධ්‍යයනයක් කරන්න කියලා අපි කාරණා දෙකක් සම්බන්ධයෙන් නීතිපතිතුමාගෙන් උපදෙස් ඉල්ලුවා. ඒ උපදෙස් ඉල්ලන ලද එක් කාරණයක් තමයි, මෙතැන බැඳියා අතර ප්‍රශ්නයක් - conflict of interest - තිබීම. ඒ බැඳියා අතර ප්‍රශ්නය ගැන විමර්ශනයක් කරන්න කියලාත් අපි උපදෙස් ඉල්ලුවා. ඒ අනුව අපි කාරණා දෙකක් සම්බන්ධයෙන් උපදෙස් ඉල්ලුවා.

එකක් තමයි, හිස්බුල්ලා මහතා හිරා පදනමේ සභාපතිවරයා හැටියට ඉඳගෙන වෘත්තීය පුහුණු අමාත්‍යාංශය එක්ක ගිවිසුමක් අත්සන් කිරීම. ඒ ගිවිසුම අත්සන් කරන්නේ එවකට වෘත්තීය පුහුණු ඇමතිවරයා හැටියට සිටි ඩලස් අලහප්පෙරුම මැතිතුමාත් එක්ක. "රජයත් සමඟ ඉඳගෙන ගිවිසුමක් අත්සන් කරන්න බැහැ" කියලා පැහැදිලිව මේ ලිපියේ නීතිපති දෙපාර්තමේන්තුව සඳහන් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි.

හිරා පදනම 2015.07.17 වැනි දා BOI එකත් එක්ක අත්සන් කරපු ගිවිසුමත් නීති විරෝධී බව කියා තිබෙනවා. එතුමා එවකට නියෝජ්‍ය ඇමතිවරයකු හැටියට ඉඳගෙන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයත් එක්ක -රජයත් එක්ක- තමයි මේ ගිවිසුම අත්සන් කරන්නේ. නීතිපතිතුමා කියනවා, මේ ගිවිසුම් දෙකම නීති විරෝධියි කියලා. හිස්බුල්ලා මහතාගේ වැඩ ගැන කථා කරන්න, මීට වඩා තව මොනවත් ඕනෑද? ඒ නිසා ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව මම ස්ථිර කරනවා. නීතිපති දෙපාර්තමේන්තුවේ මේ ලිපියත් මම **සභාගත*** කරනවා.

එම ලිපියේ මෙසේ කියා තිබෙනවා:

> "In terms of Article 91(1)(e) of the Constitution, Mr. Hizbullah would not have been entitled to sit and vote as a Member of Parliament with effect from 11.06.2013, which is the date on which the MOU between Sri Lanka Hira Foundation and the Ministry of Youth Affairs and Skills Development was signed by him as its Chairman."

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

එම ලිපියේ පැහැදිලිවම කියනවා, "2013.06.11 වැනි දා සිට හිස්බුල්ලා මහතාට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස මේ පාර්ලිමේන්තුවේ රැඳී සිටිය නොහැකියි" කියලා.

නීතිපති දෙපාර්තමේන්තුවෙන් එවා තිබෙන මේ ලිපියේම කියා තිබෙනවා, "Dilan Perera v. Rajitha Senaratne" කියන කාරණයත්. ඒක ඉතිහාසයේ තිබුණු තවත් එක් නඩුවක්. මන්ත්‍රීවරු විධියට හිටපු පුද්ගලයන් දෙදෙනෙකුගෙන් එක් පුද්ගලයකු කියනවා, "ඔබ මන්ත්‍රීවරයකු හැටියට සුදුසු නැහැ" කියලා. නමුත්, ඉතිහාසයේ ප්‍රථම වතාවට නීතිපති දෙපාර්තමේන්තුව කියනවා, "හිස්බුල්ලා මහතා මන්ත්‍රීවරයෙකු හැටියට සුදුසු නැහැ" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක තමයි ලියවිල්ල; මේක තමයි, මේ රටට කරන එළිදරව්ව. මේ අපි සාකච්ඡා කරන අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව සත්‍යයක් බවට නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලැබුණු සහතිකයට වඩා වෙන සහතිකයක් අවශ්‍ය නැහැ. එම ආංශික අධීක්ෂණ කාරක සභාවේ සියලු සාමාජික මන්ත්‍රීවරුන්ට මම ගෞරව කරනවා. අපි එක පේළියට එකට ඉඳගෙනයි මේ කටයුතු කළේ. මම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට ඉඳගෙනයි මේ කටයුතු කළේ. ඒ නිසා අපි සියලුදෙනාම එකතුව එක හඬින් කිව්වේ, "අපි මේ සත්‍ය හෙළි කළ යුතුයි" කියලායි. අපි අද කථා කරන්නේ ඒ සත්‍ය. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ ගරු සභාවේ සියලුදෙනා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තාවත් එක්ක එකඟ වෙයි කියලා.

එම ආයතනය හදන්න 2013 වර්ෂයේදී තමයි මුලින්ම ඉඩමක් ලැබෙන්නේ. 2013දී මහවැලි අමාත්‍යාංශයෙන් ඉඩමක් ඉල්ලනවා, ග්‍රාමීය පුහුණු මධ්‍යස්ථානයක් හදන්න. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය 2013.07.24 දින ශ්‍රී ලංකා හිරා පදනමට ග්‍රාමීය පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යෑම සඳහා අසේලපුර ප්‍රදේශයෙන් අක්කර 35ක බිම් කොටසක් අවුරුදු 35කට බදු දෙනවා. මේ ඉඩම බදු දෙන්නේ මහවැලියෙන්. මේ රටේ හිටපු එවකට මහවැලිය භාර ඇමතිවරයා කවුද? ඒ තමයි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ කාලයේ තමයි අක්කරයක් වර්ෂයකට රුපියල් 14,000කට බදු දෙන්නේ. එතකොට අක්කර 35ටම වාර්ෂික බදු මුදල, රුපියල් 491,200යි. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා 2013දී බදු දෙන ඒ ඉඩම අවසානයේදී සත්‍ය බදු ගිවිසුමක් හැටියට අත්සන් කරන්නේ, 2018දී නැවතත් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මහවැලි ඇමතිවරයා වශයෙන්. 2013 මහවැලි ඇමතිවරයා ලෙස අවුරුදු 35කට බදු දෙන ඉඩම, සත්‍ය බදු ගිවිසුමක් හැටියට 2018දීත් මහවැලි ඇමතිවරයා වශයෙන් අත්සන් කරනවා.

මේ ඉඩම ලැබුණාට පසු අපි ඒ සම්බන්ධයෙන් බැලුවා. අපි නිරීක්ෂණ චාරිකාවට සහභාගි වුණා. මේ ඉඩමේ අක්කර 35ක් තිබෙනවා. දුටු පමණින්, බැලූ බැල්මෙන් අපි දැක්කා, මේ ඉඩම අක්කර 35කට වැඩි බව. ඒ නිසා මේ සම්බන්ධයෙන් මහවැලි අධිකාරියෙන් අපි පරීක්ෂණයක් ඉල්ලුවා. ඒ අපි ඉල්ලූ පරීක්ෂණයට අනුව මහවැලි අධිකාරිය පැහැදිලිවම ප්‍රකාශ කර තිබෙනවා, මේ අක්කර 35ට අමතරව තවත් අක්කර 8ක අනවසර ඉදිකිරීම් සිදුකර තිබෙන බව.

අපේ ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තාවට පිළිතුරු දෙමින් හිස්බුල්ලා මැතිතුමා හදලා තිබෙන වාර්තාවේ තිබෙනවා,"නැහැ, high-tension power line එකක් ගියා. තව ඇළක් තිබෙනවා. ඒක ඇතුළේ අක්කර අටක් තිබුණා. ඒ අක්කර අට තමයි මම එළියෙන් අල්ලා ගත්තේ" කියලා. නමුත්, මහවැලි අධිකාරිය කියනවා, නැහැ, ඒ high-tension power line එකටයි, ඒ ඇළටයි අයිති ඉඩමට පරිබාහිරව තමයි අක්කර 35ක් ඇතුළේ තිබෙන්නේ කියලා. ඒ අක්කර 35ට පරිබාහිරව තව අක්කර 8ක ප්‍රමාණයක් ඇතුළේත් තිබෙනවා. නමුත් හිස්බුල්ලා මහතා හිතනවා, එහෙම නැහැ කියලා. එළියෙන් තව අක්කර 8කුත් අල්ලාගෙන buildings හදනවා.

ඉතින් මොකක්ද මේ රටේ තිබෙන නීතිය? ඒ ගැන තමයි අපි අද මේ ප්‍රශ්න කරන්නේ. අපි මේ සටන් කරන්නේ, නීතිය වෙනුවෙන්. මේ කාරණයට මහවැලි අධිකාරියේ නිලධාරි මහත්වරු පැහැදිලිව පිළිතුරු ලබා දීලා තිබෙනවා. ඔවුන්ගේ නිරීක්ෂණවල පැහැදිලිවම තිබෙනවා, මේ අක්කර 35ට පරිබාහිරව මේ අක්කර 8 පරිහරණය කරනවා, ඒක නීති විරෝධියි කියලා. අපි වාර්තාවක් ලබා ගත්තා, ආංශික අධීක්ෂණ කාරක සභාවට. අපි උපදෙස් දුන්නා, ඒ ඉඩම නීති විරෝධී නම්, ඒක පවරා ගන්න වහාම ක්‍රියා කරන්න කියලා.

ඊළඟට, මේ ආයතනයට මුදල් ලැබීම සම්බන්ධයෙන් බලමු. මම කලින් ප්‍රකාශ කළා, මෙම ආයතනය සම්බන්ධයෙන් අපි පරීක්ෂණ කළේ අප්‍රේල් 21 වැනි දාට කලින් ඉඳලා බව. අපි අප්‍රේල් 21 වැනි දාට කලින් රැස්වුණා, 2019 මාර්තු 14 වැනි දා. එවකට ඒ ආයතනයේ සභාපතිවරයා හැටියට හිටිය හිස්බුල්ලා මහතා ආණ්ඩුකාරවරයා වීමත් සමඟ ඒ සභාපති ධුරයෙන් අයින් වෙලා තිබුණා. 2019 මාර්තු 14 වැනි දා අපි කාරක සභාව රැස්වුණාම, ඒකට ආවේ එතුමාගේ පුතා වන හිරාස් හිස්බුල්ලා මහතා. හිරාස් හිස්බුල්ලා මහතාගෙන් මේ ආයතනයේ ප්‍රාග්ධනය පිළිබඳව කාරක සභාව විමසුවාම, ඒකට පිළිතුරු දෙමින් ආයතනයේ සභාපති කියන්නේ, සවුදි අරාබියාවේ පරිත්‍යාගශීලීන්ගේ සුහදත්වය මත මෙම ව්‍යාපෘතියට ආධාර ලබාදී ඇති බවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ඉතාම වැදගත් කාරණයක්. මේකට ලැබුණු මුදල්, ආධාර - donations - කියලායි කියන්නේ.

මේ වාර්තාව මෙහෙම තියාගෙන, අපි නැවත හිරාස් හිස්බුල්ලා මහතා සහ මොහොමඩ් හිස්බුල්ලා මහතා වන හිටපු ආණ්ඩුකාරතුමා පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභාවට කැඳෙව්වා. ඒ සියලු සාකච්ඡා පටිගත කරලා තිබෙනවා. ඒ නිසා ඒ කියපු ඒවා බොරු කියන්න බැහැ, කාටවත්. ඒ සාකච්ඡාවේදී අපි ඇසූ ප්‍රශ්නවලට හිරාස් හිස්බුල්ලා මහතා කියනවා, මේ මුදල් ලැබුණේ ආධාර හැටියට කියලා. ණය හැටියට ලැබුණා කියන්නේ නැහැ. අපි කෙළින්ම ඇහුවා, මේ මුදල් ණයක් හැටියටද ලැබුණේ, ආධාර හැටියටද කියලා. ඒ විධියට රටට ආධාර ලබා ගන්නවා නම් බොහොම හොඳයි. නමුත්, ඒවා ලබාගන්නා ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදය හරහා ලබාගන්නවා නම් කිසිම ප්‍රශ්නයක් නැහැ. ආධාර හැටියට ලබා ගත්තාද කියලා ඇහුවාම, හිටපු ආණ්ඩුකාර හිස්බුල්ලා මහතා - පියා - කියනවා, නැහැ, එයා පොඩි ළමයෙක් නේ. එයාට වරදින්න ඇති කියලා. එතුමා ඒ කියපු වචන මම ඒ ආකාරයටමයි කියන්නේ. "එයා පොඩි ළමයෙක් නේ. එයාට වරදින්න ඇති. මම එය නිවැරැදි කරනවා. මේ මුදල් ආධාර හැටියට නොවෙයි, ණයක් හැටියටයි ලැබුණේ" කියලා එතුමා කිව්වා. ඒ කාරණය තමයි අපි ප්‍රථම වතාවට ඇහුවේ. අපේ ඒ කාරක සභාවේ හිටපු සහෝදර මන්ත්‍රීවරුන්, මන්ත්‍රීතුමියන්ලා මා මේ කියන කාරණයට සාක්ෂි දරයි. ඒ අවස්ථාවේදී සභාපතිවරයා හැටියට මා ප්‍රශ්න කළා, පොඩි ළමයකු කියන පුතාද, මේ Batticaloa Campus (Pvt.) Limited ආයතනයේ වර්තමාන සභාපති, පොඩි ළමයකු කියන පුතාට පුළුවන්ද මේ ආයතනය පවත්වාගෙන යන්න? කියලා. මෙය තමයි ලොකුම බොරුව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කීප වතාවක්ම කියා සිටියා, -

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමනි, එතුමාට ප්‍රශ්නයක් අහන්න අවසර දෙන්න පුළුවන්ද?

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
පුළුවන්. එතුමාට ප්‍රශ්නය අහන්න කියන්න.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පැහැදිලි කිරීම මා ඉතා හොඳින් අහගෙන සිටියා. ඒ පුතාගේ වයස කොපමණද දන්නේ නැහැ. ඒ වාගේම ඔබතුමා කිව්වා, අක්කර 8ක ප්‍රමාණයක් අල්ලාගෙන ඉන්නවා කියලා. අක්කර 35ට අමතරව තව අක්කර 8කුත්, ඒ එක්කම තවත් අක්කර 7ක ප්‍රමාණයකුත් ඒ ගොල්ලන් අල්ලාගෙන ඉන්නවා කියලා තමයි අපට ආරංචි වුණේ. ඒ අනුව අක්කර 51ක් විතර ඒ ගොල්ලෝ පරිහරණය කරනවා. ඒ අක්කර 8 පවරා ගැනීම සුදුසුයි කියන එක ඔබතුමාගේ යෝජනාවලදීත්, කථාවේදීත් පැහැදිලි වෙනවා. එය නිවැරැදි කර ගන්න මා කැමැතියි. ඒ අක්කර 8 විතරක් නොවෙයි, අක්කර 51ම පවරාගෙන, මේ විශ්වවිද්‍යාල භූමිය සහ ඒ ගොඩනැඟිලිත් පවරා ගැනීම සුදුසුයි කියන අදහස මා ඉදිරිපත් කරනවා.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ඔබතුමාගේ අදහසේ තමයි අපිත් ඉන්නේ. මේ සියල්ල රජයට පවරා ගන්න කියලායි අපි කියන්නේ. නමුත් මහවැලි අධිකාරියෙන් අපි ඉල්ලා සිටියේ, මුලින්ම මේ පරීක්ෂණය සිදු කරන්න නම් නීතිවිරෝධී ලෙස අල්ලාගත් අක්කර ප්‍රමාණය නැවත පවරා ගන්න අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න, මේ ආයතනයේ සම්පූර්ණ ඉඩ කඩම් පවරා ගන්න කලින් එය නිවැරැදිව කර ගන්න කියන එකයි. ඔබතුමා නිවැරැදියි. අපි ඉල්ලන්නේත් ඒකයි.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, ඒ පුතාගේ වයස කීයද?

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ඒ පුතාගේ වයස නම් මට මේ වෙලාවේ මතක නැහැ. ඔහු උපාධිධාරියෙක්. මා හිතන හැටියට අවුරුදු 18ට වැඩියි; අවුරුදු විසි ගණනකට වැඩි ඇති. අපි වයස ඇහුවේ නැහැ. ඔහු උපාධිධාරියකු විතරක් නොවෙයි, අවුරුදු 18ට වැඩි වැඩිහිටියෙක්. ඒ විතරක් නොවෙයි. මේ ආයතනයේ වර්තමාන සභාපතිවරයා ඔහුයි. ඒ වාගේම, මේ හිරා පදනමේ සහ මේ ආයතනයේ කොටස්කරුවකු හැටියටයි ඔහු දිගටම සිටියේ. ඒ නිසා ඔහු පොඩි ළමයෙක් වෙන්න බැහැ.

මුදල් සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් අදහස් විමසුවාම, "Accounts at Bank of Ceylon" කියන කාරණය යටතේ පැහැදිලිවම කියා තිබෙනවා, මේ මුදල් ලැබීම සම්බන්ධයෙන් පැහැදිලි ගැටලුවක් තිබෙනවා, ඒ මුදල් ලැබීම සම්බන්ධයෙන් වහාම පරීක්ෂණයක් කළ යුතුයි කියලා. එම පරීක්ෂණය සම්බන්ධයෙන් මෙලෙස කියා තිබෙනවා: "In view of the aforementioned serious legal issues and potential violations of the law, the Committee is advised to proceed with its recommendation to direct Serious Financial Crimes Investigation Division of the Police and the Central Bank to conduct an investigation into this matter, with the assistance of the Saudi Arabian Embassy in Sri Lanka obtained through the Ministry of Foreign Affairs, if required."

අපි යෝජනා කරන්නේත්, මේ මුදල් ගනුදෙනු සම්බන්ධයෙන් පැහැදිලිවම පරීක්ෂණයක් අපට අවශ්‍ය බවයි. ඒ පරීක්ෂණයේදී සියලු මූල්‍ය ආයතන සම්බන්ධ පරීක්ෂණ කරලා, විදේශ කටයුතු අමාත්‍යාංශයත්, තානාපති කාර්යාලයත් එක්ක ව්‍යවහාරික විගණනයක් -forensic audit එකක්- සමඟ මෙය සම්පූර්ණයෙන්ම පරීක්ෂා කරන්න කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආංශික අධීක්ෂණ කාරක සභාවේ නිර්දේශ හැටියට කාරණා 15ක් මේ වාර්තාවේ ඉදිරිපත් කර තිබෙනවා. ඒ කාරණා කීපයක් මා ඉදිරිපත් කළා. එක කාරණයක් තමයි, conflict of interest කියන කාරණය. විශේෂයෙන්ම නීතිපති දෙපාර්තමේන්තුව විසින් එවන ලද recommendations සම්බන්ධයෙන්, ආංශික අධීක්ෂණ කාරක සභාව හැටියට අපි ගරු කථානායකතුමාගෙන් ලිඛිතව ඉල්ලීමක් කළා, ඉදිරි පියවර ගැනීම සඳහා නීතිමය කටයුතු කරන්න නීතිපති දෙපාර්තමේන්තුවට උපදෙස් ලබා දීමේ කටයුත්ත කරන්න කියලා. මා ඒ ලිපිය **සභාගත*** කරනවා. මේ නඩු නිමිත්ත සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යෑමට ගරු කථානායකතුමා ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇතැයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. මෙයත් ජාතික කර්තව්‍යයක්. මෙය ඉතා අවශ්‍ය දෙයක්.

මේ අනුව මේ රටේ පාර්ලිමේන්තුවේ ඉන්න මේ මන්ත්‍රීවරුන් 225 දෙනාටම වගකීමක් පැවරෙනවා. මේ රටේ පැහැදිලිවම නීති පද්ධතියක් තිබෙනවා, මන්ත්‍රීවරයෙකු විධියට ඉඳගෙන රජය සමග කිසිම ගිවිසුමක් අත්සන් කළ නොහැකියි කියලා. එහෙම කළ නොහැකියි කියන එක ගැන අපට සහතිකය ලැබෙන තුන්වැනි වතාව මේ. අපි වැරදිලාවත් හිස්බුල්ලා මහතා කළ මේ වැඩ සියල්ලට අනුමැතිය දීලා, මේ ආයතනය එතුමාට පවත්වාගෙන යන්නට දුන්නොත් අපටත් ලයිසන් එකක් ලැබෙනවා. මටත් පුළුවන් ගිහින් අක්කර අටක් හෝ අක්කර පණහක් හෝ බලයෙන් අල්ලාගෙන බිල්ඩින් එකක් හදලා අයිති කර ගන්න. එසේ නම්, ඒක තමයි මේ රටේ නීතියෙන්ම දෙන ලයිසන් එක. නමුත් එය නොදිය යුතුයි. අපි ආණ්ඩුවට කියා සිටිනවා, අපි ආණ්ඩුවේ මන්ත්‍රීවරු හැටිය මේ දෙස බලාගෙන ඉන්නවා කියලා. මෙය කිසිසේත් නොවිය යුතු දෙයක්. එම නිසා තමයි අපි මේ ගැන දීර්ඝ වශයෙන් කියන්නේ.

මේ සඳහන් කාරණා පහළොව ඇතුළේම තියෙන්නේ, මෙම ආයතනය කරන ලද විවිධ අකටයුතුකම් ගැන.

මේ ආයතනය පිහිටුවනකොට මේ මුදල් ලැබීමේදී බරපතළ වරදක් සිදුවෙලා තිබෙන බව හරි පැහැදිලියි. ලංකා බැංකුවට මුදල් ලැබීම සම්බන්ධ ගැටලු තිබෙනවා. සාමාන්‍යයෙන් බැංකුවකට මුදල් ලැබෙන කොට සහ account එකක් ආරම්භ කරනකොට ඒ මුදල් ලැබෙන්නේ කොහොමද කියන විස්තර අපි ලබා දිය යුතු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මුදල් ලැබෙන්නේ ණයක් හැටියට කියලා කිසිම තැනක සඳහනක් නැහැ. එතකොට ඒක මුදල් ලැබෙන ආකාරය හිතා මතාම සඟවා තබා ගැනීමක්. ඒ වාගේම ඒ මුදල් ලැබෙන කාලයේ එතුමා මේ රටේ සිටි ආර්ථික

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

සංවර්ධන නියෝජ්‍ය ඇමතිවරයා. මට මෙතැනදී ප්‍රශ්නයක් පැන නඟිනවා, විදේශයකින් ණයක් ලබා ගන්නා ක්‍රමය දන්නේ නැතිව ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිකමක් කරන්නේ කොහොමද කියලා මෙහෙම ද රටේ කටයුතු වෙන්නේ? එසේ නම් ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිවරයා හැටියට ඉඳගෙන ණයක් ලබා ගත්තාය කියන එක, එසේ කටයුතු කිරීමම කියන කාරණයේ තිබෙන්නේ බැඳියාවන් අතර ගැටුමක්. එතුමාගේ බලය අයුතු ලෙස පාවිච්චි කරලා තමයි මේ හැම තැනම කටයුතු කරලා තිබෙන්නේ.

මේ ආයතනය සම්බන්ධයෙන් පරීක්ෂණ කරනකොට අපි උතුරු වාකරයේ ප්‍රාදේශීය ලේකම් කැඳවා ඇහුවා, ඒ වාගේම ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් කැඳවා ඇහුවා, මෙම ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ අනුමතිය ලබා ගත්තේ කොහොමද කියලා. ඒ සාක්ෂි තිබෙනවා. මේ රජයේ සේවකයන් ඇවිත් අපේ ආංශික අධීක්ෂණ කාරක සභාව ඉදිරියේ දුන් සියලු වාචික සාක්ෂි record කරලා තිබෙනවා. අපි මේ කියන්නේ බොරුවක් නම්, හිස්බුල්ලා මහතාට පුළුවන් කථානායකතුමාගෙන් හෝ අවසරය අරගෙන මේ සාක්ෂි මොනවාද කියලා බලන්න. එතුමා ඉදිරිපත් කරන මේ වාර්තාවේ එතුමා දිගින් දිගටම කියනවා, අපි කරන්නේ බොරු, පාර්ලිමේන්තුවේ විසි දෙනෙකුගෙන් යුත් කණ්ඩායම කරන්නේ බොරු කියලා. වාකරයේ ප්‍රාදේශීය සභාවේ නිලධාරි මහත්ම මහත්මීන් දුන් එම සාක්ෂිවල තිබෙනවා, මේ සඳහා අනුමැතිය ලබාගත් බවට file එකක් නැහැ කියලා. කිසිම තැනක ඒ ලියකියවිලි නැහැ. හිස්බුල්ලා මහතා අපට ගෙනැල්ලා පෙන්වනවා, ගොඩනැඟිලි සඳහා අනුමැතිය ලැබුණු architectural designs තිබෙන ලොකු plan එක. ඒ plan එකේ තිබෙනවා, 2016 දිනයක්. ඒ architectගේ දිනය. එක පැත්තකින් අත්සන් කර තිබෙනවා, seal එකත් එක්ක ප්‍රාදේශීය සභාවේ නිලධාරීන්. අත්සන් කර තිබෙන කිසිම තැනක දිනය නැහැ. දිනය නැති සෙල්ලම එතුමා දිගටම කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දිනය නැති සෙල්ලම මුලින්ම කරන්නේ ආචාර්ය සරත් අමුණුගම මැතිතුමාට. හිස්බුල්ලා මහතා ආචාර්ය සරත් අමුණුගම මැතිතුමාට, the then Minister of Higher Education and Research, ලියුමක් ලියනවා, "Approval for Establishment of Higher Education Institute, Batticaloa" කියන සිරස යටතේ. මේ ලියුමට දිනයක් නැහැ. දින දාන්නේ නැහැ. හැබැයි අපි දිනය සොයා ගන්නේ, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට එය ලැබුණාය කියා සඳහන්ව තිබෙන දිනයෙන්, එනම්, 2015 ජූලි 03. මේ රටේ මන්ත්‍රීවරයකු හැටියට, ආණ්ඩුකාරවරයකු හැටියට හිටපු හිස්බුල්ලා මහතා දින රහිතව වැඩ කරන්නේ ඇයි කියලා මා දන්නේ නැහැ. මේ දින රහිතව වැඩ කරන නිසා අපට විශාල සැකයක් ඇති වෙනවා. ගොඩනැඟිලි සඳහා අනුමැතිය ඉල්ලා දුන් ලිපි අතරේත් දින නැහැ; ඒ seal එක නැහැ; දිනයත් නැහැ. දිනය හැටියට තිබෙන්නේ design එක ඇඳපු දිනය. අපි දන්නවා, ගොඩනැඟිලි ඉදි කිරීම සඳහා අනුමැතිය ලැබුණා නම්, ඒ අනුමැතිය ලැබුණු දිනය -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා මේ ගත වෙන්නේ ඔබතුමාට නියමිත අවසාන විනාඩි පහ.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමාට නියමිත විනාඩි 6 මම ලබා ගන්නවා. ඊළඟට මේ කාරණයේදී-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාටත් වෙලාව දෙන්න ඕනෑ.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමාට මම මුලින්ම කියලා තිබුණේ ඒක.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා ඒ වෙලාව ඔබතුමාට ලැබෙන බව-

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මට ඒ වෙලාව ලබා දෙන්න. මම කියලායි තිබුණේ එතුමාට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට විනාඩි පහක් තිබෙනවා. කරුණාකර කවුරු හෝ ඒ වෙලාව ලබා දෙන බව මූලාසනයට කියන්න. මොකද, මීට කලින් ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාටත් -

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මම කලින්ම කියා තිබුණා, ඒ විනාඩි 6 මට අවශ්‍යයි කියලා.

මේ මුදල් ලැබීම සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් මේ සාකච්ඡාව සිද්ධ කරමින් ඉන්නේ, ඒ සම්බන්ධයෙන් මේ රටේ විශාල ප්‍රශ්නයක් තිබෙන නිසායි. ඒ නිසායි අපි ඉල්ලා සිටින්නේ, මුදල් ලැබීමේ ගිවිසුම් සම්බන්ධයෙන් කරන සම්පූර්ණ පරීක්ෂණය ශ්‍රී ලංකා මහ බැංකුවත් එක්ක එකතු වෙලා සිදු කළ යුතු බවයි.

ඒ වාගේම, මේ කාරක සභාවේ නිර්දේශ අනුව බලනවිට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයත් එක් වරදක් කර තිබෙනවා. මේ එක තැනක මුදල් ගෙවීමේදී "බැටිකලෝ විශ්ව විද්‍යාලය" යනුවෙන් රිසිට් පතක් කඩා තිබෙනවා. එම නිසා උසස් අධ්‍යාපන ඇමතිවරයාගෙන් ඉල්ලා සිටිනවා, මේ ගැන පරීක්ෂණයක් කරන්න කියලා.

නිලධාරීන් වෙතින් වැරැද්දක්වීම තුළ, මේ ආයතනය විශ්වවිද්‍යාල ආයතනයක් ලෙස නම් කරන ඉල්ලීමක් සමාගම් මැදුරෙන් කරලා තිබුණා. මෙම වාර්තාවේ පැහැදිලිව සඳහන් වෙන මේ කාරණා පහළොවම සම්බන්ධයෙන් නීතිපතිතුමාගේ මතය විමසා තිබෙනවා. වර්තමානයේ මේ ප්‍රශ්නය දෙස මුළු රටම බලාගෙන ඉන්නවා. මේ ප්‍රශ්නයේදී කිසිවෙකුත් ලඝු කරන්න බැහැ, මෙය ජාතිවාදී ප්‍රශ්නයක් පැත්තකට ආලා. මම ඒක කියනවා. ඒක නොවෙයි, මෙතැන තිබෙන ප්‍රශ්නය. මා එය නැවත නැවතත් කියනවා. සම්පූර්ණයෙන්ම මේ ප්‍රශ්නය තියෙන්නේ රටේ විනය, නීත්‍යානුකූල ස්වභාවය ගැන. අපි මේ තර්ක කරන්නේ ඕනෑම ආයතනයක්, නැත්නම් ඕනෑම දෙයක් කරන ක්‍රමවේදයක් තියෙනවාය කියන කාරණය ගැනයි. ඒ ක්‍රමවේදයෙන් පරිබාහිරව මේ රටේ කටයුතු කරන්න බැහැ. අපි දන්නවා, උසාවියට ගියාම විනිශ්චයකාරවරුත්, නීතිඥවරුත් සියලුදෙනාම උසාවියේ නීතියට හිස නමලා යන්නේ කියලා. අපි කිසිවෙකුට බැහැ මේ රටේ නීතියට පිටින් යන්න. ඒ නිසා තමයි මේ ආංශික අධීක්ෂණ කාරක

සභාවේ නිර්දේශ දිහා පාර්ලිමේන්තුව විතරක් නොවෙයි, මුළු රටම බලාගෙන ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මතක් කරන්න ඕනෑ මේ ආංශික අධීක්ෂණ කාරක සභා හරහා රටට වන සේවය පිළිබඳව. අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව හරහා අපි වාර්තා කිහිපයක් ඉදිරිපත් කරලා තිබෙනවා. අපි මුලින්ම සයිටම් ආයතනය සම්බන්ධයෙන් වූ වාර්තාව ඉදිරිපත් කළා. නමුත් අපි වාර්තාව ඉදිරිපත් කරපු ආකාරයට නොවෙයි ඒ කටයුතු සිද්ධ වුණේ. අවසානයේදී ජනාධිපතිවරයා විසින් පනවන ලද කමිටුවක් හරහා ගත් තීරණ තමයි ක්‍රියාත්මක වුණේ. ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තාවේ සියලු විස්තර, සියලු දේවල් සාක්ෂි සහිතව තියෙනවා. රටේ ජනතාවගෙන් අපි ඉල්ලා සිටිනවා, මේ වාර්තාවත් හොඳට කියවා බලන්න කියලා. මේ වාර්තාව කියවා බැලුවාම තමයි තේරෙන්නේ මේ ආයතනය පිහිටුවීමේදී තිබුණු විෂමතා, දුර්වලතා, අයථා ගනුදෙනු, අවසර ගැනීමේ අයථා ක්‍රියාදාම පිළිබඳව. ඒ සියල්ල හෙළිවෙලා තියෙනවා. ඒ නිසා තමයි මේ සම්බන්ධයෙන් ගන්නා තීරණය දිහා මුළු රටම බලාගෙන ඉන්නේ. ආංශික අධීක්ෂණ කාරක සභා නීතිරීති යටතේ අපි මේ ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තාව ඉදිරිපත් කළා, කැබිනට් මණ්ඩලයට. කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළාට පස්සේ සති හයක් ඇතුළත ඒ සම්බන්ධයෙන් ගන්න තීරණය කුමක්ද කියලා පාර්ලිමේන්තුවේ අපි බලාගෙන ඉන්නවා. අපට දැන ගන්න ලැබුණු පරිදි මේ සම්බන්ධයෙන් කැබිනට් අනුකාරක සභාවක් දාලා තියෙනවා. ඒ අනුකාරක සභාව හරහා මේ වාර්තාව සම්බන්ධයෙන් ගත යුතු පැහැදිලි තීරණය ලබා ගනීවි කියා අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීතුමනි, එම කාරක සභාවේ සභාපතිතුමා වශයෙන් ඔබතුමාගෙන් කාරණයක් දැන ගන්න කැමැතියි. කැබිනට් මණ්ඩලයට අමතරව, - මොකද ඒක ආණ්ඩුවේ වැඩක් නේ - රජයේ පරීක්ෂණ ආයතන තිබෙනවා නේ. CID එක තිබෙනවා, ඒ වාගේම මූල්‍ය දූෂණ පිළිබඳ සොයන්න වෙනම FIU එකක් තිබෙනවා. ආංශික කාරක සභාව විධියට ඔබතුමන්ලා එවැනි ආයතනවලට මේ ගැන පැමිණිලි කරලා තිබෙනවාද, පැමිණිලි කරන්න බලාපොරොත්තු වෙනවාද?

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉතාම වැදගත් ප්‍රශ්නයක් ඇහුවේ. අපි මුලින්ම කළේ මේ වාර්තාවේ කාරණා කිහිපයක් සම්බන්ධයෙන් නීතිපතිගේ මතය විමසීමයි. වාර්තාවේ කාරණා පහළොවම සම්බන්ධයෙන් අපි දැන් නීතිපතිතුමාගේ මතය විමසලා තිබෙනවා. අපි මුලින්ම කළේ ඒක. අපට ඒ කාරණා දෙකක් සම්බන්ධයෙන්, conflict of interest සහ මූල්‍යමය තත්ත්වය සම්බන්ධයෙන් නීතිපතිතුමාගේ මතය සහිත ලේඛනය ලැබිලා තිබෙනවා. අද මම එය සභාගත කළා. ඒ අනුව තමයි මුලින්ම කථානායකතුමාගෙන් අපි ඉල්ලා සිටින්නේ ඉදිරි පියවර ගන්න කියලා conflict of interest කියන කාරණයට. එහි පැහැදිලිවම කියන මන්ත්‍රී ධුරය අහෝසිවිය යුතුයි කියන කාරණයේදී, නීතිපති දෙපාර්තමේන්තුව හරහා නඩු පැවරීමේ කටයුතු කරන්න කියන ඉල්ලීම අපි කරනවා. ඒ පළමුවන කාරණය. ඊට පසුව නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉදිරි පියවර ගත්තාට පස්සේ, ඒ වාගේම අද පැවැත්වෙන මේ විවාදයෙන් පස්සේ අපි බලාපොරොත්තු වෙනවා, මේ සම්බන්ධයෙන් ඒ ආයතන සියල්ලටම පැමිණිලි කරන්න. මම හිතන හැටියට අද මේ විවාදය පැවැත්වුණාට පස්සේ තවදුරටත් මේ වාර්තාවේ කාරණා සම්බන්ධයෙන් තිබෙන පැහැදිලි බව වැඩි වෙනවා. ඒ හරහා ඕනෑම මන්ත්‍රීවරයකුට හෝ රටේ ඕනෑම පුරවැසියකුට මේ වාර්තාවේ තියෙන කාරණා සම්බන්ධයෙන් ඒ ආයතනවලට පැමිණිලි කරන්න සහ ඒ පැමිණිලි හරහා පරීක්ෂණ කෙරෙනවාද කියලා සොයා බලන්න පුළුවන්.

ඒ වාගේම නීතිපති උපදෙස් ලැබුණාට පසුව ඒ සියලු කාරණා සම්බන්ධයෙන් ආංශික අධීක්ෂණ කාරක සභාව හැටියට ඉදිරි ක්‍රියාමාර්ග ගන්නේ කොහොමද කියලා අපි අධ්‍යයනය කරලා, කටයුතු කරනවා. බොහොම ස්තුතියි ඔබතුමා ඒ ප්‍රශ්නය ඇහුවාට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාල වේලාව තිබෙන නිසා මම අවසාන වශයෙන් නැවතත් මතක් කරන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. විශේෂයෙන්ම අපි ඉල්ලා තිබෙන නිර්දේශ 15 ගැන, මේ රටේ පවතින පාලනය යටතේ සහ රජය යටතේ පරීක්ෂණ කළ යුතුයි. ඊට අමතරව මේ සම්බන්ධයෙන් අපි ඉල්ලා තිබෙන නිර්දේශ අනුව ක්‍රියාත්මක විය යුතුයි. මූලික වශයෙන් මේ සිද්ධිය සම්බන්ධයෙන්, මේ සිදු වූ දේවල් සම්බන්ධයෙන් පැහැදිලිව පරීක්ෂණයක් අවශ්‍යයි. ඒ පරීක්ෂණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග වහාම ගන්න කියලා අපි ආණ්ඩුවට බල කරනවා. ඒ සඳහා ක්‍රියාමාර්ග ගත්තාට පස්සේ තමයි නීතිමය පැත්ත ගැන කල්පනා කරන්න වෙන්නේ. මේ රටේ ජනතාව බලාගෙන ඉන්නවා මේ ප්‍රශ්නයට විසඳුම් දෙන ආකාරය. ඒ විසඳුම් දෙන ආකාරය සම්බන්ධයෙන් අපට පැහැදිලි තීරණයක් ලැබිය යුතුයි. විශේෂයෙන්ම ආංශික අධීක්ෂණ කාරක සභාව හැටියට අපි ඒ තීරණය බලාපොරොත්තු වෙනවා. ඒ ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු සීනිතම්බි යෝගේෂ්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.43]

**ගරු සීනිතම්බි යෝගේෂ්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கல்வி மற்றும் மனிதவள அபிவிருத்தி பற்றிய துறைசார் மேற் பார்வைக் குழுவின் அறிக்கையில் மட்டக்களப்புப் பல்கலைக் கழகம் தொடர்பாகக் குறிப்பிடப்பட்டுள்ள விடயத்தை JVPயினர் இன்று ஒத்திவைப்புவேளைப் பிரேரணையாகக் கொண்டுவந்திருக்கிறார்கள். நான் மட்டக்களப்பு மாவட் டத்தைச் சேர்ந்தவன். 'மட்டக்களப்புப் பல்கலைக்கழகம்' என்று சொல்லப்படுகின்ற இந்த நிறுவனமானது, ஆரம்பத்தில் பல்கலைக்கழகக் கல்லூரியாகவே ஆரம்பிக்கப்பட்டது. ஒவ்வொரு மாவட்டத்துக்கும் ஒவ்வொரு பல்கலைக்கழகக் கல்லூரி உருவாக்கப்பட வேண்டுமென்ற அடிப்படையில், கடந்த மஹிந்த ராஜபக்ஷ அவர்களின் ஆட்சிக் காலத்தில் உயர் கல்வி அமைச்சராக இருந்த எஸ்.பி. திசாநாயக்க அவர்களினால் இது கொண்டுவரப்பட்டது. இதனைப் புனானைப் பகுதிக்குக் கொண்டுசெல்லாமல், மட்டக்களப்பின் மத்தியிய பகுதியில் அமைக்க வேண்டுமென்று கூறி அப்போது நாங்கள் இதனை எதிர்த்தோம். அதன் பின்னர் இது தொடர்பில் பல செயற்பாடுகள் நடைபெற்றிருப்பதை இப்போது நாங்கள் அறிகின்றோம்.

குறிப்பாக, இது ஆரம்பத்திலே ஒரு தொண்டர் நிறுவனமாகப் பதிவுசெய்யப்பட்டு, அதன்மூலம் நிதிகளைப் பெற்றுத்தான் ஆரம்பிக்கப்பட்டிருக்கிறது. இதனை Hira Foundation இன் கீழ் ஆரம்பிப்பதற்கான ஒப்பந்த மொன்று2013.08.15ஆம் திகதி இளைஞர் அலுவல்கள் மற்றும்

[ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා]

தொழிற்பயிற்சி அமைச்சரினால் கைச்சாத்திடப்பட்டிருக்கின்றது; அதற்கான நடவடிக்கை எடுக்கப்பட்டிருக்கிறது. பின்னர் இது Batticaloa Campus (Pvt.) Limited என்று பெயர் மாற்றம் பெற்றிருக்கிறது. ஆரம்பத்தில் Hira Foundation தான் இதனை முன்னெடுத்து வந்திருக்கின்றது. அப்போது இது மட்டக்களப்புப் பல்கலைக்கழகக் கல்லூரியாகத்தான் பதிவு செய்யப்பட்டிருக்கிறது. கௌரவ சரத் அமுனுகம அவர்கள் உயர் கல்வி அமைச்சராக இருந்த காலத்தில், இதனை உயர் கல்வி அமைச்சில் Batticaloa University College என்றுதான் பதிவுசெய்திருக்கிறார்கள். உண்மையிலே இது ஒரு தனியார் நிறுவனப் பதிவு. உயர் கல்வி அமைச்சு அதற்கு ஏற்ற விதத்திலே நடைமுறைகளைச் செய்ய முடியாது. ஆனால், அவர்கள் செய்திருக்கின்றார்கள். இதுபற்றி ஆராய்ந்தபோது, சம்பந்தப்பட்ட அமைச்சு அவர்களுக்கு ஆதரவாக இருந்திருப்பதாகத் தெரிய வருகின்றது. மஹிந்த ராஜபக்ஷ அவர்களின் ஆட்சிக்காலத்திலே கூடிய ஆதரவு வழங்கப்பட்டிருக்கின்றது.

உண்மையிலே, அந்தப் பல்கலைக்கழகம் அமைந்துள்ள இடமானது 1954 மற்றும் 1974ஆம் ஆண்டுகளிலே மலையகப் பகுதிகளிலேயிருந்து இடம்பெயர்ந்து வந்து அங்கு குடியேறிய மக்களில் 44 குடும்பங்கள் வயல் செய்த காணியாகும். அந்தக் காணியைத்தான் மகாவலி அபிவிருத்தி அதிகாரசபையிடமிருந்து ஹிஸ்புல்லாஹ் அவர்கள் பெற்றிருக்கின்றார். ஆனால், அது பெறப்பட்ட விதத்தைப் பார்க்கின்றபோது, இவ்வாறான திட்டமென்றே கூறப்படாமல் வேறொரு திட்டத்துக்கெனப் பெற்று அதனைப் பயன்படுத்தியிருப்பது எங்களுக்குத் தெரியவருகின்றது. இலங்கையிலே ஒரு தனியார் பல்கலைக்கழகத்தைக் கொண்டுவருவதானால், அதற்கான சட்டமுறைகள் சரியான முறையிலே பின்பற்றப்பட்டிருக்க வேண்டும். அவ்வாறான நடைமுறைகள் பின்பற்றப்படாமல், ஆரம்பத்திலே ஒரு தொண்டர் நிறுவனத்தை உருவாக்கி, அதன்மூலம் அவரும் அவரது மகனும் இணைந்து செயற்பட்டுப் பின்னர் அதையொரு கல்லூரியாகக் கொண்டுவந்து, அதன் பிற்பாடு அதையொரு பல்கலைக்கழகமாக மாற்றுவதற்கு நடவடிக்கை எடுத்திருக்கின்றார்.

இவரது இந்தப் பல்கலைக்கழகம் தொடர்பாக ஆராய்ந்த சம்பந்தப்பட்ட துறைசார் மேற்பார்வைக் குழுவில் நானும் அங்கத்தவராக இருக்கின்றேன். இதுபற்றிப் பல்வேறு விதமாக நாங்கள் ஆராய்ந்தபோது, அங்கே இடம்பெற்ற பல விடயங்கள் அவரது பிழையான நடைமுறையை எடுத்துக் காட்டியிருக்கின்றன. இந்தக் குழுவின் தலைவர் அவர்கள் கூறியது போன்று, அதற்கென நிதி பெறப்பட்ட விதம் பிழையாக இருக்கின்றது. இவ்வாறு வெளிநாட்டிலிருந்து ஒரு தமிழ் மகன் நிதியைக் கொண்டுவந்திருப்பாராக இருந்தால், அவர் தமிழீழ விடுதலைப் புலிகளுடைய நிதியைக் கொண்டுவந்திருப்பார் என்று கூறிக் கைது செய்திருப்பார்கள். ஆனால், சட்டவிரோதமான முறையிலே ஹிஸ்புல்லாஹ் அவர்கள் அந்த நிதியைக் கொண்டுவந்திருக்கின்றார். இலங்கை வங்கியிலே ஒரு பெயரில் கணக்கை ஆரம்பித்துவிட்டுப் பின்னர் இன்னுமொரு பெயருக்கு அதை அவர்கள் மாற்றியிருக்கின்றார்கள். 3.6 பில்லியன் ரூபாய் நிதி இலங்கையின் வெளிநாட்டு நிதிக் கொள்கைப் பரிமாற்றத்துக்கு அப்பாற்பட்ட விதத்தில், பிழையான நடைமுறையின்கீழ் அந்தக் கணக்கில் வந்திருக்கின்றது. இதை அப்போதிருந்த அரசாங்கம் மறைத்தது. இப்போதிருக்கின்ற அரசாங்கமும் மறைக்கப்போகின்றதா? என்று நான் கேள்வியெழுப்ப விரும்புகின்றேன்.

அங்கே அந்தக் கட்டிடம் அமைக்கப்பட்ட விதத்தைச் சென்று பாருங்கள்! மூவின மக்களும் வாழ்கின்ற அந்த இடத்திலே, குறிப்பிட்ட ஒரு மதம் சார்ந்த அடையாளத்தோடு அந்தப் பல்கலைக்கழகம் அமைக்கப்பட்டிருக்கின்றது. ஏராளமான பேரீச்சை மரங்களைக் கொண்டுவந்து, அந்தப் பல்கலைக்கழக வளவிலே நாட்டியிருக்கின்றார்கள். அவ்வாறு செய்வதற்கு அது என்ன சவுதி அரேபியாவா? அங்கு சென்று பார்த்தால்தான் எவ்வாறு திட்டமிட்ட வகையிலே அந்தப் பல்கலைக்கழகத்தை ஹிஸ்புல்லாஹ் அவர்கள் உருவாக்கியிருக்கின்றார் என்று விளங்கும்! ஒரு மதத்தை அடிப்படையாக வைத்துத்தான் அவர்கள் அந்த நடவடிக்கையை மேற்கொண்டிருக்கின்றார்கள். அது பார்ப்பவர்களுக்குத் தெளிவாக விளங்கும்.

அதுதவிர, இந்தக் குழுவிலே நாங்கள் ஆராய்ந்தபோது, ஓர் உண்மை கண்டுபிடிக்கப்பட்டது. அந்த 3.6 பில்லியன் ரூபாய் நிதியும் அன்பளிப்பாகக் கிடைத்ததென்று ஹிஸ்புல்லாவின் மகன் சொல்கின்றார். ஆனால், அப்பா ஹிஸ்புல்லா, அந்த நிதி கடனாகக் கிடைத்ததென்று சொல்கின்றார். பாருங்கள்! நிதி வந்த விதத்திலே அப்பாவுக்கும் மகனுக்கும் இடையிலேயே மாறுபட்ட கருத்துள்ளது. ஆகையால், இதில் பாரிய ஊழல் இருக்கின்றது. இதை அரசாங்கம் விசாரிக்க வேண்டும்; நிதிக் குற்றப் பிரிவு விசாரிக்க வேண்டும். அதுமாத்திரமன்றி, இந்தப் பல்கலைக்கழகத்தை அரசாங்கம் பொறுப்பேற்க வேண்டும்.

இப்போது ஹிஸ்புல்லாவின் கருத்துக்கள் சில இணையத் தளங்களிலே வெளிவருகின்றன. "என்னிடமிருந்து யாரும் அதை அசைக்க முடியாது" என்று கூறியிருக்கின்றார். ஆகவே, அதற்குப் பின்னணியிலே அரசாங்கம் இருக்கின்றதா? சொல்ல முடியாது! அரசாங்கங்கள் அரசியலுக்காக நாடகமாடக்கூடும். ஆனால், எந்த அரசாங்கமும் இதற்கு விட்டுக்கொடுக்க முன்வரக்கூடாது. அது மஹிந்த ராஜபக்ஷவின் அரசாங்கமாக இருக்கலாம்; ரணில் விக்கிரமசிங்கவின் அரசாங்கமாக இருக்கலாம்! உண்மையை மறைக்கக்கூடாது, களவுக்குத் துணைபோகக்கூடாது, பிழையான நடவடிக்கைக்கு உடன்படக்கூடாது.

மகாவலி அபிவிருத்தி அதிகாரசபை இந்தப் பல்கலைக்கழகத்துக்கு 35 ஏக்கர் காணியை வழங்கியிருக்கின்ற நிலையில், எதற்காக அதற்கு மேலதிகமான காணி? அவ்வாறு 8 ஏக்கர் காணிக்கு மேலாக எடுத்திருக்கின்றார்கள். ஒரு சாதாரண பொதுமகன் அரச காணியை இவ்வாறு எடுத்திருந்தால், காணிச் சட்டப்படி என்ன செய்திருப்பார்கள்? அதற்குள்ளே கட்டிடம் அமைத்திருந்தால், காணிச் சட்டப்படி என்ன செய்திருப்பார்கள்? வாகரைப் பிரதேச செயலகம், வாகரைப் பிரதேச சபை ஆகியவற்றுக்குச் சென்று நான் விசாரித்தேன். அங்கெல்லாம் சரியான நடைமுறைகள் பின்பற்றப்படாத முறையில் இந்தக் கட்டிட அமைப்பு மேற்கொள்ளப்பட்டிருக்கின்றது. சட்டத்துக்கு முரணான வகையில் நிதி பெறப்பட்டிருக்கின்றது; சட்டத்துக்கு முரணான வகையில் கட்டிடம் அமைக்கப்பட்டிருக்கின்றது. அதேநேரத்தில், ஓர் இனம், மதம் சார்ந்து அந்தக் கட்டிடம் அமைக்கப்பட்டிருக்கின்றது. இந்த நிலையிலே, இந்தப் பல்கலைக்கழகத்தை அரசாங்கம் பொறுப்பேற்க வேண்டும். பிழையான நடைமுறைகள் இங்கே நடைபெற்றிருக்கின்றன. நாங்கள் இதனை அனுமதிக்க முடியாது.

நாங்கள் பல விடயங்களையும் ஆராய்ந்தபோது ஒவ்வொன்றும் தந்திரோபாயமாக மேற்கொள்ளப் பட்டிருப்பது தெரியவந்தது. ஹிஸ்புல்லாஹ் அவர்கள் முன்பும் Seylan Bank இலே எட்டுக் கோடி ரூபாயை அவரது மனைவியின் பெயரிலே கடனாக எடுத்திருந்தார். அது பாரிய பிரச்சினையாக வெளிப்பட்டது. அதுமாத்திரமல்ல,

வாழைச்சேனை புகையிரத நிலையத்திற்கு அருகாமையிலே அவர் ஓர் ஆடைத் தொழிற்சாலையை நிறுவியிருந்தார். அந்த ஆடைத் தொழிற்சாலை தொடர்பாகவும் பிரச்சினை ஏற்பட்டது. ஆகவே, அவர் பல விதமான முறையிலே நிதிகளைப் பெற்று தனக்கு ஏற்ற வகையில் நடைமுறைகளை மேற்கொள்வதற்கு அப்போது இருந்த அரசாங்கமும் இப்போதிருக்கின்ற அரசாங்கமும் உடந்தையாக இருந்திருக்கின்றன. ஆகவே, இது தொடர்பாக விசாரிக்கப் படவேண்டும். அவரது வங்கிக் கணக்குகள் தொடர்பிலும் விசாரணை மேற்கொள்ளப்பட வேண்டும். அந்த நிறுவனம் இப்போது மட்டக்களப்புப் பல்கலைக்கழகம் என்ற பெயரிலே கூறப்படுவதை நிறுத்தி, அதனை அரச பல்கலைக்கழகமாக மாற்றி, அதற்கொரு தனியான பெயரையிட்டு, இது அரசவுடைமையாக இயங்குவதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமென்று இந்தச் சபையிலே கேட்டுக்கொள்கிறேன். ஏனென்றால், இங்கு மேற்கொள்ளப்பட்ட அத்தனை செயற்பாடுகளிலும் ஊழல்கள்! எனவே, இந்த அரசாங்கம் ஊழலுக்கு உடந்தையாக இருக்கின்றதா? என்பதனை இந்தப் பல்கலைக்கழக விடயத்திலே மக்கள் காண்பார்கள் என்பதைக் கூறி, விடைபெறுகின்றேன்.

[අ.භා.3.52]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. පසුගිය රජය කාලයේ - මහින්ද රාජපක්ෂ යුගයේ- ඔබු දුවපු පිළිකා ටිකට බෙහෙත් කරන්න, එහෙම නැත්නම් ඒ කුණු ගොඩවලට උත්තර හොයන්න තමයි පසුගිය වසර හතරක කාලය පුරාම යහ පාලන රජයට සිද්ධ වුණේ. මම එහෙම කියන්නේ අපි ණය කන්දකට යට වෙලා සිටින නිසායි. ඒවා මේ යහ පාලන රජයේ ණය නොවෙයි. මීතොටමුල්ල කුණු කන්දට අපට කරගහන්න වුණා. "සයිටම්" විශ්වවිද්‍යාලය ගෙනාවේ කවුද, ඒ යෝජනාව මේ සභාවට ඉදිරිපත් කළේ කවුද, ඒකට ණය දුන්නේ කවුද කියන එක අද සමහර අයට අමතක වෙලා තිබෙනවා. ඒ ඔක්කෝමත් හරි, ඒකට කරගහන්න වුණේත් අපටයි. ෂැන්ග්‍රි-ලා හෝටලය සම්බන්ධ සිද්ධියත් එහෙමයි. හම්බන්තොට වරාය සිද්ධියත් එහෙමයි. මත්තල ගුවන් තොටුපොළ සම්බන්ධයෙන් ගත්තාම ඒකත් එහෙමයි.

මම නියෝජනය කරන ලග්ගල මැතිවරණ කොට්ඨාසයේ, මොරගහකන්ද සහ කළු ගඟ කියන ව්‍යාපෘති ඇතුළේ ඇතිවෙලා තිබෙන ප්‍රශ්න ගත්තාම, ඒවාත් එවකට -2008 වර්ෂයේ- පාලන යුගයේ හිටපු අය ගෙනා ප්‍රශ්න. ඒවාට අද අපි තමයි උත්තර හොයන්නේ. උමා ඔය ව්‍යාපෘතිය ගත්තත් එහෙමයි. අද බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාව දුක් විඳින්නේ පසුගිය කාලයේ ඒ කරපු දේවල් නිසා තමයි. මෙන්න මේ විධියට අපට හම්බ වුණු ඊළඟ ප්‍රශ්නය -කුණු ගොඩ, පිළිකාව- තමයි Batticaloa Campus (Pvt.) Limited කියන එක. අද ඒක, 'ෂරියා විශ්වවිද්‍යාලය' කියා ප්‍රසිද්ධ වෙලා තිබෙනවා. ඒ වචන මොනවා වුණත් අද අපට මේ ප්‍රශ්නයට විසඳුම් හොයන්න වෙලා තිබෙනවා.

අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කමිටුවේ සාමාජිකාවක් විධියටත්, මහජන නියෝජිතවරියක් විධියටත් තමයි මම මේ ගැන කථා කරන්නේ. එහෙම නැතිව, මෙය හුදෙක් මුස්ලිම් සමාජයට එරෙහිව කරන කථාවක් නොවෙයි. මොකද, මා පාර්ලිමේන්තුවට එවන්න මගේ දිස්ත්‍රික්කයේත් වැඩි වශයෙන් ඡන්දය පාවිච්චි කළේ මුස්ලිම් ජනතාවයි. එම නිසා, අද අප කරන මේ විවාදය මුස්ලිම් සමාජයට එරෙහිව කරන විවාදයක් නොවෙයි කියන එක මම මුලින්ම සියලු මාධ්‍යවලටත්, සමාජයටත්, රටටත් කියා සිටිනවා.

විශ්වවිද්‍යාල අධ්‍යාපනයට සුදුසුකම් ලබන සියයට 82ක් පමණ වන ශ්‍රී ලංකාවේ ශිෂ්‍ය ජනගහනයෙන් විශ්වවිද්‍යාලවලට යන්නේ සියයට හතරයි කියලා අපි දන්නවා. එම නිසා, අපේ රාජ්‍ය විශ්වවිද්‍යාල සංඛ්‍යාව උසස් අධ්‍යාපනයට අවශ්‍ය සැපයුම කරන්නට අපොහොසත් වෙලා තිබෙනවා. ඒ හේතුවෙන් අපේ දරුවන්ට පිට රටවලට යන්න වෙනවා; අපේ රටේ මුදල් විශාල ප්‍රමාණයක් පිට රටට ඇදෙනවා; මුදල් හිඟ දරුවෝ වෙන වෙන විකල්පවලට යනවා. මේ මොනවා වුණත්, රාජ්‍ය විශ්වවිද්‍යාලවල ඉගෙනුම් අවස්ථා නොලැබෙන දරුවන්ට -ඒ ශිෂ්‍ය ප්‍රජාවට- පෞද්ගලික විශ්වවිද්‍යාලවල හෝ උසස් අධ්‍යාපන ආයතනවල අවශ්‍යතාවක් තිබෙනවාය කියන එක අපි දන්නවා. ඒක ඇත්ත. නමුත්, මේ කථාව ඊට වඩා වෙනස් එකක්.

මට කලින් කථා කළ හැමදෙනාම Batticaloa Campus (Pvt.) Limitedහි ආරම්භය ගැන සඳහන් කළා. අපි දන්නවා, එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මැතිතුමා මහවැලියෙන් ගත් අක්කර 35ක ඉඩම, මහින්ද රාජපක්ෂ යුගයේ ඩලස් අලහප්පෙරුම ඇමතිතුමාත් එක්ක එකතු වෙලා -ඒ කාලයේ- ගත්ත එකක් බව. 2013 ජූනි මාසයේදී, "Malik Abdullah University College" කියන නමින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් විධියට, NVQ සහතිකයක් ලබා දෙන්න තමයි මෙය පිහිටුවන්නේ. 2014 වසර වෙනකොට මේ ආයතනයේ නම "Batticaloa University College" කියලා වෙනස් වෙනවා. 2015 වර්ෂය වෙනකොට එහි නම, "Batticaloa Campus (Pvt.) Limited" වෙනවා. ව්‍යාපාර ලියා පදිංචි කිරීමට අදාළ පනත යටතේ ඒ ගොල්ලන් මේ ආයතනය ලියා පදිංචි කරනවා.

2016දී එය, "Batticaloa Campus of Sri Lanka" වෙනවා. මේ ගොල්ලන් මේ ආයතනය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියා පදිංචි කරනවා. මේ සඳහා අවස්ථා 7කදී රුපියල් බිලියන 3.6ක් සවුදි අරාබියේ අලි අබ්දුල්ලා අල්-ජුෆාලි පදනමෙන් සහන ණයක් ලෙස දුන්නා කියලා හිස්බුල්ලා මැතිතුමා කියනවා. ලංකා බැංකුවේ ගිණුමේ එහි නම ලෙස සඳහන් වෙන්නේ, "Batticaloa Campus College of Sri Lanka" යනුවෙන්. නමුත්, මුදල් ලැබෙන විට ඒ නමින් ගිණුමක් එතැන නැහැ. එහෙම නම්, මෙවැනි මුදල් බැරවීමක් සිද්ධ වුණේ කොහොමද කියලා අපට ගැටලුවක් තිබෙනවා.

2016 ජූනි 04වන දා සිට 2017 ජූලි 07වන දා දක්වා, හත්වරක් මේ ආයතනයට මුදල් ලැබිලා තිබෙනවා. එතකොටත් මේ නමෙහි වෙනසක් තිබෙනවා. 2016.03.04වන දා රුපියල් කෝටි 69ක්, 2016.05.05වන දා රුපියල් කෝටි 56ක්, 2016.08.03වන දා රුපියල් කෝටි 52ක්, 2016.10.05වන දා රුපියල් කෝටි 42ක්, 2016.01.03වන දා රුපියල් කෝටි 54ක්, 2016.03.03වන දා රුපියල් කෝටි 43ක්, 2016.06.07වන දා රුපියල් කෝටි 45ක් වශයෙන් තමයි මේ මුදල් ලැබිලා තිබෙන්නේ. නමුත්, මේ මුදල් ලැබුණු ආකාරය ගැන කමිටුව ඇතුළේදී වග කිව යුතු අය ලබා දුන් පිළිතුරු එකිනෙකට පරස්පරයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ආයතනයේ වත්මන් සභාපති හිරාස් හිස්බුල්ලා මහත්මයා කියනවා, "ඒක ප්‍රදානයක්" කියලා. අපි ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන්න කිව්වාම, එතුමා ඒවා ඉදිරිපත් කරන්නට අපොහොසත් වුණා. හිටපු ආණ්ඩුකාර හිස්බුල්ලා මහත්මයා කියනවා, "නැහැ, ඒක ණයක් ලෙස තමයි ලැබුණේ, ඒ ළමයා පොඩි ළමයෙක්, මෙවාට උත්තර දෙන්න දන්නේ නැහැ" කියලා. අපට ඒ වෙලාවේ ලොකු ගැටලුවක් මතු වුණා, මේ වාගේ අත දරුවෙකුටද විශ්වවිද්‍යාලයක සභාපතිකම දුන්නේ කියලා. ණයක් විධියට ඒ මුදල් දුන්නා නම් ඒ ලියකියවිලි ඉදිරිපත් කරන්න කියලා අපි එතුමාට කිව්වා. එතකොට එතුමා කියනවා, ඒවා BOI එකට සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කළා කියලා. නමුත් අපි විමසීමක් කරලා බලනකොට පෙනී ගියා, එහෙම දෙයක් සිද්ධවෙලා නැති බව. ඒක තවම අභිරහසක්. මේ අය විවිධ ආයතන සමඟ ණය සඳහා ගිවිසුම්ගත වී තිබුණත්, ඒ

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

සම්බන්ධයෙන් ලංකා බැංකුව හෝ ශ්‍රී ලංකා මහ බැංකුව කිසිදු විටක දැනුවත් කිරීමක් කරලා නැහැ. ඒ නිසා, මෙතැන මූල්‍ය වංචාවක් සිද්ධවෙලා තිබෙනවාය කියන එක සියලුදෙනාටම පැහැදිලි ඇති.

ඊළඟට, මේ ඉඩම පිළිබඳව කථා කළොත්, 2013.07.24වන දා ශ්‍රී ලංකා හිරා පදනමට වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යෑමට මහවැලි අධිකාරියේ අසේලපුර, ජයන්තියාය ඒකකයෙන් අක්කර 35ක්, තිස්පස් අවුරුදු බදු පදනම යටතේ ලබාගන්නවා. අක්කරයකට රුපියල් 14,340 ගණනේ මුළු ඉඩමට රුපියල් 491,200ක් දීලා තමයි මේ ඉඩම අරගෙන තිබෙන්නේ. අපිට හොයා බලන කොට තේරෙනවා, මෙය අක්කර 35 ඉක්මවා ගිහිල්ලා, අක්කර 8ක අනවසර ඉදිකිරීමකුත් කරලා තිබෙන බව. ඒ වාගේම තව අක්කර 15ක් හෙළි පෙහෙළි කරලාත් තිබෙනවා. දෙවැනි වැරැද්ද මෙයයි. මේ ඉඩම සම්බන්ධයෙන් ගත්තාමත් එය ලබා ගත් විධියත් නීති විරෝධී බව අපි දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ ආසනයේ මිනිසුන් මහවැලි ඉඩම් ප්‍රශ්නයට මුහුණ දුන්නු ආකාරය මට මේ අවස්ථාවේදී මතක් වනවා. ඒ මිනිසුන්ට මේ වනතුරු මහවැලියෙන් ඉඩම් ගන්න බැරිව ඉන්නවා. සින්නක්කර ඔප්පුව -ස්වර්ණ භූමි ඔප්පුව, ජයභූමි ඔප්පුව- තිබෙන අපේ ලග්ගල මිනිසුන්ට අද මහවැලියෙන් අක්කරයක් ගන්න බැරිව ඉන්නවා.

මේ ඉඩම් ලබා දුන්නු ආකාරය පිළිබඳවත් අපට ලොකු ගැටලුවක් තිබෙනවා. ඒ වාගේම මේ ඉදිකිරීම් සඳහා ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා ගත් ලිපි ලේඛන අපේ කමිටුවට ඉදිරිපත් කරන්න එතුමාට බැරි වෙලා තිබෙනවා. එතුමා රාජ්‍ය දේපළ වංචාවක් සිදු කරලා තිබෙනවාය කියලා මම කියනවා. මේ සම්බන්ධයෙන් වැදගත්ම කාරණයක් කියන්න තිබෙනවා. මෙතැන පීඨ හයක් ගැන කථා කරනවා. ඉංජිනේරු හා තොරතුරු තාක්ෂණ පීඨය, ගෘහ නිර්මාණ සැලසුම් හා ගිණුම් කටයුතු පීඨය, නීති පීඨය, සංචාරක හා ව්‍යාපාර කළමනාකරණ පීඨය, කෘෂි තාක්ෂණ හා සම්පත් කළමනාකරණ පීඨය, ආගමික, භාෂා හා සංස්කෘතික අධ්‍යාපන පීඨය වාගේම දැන් වෛද්‍ය පීඨයකුත් ඉල්ලා තිබෙනවා. ආගමික, භාෂා හා සංස්කෘතික අධ්‍යාපන පීඨය යටතේ, "Bachelor of Arts in Sharia and Islamic Studies" කියලා තිබෙනවා. මේ උපාධිය කරන අයගෙන් කිසිම අය කිරීමක් කරන්නේ නැහැ. දැනට ලංකාවේ එහෙම නැත්නම් ඉන්දියාවේ, බංග්ලාදේශයේ Islamic සංවිධාන හරහා මේ ගැන පූර්ව ප්‍රචාර සිදු කරලා තිබෙනවා. ජාතිවාදයක් ගැන නොවෙයි මම මේ කථා කරන්නේ. මේක බොහොම වැරදි ක්‍රියාවක්. රජයේ වගකිව යුතු තනතුරක් දරන පුද්ගලයකු හැටියට තම බලය අවභාවිත කර තිබෙනවා කියන එක තමයි මගේ මතය වන්නේ. ඉඩම ලබා ගත්ත තැන ඉඳලාම, මුදල් ගනුදෙනු සිදු වුණු තැන ඉඳලාම, අනවසර ඉදිකිරීම් සිදු කරපු තැන ඉඳලාම -මේ සියල්ලම- නීති විරෝධීයි කියලා මම කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මා මේ කාරණයත් කියනවා. කමිටු සාමාජිකයෙකු ලෙස වාගේම මේ රටේ පුරවැසියෙකු ලෙස ඇහැට දැකපු දේ අනුව මා කරන ඉල්ලීම මේකයි. අපි ඒ ආයතනය නිරීක්ෂණය කරන්න ගියා. මෙම ඉදිකිරීම් සංකීර්ණය රජයට පවරා ගෙන වෙනම විශ්වවිද්‍යාලයක් විධියට හෝ පීඨයක් ලෙස පවත්වාගෙන යෑම සුදුසුයි කියන එකයි අපි කමිටුව හැටියට දකින්නේ. ඒ වාගේම, අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තාවේ දැක්වෙන නිර්දේශවලටත් අවධානය යොමු කරන්න ඕනෑ. ඒ අනුව පරීක්ෂණයක් කරන්න ඕනෑ. දඬුවම් කරන්න ඕනෑ අය ඉන්නවා නම් ඒ අයටත් දඬුවම් කරන්න කියාත් මා ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, දැන් ඔබතුමිය කථාව අවසන් කරන්න.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න. මෙය මුස්ලිම් ප්‍රජාව අපහසුතාවට පත් කිරීමට කරන කාර්යයක් නොවන බව මා නැවත වතාවක් අවධාරණය කරනවා. මොකද, මේ රටේ මේ වෙලාවේ තිබෙන තත්ත්වය හොඳ නැති නිසා හිස්බුල්ලා මහත්මයාගෙනුත් මා ඉල්ලා සිටිනවා, තමන්ගේ වර්ගයා මෙලෙස අසරණ භාවයට, අපහසුතාවට පත් නොකර මේ ආයතනය රජයට බාර දෙන්න කියලා. මේ වැරැද්ද නිවැරදි කරන්න කියලා ගරු ජනාධිපතිතුමාගෙනුත්, අගමැතිතුමාගෙනුත් බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. හිස්බුල්ලා මහත්මයා UNP එකට උදවු කරලා තිබුණා නම් මේ වනකොට මේ විශ්වවිද්‍යාලය එතුමාගෙන් අයින් කරලා රජයට පවරාගෙන අවසාන බව මම කොහොමත් දන්නවා. රුපියල් ලක්ෂ හතරක් පඩි ගන්නවා කියලා පසු පෙළ මන්ත්‍රීවරු හම ගහන හැටි දැන් අපි දකිනවා. මෙය අවස්ථාව කරගෙන රුපියල් ලක්ෂ හතරක් වැටුප් ගන්න මන්ත්‍රීවරුන්ගේ ලේඛනය හෙට වන කොට මාධ්‍යයට ලබා දෙන්න කියන ඉල්ලීම එතුමාට කරමින් මා නිහඬ වනවා. ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

ඊට ප්‍රථමයෙන්, මූලාසනය සඳහා ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு ஹர்ஷன ராஜகருணா அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. HARSHANA RAJAKARUNA *left the Chair, and* THE HON. BIMAL RATHNAYAKE *took the Chair.*

[අ.භා.4.04]

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව ආරම්භ කරන්න පෙර, රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියගේ සමාරම්භක ප්‍රකාශය ගැන අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු ආශු මාරසිංහ මැතිතුමාගෙන් නිවැරදි කිරීමක් කර ගන්නට ඕනෑ. මැතිතුමනි, එවකට ඇමතිතුමා වශයෙන් හිටපු ඩලස් අලහප්පෙරුම මැතිතුමාත් එක්ක එකතු වෙලා මහවැලි ඉඩම් හිස්බුල්ලා මැතිතුමා විසින් අත්පත් කර ගත්තාය කියලා එතුමිය කිව්වා. එහෙම එකක් ආංශික අධීක්ෂණ කමිටු වාර්තාවේ තිබෙනවාද? එහෙම එකක් වාර්තා වෙලා තිබෙනවාද? ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පැහැදිලි කිරීම මට වටිනවා. ශිෂ්ට සම්පන්න ජනතා නියෝජිතයකු විධියට ඔබතුමා කරන ඒ පැහැදිලි කිරීම වටිනවා කියලා මම හිතනවා.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු මන්ත්‍රීතුමනි, වාර්තාවේ පැහැදිලිව තිබෙන්නේ, මහවැලි අධිකාරියේ ඉඩම 2013 වර්ෂයේදී කොයි ආකාරයෙන් ද ලබා දුන්නේ කියන කාරණයයි. මහවැලි අධිකාරියේ ඉඩම ලබා දීම සම්බන්ධයෙන් තමයි මා දිගින් දිගටම ප්‍රකාශ කළේ.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

පැහැදිලියි. ඔබතුමාගේ ප්‍රකාශය පැහැදිලියි. නමුත්, ගරු මන්ත්‍රීතුමියගේ ප්‍රකාශය නිවැරදි කර ගන්නයි මට අවශ්‍ය වෙලා තිබුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඉතාම ගෞරවයෙන් -

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය කාර්යක්ෂමව, උනන්දුවෙන් වැඩ කරන මන්ත්‍රීතුමියක්. ඔබතුමිය චරිත ඝාතනයේ සහ ශිෂ්ටත්වයේ මායිම් තේරුම් ගන්නවා ඇතැයි - [බාධා කිරීමක්]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව දෙනවා නම් හොඳයි.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු මන්ත්‍රීතුමියනි, මට විනාඩි 12යි තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මා එතුමියට වෙලාව දීලායි තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය පැහැදිලි කරන්න.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

එතැනදී, ඔබතුමාගේ පැමිණීම සම්බන්ධයෙන් කතා කරන්න ගිය එක,පොඩි වැරැදීමකින් කියැවුණු දෙයක්.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය එය නිවැරදි කළේ නැත්නම් -

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ඒක හරි. [බාධා කිරීමක්] ඔබතුමාගේ පැමිණීමත් අගය කරනවා, මේවා අහගෙන ඉන්න. ඒ කාලයේ සිටි වග කිව යුතු සහ නිපුණතාවක් තිබුණු - [බාධා කිරීමක්]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் றஹுமான்)
(The Hon. Mujibur Rahuman)

එතුමාගේ කාලයේ තමයි ගිවිසුම අත්සන් කළේ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ඔබතුමාගේ කාලයේ තමයි ඒ ගිවිසුම අත්සන් කළේ. ඒක හරි.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු මන්ත්‍රීතුමියනි, ඔය විධියටම තමයි ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා පින්තූරයක් පෙන්නලා කිව්වේ, මෙන්න ෂරියා විශ්වවිද්‍යාලය වෙනුවෙන් ගිවිසුම අත්සන් කරනවා -ඩලස් අලහප්පෙරුමත් හිස්බුල්ලාත් ගිවිසුමට අත්සන් කරනවා- කියලා. එසේ පින්තූරයක් පෙන්නලා මේ පිළිබඳව ඉතාම විකෘති, අප්‍රසන්න පින්තූරයක් තමයි රට හමුවේ තැබුවේ. මා එතැනට ප්‍රවේශ වෙන්නම්.

මම ස්තුතිවන්ත වෙනවා, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමා ඇතුළු ඒ කමිටුවේ සියලුදෙනාට, කිසියම් තීරණාත්මක කාරණාවක් සම්බන්ධයෙන් ඉතාම වෙහෙසකර, දුෂ්කර අභ්‍යාසයක් කරලා යම් යම් තොරතුරු සොයා ගැනීම පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කතා කරන්න බලාපොරොත්තු වන්නේ මේ සමස්ත මාතෘකාව තුළ ඇති වැදගත් කාරණයක් ගැනයි. මෙහි යම් දූෂණයක්, වංචාවක් වෙලා තිබෙනවා නම්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විධියට අප සියලුදෙනා ඊට එරෙහිව එකමුතුව කටයුතු කරන්න ඕනෑය කියන යෝජනාවට එකඟ වෙමින් තමයි මා කතා කරන්නේ. එවකට යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සම්බන්ධයෙන් දැන හෝ නොදැන බොහෝ සාවද්‍ය කරුණු අද සමාජගත කරලා තිබෙනවා. එවකට සිටි ඇමතිවරයා මමයි.

[ගරු ඩලස් අලහප්පෙරුම මහතා]

සමහර වෙලාවට ඒ කථාව කළේ, සද්භාවයෙන් නොදැන වෙන්න පුළුවන්. එහෙම නැත්නම්, දැනගෙන චරිතය ඝාතන කිරීමේ ද්වේෂසහගත චේතනාව පෙරදැරිව වෙන්නත් පුළුවන්. ඔය දෙකෙන් එකක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඉතාම ආඩම්බරයෙන් තමයි මේ කාරණය කියන්නේ. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ජනාධිපති ධුර කාලය තුළ මේ රටේ නිපුණතාව සංවර්ධනය කිරීම වෙනුවෙන් ඉතිහාසයේ දැවැන්ත පියවර රාශියක් ගත්තා. මේ රටේ තෘතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට පමණක් සීමා නොවී ප්‍රධාන පියවර 5ක් -ප්‍රධාන තීන්දු 5ක්- ගනු ලැබුවා, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මැතිතුමනි. එකක් තමයි, 1 සිට 7 දක්වා වන ජාතික වෘත්තීය සහතිකය - National Vocational Qualification, NVQ - මේ රටට හඳුන්වා දීම. ඒක විශේෂිත පියවරක්. ඒ වාගේම වැදගත් පියවරක්, ඒ වෙනුවෙන් වෙනම විශ්වවිද්‍යාලයක් -වෘත්තීය තාක්ෂණික විශ්වවිද්‍යාලය, UNIVOTEC - ආරම්භ කිරීම. ඒ වාගේම වැදගත් පියවරක් තමයි, තාක්ෂණවේදය විෂයය ධාරාව මේ රටේ උසස් අධ්‍යාපන පාඨමාලා තුළට ඇතුළු කර ගැනීම. ඒ වාගේම වැදගත් තවත් පියවරක් තමයි, විශ්වවිද්‍යාල විද්‍යායතන - University Colleges- ඇති කිරීම. ඒ වාගේම වැදගත් අවසාන පියවර තමයි, NVQ ladder එක සහ ප්‍රධාන උපාධි අතරේ යම් සම්බන්ධතාවක් ගොඩ නැඟීම සඳහා කටයුතු කිරීම. මේක මේ රටේ අනාගතය දෙස දකින කිසිවකුට බැහැර කරන්න පුළුවන් කාරණාවක් නොවෙයි කියා මම හිතනවා.

මා මේ හදන්නේ ප්‍රාථමික දේශපාලනයට ආමන්ත්‍රණය කරන්න නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යටතේ අපි තාක්ෂණවේදය හඳුන්වා දෙන්න තීරණය කිරීමත් එක්ක රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශයත් සමඟ ඒකාබද්ධ වෙලා මේ රටේ විශ්වවිද්‍යාල විද්‍යායතන - University Colleges - 20ක් ආරම්භ කරන්න තීන්දු කරලා, එයින් 6ක් 2013 ඉඳලා 2014 අවසානය වන විට ආරම්භ කරලා තිබෙනවා. යාපනය, කුලියාපිටිය, කෑගල්ල, මාතර, රත්මලාන වැනි නගරවල රාජ්‍ය අංශයේ විශ්වවිද්‍යාල විද්‍යායතනත්, පෞද්ගලික අංශය පැත්තෙන් ජයවර්ධනපුර රෝහලත් සමඟ කාත්තන්කුඩිවල වාගේම, මේ රටේ ඉදිකිරීම් ආයතන රාශියක් සමඟ එකතුවෙලා බත්තරමුල්ලේත් ආරම්භ කළ බව අපට පෙන්වා දෙන්න පුළුවන්. මෙන්න මේ වැඩ පිළිවෙළ ආරම්භ කිරීමේදී තමයි, Sri Lanka Hira Foundation ආයතනයෙන් මේ ඉල්ලීම අප වෙත යොමු වෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ කාරණය කියන්න ආඩම්බර වෙනවා. අපි ඉතාම පැහැදිලිව වෘත්තීය පුහුණු පාඨමාලා 4ක්, කාත්තන්කුඩිය ප්‍රදේශයේ ආරම්භ කළා. පුනානි විශ්වවිද්‍යාලය කියන්නේ තවත් ඇත තිබෙන එකක්. මේ වාර්තාවේ තිබෙනවා, හරියට මෙතැන තිබෙන්නේ පර්චර් 47යි කියලා; "The total land area is about 47 perches".

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 4ක කාලයක් තිබෙන්නේ. ඔබතුමාට කථාව සංවිධානය කර ගන්නයි මම මේ මතක් කිරීම කළේ.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු මහින්ද අමරවීර මන්ත්‍රීතුමා අද කථා කරන්නේ නැහැ. මට එතුමාගෙන් විනාඩි 5ක පමණ කාලයක් ගන්න පුළුවන් වෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමාට දැනට විනාඩි 6ක් වෙන් කර තිබෙනවා. විපක්ෂයේ සංවිධායක කාර්යාලයෙන් ඒ දැනුවත් කිරීම කළ යුතුයි. ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
බොහොම ස්තුතියි.

ඒ අනුව අපි තීරණය කරනවා, විශ්වවිද්‍යාල විද්‍යායතන ආරම්භ කිරීමේ කටයුත්තේදී මේ ආයතනත් සම්බන්ධ කර ගෙන ඒ කටයුතු ආරම්භ කරන්න. මෙතැන කාරණා දෙකක් තිබෙනවා. මම අද මේ සභාවට කියන්නට ඕනෑ, මේ කාරණා දෙක පටලවා ගන්න එපා කියලා. රටේ වෘත්තීය අධ්‍යාපනය නංවාලීම සඳහා මෙවැනි දෙයක් ආරම්භ කිරීම ගැන අපි ආඩම්බර වෙනවා. ගරු රවුෆ් හකීම් මැතිතුමනි, වෘත්තීය නිපුණතාවක් ගන්න උනන්දුවක් තිබෙන දරුවෙක් කාත්තන්කුඩි ප්‍රදේශයේ ඉඳලා කිලෝමීටර් 60ක් දුර ගෙවා ඊළඟ වෘත්තීය පුහුණු ආයතනය වෙත යන්න ඕනෑ. කිලෝමීටර් 60ක් යන්නට ඕනෑ. අපේ අවබෝධතා ගිවිසුම මම සභාගත* කරනවා. ඒ අවබෝධතා ගිවිසුමේ විශේෂිත කොන්දේසි තිබෙනවා. මොනවාද, ඒ කොන්දේසි? ඒ කොන්දේසි යටතේ අපි කියනවා, "The Diploma Courses should be offered on free of charge basis" කියලා; සල්ලි හම්බ කරන්න නොවෙයි.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කාරණයක් පැහැදිලි කරන්නම්.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාලය එතුමාගේ වේලාවෙන් අඩු කරන්න.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ලක්ෂ්මන් හුළුගල්ල මැතිතුමා Sri Lanka Hira Foundation ගැන NGO Secretariat එකට වාර්තාවක් ලබා දීලා තිබුණා, මේක භයානක සංවිධානයක් හැටියට. ඔබතුමන්ලා Agreement එක sign කරනකොට ඒ වාගේ වාර්තාවක් සොයා ගත්තේ නැද්ද?

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
නැහැ. අපේ අමාත්‍යාංශයට 2013දී මෙවැනි Agreement එකකට එවැනි වාර්තාවක අවශ්‍යතාවක් පිළිබඳව කිසිම ආකාරයකින් දැනුම්දීමක් කරලා තිබුණේ නැහැ. ඔය කියන වාර්තාව එන්නේ 2017දී.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
2014දී තමයි අපට ලැබිලා තිබෙන්නේ. 2014දී තමයි NGO Secretariat එකට ලැබිලා තිබෙන්නේ. නමුත්, ඊට කලිනුත් විස්තර අරගෙන තිබෙනවා; 2013 වර්ෂයේත් ලැබිලා තිබෙනවා. නමුත්, 2014 වර්ෂයේ,-

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාව වෙනකොට මේක 1993දී සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි ආයතනයක් විතරයි. ඔබතුමා දන්නවා. ඔබතුමා ළඟ එම ලේඛනය තිබෙනවා. මෙය රාජ්‍ය නොවන සංවිධානයක් විධියට එනම් NGO එකක් විධියට, -[බාධා කිරීමක්]- පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් කරන්නේ 2015 මාර්තු 02වැනි දා.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

යෝජනා සම්මතයයි, පිළිගැනීමයි කියන්නේ දෙකක්. යෝජනා කිසිවක් පිළිගෙන නැහැ.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

මම කියන්නේ පිළිගත්ත එක ගැන නොවෙයි. ඒක පාර්ලිමේන්තුවට ආවේ 2015 දී.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත් පිළිගෙන නැහැ.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

අපි කටයුතු කරන්නේ 1993දී සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ආයතනයක් සමඟයි.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ඒ අවස්ථාවේදී ලක්ෂ්මන් හුළුගල්ල මැතිතුමා මේ ගැන කියලා තිබෙනවා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ඒ නිසාම අපේ මේ කොන්දේසි ටික දිහා බලන්න. අපි ඉතාම පැහැදිලිව කියන කොන්දේසි අතරේ එකක් තිබෙනවා, “All Diploma Courses should be opened to the youth of general public of Sri Lanka” කියලා. මේක එක ජාතියකට, එක ආගමකට සීමා කරපු එකක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ ලේඛනය **සභාගත*** කරනවා.

මේ සියලු කාරණා ඇතුළත් කරලා වෘත්තීය පුහුණු පාඨමාලා තුනක් ආරම්භ කරනවා. ඒකට අර්ථ නිරූපණයක් දෙනවා, "විශ්වවිද්‍යාලයක්" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විශ්වවිද්‍යාලය පටන් ගන්නේ කවදාද? Batticaloa Campus College (Pvt.) Limited එකට ඉල්ලීම කරන්නේ ම, 2015.07.14 වෙනි දා. ඊළඟට, "Batticaloa Campus (Pvt.) Limited" කියලා නම වෙනස් වෙන්නේ 2016.02.19 වෙනි දා. ඔබතුමාගේ වාර්තාවේ මේ සියල්ලම තිබෙනවා. ඒ වාගේම, 2015 දී BOI එකට ඉල්ලීම කරන්නේ හත්වෙනි මාසයේ 17 වෙනි දා. Batticaloa Campus (Pvt.) Limited එකට BOI approval එක ලැබෙන්නේ 2016.01.12 වෙනි දා. මේ පළමු ගිණුම විවෘත වෙන්නේ කවදාද? මේ පළමු ගිණුම විවෘත කරන්නේ ම 2016.01.04 වන දා. මේ කාරණා ටික බැලුවාම විශ්වවිද්‍යාලයක් සඳහා ඉල්ලුම් කරන දිනය, ඒක අනුමත කරන දිනය, ඒ සඳහා ගිණුම විවෘත කරන දිනය, එහි කළමනාකරණ කටයුතු ආරම්භ කරන දිනය කියන මේ සියල්ලම සිදු වෙන්නේ 2015.07.14න් පස්සේ. නමුත්, කීප දෙනෙක් කරන්නේ මොකක්ද? ලංකාව පුරා ක්‍රියාත්මක වූ වෘත්තීය පුහුණු පාඨමාලා ආරම්භ වීමේ කටයුත්තයි, මේකයි අතරේ පාලමක් හදන්න කටයුතු කරනවා. ඒක ද්වේශසහගතව කරන බවයි මට සමහර අයගේ කථාවලින් දැනෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අමාත්‍යාංශය යටතේ කථා කරද්දී ගරු රවුෆ් හකීම් ඇමතිතුමනි, ජර්මන් ටෙක් එකට අවුරුදු හතකින් ලංකාවේ බහුතරයක් දමිළ භාෂාව කථා කරන දිස්ත්‍රික්ක පහකින් එක දරුවෙක්වත් ඇවිල්ලා නැහැ. එක දරුවෙක්වත් ඇවිල්ලා නැහැ! මොකක්ද මේකට හේතුව කියලා බැලුවාම පෙනුණ දෙයක් තමයි, අඩුම ගණනේ ඒ දැන්වීම දමිළ භාෂාවෙන් මුද්‍රණය වෙන පත්තරයක පළ කරන්නේ නැහැ කියන එක. කොළඹ විතරයි ඒ exam centre එකක් තිබෙන්නේ. අපි මේක වෙනස් කරනවා, ලංකාවේ හැම දරුවෙකුටම එන්න පුළුවන් වෙන විධියට. අපි ඒ අනුව ලංකාවේ මධ්‍යස්ථාන හතරක ඒ කටයුතු ආරම්භ කරනවා. දමිළ භාෂාවෙන් මුද්‍රණය වෙන පත්තරවලත් මේ ගැන දැන්වීමක් පළ කරනවා. ඊටපසු අවුරුදු දෙකක් යනකොට දමිළ භාෂාව මව් භාෂාව කර ගත් දරුවන් තිස්පස් දෙනෙක් ජර්මන් ටෙක් එක ඇතුළට එනවා. අපට අවශ්‍ය වෙලා තිබුණේ අමාත්‍යාංශයක් විධියට රටේ හැම ජන කොටසක් අතරටම මේ නිපුණතාව අරගෙන යන්නයි. තමුන්නාන්සේලා කොච්චර චෝදනා කළත්, මම මේ අවස්ථාවේදී හිස්බුල්ලා මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. 2013 ඉඳලා අවුරුදු තුනකටයි මේ සඳහා අවසර දුන්නේ. මම කථා කරන්නේ ඒ වෘත්තීය පුහුණු ආයතනය ගැනයි; මේ කියන විශ්වවිද්‍යාලය ගැන නොවෙයි. මේ කියන විශ්වවිද්‍යාලය ගැන මට කිසිම අවබෝධයක් නැහැ. ආශු මාරසිංහ මැතිතුමාගේ කමිටු වාර්තාවේ තිබෙන තොරතුරු අනුව මට ඒ ගැන අවබෝධයක් නැහැ. ඒ නිසා මම ඒ ගැන කථා කරන්නේ නැහැ. හැබැයි, මේ වෘත්තීය පුහුණු පාඨමාලා පවත්වාගෙන ගිය තැන්වලදී මුදල් අය කරන්නේ නැතිව NVQ level 5 සහතික පත්‍ර 168ක් අහිංසක දරුවන්ට ප්‍රදානය කරලා තිබෙනවා. එතැනදී හිස්බුල්ලා මැතිතුමා ඉතා අවංකව ඒ කටයුතුවලදී පෙනී ඉඳලා තිබෙනවා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ, මේ කරුණු දෙක පටලවන්න දෙන්න එපා කියලායි. මෙතැන තිබෙන්නේ කරුණු දෙකක්. කිසිසේත්ම සම්බන්ධයක් නැහැ, කාත්තන්කුඩි නගරයේ 2013දී ආරම්භ කරපු පර්චස් 47ක පුංචි බිමක, පුංචි ගොඩනැගිල්ලක ආරම්භ කරපු වෘත්තීය පුහුණු පාඨමාලා තුනත්, ඒ වාගේම 2016දී BOI approval එක ඇතිව Batticaloa Campus (Pvt.) Limited කියලා පුනානිවල ආරම්භ කරපු -කාත්තන්කුඩිවලට වඩා කිලෝමීටර් 55කට මෙහා පැත්තේ ආරම්භ කරපු- විශ්වවිද්‍යාලයත් කියන්නේ පැහැදිලිවම ආයතන දෙකක්. 2019දී මේ මොහොතේත් කාත්තන්කුඩියේ ඒ ආයතනය පවතිනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආයතන දෙක එකක් හැටියට හඳුන්වලා, දේශපාලන වශයෙන් කෙනකුගේ චරිත ඝාතනය කරන්න හදන කිසි කෙනෙකුට පටු දේශපාලන වාසියක් වෙනුවෙන් කටයුතු කරන්න ඉඩ දෙන්න එපා කියන ගෞරවනීය ඉල්ලීම කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[අ.භා. 4.19]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම Batticaloa Campus (Pvt.) Limited හෙවත් මඩකලපුව පෞද්ගලික විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

පෞද්ගලික විශ්වවිද්‍යාල ගැන කථා කරන මේ අවස්ථාවේ දී ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමාත් මෙතැන සිටින නිසාත්, මේ දවස්වල ලංකාව පුරාම අ.පො.ස.(උසස් පෙළ) විභාගය පැවැත්වෙන නිසාත්, මෙම කාරණය පිළිබඳව මම එතුමාගේ අවධානය යොමු කරවනවා. මුස්ලිම් ශිෂ්‍යාවන්ට හිජාබය පැළඳගෙන විභාගය ලිවීම සමහර විභාග මධ්‍යස්ථානවල අවහිර කරලා තිබෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛයක් මඟින් මුස්ලිම් ශිෂ්‍යාවන්ට හිජාබය පැළඳගෙන විභාගයට පෙනී සිටීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශය සහ විභාග දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබෙනවා. එසේ ලබා දී තිබියදීත් සමහර විභාග ශාලාවල සිටින පුද්ගලයන් තමන්ගේ පෞද්ගලික අදහස් ක්‍රියාත්මක කිරීම නිසා මුස්ලිම් ශිෂ්‍යාවන් අපහසුතාවට පත්වෙලා තිබෙනවා. මේ කාරණය අධ්‍යාපනය එක්ක සම්බන්ධ නිසාත්, මේ වකවානුව විභාගය පවත්වන කාල වකවානුවක් නිසාත් මම මේ අවස්ථාවේ දී ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා, මෙම ප්‍රශ්නයට මැදිහත් වෙලා එම අවහිරතා ඉවත් කරලා, ඒ ළමයින්ට යහපත් මානසික මට්ටමකින් යුතුව විභාගයට පෙනී සිටීමේ අයිතිය ලබා දෙන්න කියලා.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි අවස්ථාවක් දෙන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මොකක්ද ඔබවහන්සේගේ ගැටලුව?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට වෙන් වූ කාලයෙන් තමයි ගරු අතුරලියේ රතන ස්වාමීන්වහන්සේට වේලාව දෙන්න වන්නේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වේලාව දෙන්න බැහැ.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මට තත්පරයක කාලයක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Point of Order එකක් නොවෙයි නම් කාලය ලබා දෙන්න අපහසුයි, ගරු ස්වාමීන්වහන්ස.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මට පොඩි පැහැදිලි කර ගැනීමක් සඳහා තත්පරයක කාලයක් දෙන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
හොඳයි, අහන්න, අහන්න.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිජාබය ඇන්දාම කන් දෙක වැහෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
කන් ඇරගෙනයි ඒක අඳින්නේ.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
හිජාබය අඳින්නේ කන් ඇරගෙන කියලා ඔබතුමා එකඟ වෙනවාද?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔව්, එකඟ වෙනවා.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
එහෙම නම් ප්‍රශ්නයක් නැහැ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
විභාග දෙපාර්තමේන්තුවෙන් එම කොන්දේසිය දාලා තිබෙනවා. කන් දෙක නොවැසෙන පරිදි හිජාබය පැළඳගෙන විභාගය ලියන්න කියන එකට එකඟ වෙනවා. අපිත් ඒකට එකඟයි. [බාධා කිරීමක්] නැහැ, නැහැ. අපි ඒකට එකඟයි, ගරු ස්වාමීන්වහන්ස. ඒ ගැන වාදයක් නැහැ. හිජාබය පැළඳගෙන විභාගය ලියන අවස්ථාවේ දී ශිෂ්‍යාවන්ගේ කන් දෙක පෙනෙන්නට තිබිය යුතුයි කියන එකට අපි එකඟයි. ඒ කියන්නේ, Identity Card photo එකේ තිබෙන විධිය ගැන විවාදයක් නැහැ, ඒකට එකඟයි. නමුත්, සමහර තැන්වලදී ඒ විධියට පැළඳගෙන එන්නත් ඉඩ දීලා නැහැ, විභාගය ලියන්නත් ඉඩ දීලා නැහැ. ඒ අයිතිය ලබා දීලා තිබියදීත් සමහර අය ඒක වළක්වනවා. හිජාබය නුරුස්සන සමහර අය ඉන්නවා. අනෙක් අයගේ අනන්‍යතා පිළිගන්නේ නැති උදවිය ඉන්නවා. ඒ උදවියගේ මානසික මට්ටම ගැන සොයලා රජය ඒ අය සම්බන්ධයෙන් යම් ක්‍රියාමාර්ග ගන්න වෙනවා. මොකද, ඒවා රජයේ ප්‍රතිපත්තියට විරුද්ධව කරන දේවල් නිසා. අධ්‍යාපන අමාත්‍යාංශය, ඒ වාගේම විභාග දෙපාර්තමේන්තුව යම් guideline එකක් ලබා දීලා තිබියදී, එයට පටහැනිව සමහර උදවිය තමන්ගේ පෞද්ගලික අදහස් ක්‍රියාත්මක කරන්න උත්සාහ කරනවා. ඒ තුළ නොයෙකුත් ආකාරයේ ගැටුම් නිර්මාණය වීම වළක්වාගන්න අවශ්‍ය නිසා තමයි ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමාට මා මේ ප්‍රශ්නය යොමු කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද Batticaloa Campus (Pvt.) Limited හෙවත් මේ පෞද්ගලික විශ්වවිද්‍යාලය ගැන විශාල ආරවුලක් මතුවෙලා තිබෙනවා. ඒ ආරවුල මතුවෙලා තිබෙන්නේ ඒක Sharia university එකක් කියලා බොහෝ අය කියන්න උත්සාහ කළ නිසා. එහෙම නැත්නම් ඒක ඉස්ලාමීය නීතිය උගන්වන university එකක් -විශ්වවිද්‍යාලයක්- කියලා කිව්වා. ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා, එතුමන්ලාගේ කාලයේ නිපුණතා සංවර්ධනය සඳහා ගත් පියවර ගැන, අත්සන් කළ ගිවිසුම් ගැන, කථා කරලා, වෘත්තීය මට්ටම දියුණු කිරීමට හදපු පාසලක් හැටියට තමයි මෙම විශ්වවිද්‍යාලය හැඳින්වූයේ. අපි එහි යථාර්ථය, එහි ඇතුළාන්තය අරගෙන බැලුවොත්, ඇත්තටම කමිටු සාකච්ඡාවල දී ඒක Sharia university එකක් හැටියටවත්, එය ඉස්ලාමීය නීතිය උගන්වන විශ්වවිද්‍යාලයක් හැටියටවත් හඳුන්වලා නැහැ. එතකොට, යම් යම් අය සමාජය තුළ යම් ගැටුම් නිර්මාණය කරන්න මේ කරුණ පාවිච්චි කළා; ගැටුම් ඇති කරන්න උත්සාහ කළා. ඒක Sharia university එකක් නොවෙයි. මේ වාර්තාව හදපු මහාචාර්යතුමාත් මෙතැන ඉන්නවා. එතුමා කියන හැටියටත් ඒක Sharia university එකක් නොවෙයි. නමුත්, එහි ඉස්ලාමීය නීතිය උගන්වන අංශයක් තිබෙන්නට පුළුවන්. ඉස්ලාම් නීතිය උගන්වන විශ්වවිද්‍යාල ලෝකයේ ඕනෑ තරම් තිබෙනවා. එවැනි විශ්වවිද්‍යාල ලෝකයේ ඕනෑ තරම් තිබෙනවා. බෞද්ධ දර්ශනය ගැන උගන්වන අංශ තිබෙනවා, ඉස්ලාම් නීතිය උගන්වන අංශ තිබෙනවා, ක්‍රිස්තියානි නීතිය උගන්වන අංශ තිබෙනවා. ඒ වාගේම අනෙකුත් ආගම් උගන්වන අංශය තිබෙනවා. එවැනි විශ්වවිද්‍යාල ලෝකයේ හැම තැනකම තිබෙනවා.

මම හිතන විධියට ලංකාවේ තිබෙන විශ්වවිද්‍යාලවලත් ඒවා තිබෙනවා. ඒක අලුත් දෙයක් නොවෙයි. නමුත් මෙතැන තිබෙන ප්‍රශ්නය වන්නේ, අපේ උසස් අධ්‍යාපන කමිටුවේත් මතු කරන්නේ මේ සඳහා මුදල් ආපු විධිය ගැනයි. ඒක තමයි මෙතැන තිබෙන ලොකුම ගැටලුව. හිස්බුල්ලා මැතිතුමා මේ මුදල ලබා ගත්තේ කොහොමද, හිස්බුල්ලා මැතිතුමා මේ මුදල ගෙන්වා ගැනීමේ දී නීති විරෝධීව කටයුතු කරලා තිබෙනවාය කියන ගැටලුව පිළිබඳව තමයි අද මෙතැන බොහෝ කථිකයන් කථා කළේ. එහෙම නැතිව එම විශ්වවිද්‍යාලයේ උගන්වන විෂයයන් සම්බන්ධව, එම විශ්වවිද්‍යාලයේ තිබෙන සැලසුම් හා එහි තිබෙන ස්වභාවය වැනි දේවල් පිළිබඳව නොවෙයි කථා කළේ. නීති විරෝධී ලෙස මුදල් ගෙනැල්ලා තිබෙනවා. නීති විරෝධී මුදල් ගෙනැත් හදපු විශ්වවිද්‍යාලය නීති විරෝධී විශ්වවිද්‍යාලයක්. ඒ නිසා මේක රජයට පවරා ගත යුතුයි කියන අදහස තමයි හුඟක් අය මේ විවාදයේදී දී මතු කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එක දෙයක් කියනවා. හිස්බුල්ලා මැතිතුමා එතුමාගේ ප්‍රචාරක කටයුතුවලදී බොහෝ දුරට ප්‍රකාශ කළේ, එතුමා සවුදි රාජ්‍යයට ගිහින් සවුදි අරාබියේ සිටින අරාබි ජාතිකයන්ගෙන් යම් යම් ආධාර උපකාර ලබාගෙන තමයි මේ ආයතනය ගොඩ නැඟුව බවයි. එතුමා පසුගිය කාලයේ කථා කරපු දේවල් සහ ඒ video clips හුඟක් මම බැලුවා.

මේ ප්‍රශ්නය ඇති වෙන්න කලින් එතුමා කථා කරපු දේවල් දෙස බලනකොට, එතුමා සවුදි අරාබිය වැනි රටවලට ගිහින් එහේ සිටින දානපතියන් හමුවෙලා, එම දානපතියන්ගේ ප්‍රදාන හැටියට මේ මුදල් ගෙනැවිත් මෙම විශ්වවිද්‍යාලය, එහෙම නැත්නම් මේ ආයතනය ගොඩ නැඟුවා කියන එක තමයි එතුමා කිව්වේ. ඒ ගැන සිතා බැලුවාම, අපේ රටේ යම් යම් දේවල් කරන්න ප්‍රදාන ලබා දෙන ලෝකයේ හුඟක් රටවල් තිබෙනවා; එහෙම පුද්ගලයන් ඉන්නවා. නෙදර්ලන්තයෙන් වෙන්න පුළුවන්, ඕස්ට්‍රේලියාවෙන් වෙන්න පුළුවන්, ජපානයෙන් වෙන්න පුළුවන්, එංගලන්තයෙන් වෙන්න පුළුවන්, ඇමෙරිකාවෙන් වෙන්න පුළුවන් ඒ වාගේ ප්‍රදාන අරගෙන සමාජ සේවය කරන උදවිය, ඒ ප්‍රදාන අරගෙන මේ රටේ ජනතාවගේ යම් යම් සංවර්ධන කටයුතු වෙනුවෙන් යොදවන උදවිය ඉන්නවා. අපි කාටවත් ඒ ගැන ගැටලුවක් නැහැ. මම හිතන විධියට ඒක අපි කාටවත් ප්‍රශ්නයක් නොවෙයි. ඕනෑම රටක කවුරු හෝ කෙනෙක් මේ රටේ තිබෙන දේවල් සංවර්ධනය කරන්න ඉදිරියට එනවා නම්, අපි කවුරුත් ඒ මුදල් අරගෙන මේ රටේ යහපත වෙනුවෙන්, රටේ ජනතාවගේ යහපත වෙනුවෙන් ක්‍රියාත්මක වෙනවා. හිස්බුල්ලා මැතිතුමාත් මේ ප්‍රශ්නය ඇති වෙන්න කලින් ඒක තමයි කිව්වේ. නමුත් මෙතැනදී මට තිබෙන ගැටලුව තමයි, ප්‍රදානයක් හැටියට ලබා දීපු මුදලක් එතුමාගේ පෞද්ගලික ආයතනයක් වෙනුවෙන් හරවා ගත්තේ කොහොමද කියන එක. එතුමාගේ පවුලේ ව්‍යාපාරයකට ඒ මුදල් ලැබුණේ කොහොමද කියන ප්‍රශ්නය තමයි මාත් මතු කරන්නේ. මේක තමයි ගැටලුව. මෙම ආයතනය රජයට පවරා ගන්න කියලාත් මේ වාර්තාවේ තිබෙනවා. මම කියන්නේ රජයට ගන්න, ඒ ගැන පරීක්ෂණ කරන්න. එතුමාට නීති විරෝධී ලෙස ඒ මුදල් ඇවිත් තිබෙනවා නම්, ඒකට අවශ්‍ය නීතිමය පියවර ගන්න. ඒක ගැන ගැටලුවක් නැහැ.

නමුත් එතුමාගේ කථාවලදී එතුමා පැහැදිලිව කියූ පරිදි, මේ රටේ සිටින අහිංසක ජනතාවට, විශේෂයෙන් අඩු ආදායම් ලබන පවුල්වල ජනතාවට උසස් අධ්‍යාපනය ලබා ගැනීමට ඒ රටවලින් මේ මුදල් ප්‍රදානය කළ නිසා ඒවා අනිවාර්යයෙන්ම ජනතාව සතු වෙන්න ඕනෑ. එහෙම නැතිව හිස්බුල්ලා මැතිතුමාගේ පවුලට මේ මුදල් යන්න බැහැ. ඒ නිසා මම යෝජනා කරනවා, විශේෂයෙන්ම මේ ආයතනය භාරකාරත්වයකට යටත් කරන්න ඕනෑ කියලා; මෙය trust එකකට ගෙන යන්න ඕනෑ. මෙය රජයට ගන්නේ නැතිව භාරකාරත්වයක් යටතට ගෙනැවිත්, එම ප්‍රදේශයේ සංවර්ධනය වෙනුවෙන්, එහෙම නැත්නම් මේ රටේ සියලු අඩු ආදායම්ලාභී පවුල්වල සිටින දරුවන්ට උසස් අධ්‍යාපනය ලබා ගත හැකි යම් ක්‍රමයකට මෙය පරිවර්තනය කරන්න ඕනෑ. මෙය රජයට පවරා ගැනීමෙන් විසඳුම ලබා දෙන්න පුළුවන් නම් හොඳයි කියලා මම හිතනවා. නමුත් තිබෙන විශ්වවිද්‍යාල ටිකත් රජයට නඩත්තු කර ගන්න බැහැ. තිබෙන විශ්වවිද්‍යාලවලට ගන්න ළමයි ටික වැඩි කර ගන්න බැහැ. තිබෙන විශ්වවිද්‍යාලවල සිටින දරුවන්ට පහසුකම් ටික ලබා දෙන්න බැහැ. එහෙම තිබියදී මෙම ආයතනයත් රජයට පවරා ගැනීම තවත් ප්‍රශ්න වැඩි කර ගැනීමක් හැටියට තමයි මම නම් දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මුදල් විදේශ රටවල සිටින දානපතියන් මේ රටේ ජනතාවගේ ප්‍රයෝජනය සඳහා, මේ රටේ ජනතාවගේ සංවර්ධනය වෙනුවෙන් ප්‍රදානය කරපු මුදල්. ඒ නිසා මේ මුදල් කාගේවත් පෞද්ගලික වුවමනාවක් වෙනුවෙන්, පවුලේ වුවමනාවක් වෙනුවෙන් යම්කිසි ලාභයක් ලැබීම සඳහා භාවිත කිරීම වැරැදියි. අපට ඒකට එකඟ වෙන්න බැහැ. මේ මුදල් මේ රටේ ජනතාවගේ සංවර්ධනය වෙනුවෙන් ප්‍රදානය කළ නිසා අනිවාර්යයෙන්ම ඒවා භාරකාරත්වයකට යටත් කරන්න ඕනෑ. ඒ භාරකාරත්වය ඇති කරන කොට එහි නියෝජනයක් හිස්බුල්ලා මැතිතුමාගේ පවුලේ උදවියට ලබා දෙනවාට අපේ විරුද්ධත්වයක් නැහැ. ඒ ගැන අපට සලකා බලන්න පුළුවන්. නමුත්, මේ මුදල් රටේ ජනතාව වෙනුවෙන් විදේශ රටවල සිටින, විශේෂයෙන්ම සවුදි අරාබියේ සිටින දානපතියන් විසින් ලබා දීපු මුදල්. ඒකයි මෙහි මූලික හරය. ඒ මුදල් අපි කාගේ හෝ පෞද්ගලික වුවමනාවකට, පවුලේ වුවමනාවකට, පවුලේ ආයතන ගොඩනඟා ගන්න වැය කරනවාට අපි එකඟ නැහැ.

மூලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, நான் ஒரு விஷயத்தைச் சொல்லவேண்டும். அது என்னவென்றால், இன்று இந்தப் பல்கலைக்கழகம் இந்த நாட்டிலே ஒரு பிரச்சினையை உருவாக்கக்கூடிய நிலைமைக்கு வந்திருக்கின்றது. ஹிஸ்புல்லா அவர்கள் -

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා සභාවේ ඉන්න වෙලාවේ සභාගත කරන්න ඕනෑ ලිපියක් තිබෙනවා. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයෙන් භයානක සංවිධානයක් ලෙස Hira Foundation එක නම් කර තිබෙන්නේ, 2012.04.18වෙනි දා. ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමනි, ඒ නිසා ඔබතුමා අත්සන් කර තිබෙන්නේ භයානක සංවිධානයක් එක්කයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
2012 ද?

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)"
2012.04.18වෙනි දා තමයි ලක්ෂ්මන් හුළුගල්ල මැතිතුමා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ නිරීක්ෂණ සහිත ලිපිය හිස්බුල්ලා මැතිතුමාට එවා තිබෙන්නේ, භයානක සංවිධානයක් හැටියට ඒකට අනුමැතිය දෙන්න බැහැ කියලා. එම ලිපිය මම **සභාගත*** කරනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
2012 දී තමයි රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඒ වාර්තාව නිකුත් කර තිබෙන්නේ.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
Sir, I rise to a point of Order. එතකොට එවැනි සංවිධානයකට විශ්වවිද්‍යාලයක් හදන්න, 2017දී අනුමැතිය දෙන්නේ ඇයි?

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමාත් මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා. මම ඉතා වගකීමෙන් කියනවා, කිසිම අනුමැතියක් දීලා නැහැ කියලා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
BOI approval හම්බ වුණාතේ?

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
BOI approval හම්බ වුණාට, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ අනුමැතිය ලැබුණේ නැත්නම් එය උසස් අධ්‍යාපන ආයතනයක් නොවෙයි. BOI approval දෙන්න පුළුවන් for any company. නමුත් මේකට උසස් අධ්‍යාපන ආයතනයක් හැටියට කිසිම අනුමැතියක් දීලා නැහැ. මම ඉතා වගකීමෙන් ඒක කියන්නේ. කිසිම අනුමැතියක් දීලා නැහැ. උසස් අධ්‍යාපන ඇමතිතුමා ඉන්නවා. එතුමා පසුව පිළිතුරු දෙයි.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-[බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ වෙලාවෙන් නොවෙයි, මම මේ සභාවේ වෙලාව ලබා දෙන්නම්. ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
එම පදනමේ සභාපතිවරයා ඊට පස්සේ මැතිවරණ තුනක දී තරග කරලා මේ පාර්ලිමේන්තුවට තේරී පත් වෙලා තිබෙනවා. දැන් ඒක ඔය කියන විධියේ සංවිධානයක් නම්, එහි සභාපතිවරයා මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු විධියට තෝරා පත් කර ගැනීම බරපතළ ගැටලුවක් නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ පැහැදිලි කිරීම අවසන්ද?

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
අවසන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දීර්ඝ වශයෙන් මේ සම්බන්ධයෙන් වාද කරමින් යන්න අපහසුයි. ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා අවසාන වශයෙන් පැහැදිලි කරන්න.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මේ සම්බන්ධයෙන් පැහැදිලිවම නීතිපති දෙපාර්තමේන්තුව වාර්තාවක් එවා තිබෙනවා හිස්බුල්ලා මහතා 2013දී එතුමා සමඟ අත්සන් කළ ගිවිසුම වැරදියි; නීති විරෝධියි; a conflict of interest තිබෙනවා කියලා. අනිවාර්යයෙන් එතුමාගේ මන්ත්‍රී ධුරය ආපස්සට ගිහිල්ලා අහෝසි විය යුතුයි කියලා සඳහන් වෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවේ එම වාර්තාවත් මම අද සභාගත කළා. ඒ වාගේම, BOI එක සමඟ අත්සන් කරන ලද ගිවිසුමත් වැරැදියි කියලා නීතිපති දෙපාර්තමේන්තුව දන්වා එවා තිබෙනවා. ජනාධිපතිතුමා තමයි එතුමා National List එකෙන් පාර්ලිමේන්තුවට ගත්තේ .

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මම කියන්නේ, 2013 එක -

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
2013දී ඔබතුමා සමඟ අත්සන් කරන ලද ගිවිසුම නීති විරෝධියි. ඒ කියන්නේ, a conflict of interest තිබෙනවා කියන කාරණය තමයි නීතිපති දෙපාර්තමේන්තුව මතු කරන්නේ. ඒ නිසා

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගන්න කියලා කථානායකතුමා හරහා නැවත අපි නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටියා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ඔබතුමා පැහැදිලි කරලා කිව්වා, නීතිපතිවරයාගේ ලිපියේ කරුණු දෙකක් පිළිබඳව. ආයෝජන මණ්ඩලය සමඟ අත්සන් කරපු එක-

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ආයෝජන මණ්ඩලය සමඟ අත්සන් කරපු එකත් වැරැදියි, ඔබතුමාගේ කාලයේ 2013දී අත්සන් කරපු එකත් වැරැදියි, මේ දෙකම වැරැදියි කියලා නීතිපති දෙපාර්තමේන්තුව කියා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මේ සඳහා මීට වඩා කාලය ලබා දෙන්න අමාරුයි. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා, ඔබතුමාට අමතරව විනාඩි දෙකක කාලයක් ලබා දෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று பாராளுமன்றத்திலே இந்தப் பல்கலைக்கழகம் தொடர்பாகக் கதைக்கப்பட்டபோது, இதற்குப் பணம் வழங்கியது சட்டத்திற்கு விரோதமானதும் முரண்பாடானதுமான விடயம் எனத் தெரிவிக்கப்பட்டதுடன், தெரிகுழுவிலும் இவ்வாறு தெரிவிக்கப்பட்டிருக்கின்றது. கடந்த காலங்களில் ஹிஸ்புல்லாஹ் அவர்கள் தேர்தல் மேடைகளிலே பேசியபோது, இந்தப் பணமானது சவூதி அரேபியாவில் இருக்கக்கூடிய அரேபியர்களால் இங்கிருக்கின்ற மக்களுடைய தேவைகளுக்காகக் கொடுக்கப்பட்ட பணம் என்று கூறியிருக்கின்றார். அவ்வாறு இந்த நாட்டிலே வாழக்கூடிய மக்களுடைய அபிவிருத்தித் தேவைக்காகக் கொடுத்த பணத்தை அவர் தனது சொந்தத் தேவைக்கோ அல்லது அவருடைய பெயரில் ஒரு நிறுவனத்தைத் தாபிப்பதற்கோ அல்லது அவருடைய குடும்பத்தாரின் வியாபார நடவடிக்கைகளை மேற்கொள்வதற்கோ அவர் பயன்படுத்த முடியாது. சவூதி அரேபியாவில் இருக்கக்கூடிய தனவந்தர்களால் இந்த நாட்டிலே எளிய குடும்பத்தில் இருக்கக்கூடிய பிள்ளைகளுடைய கல்வியை முன்னேற்றுவதற்காகக் கொடுக்கப்பட்ட பணமாக இருந்தால் நிச்சயமாக இந்தப் பல்கலைக்கழகத்தினை ஒருவருடைய சொந்தச் சொத்தாக அல்லது குடும்பத்தினுடைய தேவைக்காகப் பயன்படுத்துவதனை எங்களால் ஏற்றுக்கொள்ள முடியாது. ஏனென்றால் இது ஒரு குடும்பத்தாருடைய சொத்து அல்ல! இதனை ஒரு குடும்பத்தாருடைய சொத்தாகக் கருதுவதற்கு இது அவருடைய சொந்தப் பணமல்ல! இது சவூதி அரேபியா நாட்டிலே இருக்கக்கூடிய தனவந்தர்கள் மூலமாக இந்த நாட்டிலே வாழக்கூடிய மாணவர்களுடைய கல்வியை முன்னேற்றுவதற்காகக் கொடுக்கப்பட்ட பணம்! கௌரவ ஹிஸ்புல்லா அவர்கள் அது தொடர்பாகத் தேர்தல் காலத்திலே மேடைப் பிரச்சாரங்களிலே தெளிவாகக் கூறியுள்ளார். தான் அரபு நாட்டிற்குச் சென்று இந்த நாட்டிலுள்ள மாணவர்களுடைய கல்வித் தேவைக்காகப் பயன்படுத்துவதற்காகத்தான் இந்தப் பணத்தைச் சேர்த்துக் கொண்டு வந்ததாகவும் இது தன்னுடைய பணம் அல்ல என்றும் அவர் கூறியிருக்கின்றார். இதனை அவருடைய ஒரு சொந்த நிறுவனமாகவோ அல்லது அவருடைய குடும்பத்தாருடைய நிறுவனமாகவோ பயன்படுத்த முடியாது. அப்படிப் பயன்படுத்துவது எந்த வகையிலும் நியாயம் இல்லையென்பதை நாங்கள் ஏற்றுக்கொள்ள வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இப்போது இருக்கக்கூடிய நிலைமையில், என்னால் முன்வைக்கக்கூடிய கருத்து என்னவென்றால் 'நம்பிக்கை நிதியம்' என்று கூறக்கூடிய trust ஒன்றுக்குக்கீழே இதனைக் கொண்டுவர வேண்டும் என்பதுதான். நம்பிக்கை நிதியம் என்று சொல்லக்கூடிய அந்தக் conceptக்குள் இதனை நாங்கள் சேர்த்துக்கொள்வதனூடாக இந்தப் பல்கலைக்கழகத்தை நிச்சயமாக எல்லா மக்களும் பயன்படுத்தக்கூடிய நிலைமைக்கு நாங்கள் கொண்டுவர வேண்டுமென்று கூறிக்கொண்டு, என்னுடைய பேச்சை முடிக்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்ததாக கௌரவ உறுப்பினர் டக்ளஸ் தேவானந்தா அவர்கள்!

[பி.ப. 4.37]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்றைய தினம் மட்டக்களப்பு தனியார் பல்கலைக்கழகம் பற்றிய அவதானிப்புக்கள் தொடர்பிலான சபை ஒத்திவைப் புவேளைப் பிரேரணை மீதான விவாதத்தில் எனது கருத்துக்களையும் பதிவுசெய்து கொள்வதற்கு வாய்ப்பு வழங்கப்பட்டமை குறித்து முதலில் எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இன்றைய தலைப்புக்கு வருவதற்கு முன்பாக பணப்பெட்டி தமிழ் அரசியல்வாதிகள் தொடர்பில் சில விடயங்களைக் கூற வேண்டியிருக்கின்றது. உண்மைகளைக் கூறுகின்றபொழுது, அதை ஜீரணிக்க முடியாத, கொள்கையில்லாத - வெற்றுக் கொள்ளைகளையே அரசியல் மூலதனமாகக் கொண்டவர்கள், பித்துப் பிடித்தவர்களாகப் பிதற்றித் திரிவதுண்டு.

கடந்த வாரம் நான் நாடாளுமன்றத்திலே உரையாற்றியிருந்தபோது, வெலிக்கடைப் படுகொலைகள் தொடர்பில் நியாயம் கோரியிருந்தேன். ஒரு போராளியாக இருந்த நிலையில், வெலிக்கடைச் சிறைச்சாலைப் படுகொலைகள் நடந்தேறிய சந்தர்ப்பத்தில் நானும் ஓர் அரசியல் கைதியாக அதே சிறையில் இருந்ததால், அந்தப் படுகொலைகள் தொடர்பில் கண்கண்ட சாட்சியான என்னால் சாட்சி கூற முடியும் என்பதையே நான் சுட்டிக்காட்டி இருந்தேன். எமது மக்களின் விடுதலைக்காகப் போராடியிராத, புலிகள் விறகுக் கட்டையால் பயிற்சி கொடுப்பதற்கு அழைத்தபோதும்கூட அதற்குப் பயந்து பாடசாலைப் பிள்ளைகளைத் தனக்குப் பதிலாகப் பயிற்சிக்கு அனுப்பி, அப்பிள்ளைகளைக் காவு கொடுத்தவர்கள் இந்தச் சபையிலே எனது கருத்துக்களை ஜீரணிக்க முடியாமல், வெறும் வாய்ப்போராளிகளாக முற்படுகின்றார்கள். சம்பந்தப்பட்ட எந்தவொரு விடயம் தொடர்பிலும் நேரடியாகச் சாட்சி சொல்வதற்கு நான் தயாராகவே இருக்கின்றேன். ஆனால், எனக்குச் சம்பந்தமில்லாத, சம்பந்தப்படாத விடயங்கள் தொடர்பில் என்னால் சாட்சி சொல்ல முடியாது. ஒவ்வொருவருடைய கொள்கையில்லாத அரசியல்

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

நிகழ்ச்சிநிரலுக்கு என்னால் சாட்சி கூற முடியாது. இதுவரையில் அமைக்கப்பட்டிருந்த ஆணைக்குழுக்களிடையே கற்றுக்கொண்ட பாடங்கள் மற்றும் நல்லிணக்க ஆணைக்குழுவிடமிருந்தே சாட்சி கூற வருமாறு எனக்கு அழைப்பு கிடைத்திருந்தது. அதிலே நான் சாட்சி கூறியிருந்தாலும், என்னிடம் கேட்கப்படாத கேள்விகளைக் கேட்டதாகவும் அவற்றுக்கு நான் கூறாத பதில்களைக் கூறியதாகவும் பின்னர் அறிக்கையிடப்பட்டிருந்தது. இது தொடர்பில் பின்னர் நான் நாடாளுமன்றத்திலே கேள்வி எழுப்பி, அத்தகைய தவறுகளைத் தகுந்த ஆதாரங்களுடன் நிரூபித்துள்ளேன். அது இங்கே ஹன்சாட்டிலும் பதிவுபெற் றுள்ளது.

அரசியல் காழ்ப்புணர்ச்சி காரணமாக, சம்பந்தமில்லாத விடயங்களை எல்லாம் என்மீது பொய்யாகச் சோடித்து, அவற்றுக்கெல்லாம் சாட்சி கூற வேண்டும் எனக் கூறுகின்றவர்களைப்போல் என்னால் கருத்தோ, சாட்சியோ கூற முடியாது. கொலைகளுக்கு ஊடாக எமது மக்களின் பிரச்சினைகளைத் தீர்ப்பதில் நாம் ஒருபோதும் நம்பிக்கை கொண்டிருக்கவில்லை. கடந்த காலங்களில் எமது மண்ணில் - செம்மணியிலாகட்டும், மண்டைதீவிலாகட்டும் - பல்வேறு கொலைகள், காணாமற்போகச் செய்தமை என்பன இடம்பெற்றிருக்கின்றன. அவை தொடர்பில் விசாரணைக்கு அழைக்கப்பட்டால், எனக்குத் தெரிந்ததைக் கூற நான் எப்போதும் தயாராகவே இருக்கின்றேன். அதில் யாரும் எவ்விதமான சந்தேகமும் கொள்ளத் தேவையில்லை. இவற்றுக்கு எல்லாம் நான் சாட்சி கூற வேண்டும் எனக் கூறுபவர்கள், முதலில் இத்தகைய சம்பவங்கள் குறித்து முறைப்பாடுகளை மேற்கொள்ள வேண்டும். அதனைச் செய்யாது வெறும் மண்டைதீவுக் கிணற்றுத் தவளைபோல் கத்திக்கொண்டு இருப்பதில் எவருக்கும் எந்தப் பயனும் இல்லை என்பதை இந்தச் சந்தர்ப்பத்திலே கூறிவைக்க விரும்புகின்றேன். ஏற்கனவே இந்தச் சபையில் மண்டைதீவுக் கிணறுகளில் பலர் கொல்லப்பட்டுப் போட்டு மூடப்பட்டுள்ளதாக இந்த வெற்றுவாய்ப் போராளி கூறியபோது, அமைச்சர் மனோ கணேசன் அவர்கள் அந்தத் தகவல்களை எழுத்துமூலமாகக் கோரியிருந்தார். இவரும் அதைத் தருவதாகத் தெரிவித்திருந்தார். அதற்கு இதுவரையில் என்ன நடந்தது என்பது தெரியாது. உண்மையில் தம்மிடம் ஆதாரம் இருந்தால் அதைக் கொடுத்து விசாரணைகளை ஆரம்பிக்க வேண்டும். அதைவிடுத்து, வெறுமனே ஊடகங்களுக்காகக் கத்திக் கொண்டிருப்பதால் பயனில்லை. அதேநேரம், எமது மக்களின் துன்ப துயரங்களைக் காட்டிப் புலம்பெயர் எமது உறவுகளிடமிருந்து ஏராளமான பண உதவிகள் பெற்று, அவற்றைக் கொள்ளையடித்துக் கொண்டிருக்கின்ற இத்தகைய வாய்ப்போராளிகள் தொடர்பில் உடனடி விசாரணைகள் மேற்கொள்ளப்பட வேண்டியுள் ளதையும் இங்கு வலியுறுத்தி, இன்றைய விடயத்திற்கு வருகின்றேன்.

இன்றைய தலைப்பு உட்பட்ட விடயம் தொடர்பில் எமது மக்களிடையே நிலவுகின்ற சில கேள்விகளை இங்கே எமது மக்கள் தெளிவு பெறுவதற்காக முன்வைக்க விரும்புகின்றேன். இந்த நாட்டில் பாரிய கட்டிடமொன்று கட்டப்பட்டு, அதனது பணிகள் யாவும் பூர்த்தி செய்யப்பட்டுத் திறக்கப்படவிருந்த தறுவாயில், அதனை அதுவரையில் கண்டுபிடிக்காமல், இப்போதுதான் கண்டுபிடித்து, அதுதொடர்பில் மாறி மாறி உணர்ச்சிவசப்படக்கூடிய விமர்சனங்களை முன்வைக்கின்ற ஆய்வாளர்கள் பலரும் இந்த நாட்டில் இருப்பதைப் பார்க்கின்றபோது உண்மையிலேயே இது ஓர் ஆச்சரியமான நாடுதான்! 'மட்டக்களப்பு தனியார் பல்கலைக்கழகம்' என இங்கே இதனது பெயர் குறிப்பிடப்பட்டுள்ளது. ஒரு தனியார் கல்வி நிலையத்திற்குப் பல்கலைக்கழகம் எனப் பெயர் சூட்டக்கூடிய அல்லது வழங்கக்கூடிய அதிகாரம் உயர் கல்வி அமைச்சின் சட்டத்திற்கு அமைவாக முடியுமா? என்ற கேள்வி இங்கே முதலில் எழுகின்றது. தனியார் பல்கலைக்கழக சட்டமூலமொன்று கொண்டுவரப்படவுள்ளதாகவும் அதனை நீக்குமாறும் கோரி கொழும்பில் அனைத்துப் பல்கலைக்கழக மாணவர்கள் நடத்திய போராட்டமொன்றுக்கு அண்மையில் கண்ணீர்ப்புகை, நீர்த்தாரைகள் என்பன பிரயோகிக் கப்பட்டன. இத்தகையதொரு நிலையில், மட்டக்களப்பில் எப்படி தனியார் பல்கலைக்கழகமொன்று உருவாகியிருக் கின்றது? என்ற கேள்வி எமது மக்கள் மத்தியில் எழாமல் இருக்க முடியாது. இப்படியே பொறுப்புக் கூறவேண்டியவர்களது கண்களை மறைத்து நிறைய விடயங்கள் நடந்துவிடுகின்றன. இறுதியில் அதுபற்றிக் கேள்வி கேட்டால், பொறுப்புக்கூறுவதற்கு யாருமில்லாத நிலை என்பது இந்த நாட்டின் தொடர்கதையாகி உள்ளது.

இன்று இந்த நாட்டில் நாடாளுமன்ற உறுப்பினர்கள் அரசாங்கத்துடன் ஒப்பந்தங்களில் ஈடுபடுவது தொடர்பில் பாரதூரமான விமர்சனங்கள் முன்வைக்கப்பட்டு வருகின்றன. குறிப்பாக ஒரு நாடாளுமன்ற உறுப்பினராக இருப்பவர் அரசாங்கத்துடன் இத்தகைய ஒப்பந்தங்களைச் செய்துகொள் வதிலிருந்து தவிர்ந்துகொள்ள வேண்டும். இத்தகையதொரு நிலையில் இங்கே நாடாளுமன்ற உறுப்பினராக இருந்த ஹிஸ்புல்லாஹ் அவர்களது தலைமையைக் கொண்ட ஸ்ரீலங்கா ஹிரா மன்றமும் இளைஞர் விவகார மற்றும் தொழிற்பயிற்சி அமைச்சும் ஓர் ஒப்பந்தத்தைச் செய்து கொண்டது எந்த அடைப்படையில்? என்பது அடுத்து எழுகின்ற கேள்வியாக இருக்கின்றது. இந்த நிறுவனம் 2016ஆம் ஆண்டு ஜனவரி மாதம் 14ஆம் திகதி இலங்கை வங்கி, கொள்ளுப்பிட்டிக் கிளையில் Batticaloa Campus College (Pvt.) Limited என்ற பெயரில் வங்கிக் கணக்கொன்றை ஆரம்பித்திருந்ததாகவும், பின்னர் 2016ஆம் ஆண்டு பெப்ரவரி மாதம் 29ஆம் திகதி அந்த நிறுவனத்தின் பெயர் Batticaloa Campus (Pvt.) Limited என மாற்றப்பட்டுள்ளதாக நிறுவனத்தின் கடிதம் வாயிலாக வங்கிக்கு அறிவிக்கப்பட்டதாகவும் இதன் பிரகாரம் அந்த வங்கிக் கணக்கின் பெயர் Batticaloa Campus (Pvt.) Limited என மாற்றப்பட்டதாகவும் கூறப்படுகின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Member, you have another two minutes.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

இந்த நிலையில், Alawwal Bank, Riyadh, Saudi Arabia வங்கியின் கணக்கு உரித்தாளரான அலி அப்துல்லா அலியுப்பாலி என்பவரால் ஏழு தடவைகளில் இந்த இலங்கை வங்கியின் Batticaloa Campus College (Pvt.) Limited என்ற கணக்கிற்கு 3.6 பில்லியன் ரூபாய் நிதி வைப்பிலிடப் பட்டுள்ளதாகவும், இந்த நிதி வைப்பிலிடப்பட்டபோது Batticaloa Campus College (Pvt.) Limited என்ற பெயரில் ஒரு கணக்கு இலங்கை வங்கியில் செயற்பட்டிருக்கவில் லையென்றும் கூறப்படுகின்றது. வங்கிகளைப் பொறுத் தவரையில், கணக்கின் ஓர் எழுத்தேனும் மாறுபட்டாலும் வைப்புக்கள் ஏற்றுகொள்ளப்படுவதில்லை. எனினும் இத்தகைய பாரிய தொகையை பெயர் மாற்றப்பட்டதொரு

வங்கிக் கணக்கின் வைப்பிற்கு ஏற்றுக்கொண்டது எந்த அடிப்படையில்? என்ற கேள்வி அடுத்து எழுகின்றது. அடுத்து, "இந்த நிதி எதன் அடிப்படையில் கிடைத்தது?" என்ற கேள்விக்கு, 2019ஆம் ஆண்டு மார்ச் மாதம் 19ஆம் திகதி நாடாளுமன்றக் குழு முன்பாக மேற்படி நிறுவனத்தின் தற்போதைய தலைவர் எனக் கூறப்படுகின்ற ஹிராஸ் ஹிஸ்புல்லா, "இது நன்கொடையாகக் கிடைத்தது" எனக் கூறியுள்ள நிலையில், 2019ஆம் ஆண்டு மே மாதம் 17ஆம் திகதி இடம்பெற்றிருந்த ஒரு கலந்துரையாடலின்போது, மேற்படி நிறுவனத்தின் பணிப்பாளர் சபை உறுப்பினர்களும் இந்த நிறுவனத்தின் முன்னாள் தலைவரான ஹிஸ்புல்லாவும் "இந்த நிதி கடனாகக் கிடைத்தது" என்றும் கூறியுள்ளதாகத் தெரிகின்றது. அந்தக் கடன் ஒப்பந்தம் தொடர்பில் வினவப்பட்டபோது -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Please give me only one more minute.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
We are running out of time, Hon. Member. Please wind up.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
அந்த ஒப்பந்தம் முதலீட்டுச் சபைக்கும் உயர் கல்வி அமைச்சுக்கும் இலங்கை வங்கிக்கும் அனுப்பப்பட்டுள்ளதாகக் கூறப்பட்டுள்ள நிலையில், அத்தகைய ஒப்பந்தமொன்று தங்களுக்குக் கிடைக்கவில்லை என அந்த மூன்று நிறுவனங்களும் தெரிவித்துள்ளதாக அறியக்கிடைத்துள்ளது. ஆகவே, இந்த நிதி எதனடிப்படையில் பெறப்பட்டது? என்ற கேள்வி எழுகின்றது. இங்கே இன்னுமொரு பாரதூரமான கேள்வி எழுகின்றது. தேசிய நிறுவனமொன்று வெளிநாட்டவரிடமிருந்து ஏதேனுமொரு கடன் தொகையைப் பெற்றுக்கொள்ள வேண்டுமாயின், அதற்கான விசேட அனுமதியானது செலாவணிக் கட்டுப்பாட்டுச் சட்டதிட்டங்களுக்கு அமைவாகச் செலாவணிக் கட்டுப்பாட்டாளர் மூலமாகப் பெறப்பட வேண்டும். இவர்கள் கூறுகின்ற வகையில் இது கடன் தொகையெனில், அதற்கெனச் செலாவணிக் கட்டுப்பாட்டாளரிடமிருந்து அத்தகையதொரு விசேட அனுமதி பெறப்படவில்லை எனக் கூறப்படுகின்றது. எனவே, இத்தொகையினை மீளச் செலுத்துகின்றபோது, அத்தகைய மீளச் செலுத்துகையைச் செய்வதற்கும் உரிய வர்த்தக வங்கிக்கும் இயலாத நிலை ஏற்படும். கடன் தொகையாகட்டும், அல்லது நன்கொடையாகட்டும், இது இலங்கையின் வெளிநாட்டுச் செலாவணிச் சட்டதிட்டங்களை மீறிப் பெறப்பட்ட நிதியல்லவா? என்ற கேள்வியும் எழுகின்றது.

மேலும், இந்த நிறுவனம் அமையப் பெற்றிருக்கும் காணியானது இலங்கை மகாவலி அபிவிருத்தி அதிகார சபையிலிருந்து 30 வருட குத்தகைக்குப் பெறப்பட்ட 35 ஏக்கர் காணி எனக் குறிப்பிடப்படுகின்றபோதும், அதற்கு மேலதிகமாகச் சுமார் 8 ஏக்கர் காணி எடுத்துக்கொள்ளப் பட்டுள்ளதாகவும் கூறப்படுவதுடன், இக்கட்டிடம் அமைப் பதற்கான அனுமதி பெறப்பட்டிருப்பதாகக் கூறப்படுகின் றபோதிலும், வாகரை வடக்குப் பிரதேச சபையினால் அத்தகையதொரு அனுமதி வழங்கப்படவில்லை எனக் கூறப்படுகின்றது. அந்தவகையில், இது சட்ட ரீதியற்ற கட்டிடமா? என்ற கேள்வியும் எழுகின்றது. இந்தத் தனியார் நிறுவனம் தொடர்பில் இத்தனை கேள்விகள் எமது மக்களிடத்தே இருப்பதால், இதற்கான பதில்கள் முதலில் பெறப்பட வேண்டும். இந்தப் பதில்களை மேற்படி நிறுவனத்துடன் தொடர்புடையோர் மாத்திரமன்றி, அரச தரப்பும் வழங்க வேண்டியுள்ளது.

இதைத்தவிர, முஸ்லிம் அடிப்படைவாதத்தைக் கற்பிப்பதற் காக அல்லது இஸ்லாமியச் சட்டமான 'ஷரியா' சட்டத்தைக் கற்பிப்பதற்காக இந்த நிறுவனம் உருவாக்கப்பட்டதா? என்பது குறித்து அறிவது வேறு விடயமாகும். அதனை உயர் கல்வி அமைச்சு கண்டறிய வேண்டும். அத்துடன், இந்த நாட்டில் கல்வி தொடர்பில் நிறுவனங்கள் செயற்படுகின்ற நிலையில், அவை எந்த வகையிலானதாக இருந்தாலும், இலங்கையின் கல்வி அமைச்சின், உயர் கல்வி அமைச்சின் கல்விக் கொள்கையை அடியொற்றியதாகவே இருத்தல் வேண்டும் என்பதை நான் இங்கு வலியுறுத்திக் கூறி, விடைபெறுகின் றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.48]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාස්කු ඉරිදා මේ රටේ සිද්ධ වූ ම්ලේච්ඡ ත්‍රස්ත ප්‍රහාරයෙන් පස්සේ, අපි සියලුදෙනාම පාරට බැහැලා ඉදිරිපත් කළ යෝජනා කීපයක් තිබෙන බව මා පළමුව මතක් කරන්න ඕනෑ. ඒ යෝජනා කීපය අතර ඉතාම විශේෂ වූ යෝජනාවක් තමයි, මඩකළපුවේ විශ්වවිද්‍යාලය පිළිබඳ කාරණය. අපි ඒ වෙලාවේ එය හැඳින්වූයේ, ෂරියා විශ්වවිද්‍යාලය කියායි. හැබැයි, දැන් අපේ ඇතැම් මුස්ලිම් මන්ත්‍රීවරු ෂරියා විශ්වවිද්‍යාලයක් එතැන නැති බව කියනවා. එතුමන්ලා කියන නිසා, එතැන ෂරියා විශ්වවිද්‍යාලයක් නැහැ කියලා අපි හිතමු. හැබැයි, මේක අපට ප්‍රශ්න රාශියක් පැන නඟින ආයතනයක්. ඒ ප්‍රශ්න රාශිය ගැන අපි කරුණු ඉදිරිපත් කරද්දී, ඒ ත්‍රස්ත ප්‍රහාරයෙන් පස්සේ මේ රටේ සංහිඳියාව ඇති කර ගන්නේ කොහොමද කියන කාරණය අපට මතු වුණා. අපි එකිනෙකා අදහන ආගම අනුව, කථා කරන භාෂාව අනුව, අපේ සංස්කෘතික අංග අනුව සමාජයීය වශයෙන් සහ අපි ඉපදුණු, ජීවත් වන ප්‍රදේශ අනුව අපි වෙන් වෙලා වැඩකටයුතු කරද්දී, දේශපාලන වශයෙනුත් බෙදිලා තමයි අපි වැඩකටයුතු කළේ. මේ විධියට අපි වෙන් වෙන් වශයෙන් බෙදිලා කටයුතු කිරීම නිසා අපේ රට ආපස්සට ගියා මිසක්, ඉදිරියට ගියේ නැහැ. මේ භාෂා ප්‍රශ්නය, ආගම් ප්‍රශ්නය සහ අපේ සමාජයීය හා සංස්කෘතික අංග අපි වෙන් වෙන් වශයෙන් බෙදාගෙන වැඩකටයුතු කරමින් ජීවත්වීම අපේ රටේ ඉදිරි ගමනට විශාල බාධාවක් වුණා.

බරපතළ යුද්ධයකට මුහුණ දීලා ඒ යුද්ධයත් අවසාන කළාට පස්සේ, අපි කවුරුත් බලාපොරොත්තු වුණේ නැහැ මුස්ලිම් ජනතාව අතරින්මේ රටේ ත්‍රස්තවාදයක් ක්‍රියාත්මක වෙයි කියා.

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

හැබැයි, මුස්ලිම් අන්තවාදීන් මේ රටේ ත්‍රස්තවාදයක් ක්‍රියාත්මක කළා. ඉන් පස්සේ අපි අතර තිබුණු සංහිඳියාව නැති වෙලා, මේ අන්තවාදය තව තවත් තහවුරු වෙලා, අපි අතර භේද භින්නභාවය ඇති වෙලා, මේ ප්‍රශ්න ඉස්සරහට එනවා හා සමානවම, ජන සමාජය තුළ අපට එකට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් උදා වන අවස්ථාව ආවා. හැබැයි, එම තත්ත්වයෙනුත් අපි මේ රට මුදාගෙන යම් මට්ටමකට ගෙනාවා. මේ රටේ නැවත සාමය ඇති කරමින්, රටේ ආරක්ෂාව සඳහා අපි සියලුදෙනා එකට වාඩි විය යුතුයි කියන ඒ පණිවුඩය ලබා දෙමින් වැඩ කටයුතු කරන කාලයක් මේක.

අපේ සහෝදර කතෝලික ජනතාව දේවස්ථානවලදී නිරපරාදේ මිය යනකොට, ඒ අහිංසක ජනතාවගෙන් ගලා යන රුධිරය දැක මා කතෝලිකයෙකු හැටියට ඉල්ලා සිටියේ, අපි සියලුදෙනා එකට එකතු වෙලා අත්වැල් බැඳගෙන, මේ රටේ ආරක්ෂාව තහවුරු කරන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරමු කියායි.

ප්‍රධාන වශයෙන්ම, අපි මඩකළපු විශ්වවිද්‍යාලය ගැන ඒ ඉල්ලීම කළේ ඇයි? ඒ විශ්වවිද්‍යාලය ගැන අපට තිබුණු පළමු ප්‍රශ්නය තමයි, එතැන යම් විධියකින් ත්‍රස්තවාදීන්ට බිහි වෙන්න අවස්ථාවක් තිබෙනවාද කියා ඇති වූ සැකය. හැබැයි, ඊට පස්සේ තමයි අපි දැන ගත්තේ ඒ විශ්වවිද්‍යාලය මේ රටේ හදන්න මුදල් ආවේ කොහොමද කියලා. ඒ වෙනුවෙන් අරමුදල් ආවේ කොහොමද, ඒ අරමුදල් ලැබුණු ආකාරය නීත්‍යානුකූලද, ඒ වාගේම, එම විශ්වවිද්‍යාලය හදන්න අවශ්‍ය රජයේ අවසරය හා නීත්‍යානුකූලභාවය ලැබිලා තිබෙනවාද යනාදී වශයෙන් සහ එහි අයිතිය පිළිබඳව අපට ප්‍රශ්න රාශියක් පැන නැඟුණා.

මේ මුදල් ලැබුණු ආකාරය බලන්න ඕනෑ. මේ මුදල් ආවේ කාගෙන්ද? මේ මුදල් එවපු අයගේ ප්‍රශ්නයක් තිබෙනවාද? ඒ අය යම් කිසි සංවිධානයක්ද? මේ වාගේ ප්‍රශ්න රාශියක් අප අතර මතු වුණා. මතු වුණා විතරක් නොව මේ අපැහැදිලිතාව වැඩියෙන් තහවුරු වෙන්නත් පටන් ගත්තා. එම නිසා අපි සියලුදෙනාම එකට එකතු වෙලා මේ විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් ඉටු කළ යුතු වගකීමක් වර්තමානයේ තිබෙනවා කියලා මම හිතනවා. පාර්ලිමේන්තුවේ අපි සියලුදෙනා එකට එකතු වෙලා මේ විශ්වවිද්‍යාලය පැහැදිලිව එක් තැනකට ගෙනැල්ලා එක් වැඩ පිළිවෙළකට ගන්න ඕනෑ. මේ වැඩ පිළිවෙළේදී විශේෂයෙන්ම මේ විශ්වවිද්‍යාලය රජයට පවරා ගත යුතුයි කියලා තමයි මම යෝජනා කරන්නේ. අපි මේ විශ්වවිද්‍යාලය රජයට පවරා ගන්නේ ඇයි? මේ විශ්වවිද්‍යාලය රජයට පවරා ගන්නකොට හිස්බුල්ලා මැතිතුමා වෙන්න පුළුවන්, එතුමාගේ පුතා වෙන්න පුළුවන් ඒ අය මේ සඳහා දායකත්වයක් සැපයුවා නම්, ඒ දායකත්වය රට වෙනුවෙන් අවංකව සැපයුවා නම්, ඒ දායකත්වයට යම් කිසි සහනයක් ලබා දුන්නාට කමක් නැහැ. හැබැයි, ඒක විනිවිදභාවයෙන් යුතුව හැම දෙනාටම පිළිගත හැකි සහ රටේ සමස්ත ජනතාවට එක හා සමානව සලකන සහනයක් හැටියටත්, ඒ විශ්වවිද්‍යාලයෙන් ලබන දැනුම හා ලැබෙන අතිරේක ඵල සියල්ලම රටේ ජනතාවට සම සේ බෙදී යා යුතුයි කියලා තමයි අපි විශ්වාස කරන්නේ.

ඊයේ කටුවාපිටිය ප්‍රදේශයේ නැවතත් විශාල සිද්ධියක් වුණා. සුරුවමකට ගලකින් ගැසීම සම්බන්ධ සිද්ධියක් තමයි ඇති වුණේ. දැන් අපට ප්‍රශ්නයක් මතුවෙලා තිබෙනවා. ජාතිවාදය අවුස්සන්න, ආගම්වාදය අවුස්සන්න, එහෙම නැත්නම් ත්‍රස්තවාදය ඇති කරලා ජනතාව බිය කරන්න මෙවැනි දේවල් තුළින් නැවත වතාවක් යම් කටයුත්තක් සිද්ධ කරනවාද? ආගම් වශයෙන් වෙන්න පුළුවන්, කථා කරන භාෂාව වශයෙන් වෙන්න පුළුවන්, එහෙම බෙදිලා, කවුරු හෝ මේ රට විනාශ කරන්න, මේ රට භේදබින්න කරන්න යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා නම්, අපේ ආරක්ෂක අංශත්, රජයත් ඒ වගකීම හරියට කරට අරගෙන ඒ ගැටලු සියල්ල ජනතාව වෙනුවෙන් බේරා දිය යුතුයි කියලාත් මම යෝජනා කරනවා. විශේෂයෙන්ම මේ විශ්වවිද්‍යාලය ෂරියා විශ්වවිද්‍යාලයක් නොවන්නත්, මේ විශ්වවිද්‍යාලය රජයට පවරා ගෙන ජනතා අයිතියට ලබා දිය යුතුයි කියලාත් යෝජනා කරමින් මම නිහඬවනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

[අ.භා. 4.55]

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, (මහාචාර්ය) ආශු මාරසිංහ මැතිතුමාට අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වනවා. අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිවරයා විධියට එතුමා මේ කරුණ පිළිබඳව දීර්ඝ පරීක්ෂණයක් සිදු කර තිබෙනවා. එම ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ලෙස එතුමා ඉල්ලීමක් කරනවා, සීමාසහිත මඩකලපුව විශ්වවිද්‍යාල පෞද්ගලික සමාගම "මඩකළපුව විශ්වවිද්‍යාලය" නමින් රජයේ විශ්වවිද්‍යාලයක් බවට පත් කරන්න කියලා. හැබැයි, දැන් ටිකකට කලින් ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කළ කථාව අහගෙන සිටියා නම්, එතුමා කරන්නේ හුදු යෝජනාවක් පමණයි කියලාත් තේරෙනවා. එතුමන්ලා කථා කරන ඒවා හිස් ප්‍රලාප. එම නිසා මේ අය රඟපෑමක් කරනවා කියන එකයි, අපේ අදහස.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු බිමල් රත්නායක මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. BIMAL RATHNAYAKE *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපට මේ විශ්වවිද්‍යාලයත් එක්ක පැන නඟින ගැටලු කීපයක් තිබෙනවා.

මුදල් ඇතුළුව මේ සා අතිවිශාල වත්කම් ප්‍රමාණයක් මේ විශ්වවිද්‍යාලයට -මේ කියන පෞද්ගලික ආයතනයට- ලැබෙන්නේ කොහොමද? අපි දන්නවා, 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ විනිමය පාලන පනත අපේ රටේ ක්‍රියාත්මක වූ බව. ඒ පනත් යටතේ අපේ රටට විදේශ මුදල් ලැබෙන විට යම් විමර්ශනයක් සිදු කිරීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකයක් මහ බැංකුව විසින් ආරම්භ කළා. එම නිසා ඒ දේවල් සම්බන්ධයෙන් යම් විගණනයක් තිබුණා. ත්‍රස්තවාදී සංවිධානවලට සහ අන්තවාදී කල්ලි කණ්ඩායම්වලට මුදල් ලැබීම පිළිබඳ යම් පාලනයක් අපේ රට තුළ 2006 පනතත් එක්ක ආරම්භ වුණා. මේ රජය 2017 වර්ෂයේදී විනිමය පාලන පනත වෙනස් කරනවා. ඊට එරෙහිව ඒකාබද්ධ විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායම විධියට අපි අධිකරණයට ගියා. විනිමය පාලන පනතේ නීති ලිහිල් කිරීම නිසා රටේ අන්තවාදී කල්ලි කණ්ඩායම්වලට රට විනාශ කරන අප්‍රේල් 21 ප්‍රහාර වැනි දේට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන එන්න ඉඩකඩ ලැබෙනවා. මේ අපරාධය රටට කරන්න එපා කියලා එදා අපි පාර්ලිමේන්තුවේදී කිව්වා.

"සහරාන්ලා එක්කෙනෙක් නොවෙයි, සහරාන්ලා දහසක් බිහිවෙයි. මේ රටේ අහිංසක සිංහල, දෙමළ, මුස්ලිම් මිනිසුන්ගේ සමඟිය නැති වෙයි. මේ මුදල්වලින් ත්‍රස්තවාදය පෝෂණය කරයි.මේ රට ලේ විලක් කරයි" කියලා, එදා මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත ගෙනෙන වෙලාවේ අපි කිව්වා. ඒ වෙලාවේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු, අගමැතිතුමා සුපුරුදු ලෙස හිනා වුණා. අපි අධිකරණයට ගියාම, ශ්‍රේෂ්ඨාධිකරණයේ ගරු විනිශ්චයකාරතුමන්ලා කිව්වා, රටට විදේශ විනිමය ලැබීම ගැන විපක්ෂය විරුද්ධද? කියලා. මම ඒ පිළිබඳ කථා කරන්න යන්නේ නැහැ. හැබැයි, ඉන් පසුව ඇති වන තත්ත්වය මම කියන්නම්.

"2017 ඔක්තෝබර් මාසයේ ආර්ජන්ටිනාවේ, බුවනොස් අයිරිස් පැවැති මූල්‍ය කාරක සාධක බලකායේ සැසි වාරයේදී, ශ්‍රී ලංකාව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ ක්‍රමෝපායන්ගේ දුර්වලතා සහිත රටක් ලෙස මූල්‍ය කාර්ය සාධක බලකායේ අනුකූලතා ලේඛනයේ ලැයිස්තු ගත කරන ලද අතර, ඒ නිසා මෙය අළු ලේඛනයට ඇතුළත් වීම ලෙස හඳුන්වනු ලැබේ." ලෝකයේ ත්‍රස්තවාදීන්ට, අන්තවාදීන්ට මුදල් ලැබීම සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම පිළිබඳ කාරණාත් එක්ක අළු ලේඛනයට අපේ රට ඇතුළත් කරනවා.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත ගෙන ඒමෙන් රජය යම් දෙයක් බලාපොරොත්තු වූ බව අපි දන්නවා. මේ රටේ වගකිවයුතු අමාත්‍යවරයකුට විරුද්ධව මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යටතේ නඩුවක් තිබුණා. ඒ නඩුවේ මහාධිකරණ තීන්දුව ලබා දුන් දවසේ, එම තීන්දුව ලබා දුන් උගත් විනිශ්චයකාරතුමිය විශ්‍රාම ගියා. එතුමිය කිව්වා, "නැවත නඩු පැවරිය හැක. තාක්ෂණික වරදක් මත මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යටතේ පවරා තිබෙන මේ නඩුව බැහැර කරනවා. නැවත නඩු පැවරිය හැක" කියලා. රවි කරුණානායක ඇමතිතුමාට විරුද්ධව ඒ නඩුව පැවැති බව කවුරුත් දන්නවා. ඒ නඩුව ඉවත දැම්මා. ඒ නිසා හෝ වෙනත් කුමන හේතුවක් නිසා හෝ මේ රජය ත්‍රස්තවාදීන්ට සහ අන්තවාදී කල්ලි, කණ්ඩායම්වලට නිදහසේ මුදල් එන්න ඉඩ දුන්නා. එදා ඒ ගැන හිනා වුණු, එදා වගඋත්තර සැපයූ මහ බැංකුවේ නිලධාරින්, එදා විනිමය පාලන පනත් කෙටුම්පත වෙනුවෙන් කරුණු දක්වපු අය අද අඬනවා.

පාස්කු ප්‍රහාරය පිළිබඳව සොයා බැලීමට පත් කළ කාරක සභාවේදී මහ බැංකු අධිපතිවරයා සඳහන් කළ කාරණයක් මම කියන්නම්.. මේක ඉතිහාසයට එකතු කළ යුතුයි. 2019 ජූලි මාසයේ 27 වැනි දා - සෙනසුරාදා - "ලංකාදීප" පුවත් පතේ මෙසේ සඳහන් වෙනවා.

"2017 විනිමය පනතේ හිලක්.
හිස්බුල්ලා සරසවියට හොර සල්ලි ආ හැටි හොයන්න බෑ.
මහ බැංකු අධිපති"

එහෙම කියන්නේ මහ බැංකු අධිපතිතුමායි. ලජ්ජා වෙන්න ඕනෑ. එම පනත් කෙටුම්පත ගෙන එන්න ඉඩ දෙන වෙලාවේ මහ බැංකුවට වග කීමක් තිබුණා අධිකරණයට ගිහිල්ලා කියන්න, මේ වාගේ අපරාධ රටට කරන්න එපා කියලා. හිස්බුල්ලා සරසවියට හොර සල්ලි ආපු හැටි මම ගණන් හිලව් වශයෙන් කියන්න යන්නේ නැහැ. ඒ මුදල රුපියල් කෝටි විසිඑක්දහසට වැඩියි. ඒවා කවර පාඨමාලාව ආරම්භ කරන්නද, කවර අන්තවාදය පෝෂණය කරන්නද, ඒවා සැබෑ අරමුණින් එවපු මුදල්ද? අද ඒ පිළිබඳව නීතිමය පියවරක්වත් ගන්න පුළුවන්කමක් නැති බව තමයි මහ බැංකුවේ අධිපතිතුමා කියන්නේ. මේවා අපේ කථා නොවෙයි. අපි එහෙම කිව්වොත්, කේන්තියට, වෛරයට කිව්වා කියලා හිතයි නේ. ඒ විධියට මහ බැංකුවේ අධිපතිතුමායි කියන්නේ. මතු දැනුවත් බව උදෙසා එම ලංකාදීප පුවත් පතේ කොටස මම **සභාගත*** කරනවා.

ඒ විතරක් නොවෙයි, මෙය විශ්වවිද්‍යාලයක් ලෙස ලියා පදිංචි වෙන්නේ 2016 සිටයි. ඒක කාටත් රහසක් නොවෙයි නේ. ඉන්පසු ඔබතුමන්ලා දන්නවා, 2016න් පසුව මහවැලි සංවර්ධන අමාත්‍යාංශයෙන් විශාල භූමි ප්‍රමාණයක් මේ සඳහා ලැබුණු බව. ඒ ලැබුණු ප්‍රමාණයට අමතර භූමි ප්‍රදේශයක්, -පොදුවේ ගත්තාම අක්කර 40කට ආසන්න ප්‍රමාණයක්- නිල මාර්ගයෙනුත්, ඒ වාගේම අනවසරයෙනුත් මේ සරසවියට යා කරගන්නවා. සාක්ෂි ඇතිව, කම්ටුවේ සාමාජිකයකු ලෙසයි මා මෙය කියන්නේ. දිගින් දිගටම මේ නීති විරෝධී ක්‍රියාවලිය සිදු වෙන්න ඉඩ දීලා, දැන් කමිටු පත් කරනවා; කමිටුවලින් සුදු හුණු ගානවා; ඉන් පස්සේ වග කීම විපක්ෂය පැත්තටත් දමනවා. ජරාජීර්ණ, පරණ දේශපාලන සුදුවම ලජ්ජා නැතිව සිදු කරනවා. ඒ හැර, මේ යෝජනා, මේ දේවල් මේ ආණ්ඩුව තිබෙන තුරු මේ රටේ ක්‍රියාත්මක වෙන ඒවා නොවෙයි. ඒ නිසා මේ ආයතනය රජයට පවරා ගන්න කියා අපි ඉල්ලනවා. හැකියාවක් තිබෙනවා නම්, පුළුවන් නම් මෙය රජයට පවරා ගන්න. එසේ පවරා ගෙන එම විශ්වවිද්‍යාලය ජාතික විශ්වවිද්‍යාල පද්ධතියට එකතු කරගන්න.

අපි දන්නවා, අපේ රටේ සැක කටයුතු මූල්‍ය ගනුදෙනු 1,300කට අධික ප්‍රමාණයක් වාර්තා වෙනවාය කියලා 2017 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ සඳහන් වෙනවා. දැන් කොටි ත්‍රස්තවාදය අවසන් වෙලායි තිබෙන්නේ. හැබැයි මූල්‍ය බුද්ධි ඒකකය විසුරුවා හැරීමෙන් පසු මුදල් විශුද්ධිකරණය ඇතුළු සැක කටයුතු ගනුදෙනු 1,300න් අද විමර්ශනය කරන ප්‍රමාණය 300කට පමණ සීමාවෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා දැන් මේ රටට ඇතිවෙලා තිබෙන ඉරණම මොකක්ද? දවසින්-දවස තම-තමන්ගේ දේශපාලන හිතවාදින්ට සහ සහචරයන්ට ප්‍රතිලාභ සහ වරප්‍රසාද සැපයීම පිණිස, මේ රටේ පැවැති යහපත් දිවි පැවැත්ම, සාමකාමීභාවය මේ රජය විනාශ කරමින් සිටිනවා. තාක්ෂණික ආයතන ඇති කිරීම, විශ්වවිද්‍යාල ඇති කිරීම, කාර්මික ආයතන ඇති කිරීම තුළින් අපේ රටේ උතුරේ හෝ නැඟෙනහිර හෝ දකුණේ වෙනත් ඕනෑම ප්‍රදේශයක සිංහල, දෙමළ, මුස්ලිම් තරුණයන්ට පුහුණුව ලබාදෙන්න ඕනෑ. ඒ තරුණයන්ට අධ්‍යාපන අයිතිය ලබා දෙන්න ඕනෑ. හැබැයි මේ අන්තවාදි ක්‍රියාවලියට මුදල් ලැබුණු ආකාරයට පිළිබඳව බරපතළ සැකයක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි. මේ මුදල් නීති විරෝධී ලෙස මේ රටට පැමිණ තිබෙනවා. මේ ආයතනයට නීති විරෝධීව මුදල් ලබා ගත්තා නම්, මේ ආයතනය තුළ කෙරෙන සියලු කටයුතු නීත්‍යනුකූල නොවන දේවල් වෙනවා. ඒ නිසා නීත්‍යනුකූල නොවන ආයතනයක් රජයට පවරා ගැනීම හැර වෙනත් විකල්පයක් නැති බව මා ඔබතුමාට ගෞරවයෙන් සඳහන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. (Dr.) Kavinda Heshan Jayawardana. You have five minutes.

[අ.භා. 5.04]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම Batticaloa Campus (Pvt.) Limited එක ගැන කථා කරන්න පටන් ගත්තේ පාස්කු ඉරිදා ඇති වූ ප්‍රහාරයෙන් පසුවයි. මෙය විශ්වවිද්‍යාලයක්ද, නැද්ද කියන එක පිළිබඳවත්, මෙය නීති විරෝධිද, නැද්ද කියන එක බොහෝදෙනාගේ අවධානයට ලක් වුණේ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුවයි. එදා අපේ අහිංසක කතෝලික ජනතාව අමු-අමුවේ ඝාතනය වනකොට, ඒ ජීවිත අහිමි වූ අයගේ පවුල්වල සාමාජිකයන්ගේ දුක, අඳෝනාව පිළිබඳව අපි කථා කරනකොට මේ ප්‍රශ්නයත් එක්තරා විධිකට මතු වුණා. මෙම ආයතනය පිහිටුවා තිබෙන්නේ හුදෙක් නීති විරෝධි ආකාරයටයි, මෙයට අවශ්‍ය ඉඩම්-කඩම්, මුදල් ලබාගෙන තිබෙන්නේ නීති විරෝධි ආකාරයටයි කියලා අපි ඒ අවස්ථාවේ කරුණු පැහැදිලි කළා. මේ Hira Foundation එක ඉතාම භයානක සංවිධානයක්ය කියන එක ආරක්ෂක අමාත්‍යාංශය හිස්බුල්ලා මැතිතුමාට ලිඛිතව දැනුම් දීලා තිබෙන බව අපේ ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා පැහැදිලි කළා. අපට පැහැදිලි වෙනවා, රුපියල් බිලියන 3.6ක් ශ්‍රී ලංකා මහ බැංකුව හරහාත්, ලංකා බැංකුව හරහාත් මුදල් ලැබෙනකොට මේ බැංකුවල ඉන්න නිලධාරින් ඒ පිළිබඳව පරීක්ෂණ කටයුතු කළේ නැහැයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, මේ රටට නීත්‍යනුකූලව හෝ මුදල් ගෙනෙනකොට මේ මුදල් ගෙනෙන්නේ මොන කාරණයකටද, මෙය ණය මුදලක්ද, මෙය පොලියට ගත් ණය මුදලක්ද, එහෙමත් නැත්නම් කවුරුන් හෝ තෑග්ගක් හැටියට, දීමනාවක් හැටියට, grant එකක් හැටියට දුන්නාද කියලා බැංකුවල නිලධාරින් ප්‍රශ්න කරනවා. නමුත් එහෙම ප්‍රශ්න කරන්නේ නැතුව මේ අයට මේ මුදල් ලැබෙනවා. ඔවුන් ඒ මුදල් අරගෙන විශ්වවිද්‍යාලයක් හදන්නද, වෙනත් ආයතනයක් හදන්නද කියලා බලන්නේ නැතුව, මේ ඊනියා විශ්වවිද්‍යාලයට මේ මුදල් වැය කළාද කියන ප්‍රශ්නයක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ රටේ විශ්වවිද්‍යාල ඇති වෙනවා නම්, පාසල් ඇති වෙනවා නම්, අධ්‍යාපන ආයතන ඇති වෙනවා නම්, මන්ත්‍රීවරුන් හැටියට අපි කැමැතියි. ඒ අධ්‍යාපන ආයතනවලට යන්නේ මුස්ලිම් තරුණයන්ද, කතෝලික තරුණයන්ද, බෞද්ධ තරුණයන්ද කියන එක නොවෙයි වැදගත්. අපි ඔක්කොම ශ්‍රී ලාංකිකයෝ. අපි බෙදෙන්න අවශ්‍ය නැහැ. නමුත් මේ ආයතනය පටන් ගත්ත විධියම වැරැදියි කියන එක අපි මුල ඉඳලාම කිව්වා.

මේ ආයතනය පටන් ගත්ත ආකාරය පිළිබඳවත්, මේ ආයතනය අස්සේ ෂරියා කියන faculty එකක් ඇති කරලා නීති උගැන්වීමේදී මේ දරුවන්ගේ මනස් වෙනස් වෙයිද කියන කාරණය මේ රටේ පාස්කු ප්‍රහාරයට ලක් වෙච්ච, ලක් නොවෙච්ච හැම කෙනාගේම හදවතට හැඟුණු, දැනුණු කාරණයක් බවට පත් වුණා. ඒක නිසා තමයි අපි මේකට විරුද්ධව කථා කළේ. එහෙම නැත්නම් මේ රටේ අධ්‍යාපන ක්‍රමයටවත්, අධ්‍යාපනයටවත්, එහෙමත් නැත්නම් මේ ආයතනයේ ඉගෙන ගන්න ඉන්න දරුවන්ගේ අනාගතය පිළිබඳ තියෙන ඊර්ෂ්‍යාවකටවත්, වෛරයටවත්, මේ ආයතනය හිස්බුල්ලා හැදුවාට කියන එකට කරන ද්‍රෝහීකමකටවත් නොවෙයි අපි කථා කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පැහැදිලිව කථා කළේ මේ ආයතනය පිළිබඳව විනිවිදභාවයක් නැති නිසායි. මේ ආයතනය ආරම්භ කිරීම පිළිබඳ විනිවිදභාවයක් නැති නිසා තමයි අපි මේ පිළිබඳව කථා කළේ. අදටත් මෙතුමාට විරුද්ධව මුදල් විශුද්ධිකරණ පනත යටතේ නඩු දාලා තියෙනවාද කියන එක පිළිබඳව අපට සැකයක් තියෙනවා. ඒ නිසා රජයක් හැටියට වගකීමක් තියෙනවා, රාජ්‍ය නිලධාරින්ට වගකීමක් තියෙනවා මේ පිළිබඳව අපක්ෂපාතී පරීක්ෂණයක් කරන්න. මම විශ්වාස කරනවා, මේ විශ්වවිද්‍යාලය රජයට පවරා ගෙන කටයුතු කරන්න අවශ්‍යයි කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, SAITM විශ්වවිද්‍යාලය වුණත් රජයට පවරා ගත්තා. ඒ නිසා ඒ වගකීම රජයට තියෙනවාය කියන එක මේ අවස්ථාවේදී මතක් කර දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව තත්පරයක් දෙන්න, වර්තමානයේ ඇති වෙලා තිබෙන තත්ත්වය ගැන කියන්න. විශේෂයෙන් එක්සත් ජාතික පක්ෂයේ මීගමුව ආසනයේ සංවිධායකවරයා හැටියට මට හැඟෙන කාරණයක් තිබෙනවා. ඊයේ කටුවාපිටිය දේවස්ථානයට යාබදව ඇති ශාන්ත සෙබස්තියන් මුනිවරයාගේ පිළිමයකට ගල් ගහලා තිබුණා. ඒ වාගේම මීට දින දෙකකට කලින් මුන්නක්කරේ ශාන්ත අන්තෝනි මුනීන්ද්‍රයාණන්ගේ පිළිමයක් අතුරුදහන් වෙලා තිබුණා. අපට හැඟෙනවා, අපට දැනෙනවා, සමහර වෙලාවට කඩාකප්පල්කාරී පිරිසක් මේ විධියට කටයුතු කරන්නේ අප අතර තියෙන සමගිය, ආගමික සමගිය, සංහිඳියාව නැති කරන්නද කියලා. ඒ පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. සිවිල් ආරක්ෂක අංශයෙන් මේ ප්‍රදේශයේ ආරක්ෂාවට දාලා හිටියා. අපි ඉල්ලා සිටිනවා, ඒ ආරක්ෂාව තර කරලා මේ තත්ත්වය පාලනය කරන්න කටයුතු කරන්න කියා. මොකද, මීගමුවේ ඉන්න ජනතාව ඉතාම වේදනාවෙන් ඉන්නේ. ඒ අය මේ ප්‍රශ්නය දැක්කා. මේ ප්‍රශ්නය අත් වින්දා. ඒ නිසා ඒ පිළිබඳවත් කටයුතු කරන්න කියන ඉල්ලීමත් මේ අවස්ථාවේදී කරනවා.

[අ.භා. 5.10]

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Hira Foundation එක බිහි කළ ඒ ආයතනය, මුලින්ම Vocational Training Centre එක, දැන් මඩකළපු සරසවිය හෙවත් Batticaloa Campus (Pvt.) Limited පිළිබඳව අද කල් තැබීමේ විවාදයක් ජනතා විමුක්ති පෙරමුණ මඟින් ගෙනැල්ලා තිබෙනවා. ඒ විවාදයට සහභාගි වෙන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. මම හිතන්නේ දැනට එක්සත් ජාතික පෙරමුණත්, එක්සත් ජනතා නිදහස් සන්ධානයත්, ජනතා විමුක්ති පෙරමුණත්, දෙමළ ජාතික සන්ධානයත් වෙනුවෙන් කථා කරපු බොහෝ දෙනෙක් කියා හිටියේ මෙම Batticaloa Campus (Pvt.) Limited රජයට ගන්න ඕනෑ කියලායි. එහෙම නම් අපි කළ යුත්තේ කුමක්ද? පාර්ලිමේන්තුවට පුළුවන්, ආණ්ඩුවට පුළුවන් යෝජනාවක් කරලා මේ කාරණා විශේෂ කාරක සභාවක සාකච්ඡා කරලා, මේ සම්බන්ධයෙන් වූ

පනත් කෙටුම්පත වහාම පාර්ලිමේන්තුව තුළ සම්මත කිරීමට. අපි මුල සිට ගෙනාපු යෝජනාව පිළිබඳව ඉතා පැහැදිලිව කියන්නේ, මේ ආයතනය රජයට පවරා ගන්න, මේ ආයතනය ශ්‍රී ලංකාවට තාක්ෂණික විෂය පිළිබඳ දැනුම ලබාදෙන ආයතනයක් බවට පත් කරන්න කියලායි. විශේෂයෙන්ම අන්තර්ජාලය හරහා ඇති වෙන යුද්ධ පිළිබඳව දැනුම ලබා දෙන ආයතනයක් බවට පත් කරන්න. සියයට 50ක් රජයට අයිති, අනික් සියයට 50 ජාති, ආගම් භේදයකින් තොරව හැමෝටම ඉගෙන ගන්න පුළුවන් විධියේ ආයතනයක් බවට පත් කරන්න. ඒ කියන්නේ කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨය වාගේ බාහිර අයටත් ඇතුළු වෙන්නට පුළුවන් විධියට මේ ආයතනය හමුදා විශ්වවිද්‍යාලයක් බවට පත් කරලා එහි භාරකාරත්වය යටතේ පවත්වාගෙන යන්න කියා තමයි අපි මුල ඉඳලාම යෝජනා කළේ.

දැන් මේ විවාදය කරන කාලය තුළ කථා කරපු බොහෝ දෙනෙකුගේ කරුණු අරගෙන බැලුවාම පැහැදිලි වන දේ තමයි, මේ සිද්ධියේ තිබෙන බරපතළකම ගැන කවුරුවත් කථා කළේ නැති එක. මේක නීතිවිරෝධී ක්‍රියාවක් කියන එක ගැන තමයි සාකච්ඡා කළේ. ඒ කියන්නේ හිස්බුල්ලා මහතා විසින් යම්කිසි නීතිවිරෝධී කටයුත්තක් කරලා තිබෙනවා. මොකක්ද ඒ නීතිවිරෝධී කටයුත්ත? පිළිවෙළට ගත්තොත්, පළමුවෙන් ඒ ඉඩම ලබා ගැනීමේ කාරණය. ඔහු ඒ ඉඩම ලබා ගත්තේ Hira Foundation එක හරහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ඇති කිරීමේ අභිලාෂය ඇතිවයි.

බැලූ බැල්මට, වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක්. ඒ දීපු ලියවිල්ලේ බොහොම පැහැදිලිව ලියා තිබෙනවා ලාභ නොලබන, නොමිලේ ඉගෙන ගන්න පුළුවන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් කියලා. බැලූ බැල්මට මේකට විරුද්ධ වෙන්න කිසිම කාරණයක් නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ ඇමති ධුරයක් දරන කෙනෙක් ඉඩමක් ලබා ගත්තාද කියන එකයි. ඒ සම්බන්ධයෙන් තිබෙන එකම විවාදය මෙයයි. ඔහු ස්වේච්ඡාවෙන් ළමයින්ට නොමිලයේ අධ්‍යාපනය ලබා දෙන සමාජ සේවා ආයතනයකට මේ ඉඩම ලබා ගත්තා නම්, බැලූ බැල්මට එතැන ලොකු ප්‍රශ්නයක් නැහැ. ප්‍රශ්නයක් වෙන්නේ හිස්බුල්ලා මැතිතුමා මේ ඉඩම ලබා ගත්තේ වංචා සහගතවද කියන කාරණයේදී. ඔහු සඟවා ගත් අභිලාෂයකින් මුලින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් කියලා පටන් අරගෙන, ඊට පස්සේ Batticaloa Campus (Pvt) Limited කියන එකට මාරු කළේ, මුලින් තිබුණු අභිප්‍රාය වෙනස් කළේ, මුල ඉඳලාම දැනුවත්වද කියන එකයි තිබෙන ප්‍රශ්නය.

ඊළඟට, මේ ඉඩම ලබා දුන්නේ කොන්දේසි සහිතවයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහි ඉදි කිරීම් කරද්දී රජයට දැනුම් දෙන්නට ඕනෑ. ඒ අරමුණ වෙනස් කරන්නට බැහැ. ඒ පිළිබඳව මහවැලි අධිකාරියෙන් මුලින් ලියවිල්ලක් දීලා තිබෙනවා. "ව්‍යාපෘතිය සඳහා යටිතල පහසුකම් ඇතුළු ගොඩනැඟිලි ඉදි කිරීමට පෙර මහවැලි අධිකාරියේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය." කියලා. නමුත් එවැනි පූර්ව අනුමැතියක් ලබාගෙන නැහැ. "බදු දෙනු ලබන කාර්යය සඳහා පමණක් ඉඩම් යොදා ගත යුතුය" කියා තිබෙනවා. බොහොම පැහැදිලිව මේවා කියලා තිබෙනවා. ඒ ඉඩම ගත්තේ මොකටද? නොමිලේ අධ්‍යාපනය ලබා දෙන vocational training centre එකක් හදන්නටි. 2016දී ඒ අරමුණ වෙනස් කරලා ඔහු ඉල්ලා සිටිනවා, Batticaloa Campus (Pvt) Ltd එකක්. එතකොට වෘත්තීය පුහුණු අධ්‍යාපනයට පරිබාහිරව සමාජ විද්‍යා අධ්‍යාපනය සඳහා මේ ආයතනය යොදා ගන්නවා. සමාජ විද්‍යාව කිව්වාම ආගම, ධර්මය, කලාව, දර්ශනය අයිති වෙනවා. හැබැයි, ඒ ඇතුළට ඔහු ඇතුළත් කරනවා වෛද්‍ය පීඨයකුත්. මේ විධියට එකිනෙකට පරස්පර කාරණා ගොඩක් මේක ඇතුළේ අන්තර්ගතවෙලා තිබෙනවා. මේ හැම එකක්ම ප්‍රශ්න තමයි. නමුත් මේවා නොවෙයි මෙතැන තිබෙන ඇත්තම ප්‍රශ්නය.

සාමාන්‍ය ව්‍යවහාරය යටතේ පෘථග්ජන පුද්ගලයන් ලාභ ලබා ගැනීම සඳහා, හම්බ කර ගැනීම සඳහා විවිධ උප්පරවැට්ටි කරනවා, ව්‍යාපාර කරනවා. ඒවායේ ප්‍රශ්න තිබෙනවා. නමුත්, ඒ වාගේ සරල ප්‍රශ්නයක් නොවෙයි මේක. මොකක්ද මේ ප්‍රශ්නයේ තිබෙන සංකීර්ණතාව?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වැදගත් අවස්ථාවේදී මම අවධානය යොමු කරන්නට කැමැති කාරණයක් තිබෙනවා, අනෙක් මන්ත්‍රීවරුන් මේ ගැන අවධානය යොමු නොකළ නිසා. ඇෆ්ගනිස්ථානයට කුමක්ද වුණේ? ඇෆ්ගනිස්තානයේත් මේ වාගේම, මේ ආකාරයටම වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන, සුබසාධක පාසල් කියලා ඉස්කෝල පටන් ගත්තා. රට පුරාම, ෂරියා නීතිය සහ ඉස්ලාම් දහමේ දැඩි ආගමික වතාවත්වලට පේ වුණු පරම්පරාවක් සඳහා අධ්‍යාපන පීඨ ඇති කරනු ලැබුවා. අකුරු බැරි ගෝත්‍රික දරුවෝ මේ ඉස්කෝලවලට ගියා. අවුරුදු 5ක් 6ක් යනකොට මේ සියලුදෙනාම ඉස්ලාම් මූලධර්මවාදයේ අන්තවාදය වෙනුවෙන් ජීවිතය පරිත්‍යාග කරන්නට පුළුවන් සන්නද්ධ සේනාංකයක් බවට පත් කළේ මෙන්න මෙවැනි ආයතනවලින්. කවුද මේවාට මුදල් දුන්නේ? සෞදි අරාබිය, කටාර්, එමීර් වාගේ රාජ්‍යයන්වල යම් කිසි පුද්ගලයකුට තෙල් වළක්, දෙකක්, තුනක්, හතරක් තිබෙනවා නම්, ඒ කියන්නේ තෙල් තිබෙන ප්‍රදේශයක ඉඩම හිමි වුණා නම් ෂෙයික්වරයෙකුට හෝ යම්කිසි ව්‍යාපාරිකයකුට ඔහු ප්‍රංශ හෝ බ්‍රිතාන්‍ය සමාගමකට ඉඩම දෙනවා. තෙල් හාරන්නේ වෙන කට්ටියක්. හැබැයි, ඔහුට නිකම් ඉඳගෙන ලාභය විධියට විශාල ධනයක් ලැබෙනවා.

අපි උදාහරණයකට ගනිමු බින් ලාඩන්. බින් ලාඩන්ගේ තාත්තා සුළු ව්‍යාපාරිකයෙක්. ඔහු කෝටිපති ව්‍යාපාරිකයෙකු බවට පත් වුණේ පසුව. ඔහුගේ පුතා අප්‍රිකානු කලාපය තුළ සැරිසරමින් ඔහුගේ සන්නද්ධ ව්‍යාපාරය හදන වෙලාවේ ඔහු අතේ තිබුණු මුදල ඇමෙරිකාව වාර්තා කරන විධියට ඇමෙරිකානු ඩොලර් බිලියන 7ක්. ඔහු ඇෆ්ගනිස්තානයට එනකොට ඔහුගේ වත්කම ඇමෙරිකානු ඩොලර් බිලියන 5ක්. ඒ ඇමෙරිකානු ඩොලර් බිලියන 5 ඔහු මුලින්ම වියදම් කළේ මෙවැනි අධ්‍යාපන ආයතන පටන් ගන්නට. ඔහු පටන් ගත්තේ මද්‍රසා වාගේ පාසල් පද්ධතියක්. ඊළඟට, vocational training centres. දැන් මේ හිස්බුල්ලා පටන් අරගෙන තිබෙන්නේ ඒ ව්‍යාපෘතියමයි. අද සෞදි අරාබියේ අන්තවාදී මූලධර්මවාදයට යට වුණු, -සම්පූර්ණ සෞදි රාජ්‍ය නොවෙන්නට පුළුවන්, සෞදි රාජ්‍යයේ අනුමැතියෙන් නොවෙන්නට පුළුවන්- ප්‍රකෝටිපති, බිලියන ගණන් ධනය තිබෙන මිනිස්සු තමයි මේවාට වියදම් කරන්නේ. සමහර අය කියනවා මේ මූලධර්මවාදය ගොඩ නැඟීම ඇමෙරිකාවේ වැඩ පිළිවෙළක් කියලා. ඒ ගැන අපට තොරතුරු නැහැ. අපට තිබෙන දත්ත අනුව මෙවැනි මූලධර්මවාදයක් පාකිස්ථානයේ අදත් තිබෙනවා. ඉම්රාන් ඛාන් අගමැතිවරයාට පවා අද සමහර ගෝත්‍රිකයන් ඉන්න ප්‍රදේශ පාලනය කරන්නට බැහැ. මේ ආකාරයටම අනාථ කඳවුරු ආසන්නයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සහ ඉස්කෝල පටන් ගත්තා. ඒ ඉස්කෝලවලින් තමයි ආත්ම ඝාතක බෝම්බකරුවන් බිහි කරන්නේ. එතකොට ඉතා පැහැදිලිව හිස්බුල්ලා මේ පටන් ගත්ත විශ්වවිද්‍යාලය ආත්ම ඝාතක බෝම්බකරුවන් බිහි කරන, ඒ සඳහා ඔළුව වෙනස් කරන, මිනීමරුවන් බිහි කරන ආයතනයක්. මේක තනිකරම දකුණු ආසියාව අස්ථාවර කිරීම සඳහා හදපු විශ්වවිද්‍යාලයක්.

මම තවත් කරුණක් ගැන අවධානය යොමු කරවන්න කැමැතියි. සම්පූර්ණයෙන් ඉන්දියානු රජය, පාකිස්තානයේ ඉම්රාන් ඛාන් අග්‍රාමාත්‍යවරයා, බංග්ලාදේශය ආදි හැම රටක්ම හිස්බුල්ලාගේ මේ විශ්වවිද්‍යාලය ගැන අවධානය යොමු කරන්න ඕනෑ. කාත්තන්කුඩියේ ඉඳලා, මඩකලපුවේ ඉඳලා, ලංකාවෙන් තමයි බෝම්බ ගහන්න ගියේ. විශ්වවිද්‍යාල ඇතුව හෝ නැතුව ගලගෙදර, කටුගස්තොට, මහනුවර, ගම්පොළ මිනිසුන් සිරියාවේ

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි]

ගිහිල්ලා මැරුණා. අපි ඒ ගැන ප්‍රශ්න කළේ නැහැ. ආත්ම ඝාතකයන් ගිහිල්ලා යුද්ධ කරලා මැරුණා. ඉංග්‍රීසි ගුරුවරුන්, ඉහළ වෘත්තිකයන්, මේ රටේ ඉස්ලාම් සමාජයෙන් මතු වෙච්ච අය ගිහිල්ලා සිරියාවේ යුද බිමේ සටන් කළත් අපි ඒ ගැන ප්‍රශ්න කළාද, අපි ඒ ගැන සාකච්ඡා කළාද? නැහැ, අපි නිකම්ම නිකම් බලාගෙන හිටියා.

ඒ වාගේම අපි දන්නවා, බෝම්බ හම්බ වුණු බව; සහරාන් දේශන පැවැත් වූ බව. සහරාන් දේශන පැවැත් වූ ප්‍රමාණය පමණක් එක්කාසු කළාට පසුව ලක්ෂයකට වැඩියි. මාත් යම්කිසි ආකාරයක සමාජ ව්‍යාපාර හදන්න මහන්සි ගත්ත කෙනෙක්. මෙතැන නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමාත් ඉන්නවා. පූර්ණ කාලිකයෙක් හදාගන්න අඩු ගණනේ දහසකට කථා කරන්න ඕනෑ. මොකද, ඒ තරම් අමාරුයි, පූර්ණ කාලිකයෙක් හදන්න. ආත්ම ඝාතකයන් අට දෙනෙක් හදන්න අඩු ගණනේ 50,000කට කථා කරලා තිබෙන්න ඕනෑ. සහරාන්ගේ අධ්‍යාපන කඳවුරු ගලගෙදර, කටුගස්තොට, මහනුවර, මාතර-වැලිගම කියන මේ හැම තැනකම තිබිලා ඒවායේ සැරිසරමින් ඔහු මේ ආත්ම ඝාතක දේශන පැවැත්වූවා. අපිට සිහි නුවණ ආවේ, අපේ ඇස් ඇරුණේ ඒ බෝම්බකරුවන් බෝම්බ ප්‍රහාර එල්ල කළාට පසුවයි.

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා (වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அப்துல்லா மஹரூப் - துறைமுகங்கள், கப்பற்றுறைப் பிரதி அமைச்சர் )
(The Hon. Abdullah Mahrooff - Deputy Minister of Ports and Shipping)
ඔබතුමා තවම ත්‍රස්තවාදීන් ඇති කරන්න තමයි බලන්නේ. ඔබතුමා university එක සම්බන්ධව කථා කරනවා නම් හොඳයි. [බාධා කිරීම්]

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ඔබතුමා දන්නා දෙයක් නැහැ. කරුණාකරලා වාඩි වෙන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීමක්] ඔබතුමාට මේක තේරෙන්නේ නැහැ. අර උගත් මහත්මයෙක් ඉන්නවා. එතුමා ප්‍රධාන පක්ෂයක නායකයෙක්. [බාධා කිරීම්] එතුමා අහගෙන ඉන්නවා නේ. අඩු ගණනේ එතුමාට තේරෙනවා. [බාධා කිරීම්]

කරුණාකර ඔබතුමා -[බාධා කිරීම්] අර හකීම් ඇමතිතුමා වාගේ ශීලාචාරව අහගෙන ඉන්නවා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වෙන්නේ නැතුව. [බාධා කිරීම්] ඔය ගොල්ලන්ගේ -[බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා - [බාධා කිරීම්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ කථා කරන්න. [බාධා කිරීමක්]

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
Campus නොවෙයි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කථා කරන්නේ. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මම කථා කරන්නේ ඉස්ලාම් අන්තවාදයේ ජාත්‍යන්තර - [බාධා කිරීම්]

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
ඉස්ලාම් අන්තවාදයක් නැහැ. [බාධා කිරීමක්

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

- ඉස්ලාම් ආගම තුළ තමයි මේ අන්තවාදය ගොඩනැඟෙන්නේ. IS කියන්නේ මොකක්ද? [බාධා කිරීමක්] ඉස්ලාම් අන්තවාදය. ඉස්ලාම් මූලධර්මවාදය, ඉස්ලාම් අන්තවාදය කියලා කොටසක් තිබෙනවා. ඒ අන්තවාදයට නොගිය කොටසකුත් ඉන්නවා. සාමාන්‍යයෙන් ඒ අන්තවාදය ප්‍රතික්ෂේප කරන මුස්ලිම් අය ඉන්නවා.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෞරවනීය ස්වාමීන් වහන්සේ නමක් මේ සභාව අමතන වේලාවේදී එම ගෞරවය අපටත් තිබිය යුතුයි; උන් වහන්සේටත් ලැබිය යුතුයි.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කෑ ගහන්නේ නැතුව - [බාධා කිරීම්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ කථා කරන්න. [බාධා කිරීම්]

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
කරුණාකරලා - [බාධා කිරීම්] - මේ මනුස්සයාට තේරෙන්නේ නැහැ නේ, කියන දේ. [බාධා කිරීම්] -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, බාධා කරන්න එපා.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වාඩි වෙන්න. ඔබතුමාගේ කථාව -[බාධා කිරීමක්] ඔබතුමාගේ ඉස්ලාම් අන්තවාදය වෙනම -[බාධා කිරීමක්] මගේ වේලාව නේ, ඔබතුමාට මගේ කථාව නවත්වන්න බැහැ. මේ ලංකාවේ පාර්ලිමේන්තුවට තහනම් කරන්න බැහැ - ඉස්ලාම් අන්තවාදය කියලා එකක් ලෝකයේ තිබෙනවා. මේ මනුස්සයා ඒක දන්නේ නැහැ. මම මොකද, කරන්නේ ඒ ගැන? අතැන ඉන්නවා, හකීම් කියලා මහත්මයෙක්; එතුමා ඇමතිවරයෙක්. එතුමා පිළිගන්නවා, ඉස්ලාම් අන්තවාදය තිබෙනවා කියලා. හැබැයි, ඉස්ලාම් අන්තවාදය තිබුණාය කියලා අපි මේ රටේ සියලු මුස්ලිම් ජනතාව ඉස්ලාම් අන්තවාදයට දමන්නේ නැහැ. ඉස්ලාම් ආගමේ මිනී මරන අන්තවාදීන් - මිනීමරුවන්- ඉන්නවා. ඉස්ලාම් ආගමේ මිනීමරන අය ඉන්නවා. තලෙයිබාන්වරු ඇෆ්ගනිස්තාන් රාජ්‍යය අවුරුදු දෙකක් පාලනය කළා. ඒක බොරුවක්ද? අද ඇෆ්ගනිස්තානයේ ගැහැනු දරුවෙක් ඉස්කෝලේ ගියොත් ඔළුවට වෙඩි තබා මරණවාද, නැද්ද? පාකිස්තානයේ මලාවි දැරියට වෙඩි තැබුවේ කවුද? ඉස්ලාම් අන්තවාදියෝ නොවෙයිද? අපිද ගිහිල්ලා වෙඩි තැබුවේ? මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඒක තේරෙන්නේ නැත්නම්, අපි මොකද, කරන්නේ? අද ලෝකයේ ඉතාම දරුණු විශේෂයෙන් ඉතාම පහත් නීති - මේවා කුරානයේ තිබෙනවාද, නැද්ද කියන එක ගැන ඉස්ලාම් සමාජය තුළ ප්‍රබුද්ධ සාකච්ඡාවක් ඇති වෙන්න ඕනෑ. අපට ඒවා විවේචනය කරන්න බැහැ. ඉස්ලාම් සමාජය තුළ ප්‍රබුද්ධ සාකච්ඡාවක් ඇති වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිස්බුල්ලාගේ මේ විශ්වවිද්‍යාලය රජයට පවරා ගන්න කියන කාරණයට අද සියලු කණ්ඩායම් එකඟ වෙලා තිබෙනවා. සමහර අය හිස්බුල්ලා ගැන කථා කරන්නවත් බයයි. හිස්බුල්ලා ගැන විවේචන දෙකක් අපට කරන්න පුළුවන්. පළමුවැනි විවේචනය තමයි, හිස්බුල්ලා සල්ලි හම්බ කිරීම සඳහා ඉස්ලාම්වාදීන්ට කඩේ යනවාද, නැත්නම් ඉස්ලාම්වාදී අන්තවාදය වෙනුවෙන් සේවය කරනවාද කියන එක. දෙවැනි විවේචනය තමයි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාවට බාධා වුණා. ඒ නිසා මට තව විනාඩි දෙකක් ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඒ වෙනුවෙන් වැඩිපුර කාලයක් එකතු කළා, ගරු ස්වාමීන් වහන්ස.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව කරුණු කීපයක් කියන්න තිබෙනවා. ඔහුට මුදල් ලැබුණු ක්‍රම, ඔහු මුදල් ලබා ගත් විධිය ගැන මා පැහැදිලි කරන්නම්. විශාල මුදල් ප්‍රමාණයක් ඔහු ලබාගෙන තිබෙනවා. බැංකුවල ඒ වාර්තා ටික මම කියන්නම්. රුපියල් මිලියන 965ක් ඔහු Batticaloa Campus (Pvt.) Limited වෙනුවෙන් අරගෙන තිබෙනවා. මේ Batticaloa Campus (Pvt.) Limited වෙනුවෙන් රුපියල් මිලියන 564ක් මාරු කරලා තිබෙනවා. මේ ඔක්කෝම තිබෙන්නේ බැංකු වාර්තා. රුපියල් මිලියන 526ක්, රුපියල් මිලියන 424ක්, රුපියල් මිලියන 30ක්, රුපියල් මිලියන 541ක්, රුපියල් මිලියන 438ක්, රුපියල් මිලියන 20ක්, රුපියල් මිලියන 450ක්, රුපියල් මිලියන 35ක්, රුපියල් මිලියන 15ක්, රුපියල් මිලියන 16ක්, රුපියල් මිලියන 32ක්, රුපියල් මිලියන 32ක් ආදී වශයෙන් ලංකා බැංකුවෙන් ගත්ත මුදලේ සමස්ත එකතුව රුපියල් බිලියන 4කට වැඩි වනවා. රුපියල් බිලියන 4කට වැඩි මුදලක් පමණක් මේ බැංකු වාර්තාවල අන්තර්ගත වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. මේ විශ්වවිද්‍යාලයට මුදල් ලබා දුන්නු අයගේ නම් ටිකත් මේ අවස්ථාවේ දී මා පැහැදිලි කරන්න කැමතියි. මේ නම් ටික ප්‍රකාශ කරන එක ඉතා වැදගත් වනවා. මෙන්න මේ ආයතන හා ඒගොල්ලන් දීපු ගණන් තිබෙනවා. ඩොලර් මිලියන 5.3ක්, ඩොලර් මිලියන 2.8ක්, ඩොලර් මිලියන 10.2ක්, ඩොලර් මිලියන 2.8ක්, ඩොලර් මිලියන 3.8ක්. ඒ මුදල් දීලා තිබෙන්නේ කවුද? Sheikh Dr. Iyman Ali Al Juffaali කියන්නේ කවුද? ආශු මාරසිංහ මන්ත්‍රීතුමා ඒ කමිටු වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා. ඒ කමිටු වාර්තාව ඕනෑ නැහැ, තමුන්නාන්සේ විදේශ කටයුතු ඇමතිවරයාට ලියුමක් දීලා අහන්න, මෙලෙස මුදල් දීපු ආයතනය මොකක්ද කියලා. මේ ඇෆ්ගනිස්ථානයට, පාකිස්තානය විනාශ කරන්න මුදල් දීපු ආයතන. අපට එම තොරතුරු ඉල්ලන්න බැහැ. ඔබතුමා විදේශ කටයුතු ඇමතිතුමාට ඒ ගැන කියන්න. මේ මනුෂ්‍යයා කවුද? මොහු සවුදි අරාබි පුරවැසියෙක්ද, මොහුගේ ආයතනය මොකක්ද? Sheikh Ferras Nasser කියන්නේ කවුද? Sheikh Ali Abbdulla al Juffali Foundation Charity එක කාගේද? Sheikh al Rashed Yahya Abdul Aziz කවුද? Sheikh Haild Ad Dawooud Abu Salik කවුද? මොවුන් මුළු ලෝකයටම බෝම්බකරුවන් හදන්න ප්‍රකෝටි ගණන් ධනය යවපු මිනීමරුවන්. මේ මිනීමරුවන් තමයි මේ සල්ලි දීලා තිබෙන්නේ. මේ ප්‍රශ්නය පාර්ලිමේන්තුවේ කථා කරන්න බය ඇයි? ඒ ගැන නිහඬව ඉන්නේ ඇයි? මේ තමයි අන්තවාදය. මේක මුස්ලිම් ප්‍රශ්නයක් නොවෙයි. ලෝකයේ ලස්සන රටක් වන ඇෆ්ගනිස්ථානය විනාශ කළා. පාකිස්තානයේ රාජ්‍යයන් ඒ තත්ත්වයට පත් කළා. අද ඉම්රාන් ඛාන් යටතේ ඒ රට යම්තාක් දුරට ගොඩනැඟිලා තිබෙනවා.

මම මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ විශ්වවිද්‍යාලය රජයට පවරා ගන්න අපි දෙගොල්ලන්ම එකඟ නම් මේ විශ්වවිද්‍යාලය රජයට පවරා ගන්නේ නැත්තේ ඇයි?

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු ස්වාමීන් වහන්සේ නහපු ප්‍රශ්නයට මා උත්තර දෙන්නම්. විදේශ කටයුතු අමාත්‍යාංශයයි, සවුදි අරාබි තානාපති කාර්යාලයයි, සියලු විදේශ ආයතනත් එක්ක එකතු වෙලා, මේ මුදල් ලබා ගත් අය පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් ලබා ගන්න කියලා අපි ඉල්ලා තිබෙනවා. අපි එහෙම කළේ නැහැ කියලා ඔබ වහන්සේ චෝදනාත්මක ස්වරූපයෙන් කිව්වා.

[பி.ப. 5.26]

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

சபைக்குத் தலைமைதாங்கும் கௌரவ உறுப்பினர் அவர்களே, Batticaloa Campus சம்பந்தமான இந்த விவாதத்தில் உரையாற்றுகையில் சில விடயங்களைக் குறிப்பிட விரும்புகின்றேன். இன்று Batticaloa Campus விவகாரம் நாட்டின் இனங்களுக்கிடையில் குரோதத்தை உண்டுபண்ணும் விதமாக வேறு திசைக்குக் கொண்டுசெல்லப்படுவதை நாங்கள் அவதானிக்கின்றோம். உண்மையில், இதுவொரு மத ரீதியான பள்ளிவாசலோ அல்லது ஓர் அரபுக் கல்லூரியோ அல்லது அது போன்ற ஒரு நிறுவனமோ அல்ல. இது உண்மையில் இந்த நாட்டின் ஒரு தனியார் பல்கலைக்கழகமாகும். இந்த நோக்கத்தின் அடிப்படையிலேதான் இந்தப் பல்கலைக் கழகத்துக்கான கட்டுமானப் பணிகள் இடம்பெற்று வந்தன. ஏப்பிரல் 21 ஈஸ்டர் ஞாயிறு குண்டுத்தாக்குதலுக்குப் பின்பு, இந்தப் பல்கலைக்கழக விடயம் சம்பந்தமாக இந்த நாட்டில் பெரும் சர்ச்சை மூண்டிருக்கின்றது. இந்தச் சர்ச்சை சம்பந்தமாக ஆராய்ந்த எங்களுடைய பாராளுமன்றத்தின் கல்வி மற்றும் மனித வள அபிவிருத்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின் தவிசாளர், பாராளுமன்ற உறுப்பினர் ஆசு மாரசிங்க அவர்கள் ஓர் அறிக்கையினைச் சமர்ப்பித்திருக்கின்றார். அதில் இந்தத் தனியார் பல்கலைக்கழகம் சம்பந்தமாகப் பத்துக் குற்றச்சாட்டுக்கள் முன்வைக்கப்பட்டிருக்கின்றது. அந்தப் பல்கலைக்கழகத்தினை நிருவகிக்கின்ற நிறுவனம் இதற்கான பதில் அறிக்கையினை குறித்த குழுவுக்கு அளித்திருக்கின்றது.

அந்த அறிக்கையில் அந்தப் பல்கலைக்கழகத்திற்கு எடுத்த காணி சம்பந்தமாகக் குறிப்பிடுகையில், உண்மையில் சட்ட ரீதியாக 35 ஏக்கர் காணிதான் அதற்கு வழங்கப்பட்ட சூழ்நிலையில், 45 ஏக்கர் காணி ஆக்கிரமிக்கப்பட்டிருப்பதாகத் தெரிவிக்கப்பட்டிருக்கின்றது. அக்குற்றச்சாட்டுக்கான பதிலில், மேலதிக 08 ஏக்கர் காணி அந்தப் பல்கலைக்கழக வளவுக்குள் செல்கின்ற canal மற்றும் ஏனைய high tension மின்சார இணைப்பு விடயங்களுக்காக ஒதுக்கப்பட்டிருக்கின்றதென்று தெளிவாகக் கூறப்பட்டிருக்கின்றது. அதேநேரம், அந்தப் பல்கலைக்கழகத்தின் கட்டுமானத்துக்கு பிரதேச சபையின் அனுமதி பெறப்படவில்லை என்றும் குற்றம் சாட்டப் பட்டிருக்கின்றது.

இந்தப் பிரதேசத்துக்குப் பொறுப்பான வாகரைப் பிரதேச சபையின் தெளிவான ஆவணங்கள் அந்தப் பதிலறிக்கையில் அடங்கியிருக்கின்றன. ஆகவே, அந்தக் கட்டுமானத்துக்கான அனுமதி அளிக்கப்பட்டிருக்கின்றது. இந்தப் பல்கலைக்கழகம் Registrar of Companies இல் பதிவு செய்யப்படுவதற்கு முன்பு இதற்கான அனுமதி கேட்டு உயர் கல்வி அமைச்சுக்கு கடிதம் அனுப்பப்பட்டுள்ளதான பெரும் குற்றச்சாட்டொன்றும் உள்ளது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, இன்னும் ஒரு நிமிடம் உள்ளது.

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
இந்த Batticaloa Campus என்பதை காத்தான்குடியில் முன்புள்ள, அதாவது திறன் அபிவிருத்தி அமைச்சினூடாக நடாத்தப்படுகின்ற Batticaloa University College உடன் சம்பந்தப்படுத்தி குறித்த குற்றச்சாட்டு முன்வைக்கப்பட்டிருப்பதையும் நாங்கள் அவதானிக்கின்றோம். அதன் உரிமையாளர் ஓர் பாராளுமன்ற உறுப்பினராக இருந்தவர். இவற்றினை முழுமையாகப் பார்க்கின்றபோது, இதுவோர் இனவாத அடிப்படையில் நோக்கப்பட்டு, அரசியல் ரீதியாகவும் ஓர் இன ரீதியாகவும் சர்ச்சைக்கு உள்ளாக்கப்பட்டிப்புருபது தெளிவாகின்றது. இந்த நாட்டில் பல சகோதரர்கள் தனியார் பல்கலைக்கழகங்களை நடாத்துகின்றார்கள். அதாவது Horizon Campus, SLIIT, CINEC Maritime Campus எனப் பல பல்கலைக்கழகக் கல்லூரிகள் நடாத்தப்படுகின்றன. ஆனால், அவற்றின்மீது இவ்வாறான குற்றச்சாட்டுக்கள் முன்வைக்கப் படவில்லை.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களது நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
Please give me one more minute, Sir.

இந்தப் பல்கலைக்கழகக் கட்டிடத்தினுடைய தோற்றம் இஸ்லாமியக் கட்டிடக்கலை வடிவத்தை ஒத்திருப்பதனால் தான் இதுவொரு பெரும் சர்ச்சையாகக் கிளம்பியிருக்கின்றது என்பதை நாங்கள் அவதானிக்கின்றோம். அதேநேரம், இதற்கு வந்த நிதிகள் இந்த நாட்டின் வங்கியூடாக வந்து சேர்ந்திருக்கின்றன என்பது புலனாகின்றது. இவ்வாறான ஒரு நிலைமையில், இந்தப் பல்கலைக்கழகத்தை வைத்து இந்த நாட்டில் இன முரண்பாடுகளைத் தோற்றுவிப்பதை ஏற்றுக்கொள்ள முடியாது. உண்மையில், இந்த Batticaloa Campus இல் அடிப்படைவாதம் போதிக்கப்படுகின்றதா, இல்லையா? எதிர்காலத்தில் போதிக்கப்படுமா? என்ற சந்தேகம் இருந்தால், அதன் உண்மைத்தன்மையைக் கண்டறிந்து செயற்பட வேண்டும். அந்தப் பல்கலைக்கழக நிர்வாகத்துடன் 50 வீதம் இலங்கை அரசாங்கம் சேர்ந்து முகாமைத்துவம் செய்கின்றபோது, அதற்கான உபவேந்தரை இலங்கை உயர் கல்வி அமைச்சே நியமிக்கின்றபோது, இந்தப் பல்கலைக்கழகச் சர்ச்சைக்கு முற்றுப்புள்ளி வைக்கலாம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up your speech now.

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
இந்த நாட்டிலுள்ள முஸ்லிம் மாணவர்கள் மட்டுமல்ல, சிங்கள, தமிழ், முஸ்லிம் என அனைத்தின மாணவர்களும் கல்வி கற்கக்கூடிய வகையில் இலங்கை அரசாங்கத்தின் மேற்பார்வையில் நடாத்தப்படுகின்ற ஒரு பல்கலைக்கழகமாக இதனை மாற்றுவதற்கு அந்த நிறுவனத்தின் உரிமையாளர்கள் அழைப்பு விடுத்திருக்கின்றபொழுது, அதனை அரசு பரிசீலித்து, ஒரு சுமுகமான முறையில் குறித்த பிரச்சினைக்குத் தீர்வுகாண வேண்டுமென்று கூறிக்கொள்ள விரும்புகின்றேன். நன்றி.

[අ.භා. 5.33]

**ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අප සාකච්ඡා කරන්නේ, වහබ්වාදීන් නිර්මාණය කරන Batticaloa Campus (Pvt.) Limited, හෙවත් Batticaloa company එක ගැනයි. ඒකට විශ්වවිද්‍යාලයක් කියලා කියන්න බැහැ. ෂරියා නීති උගන්වන්න හදන, වහබ්වාදීන් නිර්මාණය කරන්න හදන, මේ රටේ මුස්ලිම් ජනයා අන්තවාදයට කැඳවාගෙන යන, රට ඇතුළේ පාලන තන්ත්‍ර දෙකක්, බලය බෙදලා රටවල් දෙකක් ඇති කරන්න උත්සාහ කරන විශ්වවිද්‍යාලයක් තමයි Batticaloa Campus (Pvt.) Limited යනුවෙන් මේ ආරම්භ වෙමින් තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නීති විරෝධී වහබ්වාදී අන්තවාදය පතුරවන ඒ විශ්වවිද්‍යාලය වහාම රජයට පවරාගන්න කියලා කියන්නේ ඇයි? අපට ආරංචියක් ලැබෙනවා, හිස්බුල්ලා මැතිතුමා පාර්ලිමේන්තුවේ දිවුරුම් දෙන්නත් සූදානම් කියලා. උන්නැහේ ආණ්ඩුකාර තනතුරේ සිටියා. ඊට කලින් -1993 වර්ෂයේදී- හිරා පදනම හැදුවා, සමාජසේවා අමාත්‍යාංශය යටතේ. 2013 වර්ෂයේදී Hira Foundation එකට ඒ ඉඩම -ඒ අක්කර 35- ගත්තේ ග්‍රාමීය පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යෑම සඳහායි. කපටි නරින්ගේ භූමිකාව කියලා ඒකට නේ, කියන්නේ. කපටි නරින්ගේ ස්වභාවය ඒක තමයි. හිස්බුල්ලා උන්නැහේ ඒ ඉඩම ගත්තේ එහෙම කියලා තමයි. 2015දී තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ආවාට පස්සේ, එම ග්‍රාමීය පුහුණු කිරීමේ මධ්‍යස්ථාන ව්‍යාපෘතිය "Batticaloa Campus College" කියලා වෙනස් කරන්න අනුමැතිය ලැබෙනවා. ඒ අනුමැතිය ලැබෙන්නේ 2015.07.14 වන දායි. ඒ අනුව එය PV 106989 කියන අංකය යටතේ ලියා පදිංචි වෙනවා; එයට අනුමැතිය ලැබෙනවා. ඒ ආකාරයට, ඒ ග්‍රාමීය පුහුණු කිරීමේ මධ්‍යස්ථානය "Batticaloa Campus College" කියන නමට වෙනස් කරනවා. ඒ "Batticaloa Campus College" කියන ආයතනය, 2016.02.29වන දා "Batticaloa Campus (Pvt.) Limited" කියලා වෙනස් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අරාබියෙන් ලැබෙන නීති විරෝධී කෝටි ප්‍රකෝටි ගණනක් වූ සල්ලි ටික ගන්න හිස්බුල්ලා උන්නැහේ 2016.01.04වන දා, ලංකා බැංකුවේ කොල්ලුපිටිය ශාඛාවේ ගිණුමක් ආරම්භ කරනවා. ඒ අපු කෝටි ප්‍රකෝටි ගණනක් වූ මුදල් තමයි හිස්බුල්ලාටයි, හිස්බුල්ලාගේ පුතාටයි, පුතාගේ ඥාතින්ටයි, හිස්බුල්ලාගේ ඥාතින්ටයි -නෑදෑ පරම්පරාවටම- බෙදා ගන්නේ. මේ රටේ අන්තවාදය -මුස්ලිම් අන්තවාදය, ඉස්ලාම් අන්තවාදය, වහබ්වාදය- වපුරන්නයි ඒ විශ්වවිද්‍යාලය හදන්න පටන් ගන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එය ආරම්භ කරන්න හැදුවේ "Malik Abdullah University" කියන නමින්. රවුෆ් හකීම් ඇමතිතුමාට ඒක මතක ඇති. හිස්බුල්ලා මහත්මයා ඒක පටන් ගන්න හැදුවේ, ඒ නමින්. ඒ වුවමනාව වුණේ මොකක්ද? ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය තිබියදී, මේ රටේ ශ්‍රී ලාංකික දරුවන් ඒ අග්නිදිග විශ්වවිද්‍යාලයේ ඉගෙන ගනිද්දී, වෙනම නව විශ්වවිද්‍යාලයක් ඕනෑ වුණා, වහබ්වාදය වපුරන්න. වසරකට 1,500 බැගින් දස වසරකදී වහබ්වාදී බලවේගයක්, එහෙම නැත්නම් ඉස්ලාම් දේවධර්මාචාර්යවරුන් 15,000ක් බිහි කිරීම තමයි හැබෑ ලෙසම ඒ වහබ්වාදී අන්තවාදී විශ්වවිද්‍යාලයේ අරමුණ වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ක්‍රියාත්මක වන එකම විශ්වවිද්‍යාලයකටවත් එම විශ්වවිද්‍යාලයේ නිර්මාතෘවරයාගේ හෝ රටේ යතිවරයකුගේ හෝ නමක් යොදන්නේ නැහැ. බෞද්ධ භික්ෂු අධ්‍යාපනයේ මුදුන් මල්කඩ වූ, පසුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ කැලණිය විශ්වවිද්‍යාලය යන නම්වලින් රජයේ විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළත් කර ගත් විද්‍යෝදය සහ විද්‍යාලංකාර මහා පිරිවෙන් පවා හැඳින්වුයේ ඒවායේ නිර්මාතෘවරුන්ගේ නම්වලින් නොවෙයි. අපේ රටේ ලාංකීය භික්ෂු අධ්‍යාපනයේ හදවත බඳු වූ විද්‍යෝදය සහ විද්‍යාලංකාර මහා පිරිවෙන් ජාතික විශ්වවිද්‍යාල පද්ධතියට එකතු කරමින්, පරිපූර්ණ භික්ෂුවක් බිහි කිරීම සඳහා ක්‍රියාත්මක වූ පිරිවෙන් මූලික කරගත් අසහාය භික්ෂු අධ්‍යාපන ක්‍රමය විනාශ කර දැමූ ඒ ඓතිහාසික කුමන්ත්‍රණය ගැන අපි කවදා හෝ දවසක මේ පාර්ලිමේන්තුවේදී වෙනම කථා කරන්න ඕනෑ. ලංකා රජයේ අනුග්‍රහයෙන්, වෘත්තීය පුහුණු අධ්‍යාපන ආයතනයක් ආරම්භ කරනවා කියලා මේ ආයතනය හොර රහසේ ආරම්භ කළේ, අරාබියේ අබ්දුල්ලා රජුගේ නම ලංකාවේ, ලෝකයේ ප්‍රචලිත කිරීමටයි, ඒ වහබ්වාදය වපුරන්නටයි. ඒ වහබ්වාදය මේ රටේ වපුරන ක්‍රියාවලිය අප්‍රේල් 21වන දා ප්‍රහාරයෙන් ඉදිරියට ආවා.

'වහබ්' කියලා කියනකොටම නළියන, 'ෂරියා' කියලා කියනකොටම නළියන සමහර මන්ත්‍රීවරු ඉන්නවා. එක රටක් ඇතුළේ ජීවත් වෙන්න කැමැති මුස්ලිම් ජනතා නායකයන්ගෙන් නොවෙයි, මම මේ අහන්නේ. සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව එක රටක් තුළ ජීවත් වෙන්න කැමැතියි. හැබැයි, ඒක නොවෙයි මේ සිද්ධ වෙන්නේ. ජනතා විමුක්ති පෙරමුණේ නිර්මාතෘවරයා වන රෝහණ විජේවීර සහෝදරයා මීට විසි වසරකට කලින්, දෙමළ ඊළාම් අරගළයට විසඳුම කුමක්ද? කියන පොතේ ලියා තිබෙනවා, කවදා හෝ දවසක මේ රටේ උතුරේ මලයනාඩුවක්, නැඟෙනහිර කිලකස්ථානයක් බිහි වෙන්න පුළුවන් කියලා. ඒක තමයි අද මේ වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වහබ්වාදයේ එක ඉගැන්වීමක් තිබෙනවා. ගරු රවුෆ් හකීම් ඇමතිතුමාත් දැන් මේ ගරු සභාවේ ඉන්නවා. මම කලින් කියපු, නළියන සමහර මන්ත්‍රීවරුත් මේ සභාවේ දැන් ඉන්න නිසා මම මේ කාරණය කියන්නම ඕනෑ. වහබ්වාදයේ මෙන්න මෙහෙම එකක් කියනවා. මේ රටට කරන්න හදන්නේ මේකද කියායි මම මේ අහන්නේ. ජිහාඩය කියන්නේ මොකක්ද කියලා කුරාණයේ එක් වගන්තියක පසුවදනේ මෙන්න මෙහෙම කියා තිබෙනවා.

"ජිහාඩ් යනු, අල්ලාගේ අරමුණු ඉෂ්ට කිරීම වෙනුවෙන් ප්‍රචණ්ඩත්වය සහ පූර්ණ බලය සහ ආයුධ සන්නද්ධව අල්ලා සහ මොහොමඩ්, එනම් ඉස්ලාමය විශ්වාස නොකරන ජනයා විනාශ කිරීම සඳහා මුස්ලිම්වරුන් විසින් කළ යුතු ශුද්ධ වූ සටනයි. ජිහාඩය ඉස්ලාමයේ ඉතා වැදගත්ම ක්‍රියාවලියකි. එය ඉස්ලාමයේ රඳා පැවැත්ම සඳහා ඇති එක් බල කණුවකි. ජිහාඩය හරහා ඉස්ලාමය ස්ථාපිත වන්නේය. ජිහාඩය සෑම මුස්ලිම්වරයකුගේම බන්ධනීය ඉස්ලාමීය වගකීම වන්නේය."

වහබ්වාදී විශ්වවිද්‍යාල හදලා මොවුන් කරන්න හදන්නේ මේක නම්, මේ රටේ සාම්ප්‍රදායික මුස්ලිම් ජනයා විතරක් නොවෙයි, දෙමළ, සිංහල මිනිසුත් පාරට බැහැලා ඒකට විරුද්ධව සටන් කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් මේ රටේ ජනතාවට එළියේ සටනක් තිබෙනවා. මේ විශ්වවිද්‍යාලය අනිවාර්යයෙන්ම රජයට පවරා ගත යුතුයි කියන කාරණය මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා.5.41]

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා Batticaloa Campus (Pvt.) Ltd ගැන බොහොම ආවේගශීලීව කථා කළා. හැබැයි, එතුමන්ලාගේ ආණ්ඩුව පැවැති කාලයේ -2013 අගෝස්තු 15වැනි දා- තමයි මේ ගිවිසුම අත්සන් කළේ. ඒ ආණ්ඩුවේ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයත්, ශ්‍රී ලංකා හිරා පදනමත් තමයි මේ Batticaloa Campus (Pvt.) Ltd සඳහා වසර 3ක කාලයකට ගිවිසුම් අත්සන් කළේ. ඒ නිසා අද නොවෙයි එදා නේ, තමුන්නාන්සේලාට කෑ ගහන්න තිබුණේ. කොහෙන් හෝ මේ වාගේ දෙයක් අටවාගෙන, ISIS ත්‍රස්තවාදීන්ට උඩගෙඩි දීලා, ඒ සංවිධාන තුළින් කරපු ඒවා ගැන අද ලජ්ජා නැතිව කථා කරනවා.

ගරු රවුෆ් හකීම් ඇමතිතුමනි, දේශපාලනයේ පරිණත කෙනකු හැටියට, මුස්ලිම් ජනතාවගේ නායකයකු හැටියට ඔබතුමා මෙවැනි කනගාටුදායක දේවල්වලට කවදාවත් අත තැබුවේ නැති බව අප දන්නවා. එදා ඩලස් අලහප්පෙරුම මැතිතුමා ඇමතිවරයා හැටියට මේ ගිවිසුම අත්සන් කරද්දී, හිස්බුල්ලා මැතිතුමා නියෝජ්‍ය අමාත්‍යවරයකු හැටියට කටයුතු කරමින් මේ දේවල් කරද්දී, මෙතුමන්ලා කසාය බීපු ගොළුවෝ වාගේ හිටියා. අද ලජ්ජා නැතිව මහා හයියෙන් කෑ ගහලා කියනවා, "මේවාට විරුද්ධව කටයුතු කරනවා" කියලා. තමුන්නාන්සේලා මේ දේවල්වලට විරුද්ධව කථා කළ යුතුව තිබුණේ එදායි. එසේ නොකළ එක ගැන මම කනගාටු වෙනවා.

එදා SAITM එක හදනකොටත් සිද්ධ වුණේ මේක තමයි. එතුමන්ලා මේ වාගේ කුණු ගොඩවල් අපේ රටේ හදලා, අපේ ආණ්ඩුව පත්වුණු දවසේ ඉඳලා නොයෙක් විධියෙන් මේ රට නොසන්සුන් තත්ත්වයට පත් කළා. එදා SAITM එකට විරුද්ධව විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් පාරට බැහැලා උද්ඝෝෂණය කරද්දී, ගරු මහාචාර්ය ආශු මාරසිංහ මැතිතුමාත්, අපිත් එදා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී ඒ වෙනුවෙන් සටන් කරලා ඒක රජයට පවරා ගන්න කටයුතු කළා. වාසනාවකට, අපට ඒ ප්‍රශ්නය අවසන් කරන්න පුළුවන් වුණා. මේකත් එහෙම තමයි. තමුන්නාන්සේලා මෙවැනි ගිවිසුම් අත්සන් කරලා මේ රට ඉතාම අවාසනාවන්ත තත්ත්වයකට පත් කළා.

ආංශික අධීක්ෂණ කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ ඇතුළත් වාර්තාවේ මේ සියලු දේවල් පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා. එම වාර්තාවේ නිරීක්ෂණ අංක 12.1.3හි මෙසේ සඳහන් වෙනවා:

> "ඊට සමගාමීව 2015.07.03වැනි දින යුනිවර්සිටි කොලේජ් බැටික්ලෝ ආයතනයේ සභාපති සහ එවකට ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයා වූ ගරු මොහොමඩ් ලෙබ්බෙ අලිම් මොහොමඩ් හිස්බුල්ලා මහතා විසින් එවකට උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍යවරයා වූ ගරු ආචාර්ය සරත් අමුණුගම මහතා වෙතින් එකී ආයතනය උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස සැලකීමේ අනුමතිය ඉල්ලා ඇත."

මේ ආයතනය රජයට පවරා ගන්න ඕනෑය කියලා දැන් කියනවා. අතිගරු ජනාධිපතිතුමාටත් මා මේ කාරණය කියන්න කැමැතියි. මේ සම්බන්ධයෙන් එතුමා options දෙකක් කියලා තිබෙනවා.

එක්කෝ මේ ආයතනය රජයට පවරා ගන්න ඕනෑ. එහෙම නැත්නම්, හිස්බුල්ලා මහතා ඇතුළු එතුමාගේ පුතාගේ කණ්ඩායමට මේ ආයතනය පෞද්ගලිකව පවත්වා ගෙන යන්න ඉඩ දෙන්න ඕනෑ. එක්සත් ජාතික පෙරමුණේ ආණ්ඩුව ශක්තිමත්ව මේ රට ගෙනයනකොට, අප්‍රේල් 21 වෙනි දා ඇති වූ සිද්ධිය සියලුදෙනාම දන්නවා. ඒ සිද්ධිය ඇති නොවුණා නම්, මේ රටේ තිබෙන තත්ත්වය අපි ඉතාම පැහැදිලිව දන්නවා. ඒ තරම්ම ඉතාම ආශ්චර්යවත් විධියට අපට මේ රට ගෙනයන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමන්ලා අපට නොවෙයි මේක කියන්න ඕනෑ. එතුමන්ලා පාරට බහින්න ඕනෑ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්ද රාජපක්ෂ මැතිතුමා ලජ්ජා නැතිව SAITM එකටත් ඇවිල්ලා, ගිවිසුම අත්සන් කරලා, ලජ්ජා නැතිව loan එකත් pass කරලා අවසානයේ කිව්වේ මොකක්ද? ඒකට මම කැමැති නැහැ කිව්වා. මෙවැනි කටයුතු කරපු අය, අත්සන් කරපු අය අද ඇවිල්ලා මොර ගහනවා, අපි පාරට බහිනවා, මෙහෙම වුණොත් බෙල්ලේ වැළලා ගන්නවා කියලා. එල්ලෙන්න කියන්න කොහේ හෝ ගිහිල්ලා. පාර්ලිමේන්තුවේ එල්ලෙන්න ඕනෑ නැහැ. මෙතැනත් නොයෙකුත් දේවල් කරලා ඩෙබා නටලා අපවිත්‍ර කළේ මේ අයයි කියලා මම කියනවා. ඒ කවුරු මොන විධියට කිව්වත්, හිස්බුල්ලා මහතාට ආණ්ඩුකාරකම් දෙනකොට, නියෝජ්‍ය ඇමතිකම් දෙනකොට, ලජ්ජා නැතිව ඒවාට ආශිර්වාද කරපු, ඒ අයත් එක්ක ගනුදෙනු කරපු, ඒ අයත් එක්ක එක බත්පත කාපු, ඒ අයත් එක්ක කටයුතු කරපු අය අද ලජ්ජා නැතිව ඇවිල්ලා මෙහෙම කියනවා. ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව සම්බන්ධයෙන් අපි ඉතා පැහැදිලිව තීන්දුවක් ගන්නවා. අපි හෙට අනිද්දා Batticaloa Campus එකට යනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව තත්පර කිහිපයක් දෙන්න. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අපි සියලුදෙනාම එතැනට ගිහිල්ලා, මේකට මුදල් ආවේ කොහොමද, ඒ ගැන මහ බැංකුවෙන් කළේ මොකක්ද කියලා බලනවා. මහ බැංකුවේ මූල්‍ය බුද්ධි අංශයක් තිබෙනවා. මේ කටයුතු කරද්දි බුද්ධි අංශය නිදා ගත්තාද කියලා මම අහනවා. රුපියල් කෝටි 1700ක මුදලක් ලංකාවට ගෙනැල්ලා හොර පාරෙන් ෂරියා විශ්වවිද්‍යාලයක් ඇති කරන්න කටයුතු කිරීම ගැන අපි කනගාටු වෙනවා. ඒක අනිවාර්යයෙන්ම අපි රජයට පවරා ගන්නවාය කියමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා.5.46]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මම මේ කාරණය ගැන අවස්ථා කීපයකදී පාර්ලිමේන්තුවේ අදහස් දක්වපු මන්ත්‍රීවරයකු හැටියට, ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් එක් නිශ්චිත කාරණයක් පැහැදිලි කරන්න ඕනෑ. අපි මේ ප්‍රශ්නයට ප්‍රවේශ වෙන්නේ, මේ ප්‍රශ්නයේදී අදහස් දක්වන්නේ කිසිම ආකාරයකින් ජාතිවාදී පදනමකින් හෝ ආගමික පදනමකින් නොවෙයි. නැඟෙනහිර පළාතේ මුස්ලිම් ජනතාවගේ දරුවන්ට අධ්‍යාපනය ලබා දීමේ අයිතිය පිළිබඳ ප්‍රශ්නයකට අදාළව නොවෙයි. ඒ නිසා අපේ කරුණු ඉදිරිපත් කිරීම ඉතා පැහැදිලිව, රජයේ චක්‍රලේඛ, රජයේ නීතිරීති, රජයේ තිබෙන පොදු ක්‍රමවේදය අමු අමුවේ උල්ලංඝනය කරපු හොරකමක් හෙළිදරව් කිරීමක්ම පමණයි. මේ හොරකම කරන්න ඇමතිකම් පාවිච්චි කරලා මැදිහත් වෙන්නේ හිස්බුල්ලා වෙනුවට සුමනදාස කියලා කෙනෙක් නම්, ඒත් අපි මේ හොරකම හෙළිදරව් කරනවා. ගුණසිරි කියලා

කෙනෙක් නම් ඒත් අපට ප්‍රශ්නයක් නැහැ. මම මේ වෙන විධියේ නම් කිව්වේ සමහර ඇමතිවරුන්ගේ නම් මා අතින් කියැවෙයි කියලායි. මේක ජාතිවාදී පදනමක් මත ඇති වූ ප්‍රශ්නයක් නොවන නිසාම තමයි අපි පැහැදිලිව කියන්නේ මේ අවිනීතික, නීතිවිරෝධී ගනුදෙනුව වහා අවසන් කරලා, මේ සඳහා රජයෙන් දශමයකවත් අනුග්‍රහය සපයන්නේ නැතිව මේ දේපොළ, මේ ඉඩම, මේ ඉදිකිරීම රජයට පවරා ගෙන නැඟෙනහිර පළාතේම මුස්ලිම් ජනතාවගේ දරුවන්ට නොමිලේ අධ්‍යාපනය ලබා ගැනීමට රජයේ විශ්වවිද්‍යාලයක් ආරම්භ කරන්න කියලා. එතකොට ඔබතුමන්ලාගේ ප්‍රශ්නය ඉවරයි නේ. එතකොට ජාතිවාදී කථාවක් එතැනට එනවාද? ඕනෑ නම් ඒ ඉන්න මුස්ලිම් ජනතාවගේ දරුවන්ට, දෙමළ ජනතාවගේ දරුවන්ට නැඟෙනහිර පළාතේම රජයේ විශ්වවිද්‍යාලයක් ආරම්භ කරන්න. එතකොට කිසි ප්‍රශ්නයක් නැහැ. අපි හෙළිදරව් කළ යුත්තේ ජාතිවාදී පදනමකින් මේ සඳහා අපේ විරුද්ධවීම නොවෙයි. දෙමළ මාධ්‍යයෙන් ලියන සමහර අය ජනතා විමුක්ති පෙරමුණේ අපි සම්බන්ධයෙන් මේ ප්‍රශ්නය ජාතිවාදී පදනමකට ආරෝපණය කරන්න හදනවා. ඒක ලේසියි. නමුත්, ඒක වැරදියි. මම ඒකට හේතු කියන්නම්.

මුලින්ම, 2012 දෙසැම්බර් 10 වෙනි දා මේකට අනුමැතිය ලබා දෙන්න තමයි නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා අත්සන් කරන්නේ. මහවැලි නේවාසික ව්‍යාපාර කළමනාකරු රංජිත් පෙරේරා ඉල්ලීමක් කරනවා, "වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා බිම් කොටසක් ඉල්ලා සිටීම" කියන කාරණාව යටතේ හිටපු අමාත්‍ය හිස්බුල්ලා මහතා ශ්‍රී ලංකා හිරා පදනමෙන් යොමු කරපු ලියුමකුත් එක්ක. ඒ අනුමැතිය දෙන්නේ, පොදු කටයුත්තක් සඳහා අනුමැතිය දෙනවා කියලායි. මම එම ලිපි දෙක හැන්සාඩගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

හැබැයි, ඉඩම් ඇමතිවරයාගේ නිර්දේශයක් නැතුව, ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශයක් නැතුව මහවැලි අධිකාරියට අනුමැතියක් දෙන්න බැහැ. නමුත් ඉඩම් ඇමතිවරයාගේ හෝ ඉඩම් කොමසාරිස්වරයාගේ අනුමැතියක් නැතුව ඒ අනුමැතිය දීලා තිබෙනවා. ඊට පස්සේ Batticaloa Campus (Pvt.) Limited හැටියට ඒකේ නම වෙනස් කරලා, උසස් අධ්‍යාපන විශ්වවිද්‍යාල ආයතනයක් ආරම්භ කරන්න නැවත අනුමැතියක් ඉල්ලනවා. ඒ සඳහාත් ඇමතිවරයාගේ අනුමැතිය ගන්න ඕනෑ. ඉඩම් ඇමතිවරයාගේ අනුමැතියක් නැතුව 2016 අගෝස්තු 29 හා ඔක්තෝබර් 27 මහවැලි අධිකාරියෙන් ඒකට අනුමැතිය දීලා තිබෙනවා. ඒක දෙන්න බැරි අනුමැතියක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ ඉඩම් රෙගුලාසි යටතේ එය ගැසට් පත්‍රයේ පළ කරන්න ඕනෑ. ඉඩම මොන ක්‍රමයට දීර්ඝ කාලීනව බදු දුන්නත්, බදු පදනමට කලින් අනිවාර්යයෙන්ම අනුමැතියක් ලබා ගන්න ඕනෑ. හැබැයි, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය 2017දීයි ඒ අනුමැතිය ඉල්ලන්නේ. නමුත්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ඇමතිවරයාට යොමු කර තිබුණේ, 21/2 රෙගුලාසිය යටතේ පළ කළ යුතු ගැසට් නිවේදනය පළ නොකිරීමට සුදුසු ලෙස අනුමත කරන්න කියායි. අපි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නිලධාරින්ගෙන් අහනවා, ගැසට් පත්‍රයේ පළ නොකළ යුතුයි කියලා එම නිවේදනය නිකුත් කරන්න තීරණය ගත්තේ ඇයි කියලා. දිගු කාලීන බදු පදනමින් දෙන දෙයක් නම් ඒක ගැසට් පත්‍රයේ පළ කරන්න ඕනෑ. ගැසට් පත්‍රයේ පළ කළාම තමයි ඒ සඳහා විරෝධයක් පළ කරන්න ඉන්න කෙනෙකුට විරෝධය පළ කරන්න පුළුවන් වෙන්නේ. හැබැයි, ගැසට් පත්‍රයේ පළ නොකර අනුමැතිය දෙන්න කියලා ඉල්ලන්නේම, විරෝධයක් සිද්ධ වෙනවා නම් එය වැළැක්වීමේ අරමුණයෙන්ම තමයි. ඒක ඉතාම පැහැදිලියි. එම නිසා අපි කියනවා මේ කාරණයට මේ සඳහා අත්සන් කළ නිලධාරින් වග කියන්න ඕනෑ, අනුමැතිය ඉල්ලපු කට්ටිය වග කියන්න ඕනෑ කියලා. ඒ ගොල්ලෝ ක්‍රමවේද නොදැන නොවෙයි ඒ අනුමැතිය ඉල්ලන්නේ. "රජයේ ඉඩම් ආඥා පනත යටතේ ලබා දී ඇති වාණිජ ඉඩම සඳහා දීර්ඝ කාලීන බදුකරයක් නිකුත් කිරීමට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම" කියලා මහවැලි බී කලාපයේ බදුකරුවකු වන සභාපති, බැටික්ලෝ කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය එම අයදුම් පත්‍රය පුරවනවා. මා එම අයදුම් පත්‍රය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

එම ඉල්ලුම් පත්‍රය අනුව නම්, ඉඩම් අමාත්‍යවරයාගේ නියෝගය අරගෙන ඒ නියෝගයෙන් පස්සේ තමයි අනික් කට්ටියගේ නිර්දේශයට එන්න ඕනෑ. අත්සන් කරන්න ඕනෑ එහෙමයි. නමුත්, ඉඩම් අමාත්‍යවරයාගේ අනුමැතිය ගන්නේ 2017.12.08 වැනි දින. ඊට කලින් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම් අනුමත කරනවා. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ (ඉඩම්) අත්සන් කරනවා, 2017.12.08 දින මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම් විසින් අත්සන් කර, එම අමාත්‍යතුමාගේ අනුමැතියට යවනවා. අවසානයේ තමයි ජනාධිපතිතුමාගේ අත්සන එන්නේ, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා හැටියට. මේ ඉල්ලීමකට ඇමතිතුමා තමයි මුලින් අත්සන් කරන්න ඕනෑ. ඇමතිතුමා අත්සන් කරන්නේ නැත්නම් ලේකම්ට හෝ වෙනත් කිසිවෙකුට අත්සන් කරන්න බැහැ. ඒක තමයි ක්‍රමවේදය. හැබැයි, මෙතැනදී ඒ ක්‍රමවේදය අනිත් පැත්තට තමයි කරලා තිබෙන්නේ. අපි අහනවා, ඒ ඇයි? මොකක්ද ඒකට තිබුණු හේතුව? මේ ක්‍රියාවලියේ ඉඩම් නිර්දේශ කිරීමම සම්පූර්ණයෙන්ම නීත්‍යනුකූල නැහැ. කොටින්ම මේ ඉල්ලීම නීති විරෝධී විධියට තමයි අනුමත කරලා තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඊට පස්සේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 2013 මැයි 18 දිනැති ඩීඑල්/1/1 දරන අභ්‍යන්තර චක්‍රලේඛය ප්‍රකාරව ඉඩම් බැහැර කිරීමට ප්‍රථම කලාපීය අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්) නිර්දේශ ලබා ගන්න ඕනෑ. ඒ නිර්දේශ අරගන්න ලියන්නේ 2017දී. ඊට පස්සේ පරිසර හා වන සංරක්ෂණ අධ්‍යක්ෂකගේ නිර්දේශය ගන්න ඕනෑ. එහෙම නිර්දේශයක් අරගෙනත් නැහැ. මෙහි වැදගත්ම දේ ඒක නොවෙයි. ඒ ගොල්ලෝ අක්කර 35ක් සඳහා අනීතික විධියට -නීති විරෝධී විධියට- අනුමැතිය අරගෙන, පසුව හිරා පදනම විසින් 2017 පෙබරවාරි 13වැනි දා තව ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනවා. මඩකළපුව විශ්වවිද්‍යාලයේ සිසුන්ට නේවාසිකාගාර, ආපනශාලා හා ක්‍රීඩා පහසුකම් ලබා ගන්න තවත් අක්කර 45ක් ඉල්ලා තිබෙනවා. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා 2017 අප්‍රේල් 18 දිනැති ලිපියෙන් කියනවා, "දැනටමත් අක්කර 35ක භූමියක් දීර්ඝකාලීන

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** කථාව අවසානයේ පළ කර ඇත.*
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

බදු පදනම යටතේ ලබා දී ඇති පාර්ශ්වයක් සඳහාම යළිත් අක්කර 45ක භූමියක් වෙනත් ව්‍යාපාර නාමයක් යටතේ කෙරෙන ඉල්ලීමක් බැවින්, මේ පිළිබඳව ඉදිරි කටයුතු සිදු කිරීම පිණිස ඔබතුමාගේ පූර්ව අනුමැතිය/එකඟතාව කාරුණිකව අපේක්ෂා කරමි" කියලා. නමුත්, විෂය භාර අමාත්‍යවරයා අත්සන පමණක් යොදා ඇත. මා 2017.04.18 දිනැති ලිපියත් හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

2017.04.18 වැනි දින ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මේ ඉල්ලීම් කරනකොට, විෂය භාර ඇමතිවරයා හැටියට ජනාධිපතිවරයා විසින් "නිර්දේශ කරමි" කියලා අත්සන් කරනවා. ඒ ඉල්ලීම කරලා තිබෙන්නේ හිරා පදනමෙන්. හිරා පදනමෙන් 2017 මාර්තු 15 දින ඉල්ලා තිබෙනවා. හිස්බුල්ලා මැතිතුමාගේ අත්සන තිබෙනවා. සභාපති, හිරා පදනම (පුද්ගලික) සමාගම යනුවෙන් එහි සඳහන් වෙනවා. මේ අක්කර 35ට අමතරව තව අක්කර 45ක් ඉල්ලනවා. ඒ අක්කර 45 ඉල්ලන ලියුම හදලා තිබෙන්නේ. අනුමැතිය දෙන්න ලියුම් ඔක්කොම හදලා තිබෙන්නේ. මහවැලි සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය 2017.05.25වැනි දින ඒ අනුමැතිය ලබා දීලා තිබෙනවා. අක්කර තිස්පහයි, හතළිස් පහයි. ජනාධිපතිතුමාගේ පොළොන්නරුවේ ඉඩමක්ද මේ දෙන්නේ කියලා මම අහනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එතුමාගේ පෞද්ගලික මුදලයෙන්ද මේ දෙන්නේ? මහවැලි අධ්‍යක්ෂ ජනරාල්ගේ පෞද්ගලික මුදලයෙන්ද තව අක්කර 45ක් දෙන්න යන්නේ? ඒ අක්කර 45 දෙන එක නතර වෙලා තිබෙන්නේ මේ විවාදය පැන නැඟුණ නිසායි; මේ සංවාදය රටේ මතු වුණු නිසායි. නැත්නම් හිස්බුල්ලා සමාගමට තව අක්කර 45ක් දෙනවා. අපි කියන්නේ ඒකයි. මෙම ආයතනය වහා රජයට පවරා ගන්න ඕනෑ. මේවා රජයේ ඉඩම්, මහවැලි අධිකාරියේ ඉඩම්, මහජනතාවගේ ඉඩම්. ඒ සියලු දේපළ රජයට පවරා ගෙන නොමිලේ අධ්‍යාපනය ලැබිය හැකි විශ්වවිද්‍යාලයක් හදන්න ඕනෑ. කිසිම ගැටලුවක් නැහැ, නැඟෙනහිර පළාතේ දරුවන්ට එහි ප්‍රමුඛතාවක් දෙන්න ඕනෑ. ඒ ගැන ගැටලුවකුත් නැහැ. හැබැයි, මේ වංචනික හොරුන්ට, තක්කඩින්ට අනුමැතිය දුන්න අයටත් එක්ක අනිවාර්යයෙන්ම අපේ රටේ නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**** සභාමේසය මත තබන ලද ලියවිල්ල:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணங்கள் :*
** Document tabled:*


රජයේ ඉඩම් ආඥා පනත යටතේ ලබා දී ඇති වාණිජ ඉඩම සඳහා දීර්ඝ කාලීන බදුකරයක් නිකුත් කිරීමට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම

| | | | |
|---|---|---|---|
| 01. | කලාපය | :- | බී කලාපය |
| 02. | බදුකරුගේ නම හා ලිපිනය | :- | සභාපති, බැටිකලෝ කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් අංක 10/18, ලේක් ඩ්‍රයිව්, කොළඹ 08 |
| 03. | සැලසුම් අංකය හා ඉඩම් ප්‍රමාණය | :- | කැ.සි 270016/02/12, පත්‍ර අංක 04 හි කැබලි අංක 800, 804, 808, 812 හෙක්ටයාර් 8.9560, 3.3745, 1.2968, 0.5373 |
| 04. | ඉඩම යොදා ගන්නා කාර්යය | :- | උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස පෞද්ගලික විශ්ව විද්‍යාලයක් පවත්වාගෙන යාම සඳහා |
| 05. | ඉඩමේ සංවර්ධන තත්වය | :- | සංවර්ධනය කරමින් පවතී. |
| 06. | නිර්දේශ කරනු ලබන්නේ දීමනාකරයක්ද/ බදුකරයක්ද | :- | දීර්ඝ කාලීන බදු කරයක් |
| 07. | බදු කොන්දේසි කාලය හා බදු ප්‍රතිශතය | :- | අවුරුදු 30යි - රජයේ තක්සේරුවෙන් 4% යි |
| 08. | නේවාසික ව්‍යාපාර කළමණාකාරගේ ලිපි අංකය හා දිනය | :- | බී/ඉ/2/2/අ/30 හා 2017.08.09 |

රජයේ ඉඩම් ආඥා පනතේ රෙගුලාසි 21(1) යටතේ බදු දීමටත් රෙගුලාසි 21(2) යටතේ පලකල යුතු දැන්වීම් පල නොකිරීමටත් සුදුසු බව නිර්දේශ කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

දිනය:- 2017.09.29.

ඩී. අසන්ත ගුණසේකර
අධ්‍යක්ෂ (ඉඩම්)
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

ලේකම්
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය:- 2017.09.29

එස්.එම්. ගෝඨාභය ජයරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

ගරු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමා
අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය:- 2017/12/08

ලේකම්
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

ගරු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමාගේ නියෝගය
අනුමත කරමි/ නොකරමි

දිනය:- 2017/12/08

ගරු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය

[අ.භා.5.55]

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ජනතා විමුක්ති පෙරමුණ අද සභාව කල් තබන අවස්ථාවේ ගෙන ආ Batticaloa Campus (Pvt.) Ltd. රජයට පවරා ගත යුතුයි. ඒ හරහා විශාල මුදල් ගනුදෙනු වෙලා තිබෙනවා. එම නිසා ඒ ගැන පරීක්ෂණයක් කරලා ඒ ගොල්ලන් නීතිය හමුවට ගෙන ආ යුතුයි කියන මේ යෝජනාව ඉතාම කාලෝචිත, ඉතාම අවශ්‍ය යෝජනාවක්. හැබැයි, මේ පාර්ලිමේන්තුව දෙවනත් කරන්න කැඟහන බොහෝ උදවිය සහ මෙම යෝජනා ගෙනෙන උදවිය පසුගිය දවස්වල -2015 අගෝස්තුවලින් පසුව- සාමූහිකව හිස්බුල්ලා මහත්මයා එක්ක පාර්ලිමේන්තුවේ අණ පනත්, යෝජනා ඔක්කොම සම්මත කර ගත්තා. කිසිම ගැටලුවක් නැතිව සියලුදෙනා ඒකරාශි වෙලා බොහොම සමඟියෙන් කටයුතු කළා.

මේ ආණ්ඩුව 2015 බලයට පත් වූ දවසේ සිට වැරැදි පාරේ යන්නේ, මේ ආණ්ඩුව වැරැදි වැඩ කරන්නේ කියන එක පෙන්වලා දෙන්න එදා අපට කොන්දක් තිබුණා. හැබැයි, මේ මඩකළපුව විශ්වවිද්‍යාලය එක පාර පැන නැඟුණු දෙයක් නොවෙයි. මේ ආණ්ඩුව බලය ගනිද්දී, 2015 අගෝස්තු මාසයෙන් පසුව අලුත් පාර්ලිමේන්තුව රැස්වෙද්දීත් මේ campus එක තිබුණා. මේ campus එක ඒ කාල වකවානු තුළ හැදෙමින් පැවතුණා. Port City එක හැදුණා වාගේ, හම්බන්තොට වරාය හැදුණා වාගේ, වෙනත් අධිවේගී මාර්ග හැදෙනවා වාගේ, විශාල කොල්ලකෑම් කරපු මේ ආණ්ඩුව පැවතෙන කාලය තුළ එය හැදෙමින් තිබුණා. හැබැයි, කවුද මේ ගැන පරීක්ෂණ කළේ? කිසිම කෙනෙක් මේ ගැන හෙව්වේ බැලුවේ නැහැ. මේ ගැන පරීක්ෂණ කරන්න ඇස් ඇරුණේ පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් අහිංසක ජනතාව 250ක්, 300ක් මිය ගියාට පසුවයි. ඊට පසුව තමයි වහාබ්වාදය එන්නේ. ඊට පසුව තමයි අන්තවාදය එන්නේ. ඊට පසුව තමයි ත්‍රස්තවාදය එන්නේ. එතෙක් මේ ගැන විමසිල්ලෙන් ඉන්න මේ ගැන පරීක්ෂණ කරන, මේ ගැන සොයා බලන කවුරුවත් කටයුතු කළේ නැහැ. CID එක තිබුණා. TID එක තිබුණා. ඒ මදිවාට FCID එක කියලා එකකුත් දමා ගත්තා. ඒ එකක්වත් Sri Lanka Hira Foundation කියන්නේ මොකක්ද, හිස්බුල්ලා කියන්නේ කවුද, ඒ සල්ලි එන්නේ කොහෙන්ද, මේ ගිණුම් මොනවාද කියලා හෙව්වේ නැහැ. ඒක තමයි අපට තිබෙන ගැටලුව. තවමත් මෙවැනි දේවල් මේ ආණ්ඩුව ඇතුළේ සිටින සමහර අය කරනවා. සමහර අය මේ ආණ්ඩුව ඇතුළේ සිටිමින්, ආණ්ඩුවේ පාර්ශ්වයන්ට සහයෝගය දෙමින්, ආණ්ඩුවේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යෑමට අත ඔසවමින් මේ වාගේ අන්තවාදිව කටයුතු කරන, ත්‍රස්තවාදිව කටයුතු කරන අයට උල්පන්දම් දෙනවා. දැන් මම එකක් කියන්නම්. මම ඊයේ පෙරේදා අධීක්ෂණ කාරක සභාවේ සිටින අතරතුර සමාගම් රෙජිස්ට්‍රාර්වරයා හරහා හලාල් සහතිකය නිකුත් කිරීමෙන් හලාල් සභාව මේ රට තුළ මොන තරම් වංචා කරනවාද කියලා අපි සොයා ගත්තා. කවුද මේ ගැන පරීක්ෂණ කරන්නේ? COPE එක කරනවාද? එහෙම නැත්නම් මේවායේ ගිණුම් පරීක්ෂා කිරීමට පාර්ලිමේන්තුවේ ගිණුම් කාරක සභාව කටයුතු කරනවාද? නැහැ. මේ රටට කෝටි ගණන් මුදල් එනවා. හලාල් සහතිකයක් ගන්න රුපියල් 150,000ක්, රුපියල් 175,000ක් ගෙවන්න ඕනෑ අය රුපියල් ලක්ෂ 10, රුපියල් ලක්ෂ 15, රුපියල් ලක්ෂ 18, රුපියල් ලක්ෂ 20 ගෙවලා තිබෙනවා. අපේ රටේ ප්‍රමිති ආයතනයක් තිබෙනවා. ඒ ප්‍රමිති ආයතනයෙන් ISO විධියට ප්‍රමිති සහතික ගන්න පුළුවන්. එහෙම නැත්නම් SLS විධියට ප්‍රමිති සහතික ගන්න පුළුවන්. හලාල් කියන්නේත් ප්‍රමිතියක්. ඒ ප්‍රමිතිය ගන්න හදා ගත්තු, අටවා ගත්තු හලාල් සභාව විශාල විධියට මූල්‍ය වංචාවක් කරගෙන යනවා. මේ වනතුරු පාර්ලිමේන්තුවට තබා රජයේ වගකිව යුතු කිසිම තැනකට ඒ ගිණුම් පෙන්වා නැහැ. ඒ නිසා Hira Foundation එක හදද්දී, Batticaloa Campus එක ලියාපදිංචි කරද්දී එයට මුදල් එන හැටි සොයා බැලීමක් කළ යුතුව තිබුණා. අපි දැක්කා, පසුගිය දවස්වල පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවට ඇවිල්ලා මහ බැංකුවේ නිලධාරින් කිව්වා, Hira Foundation එකට ආපු අති විශාල මුදල ගැන හොයන්න, කරන්න, පරීක්ෂණ කරන්න විධියක් නැහැ කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මට විනාඩි 09ක් තිබුණා. කථාව පටන් අරගෙන තවම විනාඩි දෙකක්වත් ගියේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක් පමණයි තිබෙන්නේ.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මට තව විනාඩි දෙකක් දෙන්න.

දැන් මේ ගරු සභාවේ කථා කළ මන්ත්‍රීවරයකු SAITM ආයතනයේ ගැටලු ගැන කිව්වා. SAITM ආයතනය පවරා ගත්තාය කියලා කිව්වා. නමුත්, SAITM ආයතනයට රජයෙන් මුදල් ගෙවා තිබෙනවා. තවම SAITM ආයතනය රජයට පවරා දීලා නැහැ. ඒ නිසා මේ පාර්ලිමේන්තුව හැල්ලුවට පත් වන විධියේ කථා කියන්න එපා කියලා මා මේ ගරු මන්ත්‍රීවරුන්ට කියනවා.

පාස්කු ඉරිදා ප්‍රහාරය සිද්ධ වෙලා දැනට මාස තුනහමාරකට වැඩි කාලයක් වෙනවා. ඊයේත් අපි දැක්කා, ඒ ප්‍රහාරයට ලක් වුණු දේවස්ථානයකම ප්‍රතිමාවකට ගල් මුල් ප්‍රහාර එල්ල කර තිබෙන ආකාරය. ඒ නිසා කාදිනල් උතුමාණන්ගේ, උන්වහන්සේගේ සැකයක් තිබෙනවා, මේ අන්තවාදී, ත්‍රස්තවාදී ක්‍රියා කරන කණ්ඩායම් නීතියේ රැහැනට හසු කර ගැනීම සඳහා රටේ, රජයේ වැඩ පිළිවෙළක් නැහැ කියලා. ඒ නීති පද්ධතිය තුළ වැඩ පිළිවෙළක් නැහැ කියලා. පාර්ලිමේන්තුව තුළ වැඩ පිළිවෙළක් නැහැ කියලා. ඒ නිසා අපි ඉල්ලා සිටින්නේ, කරුණාකර සභාව කල් තබන අවස්ථාවේ යෝජනා හෝ විශේෂ යෝජනා ගෙනැල්ලා, එවැනි අන්තවාදී, ත්‍රස්තවාදී කටයුතු කරන කල්ලි වෙනුවෙන්, ඒ සඳහා රටට මුදල් ගෙන්වන අය වෙනුවෙන් ක්‍රියාමාර්ග ගන්න දිවා රාත්‍රී නොබලා හෝ, පැය 24ම යොදා ගෙන හෝ, අපත් සම්බන්ධ කරගෙන හෝ මේ ත්‍රස්තවාදය මැඬලන්න අවශ්‍ය වැඩ පිළිවෙළ කරන්න කියලායි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කෙටියෙන් අවසන් කරන්න.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
හොඳයි, මම අවසන් කරන්නම්.

ඒකට දේශපාලන භේදයක් හදා ගන්න ඕනෑ නැහැ. මේ රටේ සාමය තිබෙන්න ඕනෑ. මේ රටේ සංවර්ධනය ඇති වෙන්න ඕනෑ. ඒ වෙනුවෙන් වග කියන්න, නීති හදන්න තමයි මේ පාර්ලිමේන්තුව තිබෙන්නේ. අපි පැහැදිලිවම කියනවා, "අන්තවාදී" කිව්වාට කවුරුත් කලබල වෙන්න එපා, "ත්‍රස්තවාදී" කිව්වාට කවුරුවත් කලබල වෙන්නත් එපා කියලා. මුස්ලිම් සාමාන්‍ය ජනතාව, ද්‍රවිඩ සාමාන්‍ය ජනතාව එවැනි අය නොවෙයි. නමුත්, මෙවැනි ආකාරයෙන් මුදල් ගෙනැල්ලා, ඒවා අනවශ්‍ය විධියට යොදා ගෙන, ත්‍රස්තවාදී කල්ලිවලට සහයෝගය දෙන්න කටයුතු කරන අය ඉන්නවා නම්, ඒක රටේ අභාග්‍යයක්. ඒ නිසා ඒවා වළක්වන්න අපි සියලුදෙනාම එකතු වෙන්න ඕනෑය කියන යෝජනාව කරමින්, ඒ පෞද්ගලික විශ්වවිද්‍යාලය තහනම් කිරීමට හා එය රජයට පවරා ගැනීමට අපේ සහයෝගයත් අපි ලබා දෙනවාය කියමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

[பி.ப. 6.01]

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා (වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அப்துல்லா மஹரூப் - துறைமுகங்கள், கப்பற்றுறைப் பிரதி அமைச்சர் )
(The Hon. Abdullah Mahrooff - Deputy Minister of Ports and Shipping)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த அவையிலே எம்மோடிருந்து மறைந்த கௌரவ சாலிந்த திசாநாயக்க அவர்களின் குடும்பத்தினருக்கு முதலில் அனுதாபத்தைத் தெரிவித்துக்கொள்கின்றேன்.

இன்று இரண்டு விடயங்கள் ஒன்றோடொன்று சேர்க்கப்பட்டு இங்கு விவாதிக்கப்பட்டுக்கொண்டிருக்கின்றது. Sri Lanka Hira Foundation பற்றி எங்களுடைய முன்னாள் அமைச்சர் டலஸ் அழஹப்பெரும அவர்கள் மிகத் தெளிவாகச் சொன்னார். அது 2013ஆம் ஆண்டு 4 தொழிற்பயிற்சி விடயங்களை முன்னெடுத்த ஒரு நிறுவனமாகும். அது 49 பேர்ச்சஸ் காணியிலே நிறுவப்பட்டது. அதனுடைய Chairman ஆக முன்னாள் ஆளுநர் ஹிஸ்புல்லாஹ் அவர்களும் Director ஆக அவருடைய மகனும் இருந்தது பற்றி இங்கு பேசினார்கள். இதுவல்ல இங்குள்ள பிரச்சினை! ஹிஸ்புல்லாஹ் அவர்கள் நல்ல நோக்கோடு 8 தொழிற்பயிற்சி விடயங்களை முன்னெடுத்துச் செல்ல இந்தக் campus ஐ ஆரம்பிக்க நினைத்தபோது, கடந்த ஏப்ரல் 21ஆம் திகதி கிறிஸ்தவ மதத் தலங்கள் தாக்கப்பட்ட அசாதாரண சூழலால், அவர் முஸ்லிம் என்பதற்காக இவ்வாறு விமர்சிக்கப்படுகின்றார். அது மோசடியான முறையில் செய்யப்பட்டிருந்தால் உரிய விசாரணையை நடத்திப் பாருங்கள்!

இந்த campus ஐ உருவாக்குவது தொடர்பில் 2014ஆம் ஆண்டு - முன்னைய அரசாங்க காலத்திலே அவர் கோரளைப்பற்றுப் பிரதேச சபையில் 5 தடவை பணம் கட்டியிருக்கிறார். கொழும்பு 01 இல் இருக்கின்ற BOC இன் 8வது Floor இல் இருக்கின்ற Central Bank இனுடைய Inward Remittances Department இலே அவருடைய கணக்குப் பரிமாற்றம் நடைபெற்றிருக்கின்றது. இந்த விடயத்தை நீங்கள் ஆய்வு செய்ய முடியும். அதுமட்டுமல்ல, முறைப்படியாக Board of Investment of Sri Lanka, Central Environmental Authority, Department of Agrarian Development, Divisional Forest Office - Batticaloa மற்றும் Divisional Archaeological Office ஆகியவற்றின் அனுமதியையும் பெற்றுத்தான் இந்த university உருவாக்கப்பட்டிருக்கின்றது.

இந்த நாட்டில் ஒவ்வொரு வருடமும் 198,000 மாணவர்கள் A/L பரீட்சையிலே சித்திபெறுகின்றபோதும் 28,000 பேருக்குத்தான் பல்கலைக்கழக அனுமதி கிடைக்கின்றது. மீதி 170,000 மாணவர்கள் வீதிகளிலே அலைந்துவிடக்கூடாது என்ற நோக்கத்திற்காகவே தனியார் உயர் கல்விக்கூடங்களை அமைக்க அனுமதிக்கப்படுகின்றது. உலகளாவிய ரீதியாகத் தனியார் கல்விக்கூடங்கள் university ஆகத் தரமுயர்த்தப்படுகின்றன. அந்த வகையில் அமைக்கப்பட்ட குறித்த தனியார் பல்கலைக்கழகத்தை இன்று அரசாங்கம் பொறுப்பெடுக்க வேண்டுமென்று சொல்வதற்குக் காரணமாக அடிப்படைவாதம் பற்றியும் 'ஷரிஆ' பற்றியும் இங்கு பேசப்படுகின்றது. இந்தப் பல்கலைக்கழகத்திற்கான அனுமதி உயர் கல்வி அமைச்சினூடாகப் பெறப்படுகின்றபோது, civil engineering, mechanical engineering, electrical engineering, quantity surveying, IT, agriculture, law and tourism - இந்த 8 விடயங்களைத் தவிர 'ஷரிஆ' என்கின்ற சொல் பயன்படுத்தப்பட்டிருக்கின்றதா? என்கின்ற ஒரேயொரு விடயத்தினைத்தான் நான் கேட்கின்றேன். இந்தப் பாராளுமன்றம் 225 பாராளுமன்ற உறுப்பினர்கள் கௌரவமாக இருக்கின்ற இடம். ஆகவே, இந்த விடயம் தொடர்பில் நாட்டுக்கு நீங்கள் மிகத் தெளிவாக உணர்த்த வேண்டும். அண்மையில் இந்த நாட்டில் ஒரு துக்ககரமான சம்பவம் ஏற்பட்டிருக்கின்றது. அதில் 300க்கும் மேற்பட்டவர்கள் இறந்திருக்கிறார்கள்; 500க்கும் மேற்பட்டவர்கள் காயப்பட்டு, இன்னும் துன்பப்பட்டுக் கொண்டிருக்கின்றார்கள்; முஸ்லிம் சமூகம் மிகவும் வருத்தத்துடனும் வேதனையுடனும் அதனை அனுபவித்துக் கொண்டிருக்கின்றது. இந்தத் துரதிஷ்டவசமான சம்பவத்துடன் சம்பந்தப்பட்ட சஹ்ரான் என்கின்ற பயங்கரவாதியை, குறித்த தனியார் பல்கலைக்கழக விடயத்தோடு தொடர்புபடுத்தி இந்தச் சபையைப் பிழையாக வழிநடத்த வேண்டாம்.

எம்மைப் பொறுத்தவரையில் இஸ்லாத்தில் பயங்கரவாதம் இல்லை; அடிப்படைவாதம் இல்லை. இஸ்லாம் என்பது உலகுக்கு வழிகாட்ட வந்த ஒரு மார்க்கமாகும். இந்தப் பயங்கரவாதிகளை முஸ்லிம்களோடு ஒப்பிட வேண்டாம். சஹ்ரான் என்பவர் நூற்றுக்கு நூறுவீதம் பயங்கரவாதி! அவர் உருவாக்கியவர்கள் யார்? அவர்கள் பற்றி CID, FCID மற்றும் புலனாய்வுப் பிரிவு இன்று மிகத் தெளிவாகக் கூறியிருக்கின்றது. இந்த விடயங்களை நாங்கள் தெளிவாகப் புரிந்துகொள்ள வேண்டும்.

இன்று இந்தக் குற்றச்சாட்டுகள் தொடர்பான பல விடயங்களை உள்ளடக்கிய ஓர் பதில் அறிக்கை ஹிஸ்புல்லாஹ் அவர்களால் ஒரு புத்தகமாகச் சமர்ப்பிக்கப்பட்டிருக்கின்றது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே. இந்தச் சபையில் நான் பணிவாகக் கோருவதெல்லாம், இந்த விடயம் தொடர்பாக ஒரு நீதியான விசாரணையை நடாத்துவதற்கு ஒரு குழு நியமிக்கப்பட வேண்டுமென்பதைத்தான். கௌரவ நளிந்த ஜயதிஸ்ஸ அவர்களால் பிரேரிக்கப்பட்டு, கௌரவ ஆசு மாரசிங்க அவர்களால் வழிமொழியப்பட்ட இந்தப் பிரேரணை தொடர்பாக உண்மையைக் கண்டறிய வேண்டும். முன்னாள் அமைச்சர் கௌரவ டலஸ் அழஹப்பெரும அவர்கள் இந்தத் தனியார் பல்கலைக்கழக விடயம் சம்பந்தமாகச் சொன்னார். காத்தான்குடியிலே Sri Lanka Hira Foundation மூலமாக 49 perches இலே உருவாக்கப்பட்ட கல்லூரிக்கும், அங்கு 60 கிலோமீற்றர் தூரத்திற்கப்பால் புனானையில் உருவாக்கப் பட்டிருக்கின்ற இந்த Batticaloa University Collegeக்கும் எந்தத் தொடர்புமில்லை.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up.

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் அந்தப் புத்தகத்தைச் சபைக்குச் *சமர்ப்பிக்கின்றேன். இதனையும் உபயோகித்து நீதியான விசாரணையை நடத்தி, உண்மையைக் கண்டறிந்து இந்தச் சபைக்குத் தெரிவிக்க வேண்டுமென்று கேட்டு, நிறைவு செய்கின்றேன். நன்றி.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා. 6.06]

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සභාව කල් තබන අවස්ථාවේ ජනතා විමුක්ති පෙරමුණ ගෙන එන ලද යෝජනාව ඉතා වැදගත් යෝජනාවක්. මෙම යෝජනාව සම්බන්ධයෙන් කෙටියෙන් හෝ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ඇත්තෙන්ම අද උදේ සිට මේ දක්වා විවිධ ප්‍රදේශ නියෝජනය කරන ගරු මන්ත්‍රීවරුන් කරන ලද අදහස් දැක්වීම් තුළ අපි දැකපු මූලික කාරණයක් තිබෙනවා. නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ යම් ඉඩම් ප්‍රමාණයක් අරගෙන, විවිධ යෝජනා යටතේ වෙනත් වෙනත් ඉදිකිරීම් කරමින් මේ ආයතනය "Batticaloa Campus" හෙවත් මඩකළපුව විශ්වවිද්‍යාලය හැටියට අන්තිමට හඳුන්වා තිබෙනවා.

මම ප්‍රාදේශීය සභාවක සභාපතිවරයකු හැටියට කටයුතු කරපු නිසා දන්නවා, ගමක යම් ඉදි කිරීමක් කරනවා නම්, අදාළ කොට්ඨාසයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයාගේ අනුමැතිය, පළාත් පාලන ආයතන ප්‍රධානියාගේ අනුමැතිය, ඒ වාගේම මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරියාගේ අනුමැතිය, කාර්මික නිලධාරියාගේ අනුමැතිය ලබා ගත යුතුයි කියලා. මේ සියලුදෙනාගෙන් සමන්විත මණ්ඩලයක් තුළින් තමයි ඒ ඉදිකිරීම අනුමත කරන්නේ. මේ මන්ත්‍රීවරුන්ගේ වාර්තා සහ මන්ත්‍රීවරුන් කරන ලද කථා අනුව මේ ගොඩනැඟිල්ල සඳහා ඒ කිසිම ආයතනයකින් අවසර අරගෙන නැහැ. ඒ නිසා මේ කියන කාරණා අනුව මුස්ලිම් ජනතාවට කවදා හෝ හිරිහැරයක් වෙනවා නම්, දෙමළ ජනතාවට හිරිහැරයක් වෙනවා නම් අපි කැමැති නැහැ. මොකද, අපි චිරාත් කාලයක් බොහොම සහයෝගයෙන් ජීවත් වූ ජනතාවක්.

අපේ අබ්දුල්ලාහ් මහරූෆ් නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, මෙම ඉදිකිරීම මුස්ලිම් ජාතිකයෙකුගේ යෝජනාවක් මත මුස්ලිම් නමකින් සිදු කිරීම නිසා මේ ආයතනය තහනම් කිරීමකට ලක් කිරීම වෛරයෙන් කරන ක්‍රියාවක් කියලා. අපි මුස්ලිම් ජනතාවට කියනවා, පසුගිය 21වෙනි දා සිදු වූ ඒ ප්‍රහාරය තුළින් තමයි මේ විෂබීජ මේ රටේ පැතිරී තිබෙන්නේ කියලා. අපි බොහොම සහයෝගයෙන් ජීවත් වූ පිරිසක්. ඒ වාගේම මම මහනුවර දිස්ත්‍රික්කයේ මුස්ලිම් ජනතාවත් එක්ක බොහොම සුහදශීලිව හා බොහොම සහයෝගයෙන් ජීවත් වන මන්ත්‍රීවරයෙක්.

මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කිව්වා, අද මුස්ලිම් දරුවන් උසස් පෙළ විභාගය ලියන්න යනකොට විභාගශාලාවට ඇතුළු වන්න ඉඩ දුන්නේ නැහැයි කියලා. අපි ඒකට එකඟ වන්නේ නැහැ. හැබැයි, මුස්ලිම් ජනතාව සේද මාවත දිගේ ලංකාවට ඇවිල්ලා ලංකාවේ පදිංචි වනකොට අපේ රජතුමන්ලා ඒ අයට මේ රටේ සිටින සිංහල කුල කාන්තාවන් සමඟ විවාහ වන්න අවසර දුන් බව තමුන්නාන්සේලා දන්නවා. එතකොට ඔය බුර්කාවවත් මොකුත් තිබුණේ නැහැ. අපේ ඇඳුම් ඇඳගත් සිංහල කාන්තාවන්ගේ බඩේ තමයි ඔබතුමන්ලා ඉපදිලා තිබෙන්නේ; සිංහල කාන්තාවන්ගේ කිරි බීලා තමයි ඔබතුමන්ලා හැදිලා තිබෙන්නේ. එම නිසා ඔබතුමන්ලා මොන ඇඳුම ඇඳගත්තත් සිංහල කලවම් වූ, සිංහල ඥාතිකම් කියන, අපේ ආත්තම්මාලාගේ කිරි බී හැදුණු මිනිසුන්. එම නිසා තමුන්නාන්සේලාට වෙනසක් කරනවා නම්, අපි තමයි නරක මිනිසුන් වන්නේ. මුස්ලිම් ජනතාව, දෙමළ ජනතාව කියලා විශේෂයක් කරන්න අපට කවදාවත් අවශ්‍යතාවක් තිබුණේ නැහැ. තමුන්නාන්සේලා මොන විධියට හිතාගෙන හිටියත්, අපේ හිතේ තිබෙන්නේ තමුන්නාන්සේලාත් අපේ රටේ හැදුණු මිනිසුන්, අපේ ආත්තම්මාලාගේ කිරි බීලා හැදුණු මිනිසුන් කියලායි. එම නිසා තමුන්නාන්සේලා මොන ජාතිය කියලා හිතාගෙන හිටියත් තමුන්නාන්සේලාගේ භාගයක් සිංහල.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසන් කරනවා. මගේ කථාවට විනාඩි 09ක් තිබුණා. මම පිළිගන්නවා, කාලය පිළිබඳ ප්‍රශ්නය නිසා ඔබතුමාට ඒකට කරන්න දෙයක් නැහැ කියලා.

ඒ කෙසේ වෙතත්, අපට ලක්ෂ හතරක මුදලක් වැටුප විධියට දෙනවා කියලා තිබෙනවා. අපේ නෝනාමහත්වරු අහයි, ලක්ෂ දෙකහමාරයි අපට ලැබෙන්නේ, ඉතිරි දෙකහමාර කාටද දෙන්නේ කියලා. රටේ ජනාධිපතිතුමා දෙතුන් පාරක්ම මේ වාගේ අවකැපෙන කථා කියනවා මම දැක්කා. ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව විසුරුවා කිව්වා, මම ඔක්කෝගෙන්ම අවසර අරගෙන, නීති උපදෙස් අරගෙන තමයි මේක කළේ, මේක හරි කියලා. හැබැයි, අන්තිමට උසාවි තීන්දුවෙන් කිව්වා, ඒ තීරණය වැරදියි කියලා. මම හිතන විධියට නිලධාරින් මේ දේවල් ගැන ජනාධිපතිවරයා හරියට දැනුවත් කරන්නේ නැහැ. එම නිසා අපි අසරණ තත්ත්වයට පත්වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඇතුළු අපි සියලුදෙනාටම වැටුප විධියට ලක්ෂ දෙකහමාරක්වත් ලැබෙන්නේ නැහැ. මේ කාරණය පත්තරවලින් හරි නිවැරදි කරනවා නම් හොඳයි.

ආරක්ෂක හේතු මත වර්තමානයේ ක්‍රියා කරන ආකාරය ඉතා හොඳයි. නමුත්, පසුගිය දිනවල මගේ වාහනයේ බොනට් එක කැඩිලා දෙපාරක් හැදුවා. මම කාර් එකක ආවා, ඒකේත් ඩිකිය කැඩුණා. ඒ වාගේම මම දැක්කා, අද උදේ අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමාගේ වාහනයේ බොනට් එක වහන්න බැරි බව. මේ වාහනවල බොනට් මේ විධියට නිතරම අරින්න වහන්න හදලා නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න. අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා දවසකට දහ වතාවක් පමණ එළියට ගිහිල්ලා ආවොත්, ඒ යන එන හැම අවස්ථාවේම බොනට් එකයි, ඩිකියයි ඇරලා පරීක්ෂා කරනවා. එතකොට බොනට් එකයි, ඩිකියයි විසිවතාවක් පමණ අරිනවා. මාදිවෙල මන්ත්‍රී නිවාසවලට යනකොටත් එහෙමයි. මේ විධියට නිතර අරින්න වහන්න පුළුවන් විධියට වාහනවල බොනට් හදලාත් නැහැ, ඩිකි හදලාත් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ආරක්ෂාව වෙනුවෙන්, අපට එන්න පොදු වාහනයක් ලබා දෙන්න ඕනෑ. අපේ වාහන මේ විධියට අපට නිතර හදන්න බැහැ. මේ ගැන පාර්ලිමේන්තුවෙන් මොකක් හෝ ක්‍රමවේදයක් හදලා අපේ වාහන ආරක්ෂා කරලා දෙන්න. මොකද, අපි යන්නේ, එන්නේ අපේ පෞද්ගලික වාහනවලින්. අපට ජනාධිපතිතුමා වාහන දීලාත් නැහැ, අගමැතිතුමා වාහන දීලාත් නැහැ. ඒ නිසා කරුණාකර මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ ஸ்ரீநேசன் அவர்கள்! உங்களுக்கு 04 நிமிடங்கள் இருக்கின்றன.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
எனக்குப் பத்து நிமிடங்கள் ஒதுக்கப்பட்டிருந்தது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
பத்து நிமிடங்கள் நான்கு நிமிடங்களாகக் குறைக்கப் பட்டிருக்கின்றது.

[பி.ப. 6.12]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான்கு நிமிடங்களுக்குள் எனது பேச்சைச் சுருக்கமாகப் பேசவேண்டிய நிர்ப்பந்தத்தில் நான் இருக்கின்றேன். மட்டக்களப்புப் பல்கலைக்கழகம் பற்றி ஒவ்வொருவரும் தங்களுடைய சிந்தனைப் பாங்கின் அடிப்படையில் கருத்துக்களைச் சொல்லிக்கொண்டிருக்கின்றார்கள். என்னைப் பொறுத் தமட்டில், இந்த நாட்டில் யார் எந்த வேலையைச் செய்கின்றார் என்பது முக்கியமல்ல. செய்கின்ற பணி சரியானதா, தவறானதா? என்பதுதான் முக்கியம். ஹிஸ்புல்லாஹ் கட்டுகின்றாரா, கிரிபண்டா கட்டுகின்றாரா, கிருஷ்ணபிள்ளை கட்டுகின்றாரா? என்பது எங்களுக்கு முக்கியமல்ல. அது சரியான பணியாக இருந்தால், ஹிஸ்புல்லாஹ் செய்தாலும் சரிதான்; கிரிபண்டா செய்தாலும் சரிதான்; கிருஷ்ணபிள்ளை செய்தாலும் சரிதான்! அது பிழையாக இருந்தால், நாங்கள் அதனைப் பற்றிப் பேசவேண்டிய தேவை இருக்கின்றது. இந்தப் பல்கலைக்கழகம் பற்றிய விடயத்தில் சரியாக நடந்திருந்தால், இதனைப் பற்றி ஆட்சேபிக்கவேண்டிய அவசியம் எங்களுக்கு இல்லை.

இதில் நிலம் சம்பந்தமான ஒரு பிரச்சினை இருக்கின்றது; பணம் சம்பந்தமான ஒரு பிரச்சினை இருக்கின்றது; அதன் பரிபாலனம் சம்பந்தமான ஒரு பிரச்சினை இருக்கின்றது. இந்தப் பிரச்சினைகளில் முதலாவதாக நிலம் சம்பந்தமான பிரச்சினை பேசப்படுகின்றது. இந்த மட்டக்களப்புப் பல்கலைக்கழகத்துக்காக 35 ஏக்கர் நிலம் வழங்கப்பட்டதாகச் சொல்லப்படுகின்றது. இந்த 35 ஏக்கர் நிலம் சட்டபூர்வமாக வழங்கப்பட்டது; leasing அடிப்படையில் கொடுக்கப்பட்டது என்று இன்னொரு பக்கமாகச் சொல்கின்றார்கள். அதேவேளை, அதில் 08 ஏக்கர் நிலம் மேலதிகமாகச் சட்ட விரோதமாக அதிகரிக்கப்பட்டிருக்கின்றது என்றும் சொல்லப்படுகின்றது. ஒரு விடயத்தைச் சட்டபூர்வமாகச் செய்கின்றபோது, அதனை நாங்கள் தவறு என்று சொல லவில்லை. ஆனால், சட்டத்துக்கு அப்பாற்பட்ட முறையில், 8 ஏக்கர் நிலம் சேர்த்துப் பிடிக்கப்பட்டிருப்பதாகச் சொல்லப்படுகின்றது. இதனை அளவீடு செய்துபார்க்கலாம். 35 ஏக்கர் நிலத்தில்தான் இந்தப் பல்கலைக்கழகத்தை அமைத்திருப்பதாக அவர் சொல்கின்றார், இங்கு அதனைப் பற்றி விமர்சிக்கின்றபோது, 08 ஏக்கர் நிலம் மேலதிகமாகப் பிடிக்கப்பட்டிருக்கின்றது என்று சொல்லப்பட்டால், அளவீடுகளைச் செய்து, உண்மையில் 35 ஏக்கர் நிலம்தான் இருக்கின்றதா, அல்லது 08 ஏக்கர் நிலம் அதிகமாக இருக்கின்றதா? என்ற விடயத்தைப் பற்றிப் பேசுவது அர்த்தமுள்ள பேச்சாக இருக்கமுடியும். இந்த நிலத்தில் 44 விவசாயிகள் தங்களுடைய வாழ்வாதாரத்தைச் செய்துகொண் டிருந்ததாக அல்லது குடியேறியிருந்ததாகச் சொல்லப்படுகிறது. அவ்வாறு வெளியேற்றப்பட்டவர்கள் என்ன செய்கிறார்கள், எங்கு இருக்கிறார்கள்? அவர்களுக்கு மாற்றீட்டு நிவாரணங்கள் கொடுக்கப்பட்டிருக்கின்றதா? என்கின்ற விடயங்களைப்பற்றிச் சிந்திக்க வேண்டும். இது நிலத்தோடு சம்பந்தப்பட்ட விடயமாகும். எந்த விடயத்தையும் அடிப்படைவாத ரீதியாக அணுகுவதை நான் விரும்பவில்லை. அடிப்படைவாத ரீதியான அரசியல் அணுகுமுறையால்தான் எமது நாடு அதலபாதலத்திற்குச் சென்றிருக்கின்றது.

இரண்டாவது விடயமாகப் பணத்தைப் பற்றிக் கூறப்பட்டது. இதற்கென இங்கு வந்த பணம் சட்டரீதியான பணமா, அல்லது கறுப்புப் பணமா? என்கின்ற பேச்சு இடம்பெறுகின்றது. அதில் ஒரு முரண்பாடு இருக்கின்றது. அந்தத் தனியார் நிறுவனத்தின் தவிசாளர் ஹிஸ்புல்லாஹ் அவர்கள் குறிப்பிடுகின்றார், "இது கடன் ரீதியாகப் பெறப்பட்ட பணம்" என்று. அதன் பணிப்பாளர் சொல்லுகின்றார், "இது அன்பளிப்பாகப் பெறப்பட்ட பணம்" என்று. இந்த விடயத்தில் நிர்வாக சபைக்குள்ளே முரண்பாடொன்று ஏற்பட்டிருக்கின்றது. ஆகவே, இதில் எது உண்மை என்பது அறியப்பட வேண்டும்.

அடுத்ததாக இந்த பரிபாலனம் சம்பந்தமான விடயத்தை எடுத்துக்கொண்டால், ஏன், ஓரளவுக்காவது அது பொதுமைப்படுத்தப்படாமல் இருக்கின்றது?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, சுருக்கமாகக் கூறி, நிறைவுசெய்யுங்கள்!

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
ஆம்.

ஆகவே, பொதுமைப்படுத்தப்பட்டு, வெளிப்படையாக இந்த நிர்வாகத்தை அமைத்திருந்தால் இதனை ஒரு குடும்பத்திற்குரியதாக அல்லது தனிப்பட்ட ஒரு சொத்தாக விமர்சிப்பதற்குரிய வாய்ப்பு வந்திருக்காது. ஆகவே, நாட்டில் நடைபெறுகின்ற எந்தவொரு விடயத்தையும் நாங்கள் அறிவியல்பூர்வமாகச் சிந்தித்து, அதில் எழுகின்ற பிரச்சினைக்கு முடிவைக் காணவேண்டுமேயொழிய, அதனை நாங்கள் எங்களுடைய பாங்கிலிருந்து நோக்கி, எங்களுடைய பாணியில் பேசிக்கொள்வதைத் தவிர்த்துக்கொள்ள வேண்டும். இதிலுள்ள குளறுபடி என்னவென்றால், சட்டத்திற்கு அப்பால் கூடுதலான நிலம் பெறப்பட்டிருக்கின்றது; கறுப்புப் பணம் என்று சந்தேகிக்கக்கூடிய முறையில் பணம் பெறப்பட்டிருக் கின்றது என்று சொல்லப்படுவதாகும். ஆகவே, இந்த விடயத்தை விரிவாக, விளக்கமாக அறிந்த பின்னர் இதனைப்பற்றி நாங்கள் சரியான கருத்துகளைச் சொல்லுகின்ற போது பிரச்சினைகளைத் தவிர்த்துக்கொள் ளலாம் என்பது என்னுடைய கருத்தாக அமைகின்றது. நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ கா. காதர் மஸ்தான். உங்களுக்கு நான்கு நிமிடங்கள் இருக்கின்றன.

[பி.ப. 6.17]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கா. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய சபை ஒத்திவைப்புவேளைப் பிரேரணையில் பலவாறாக விவாதம் பண்ணப்பட்டுக் கொண்டிருக்கின்றது. எமது பகுதிகளிலுள்ள மாணவர்கள் க.பொ.த. உயர்தரப் பரீட்சையில் சித்தி பெற்றுப் பல்கலைக்கழகத்துக்குச் செல்லக்கூடிய தகுதியிருந்தும் பல்கலைக்கழகங்களுக்கு அனுமதி கிடைக்காத நிலையிலிருக்கின்றார்கள். ஏனெனில், ஒவ்வொரு வருடமும் க.பொ.த. உயர்தரப் பரீட்சை எழுதும் மாணவர்களில் 19 வீதமானவர்களுக்குத்தான் அரச பல்கலைக் கழகங்களில் அனுமதி கிடைக்கின்றது. ஏனையவர்கள் வானத்தைப் பார்த்துக் கொண்டிருக்கின்றார்கள். இந்த நிலையில் அரச பல்கலைக்கழகங்களுக்கு மாற்றீடாகத் தனியார் பல்கலைக்கழகங்கள் கொழும்பு, கண்டி, குருநாகல் போன்ற மாவட்டங்களில் அமைக்கப்பட்டிருக்கின்றன. வடக்கு, கிழக்கு, ஊவா, தெற்கு ஆகிய பகுதிகளில் இவ்வாறான தனியார் பல்கலைக்கழகங்கள் இல்லை. இந்த இடத்தில் நான் குறிப்பாகக் கூறுவது என்னவெனில், இதை நிவர்த்திசெய்யும் விதமாக, எமது இந்தத் திருநாட்டின் மாணவச் செல்வங்களுக்கு, க.பொ.த உயர்தரத்தில் சித்தியடைந்தும் பல்கலைக்கழகம் செல்ல முடியாமலிருப்பவர்களுக்கு, தனியார் பல்கலைக்கழகங்களுக்குச் செல்வதற்குரிய வாய்ப்பினை வழங்குவதற்காக மேற்குறிப்பிட்ட பகுதிகளில் தனியார் பல்கலைக்கழகங்கள் உருவாகுவதற்கு ஆதரவளிப்பவர்களாக நாங்கள் இருக்க வேண்டும் என்பதாகும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது மாணவர்களுக்காக - எமது இளைஞர்களுக்காகத் தனியார் துறையினர் பல்வேறு நாடுகளுக்கும் சென்று பல வழிகளிலும் உதவிகளைப் பெற்று அல்லது தங்களுடைய சொந்த நிதியின்மூலம் இவ்வாறான பல்கலைக்கழகங்களை உருவாக் கும்போது, அவற்றுக்கு BOI அனுமதி கொடுக்கப்பட்டுள்ள நிலையில், ஏதோவொரு பிரச்சினை ஏற்பட்டதை வைத்து, தேவையற்ற முறையில் இவற்றைத் தடுக்கும்போது, பாரிய பிரச்சினைகளுக்கு நாங்கள் முகங்கொடுக்க வேண்டிவரும் என்ற அடிப்படையில், இந்த இடத்தில் உங்களுக்கு நான் ஒன்றைக் கூற விரும்புகின்றேன். பாராளுமன்றத்தில் கல்வி மற்றும் மனிதவள அபிவிருத்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவினால் இதற்கு முதல் SAITM என்ற பல்கலைக்கழகம் தொடர்பிலும் ஓர் அறிக்கை சமர்ப்பிக்கப் பட்டிருக்கின்றது. அந்த அறிக்கையினைப் பார்க்கின்றபோது, அதில், "முடிவுகளும் சிபாரிசுகளும்" என்ற பகுதியில் "மருத்துவ பீடங்களை விஸ்தரிப்பதற்கு அல்லது புதிதாக ஆரம்பிப்பதற்கு அரசுக்கு முடியாதுள்ளது" என்று கூறப்பட்டுள்ளது. அப்படியானால், தனியார் அதைச் செய்யவேண்டும் என்ற அடிப்படையில்தான் அவ்வாறு கூறப்பட்டுள்ளது. அதற்கடுத்ததாக, இன்னோர் இடத்தில் "சிபாரிசு" என்ற அடிப்படையில் "தனியார் பிரிவின் பங்களிப்புடன் இலங்கையில் புதிய மருத்துவக் கல்லூரிகளை ஆரம்பித்தல்" என்று கூறப்பட்டுள்ளது. ஆகவே, அரசுக்கு முடியாது என்பதனை இந்தப் பாராளுமன்றக் குழுவே சொல்லியிருக் கின்றபோதுதான், இவ்வாறான ஒரு முயற்சி கிழக்கு மாகாணத்தில் மேற்கொள்ளப்பட்டுள்ளது.

ஆகவே, நாட்டின் வடக்கு, கிழக்கிலும் அதேபோல் தென் பகுதியிலும் இவ்வாறான தனியார் பல்கலைக்கழகங்கள் கூடுதலாக வருவதற்குரிய ஏற்பாடுகளை அரசு செய்யவேண்டும் என்றும் எமது பகுதிகளில் கல்வி கற்க வேண்டும் என்று பெரும் ஆசையுடன் இருக்கும் மாணவர்களுக்குக் கல்வியை வழங்குவதில் பங்களிப்புச் செய்வதற்காக, வெளிநாட்டு உதவிகளைப் பெற்றாவது தனியார் பல்கலைக்கழகங்களை உருவாக்குவதற்குரிய ஆதரவினை வழங்கி, அவற்றை உருவாக்குவதற்கு உதவி செய்யுமாறும் நான் இந்தச் சந்தர்ப்பத்தில் கௌரவ உயர் கல்வி அமைச்சர் அவர்களைக் கேட்டுக்கொள்கின்றேன். நன்றி.

[6.21 p.m.]

**ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல், நீர் வழங்கல் மற்றும் உயர் கல்வி அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning, Water Supply and Higher Education)

Hon. Presiding Member, we have heard a lengthy Debate this afternoon on this issue concerning the so-called "Batticaloa Campus" and the controversy surrounding it. This Adjournment Motion proposed by the Hon. (Dr.) Nalinda Jayathissa from the Janatha Vimukthi Peramuna has evoked somewhat emotional and sentimental tirades by several Members of Parliament. As the Minister in charge of this subject, I cannot be drawn into any emotional, sentimental tirades, but I have got to present the factual situation as it stands today and the details as to how this process was undertaken by the Ministry of Higher Education.

In this regard, there had been certain other inquiries that have gone on, particularly by the Parliamentary Sectoral Oversight Committee on Education and Human Resources Development under the Chairmanship of the Hon. (Prof.) Ashu Marasinghe. It has gone into this matter in detail and submitted a Report. Subsequent to the Report being presented to the Cabinet through the Secretary to the Cabinet, the Cabinet has now taken a decision to appoint a Cabinet Subcommittee consisting of four Cabinet Ministers in charge of related subjects. The Hon. Mano Ganesan, the Minister in charge of National Integration, Official Languages, Social Progress and Hindu Religious Affairs is there. The Hon. Mangala Samaraweera, the Minister in charge of Finance, is there. Then, the Minister in charge of Higher Education and the Hon. Malik Samarawickrama, under whose Ministry the Board of Investment comes, have also been nominated as Members. That Cabinet Subcommittee is yet to officially meet.

But in the meantime, I must place here on record the process that has gone on through the Ministry of Higher Education in order to consider the request for it to be included as a degree-awarding institution. The Non-State University Section of our Ministry is the authority that needs to evaluate this request. I must say here that there have been several minutes of committees which have gone into that matter. There have been almost 35 instances in which different committees have looked into the requirements regarding the degree-awarding status.

[ගරු රවුෆ් හකීම් මහතා]

At the final meeting held on 05th of April, 2019, they had finally come to a conclusion that they cannot recognize this institution as a degree-awarding institution.

The minutes of that meeting states, I quote:

> "..... given that it does not have the capacity to operate on its own through internally generated funds or even equity. Instead it seems to be dependent on borrowing from both its main shareholder and overseas benefactors (as of now, all assets and operating losses have been financed by borrowings).
>
> The forecasted operational/financial data provided seems to be very ambitious and the basis for such forecast is not explained."

Finally, based on several such reasons, the Committee has decided that the institution cannot be awarded the degree-awarding status. So, that being the situation, Sir, I would like to **table*** the minutes.

Together with that, since the Sectoral Oversight Committee had requested the Cabinet to consider their recommendations, the Cabinet Subcommittee has to go into this in detail and decide as to what next step could be taken. This includes the future status of the entire complex, as to what we are going to do with it. There have been questions raised about the manner in which funds came for this institution, about the management of the institution and its conversion from, originally, a vocational training institute, a university college and subsequently, into a degree-awarding institution. We have got to re-examine all these processes and see what we would ultimately do with the physical infrastructure that has come up. It is an issue that the Cabinet Subcommittee has to grapple with. I am sure there have been enough previous instances in which these attempts have been made, the recent event being the SAITM and the manner in which it was finally attached to the General Sir John Kotelawala Defence University.

Of course, there is also the suggestion made by the Hon. (Dr.) Harsha De Silva Committee to look at creating a trust and to allow the trust to continue the operation of this institute. As against that, the owners of the so-called "Batticaloa Campus", Mr. Hizbullah and his foundation, have proposed that you should consider this as a Public-Private Partnership - PPP - project and that they are prepared to abide by the conditions that the Government, as a partner, will impose on the investors as it stands today. So, these are matters that the Cabinet Subcommittee can look into and finally come to a decision on.

So, this being the case, I do not want to go into much detail. Several suggestions have been made, but we have to look at the issue concerning the future of private higher educational institutions, the investments into the institution and what impact the decision being made in this instance would have on the future of such private investments. Of course, whether there were suspicious financial transactions are issues that the Financial Intelligence Unit of the Central Bank should have looked into. The commercial banks through which the monies came have also been examined. I, being a Member of the Select Committee to Look into and Report to Parliament on the Terrorist Attacks that Took Place in Different Places in Sri Lanka on 21st of April, 2019, have also looked into this issue. In fact, Mr. Hizbullah as well as the officials of the BOI, the Bank of Ceylon and the Central Bank including the Governor have come before the Select Committee and explained in detail as to the procedures that have been adopted. So, the Select Committee will submit its report on these issues and I wonder whether any kind of finding could also be indicated in their report, finally. But, all in all, what I expect is that finally the Cabinet Subcommittee that has been appointed will look into all these details and come to a conclusion, which will ensure that this controversy is put to rest and that the unnecessary fears and doubts that have been talked about in the past few months regarding the establishment of this university would finally be decided with its decision.

Thank you.

***එකල්හි වේලාව අ. භා. 6.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***
***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2019 අගෝස්තු 08වන බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 6.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*
*அதன்படி பாராளுமன்றம், 2019 ஓகஸ்ட் 08, வியாழக்கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 6.30 p.m.,* THE HON. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*
*Parliament adjourned accordingly until 10.30 a.m. on Thursday, 08th August, 2019.*

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.